
## ආතර් කොනන් ඩොයිල්ගේ

# ඉන්ද්‍රනීල මානික්‍යය

## චන්දන මෙන්ඩිස්



Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ඉන්ද්‍රනීල මාණික්‍යය

## ෂර්ලොක් හෝම්ස්ගේ
## වික්‍රමාන්විත පරීක්ෂණ

i

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

## චන්දන මෙන්ඩිස්ගේ නිර්මාණ හා පරිවර්තන

**නවකතා** - නිශ්චල චංචල දේපල

**විද්‍යා ප්‍රබන්ධ** - ජුරාසික් දඩයම

**කෙටි කතා** - චීන යෙහෙළිය

**යොවුන් නවකථා** - අබිරහස් දූපතේ නිධානය, නිල් දියමන්ති අබිරහස

**පරිවර්තන (ෂර්ලොක් හෝම්ස් කථා)**
සුනඛ ශාපය
සිව් රහස් සලකුණ
බිහිසුණු නිම්නය
මළගිය ඇත්තෝ සාක්ෂි දෙති
ලේ සලකුණ
අන්තරාය අඩවියක
මහ රෑ ආ මාරයා
ඉන්ද්‍රනීල මාණික්‍යය
දියමන්ති ඔටුන්න
ලෝහිත පරීක්ෂණය
ඔබෙන් සමුගනිමි
ෂර්ලොක් හෝම්ස් ආපසු එයි
පුද්ගලිකයි රහසිගතයි
මොරියාටිලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්
භයානක මිනිහා
කළු විකාලයා
රතුවන් හැඳි කත
ප්‍රදීපාගාරයේ විභ්‍රමය
අබිරහස් දොස්තර
ගින්දර සමග සෙල්ලම්
සමුදුරේ සටන

**පරිවර්තන (අනෙක්)**
සැඟවුණු ලොවේ සවාරියක්
ඇලන් ක්වාටමේන්ගේ වීරචාරිකාව
වියරු විද්‍යාඥයා
යකාගේ නවාතැන
හරිම පුදුමයි!
සිහිනයක රැඳි රහසක්
චාලි සහ අරුම පුදුම චොකලට් කම්හල
මේරා
රහස් පරීක්ෂකයා අතුරුදන්
හැටකපන පුංචා
හිනිපන්දත් හරහා........ලෝකය වටේ අසූ දවසකින්
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2008)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා II - සොඳුරු සිතුවම් - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2009)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා III - සඳ දියේ පාවී ගියා



http://sherlockholmesinvestigations.blogspot.com

# ඉන්ද්‍රනීල මාණික්‍යය

## ෂර්ලොක් හෝම්ස්ගේ
## වික්‍රමාන්විත පරීක්ෂණ

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ

**THE ADVENTURES OF SHERLOCK HOLMES**

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, දුව පාර, බැද්දගාන, කෝට්ටේ



Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


1. ඉන්ද්‍රනීල මාණික්‍යය 9
The Adventure of the Blue Carbuncle

2. උමං දුම්රියේ අභිරහස් මරණය 48
The Adventure of Bruce - Partington Plans

3. අයිරින් ඇඩ්ලර් 99
A Scandal in Bohemia


4. රතු හිසකෙස් ගැටලුව 141
The Adventure of the Red Headed League

5. බිහිසුණු අත්දැකීමක් 185
The Adventure of the Five Orange Pips

6. බොස්කෝම්බ් නිම්නයේ ඛේදවාචකය 216
The Adventure of the Boscombe Valley


Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



ෂර්ලොක් හෝම්ස්

Reading Purpose Only.. Not For Print.



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

http://sherlockholmesinvestigations.blogspot.com

# III

# ඉන්ද්‍රනීල මාණික්‍යය

"ඔබට ශුභ නත්තලක් සහ ප්‍රීතිමත් නව වසරක් වේවා ෂර්ලොක් හෝම්ස් මහත්මයා!"

නත්තල් උත්සවය අවසන් දෙවැනි දිනයේ බේකර් වීථියේ අපේ නිවහනට ගොඩවැදී, මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ට, මම ආශිංසන පිරිනැමුවෙමි.

දම් පැහැති පිටකබායකින් සැරසී සිටි මගේ මිත්‍රයා, සෝපාවේ වැතිර සිටියේය. ඔහුගේ දකුණු අතින්, අතේ දුරින් තිබුණේ උම්බිමට යොදාගත් පයිප්ප අඩංගු රාක්කයයි. කොළ ගැළවී වෙනවූ පොඩි වූ පුවත්පත් කිහිපයක්, අසල්හුම බිම දමා තිබිණි. සෝපාවට නුදුරින් වූ ලී පුටුවක එල්ලා තිබුණේ, කිළිටි වූ කළු පැහැති හිස්වැස්මකි. ඇවිමත් පෙල්ට් රෙද්දෙන් තනා තිබූ එහි, තැන් කිහිපයක්ම පළුදු වී ඇති අයුරු මම දුටුවෙමි. බොහෝ කාලයක් තිස්සේ පාවිච්චි කොට ගෙවී යාම නිසා, එයට ලැබී තිබුණේ අවලක්ෂණ පෙනුමකි. පුටුව මත, කුඩා දේ අල්ලන අඬුවක් ද උත්තල කාචය ද විය. හිස්වැස්ම හෝම්ස්ගේ පරීක්ෂාවට ලක්වෙමින් තිබූ බව එයින් මම වටහා ගතිමි.

"ඔබ පරීක්ෂණයක යෙදිල වගෙයි, මගේ පැමිණීමෙන් ඔබට බාධා වෙනවා නේද?"

"කිසි ප්‍රශ්නයක් නෑ වොට්සන්. පරීක්ෂණයෙන් මා හොයාගත් කරුණු ගැන සාකච්ඡා කරන්නට, මිතුරෙක් ඉන්න එක කොයිතරම් සතුටක් ද? මේක බොහොම සුළු කාරණයක්. ඒ වුණත් සිත් ඇදගන්නා ලක්ෂණ සහ උගත යුතු කරුණු කිහිපයක් මේකෙ නැත්තෙම නෑ."

හෝම්ස් පැවසුවේ හිස්වැස්ම දෙසට ඇඟිල්ල දිගු කරමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

ශීත සෘතුවේ සීතල කොතරම් වී ද යත් ජනෙල් වීදුරුවල අයිස් කැට පවා සෑදී තිබිණි. ගිනි උදුන වෙත දෑත් දිගුකොට, මම සීතලෙන් හිරිවැටී ගිය දෑත් උණුසුම් කර ගතිමි. අනතුරුව මට හුරුපුරුදු හාන්සි පුටුවේ හිඳගතිමි.

"මේක බොහොම අහිංසක දෙයක් වගේ පෙනුණාට, මට හිතෙනවා හෝම්ස් මේකට සම්බන්ධව මොකක් හරි බිහිසුණු සිදුවීමක් ඇති කියල. මොනවා හරි භයානක අපරාධයක් හෙළිකරගන්න ඔබට උදව්වෙන හෝඩුවාව මේක වෙන්න ඇති කියලා මට හිතෙනවා."

"නෑ නෑ. කිසිම අපරාධයක් නෑ" හෝම්ස් කිවේ සිනාසෙමිනි.

"වර්ග සැතපුම් කිහිපයක කුඩා ඉඩ ප්‍රමාණයක් ඇතුළත ලක්ෂ හතළිහක ජනතාව උරෙන් උර ගැටී ජීවත්වෙන්න ගියාම, මෙ වගේ දේවල් සිදුවෙනවා. මේ තරම් විශාල ජන සංඛ්‍යාවක් එකට ගැටෙමින් ජීවත්වෙන සමාජයක, ඇතිවෙන්න පුළුවන් ක්‍රියා සහ ඒවායේ ප්‍රතික්‍රියා ගණන අසීමිතයි. ඒ ඇතිවෙන්න පුළුවන් සිද්ධීන් විවිධාකාරයි. මේ අතරේ ඉතාම විස්මයජනක, සිත් කැළඹෙන ආකාරයේ සිදුවීම් පවා, අපට බලාපොරොත්තුවෙන්න පුළුවනි. නමුත් ඒවා හැම එකක්ම අපරාධ වලට සම්බන්ධ නැහැ. එවැනි සිදුවීම් මීට කලින් අප හමුවට ඇවිත් තියෙනවා නේද වොට්සන්?"

"ඔව් ඒක හරි. මගේ සටහන් පොතට ඇතුළු කළ අන්තිම පරීක්ෂණ හයෙන් තුනක්ම, කිසිම ආකාරයකින් අපරාධ යයි කිව නොහැකි ඒවා."

"හරියට හරි. මේ සුළු සිදුවීමත් ඒ කාණ්ඩයටම වැටෙන එකක් බවට සැකයක් නෑ. ඔබ හඳුනනවා නේද පීටර්සන්? අර ආරක්ෂක භටයා?"

"ඔව්?"

"මේක අන්න ඔහුට ලැබුණු ජය සංකේතයක්."

"ඒ කිව්වෙ මේ හිස්වැස්ම අයිති ඔහුටද?"

"නෑ නෑ. මේක ඔහුට හම්බවෙලා තියෙනවා. අයිතිකාරයා කවුද කියල හඳුනන්නෙ නෑ. මං ඔබෙන් ඉල්ලා සිටිනවා මේක කාගෙදෝ කබල් හිස්වැස්මක් කියල හිතන්නේ නැතුව, බුද්ධිය අවදි කරන ගැටලුවක් ලෙස සලකා විමසා බලන්න කියල. ඒක

http://sherlockholmesinvestigations.blogspot.com



11. "මට හිතෙනවා, හෝම්ස් මේක මොනවා හරි භයානක අපරාධයක් හෙළිකරගන්න ඔබට. . . "

http://sherlockholmesinvestigations.blogspot.com

මෙහේට ආවෙ කොහොමද කියල මං මුලින්ම කියන්නම්. නත්තල් දවසට එළිවෙන්න පාන්දර, මේක ඔහුට හමුවුණේ හොඳ තරබාරු පාත්තයෙකුත් සමගයි. දැන් මේ වෙලාව වෙනකොට, පාත්තයා නම් පීටර්සන්ගේ උදුනේ රෝස්ට් වෙනවාට කිසිම සැකයක් නෑ. මට දැනගන්න ලැබුණු කාරණා මෙන්න මේවායි වොට්සන්.


ඔබ දන්නවා පීටර්සන් බොහොම අවංක කෙනෙක්. ඔහු ප්‍රීති සාදයකට සහභාගි වෙලා, නත්තල් දවසේ උදේ පාන්දර ගෙදර එමින් හිටියා. ඔහු ආවේ ටොටන්හැම් කෝට් පාර දිගේ. ඔහු ඉදිරියෙන් තරමක් උස පුද්ගලයෙක් සුදු පාත්තයෙක් කරේ තබාගෙන එන හැටි, ගෑස් ලාම්පුවේ එළියෙන් පීටර්සන් දුටුවා. මේ තැනැත්තා ගමන් කළේ, ටිකක් එහාට මෙහාට විසිවෙවී වගේ.

ගුජ් වීථියට හැරෙන හන්දියේදී මේ මනුස්සයත්, හන්දියේ ගැවසුණු චණ්ඩින් කිහිපදෙනෙකුත් අතර ආරවුලක් හටගැනුණා. උන් එකෙක් එල්ල කළ පහරට, ඒ මනුස්සයාගෙ හිස්වැස්ම ගැලැවිලා බිම වැටුණා. ඔහු මොකද කළේ, චණ්ඩින්ගෙන් ආරක්ෂා වීමේ අදහසින් සැරයටිය ඉහළට එසෙව්වා. ඒක වැදුණා ළඟ තිබුණ සාප්පුවක, ප්‍රදර්ශන කවුළුවේ වීදුරුවේ. වීදුරුව කුඩු වී ගියා. මේ පුද්ගලයා චණ්ඩින්ගෙන් බේරා ගැනීමේ අදහසින් පීටර්සන් ඉදිරියට දිව්වා. අර මනුස්සයා දක්කා නිල ඇඳුමක් හැඳගත් ආරක්ෂක භටයෙක් තමන් හිටි පැත්තට දුවගෙන එන හැටි. තමන්ගේ අතින් වීදුරුවක් බිඳිලා, භීතියට පත්වෙලා හිටි ඒ මනුස්සයා, පාත්තයත් එතැන දමලා පැනල දිව්වා. ටොටින්හැම් කෝට් පාරට සම්බන්ධ අතුරු පටු මාවත් රාශියක් තියෙනවා නේ. මේ මිනිහා ඒවා අස්සෙන් අතුරුදන් වුණා. පීටර්සන්ව දැකපු ගමන් අර චණ්ඩි ටිකත් පැන දිව්වා. අන්තිමට මොකද වුණේ? සංග්‍රාම භූමියේ තිබී පීටර්සන්ට ලැබුණා ජය සංකේත දෙකක් - ඉතාම වටිනා නත්තල් පාත්තයෙක් සහ පළුදු වූ හිස්වැස්මක්."

"ඒක ඔහු නොවැරදීම අයිතිකාරයට ආපහු භාරදෙන්න ඇති?"

"මිත්‍රයා ප්‍රශ්නය තියෙන්නෙ එතැනයි. පාත්තයාගේ කකුලේ කුඩා කාඩ්පතක් නූලකින් ගැටගහල තිබුණා. ඒකෙ සඳහන් වෙලා තිබුණේ "හෙන්රි බේකර් මහත්මිය වෙත" කියලා. ඊට අමතරව හිස්වැස්මේ ඇතුළු වාටියේ H. B යන අකුරු දෙක ලියා ඇති බව කියවන්නත් පුළුවනි. මේ කාරණා දෙක අනුව අයිතිකරුවා කවුද

http://sherlockholmesinvestigations.blogspot.com



13. පීටර්සන් දැකපු ගමන් අර ගණ්ඩි ටික පැන දිව්වා."

http://sherlockholmesinvestigations.blogspot.com

කියලා අපට හොඳින් තේරුම් ගන්න පිළිවන්. නමුත් මේ නගරයේ බේකර්ලා දහස් ගණනක් ඇති. හෙන්රි බේකර්ලා සිය ගණනක් ඇති. ඉතින් නැතිවුණු බඩුවේ අයිතිකාරයා මොන හෙන්රි බේකර්ද කියලා හොයාගන්න එක පහසු වැඩක් නෙමෙයි."

"පීටර්සන් ඊට පස්සෙ මොකද කළේ?"

"මං මේ සුළු සුළු ප්‍රශ්න ගැන ලොකු උනන්දුවක් දක්වන කෙනෙක් බව පීටර්සන් දන්නවා. ඔහු නත්තල් දවසේ උදේම හිස්වැස්ම සහ පාත්තයා දෙකම මා ළඟට අරගෙන ආවා. අද උදේ වන තුරු අපි පාත්තයව තියාගෙන බැලුවා. හිම වැටෙන කාලෙ වුණත් ඌව තවත් තියාගන්න එක නුවණට හුරු නැහැ. තවත් පරණ නොකර ඌ ඉක්මනින් ආහාරයට ගැනීම සුදුසු බව මට පෙනී ගියා. ඒ නිසා මං පාත්තයව පීටර්සන්ටම භාරදුන්නා. නත්තල් භෝජනය අහිමිවුණු අර මහත්මයාගෙ හිස්වැස්ම මා ළඟ තියාගත්තා."

"ඔහු පුවත්පතේ දැන්වීමක් දමල තිබුණෙ නැද්ද?"

"නැහැ"

"ඔහු හඳුනාගැනීමට මොනවද ඔබට ලැබුණු හෝඩුවාවල්?"

"නිරීක්ෂණ මගින් අපට ගත හැකි නිගමන පමණයි."

"ඒ කියන්නේ ඔහුගේ හිස්වැස්මෙන්ද?"

"අන්න හරි"

"ඔබ විහිළු කරනවා හෝම්ස්. මේ කබල් හිස්වැස්මෙන් මොනවා හොයා ගන්න ද?"

"මෙන්න වොට්සන් මා සියුම් දේ පරීක්ෂා කරන උත්තල කාචය. ඔබ දන්නවා නේ කරුණු හොයන්න මා අනුගමනය කරන ක්‍රම මොනවද කියලා? මේ හිස්වැස්ම අයිති පුද්ගලයා ගැන, ඔබට හොයා ගත හැකි කරුණු මොනවාද කියලා බලන්න."

මම හිස්වැස්ම අතට ගෙන, එය ඒ මේ අත හරවා පරීක්ෂා කර බැලීමි. එය කළු පැහැති ෆෙල්ට් වලින් තැනූ, සාමාන්‍යයෙන් නිතර දෙවේලේ මගතොටදී දකින්නට ලැබෙන ආකාරයේ හිස්වැස්මක් විය. එහි හිසේ පළඳින කොටස රවුම් වූ අතර බොහෝ කාලයක් තිස්සේ පාවිච්චි කර තිබූ බව පැහැදිලිවම පෙනිණ. එහි ඇතුළ

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

පැත්තේ රතු පැහැති සේද පටියක් අල්ලා තිබුණත්, එය දුර්වර්ණවී තිබිණි.

හිස්වැස්ම නිෂ්පාදනය කළ ආයතනයේ නම සඳහන් ලේබලයක් එහි නොවීය. කෙසේ වෙතත් හෝම්ස් සඳහන් කළ පරිදි H. B. යන අකුරු ඇතුළු පැත්තේ ලියා තිබිණි. එහි වාටියේ හිස්වැස්ම එල්ලා තැබීම පිණිස කුඩා සිදුරක් විද ඇති අයුරු මම දුටුවෙමි. කෙසේ වෙතත් හිස්වැස්ම ගැලවීයාම වැළැක්වීමට, නිකට හරහා දැමිය හැකි ඉලාස්ටික් පටිය එහි නොවීය. ඒ හැරුණු විට මට දකින්නට ලැබුණේ, වාටියේ තැනින් තැන පළුදු වී ඇති අයුරුත්, හිස්වැස්ම පුරා දූවිලි එකතු වී ඇති සැටිත්ය. එහි මතුපිට නොයෙක් තැන්වල පැල්ලම් රැසක් සෑදී තිබිණි. ඒවා වැසීමේ අරමුණෙන් පැල්ලම් මත කළු පැහැති තීන්ත ආලේප කර ඇති බැව් මම දුටුවෙමි.

"මට නම් මොකුත් පෙනෙන්නෙ නෑ."

හිස්වැස්ම හෝම්ස් අතට දෙමින් මම කීවෙමි.

"ඇත්තම කියනවා නම් වොට්සන්, ඔබට හැම දෙයක්ම පෙනෙනවා. නමුත් ඒ දේවල් වලින් තර්කානුකූලව නිගමනයකට ඒමට ඔබ අපොහොසත්. නිරීක්ෂණය කළ හැකි දේවල් වලින් නිවැරදි නිගමනයකට ඒම අතින් ඔබ දුර්වලයි."

"එහෙනම් කරුණාකරල මට කියන්න මේ හිස්වැස්මෙන් ඔබට කියන්න පුළුවන් මොනවද කියල"

"බැලූ බැල්මටම පෙනෙනවා මේක අයිති පුද්ගලයා බුද්ධිමත් කෙනෙක් බව. අවුරුදු තුනකට පමණ ඉහතදී ඔහු හොඳ වත් පොහොසත්කම් තිබුණු කෙනෙක්. නමුත් දැන් ඔහුට අහේනි කාලයක් ඇවිල්ලයි තියෙන්නෙ. ඉස්සර ඔහුට හොඳ දුරදක්නා නුවණක් තිබිල තියෙනවා. නමුත් දැන් ඒකත් හුඟක් අඩුවී ගොස් ඇති බව කියන්න පුළුවනි. මේකට හේතුවත් බොහෝවිට ආර්ථික අතින් දුර්වල බවකට ඇදවැටීම විය හැකියි. ඔහු එහෙම තත්ත්වයකට පත්වුණේ යම් හානිකර බලපෑමක් නිසා - බාගවෙලාවට මත්පැන් වලට ඇබ්බැහිවීමක් නිසා වෙන්න පුළුවන්. ඔහුගේ බිරිඳ ඔහු කෙරෙහි දක්වන ආදරයත් නැතිවී ගිහින් බව පැහැදිලියි. ඒකට හේතුව ඔහුගේ බීමත්කම වෙන්න පුළුවනි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා හෝම්ස්?"

"ආත්ම ගෞරවය රැකගත යුතුයි කියන හැඟීම, තවමත් යම් පමණකට ඔහුගේ හිතේ තියෙනවා. ඔහු ක්‍රියාශීලී ජීවිතයක් ගත කරන කෙනෙක් නෙමෙයි. එළිමහනේ ඇවිදින්න යන්නේ පවා කලාතුරකින්. මැදිවියේ කෙනෙක්. ඔහුගේ හිසකෙස් තරමක් සුදුවෙලා. දින කිහිපයකට කලින් කොණ්ඩය කප්පවා ගෙන තියෙනවා. ඔහු හිසේ ආලේප කරන්නේ දෙහි සුවඳ කැවූ ක්‍රීම් ආලේපයක්. ඒව තමයි මේ හිස්වැස්මේ අයිතිකරුවා ගැන නිශ්චිත වශයෙන් කියන්න පුළුවන් කරුණු. ඒ අතරම බොහෝවිට ඔහුගේ ගෙදර ගෑස්ලාම්පු භාවිතයක් නොමැති වෙන්නත් පුළුවන්."

"හෝම්ස් ඔබ විහිළු කරනවා නේද?"

"කිසිම විහිළුවක් නැහැ. මම මේ නිගමනවලට ආවට පස්සෙවත්, ඒවා හොයා ගත්තේ කොහොමද කියලා ඔබට තේරුම් ගන්න බැරිද?"

"මං මහ මෝඩයෙක් බව මං පිළිගන්නවා හෝම්ස්. ඒ ගැන මගේ සැකයක් නෑ. ඒ වුණත් ඔබ ඒ නිගමනවලට ආවෙ කොහොමද කියන එකවත් මට හිතාගන්න බෑ. උදාහරණයක් වශයෙන් ඔබ කොහොමද කියන්නේ මේ මනුස්සයා බුද්ධිමතෙක් කියලා?"

එයට පිළිතුරක් ලෙස හෝම්ස් හිස්වැස්ම තම හිසෙහි දමා ගත්තේය. එයින් හෝම්ස්ගේ ඇහිබැම දක්වා වැසීගිය අතර, හිස්වැස්මේ වාටිය ඔහුගේ නාසයේ ඉහළ කෙළවර මත රැඳිණි.

"පෙනෙනවා නේද එහි පරිමාව කොපමණද කියලා? මේ තරම් විශාල මොළයක් තිබෙන කෙනෙක් බුද්ධිමතෙක් විය යුතුමයි."

"දැන් ඔහු ධන පරිහානියකට මුහුණදී ඇති බව?"

"මේක අවුරුදු තුනක් පරණයි. මෙය ඉතාම අනර්ඝ වර්ගයක හිස්වැස්මක්. බලන්න එහි ඇතුළු පැත්තට යොදා තිබෙන වටිනා සේද රෙද්ද. මේ මනුස්සයා අවුරුදු තුනකට කලින් මිල අධික හිස්වැස්මක් මිලදී ගෙන තියෙනවා. නමුත් ඊට පස්සේ එවැන්නක් ගන්න ඔහුට හැකියාවක් තිබිල නැහැ. ඒකෙන් පෙනෙනවා ඔහු ධන හානියකට පත්වී ඇති බව."

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි ඒක පැහැදිලියි. ඔහුට දුරදක්නා නුවණක් තිබූ බවත්, පසුව මානසික පසුබෑමකට ලක්වී ඇති බවත් ඔබ කිව්වේ කොහොමද? ඇයි ඔහුගේ ගුණධර්ම පිරිහී ගිය බව?"

හෝම්ස් ශබ්ද නගා සිනාසුණේය.

"දුරදක්නා නුවණ ගැන කිව්වෙ මෙහෙමයි.

"හිස්වැස්ම මිලට ගනිද්දී ඒකට ආරක්ෂක ඉලාස්ටික් පටියක් සවිකරලා ලැබෙන්නෙ නෑ. එහෙම දෙයක් හිස්වැස්ම මිලදී ගත් අලුත සවිකරවා ගැනීමෙන් පෙනෙන්නේ ඔහුට දුරදක්නා නුවණක් තිබූ බව. ඒක මොකටද? හිස්වැස්ම සුළං පහරෙන් ගැලවී යන එක වළක්වා ගැනීමට. ඊළඟට අපට පෙනෙනවා ඒ පටිය කැඩීගොස් ඇති බව. ඒක අලුත්වැඩියා කරගන්න ඔහු උත්සාහයක් අරගෙන නැහැ. ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන්, ඔහුට කලින් තිබුණු දුරදක්නා නුවණ අඩුවී ගොස් ඇති බව. ඒකෙන් මොකක්ද ඔප්පු වෙන්නෙ? ඔහුගේ ස්වාභාවික ගතිගුණ වල වෙනස්වීමක් සිදුවෙලා. ඊළඟට අපි දකිනවා මේ හිස්වැස්මේ තිබූ පැල්ලම්, කළු තීන්ත ආලේප කර වහන්න උත්සාහකර ඇති බව. ඒකෙන් අපට හිතාගන්න පුළුවන් මොකක්ද? තමන්ගේ ආත්ම ගෞරවය ඒ.කගැනීම ගැන, යම් තරමකට හෝ තැකීමක් ඔහුගේ හිතේ තවමත් තියෙනවා."

"ඔබේ නිගමන ඇත්තෙන්ම තර්කානුකූලයි."

"අනෙක් කරුණු බොහොමයක් ඔහුගේ හිස්වැස්මේ, ඇතුළු වාටිය සියුම්ව පරීක්ෂා කිරීමෙන් බලාගන්න පුළුවනි. මගේ කාචයට පෙනෙනවා, කරණවෑමියකු කතුරකින් කැපූ හිසකෙස් කොට රාශියක්, වාටියට ඇලී ඇති බව. ඒවා තැනින් තැන සුදු වූ හිසකෙස්. ඒ නිසා මැදිවියේ කෙනෙක් බව කිවහැකියි. හිසකෙස් කැබලි වල පැහැදිලිවම, දෙහි සුවඳ කැවූ ශීර්ෂාලේප සුවඳක් දැනෙනවා. හිස්වැස්ම මතුපිට ඇති දූවිලි පරීක්ෂා කරල බලන්න වොට්සන්. එය පාරේ ගමන් කරද්දී වැදෙන, සියුම් වැලි අනුෂ ගතියක් ඇති අළු පැහැති දූවිල්ල නොමෙයි. මේක දුඹුරු පැහැයක් ගත් පුළුන්වැනි සැහැල්ලු, එකට ඇලුණු දූවිල්ලක්. ඒකෙන් අපට පෙනෙන්නෙ හිස්වැස්ම වැඩිකාලයක් නිවස ඇතුළත එල්ලා ඇති බව. ඊළඟට ඇතුළු වාටිය තෙත්වීම නිසා පැල්ලම් සෑදී ඇති සැටි බැලූ බැල්මටම පෙනෙනවා. ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවන් මේ හිස්වැස්ම

http://sherlockholmesinvestigations.blogspot.com

පළඳින නැනැත්තාට අධික වශයෙන් ඩහදිය දමන බව. නිතර ඇවිදින්න යන හෝ ශාරීරික ව්‍යායාම වල යෙදෙන කෙනෙකුගේ එවැනි ඩහදිය දම්මක් ඇති වෙන්න හේතුවක් නෑ."

"ඒ වුණාට ඔබ කොහොමද ඔහුගේ බිරිඳ ගැන කිව්වෙ? ඇය දැන් ඔහුට ආදරය නොකරන බව?"

"මේ හිස්වැස්ම සති ගණනාවකින් දූවිලි ඉවත්වෙන විධියට පිරිසිදු කරල නැහැ. මගේ හිතවත් වොට්සන්. ඔබේ හිස්වැස්මෙත් මේ ආකාරයට දූවිලි එකතුවෙලා තියෙනවා නම්, අපිරිසිදු හිස්වැස්මක් පැළැඳගෙන ඔබට එළියට බහින්න ඔබේ බිරිඳ ඉඩ දෙනවා නම්, මොකක්ද මට ගන්න පුළුවන් නිගමනය? පැහැදිලිවම ඔබේ බිරිඳ ඔබ කෙරෙහි තවදුරටත් ආදරයක් දක්වන්නෙ නැහැ."

"සමහර විට ඔහු අවිවාහකයෙක් වෙන්න පුළුවනි?"

"වෙන්න බෑ. ඔහු අර ගෙදර ගෙන ගිය පාත්තයා මතකද? උගේ කකුලේ ගැට ගහලා තිබුණේ බිරිඳගේ නම ලියූ කාඩ්පතක්. ඒ, බිරිඳ සමග සමගි සාමදානයක් ඇතිකරගැනීමේ තෑග්ගක් වෙන්න පුළුවනි."

"ඔබ ළඟ හැම ප්‍රශ්නයකටම පිළිතුරක් තියෙනවා. ඒ වුණත් ඔහුගේ ගෙදර ගෑස්ලාම්පු නොමැති බව ඔබ නිගමනය කළේ කොහොමද?"

"ඉටිපන්දමකින් වැගිරුණු ඉටි පැල්ලමක් හෝ දෙකක් නම් අහම්බෙන් ඇති වූ දෙයක් වෙන්න පුළුවනි. නමුත් මේ හිස්වැස්මේ මං දුටුවා ඉටිපැල්ලම් පහකට නොඅඩු ගණනක්. ඒකෙන් පේරෙන්නේ හිස්වැස්ම පළඳින පුද්ගලයා, නිතර නිතර දැල්වූ ඉටිපන්දමක් පාවිච්චි කරන බවයි. සමහර වෙලාවට ඔහු රාත්‍රියට ගෙදර ආවම, උඩුමහලට නගින්නේ එක් අතකින් හිස්වැස්මත්, අනෙක් අතින් ඉටිපන්දමත් අරගෙන වෙන්න පුළුවනි. කොහොම වුණත් ගෑස්ලාම්පුවකින් ඔහුගේ හිස් වැස්මට ඉටි වැටෙන්න ක්‍රමයක් නෑ. ඔබට සෑහීමකට පත්වෙන්න පුළුවන්ද වොට්සන්?"

"හරි. හරි. ඔබ ඒ නිගමනයන්ට පැමිණ ඇති ආකාරය විශිෂ්ටයි" මම සිනාවෙමින් කීවෙමි.

"නමුත් හෝම්ස් දැන් ඔබ කිව්ව වගේ මෙතැන අපරාධයක් සිද්ධවෙලත් නෑ. අයිතිකාරයාට පාත්තයා අහිමිවුණා ඇරෙන්න

http://sherlockholmesinvestigations.blogspot.com

විශාල පාඩුවක් වෙලත් නෑ. ඉතින් මේ ඔක්කොම නිකරුණේ වුණු මහන්සිවීමක් වගෙයි නේද පෙනෙන්නෙ?"

මගේ අදහසට පිළිතුරු දීමට හෝම්ස් සූදානම් වූවා පමණි. එක්වරම අපේ දොර විවෘත විය. ආරක්ෂක භටයා වූ පීටර්සන් අපේ විසිත්ත කාමරයට කඩා වැදුණේය. ඉමහත් විස්මයකට පත්වූ පුද්ගලයෙකු මෙන්, දෙනෙත් විවරකරගත් ඔහුගේ මුහුණ රතු වී තිබිණි.

"අර පාත්තයා! හෝම්ස් මහත්තයා අර පාත්තයා!!. . . ." ඔහු තවත් කිසිවක් කියා ගැනීමට නොහැකිව හුස්මක් ඉහළට ඇද්දේය.

"ඇයි? මොකද උෟට වුණේ? මොකද උෟට පණ ඇවිල්ලා කුස්සියේ ජනේලයෙන් පියාඹලා ගියාවත්ද?" හෝම්ස් පුටුවෙන් නැගිට්ටේ පීටර්සන්ගේ මුහුණට වඩාත් ළංවී එය හොඳින් බලාගැනීමටයි.

"මේ බලන්න මහත්මයා මේක! මගේ බිරිඳට පාත්තයගෙ බොක්කෙ තිබිල හම්බවුණු දේ!"

පීටර්සන් තම අත දිගුකර පෙන්විය. ඔහුගේ අත්ලේ වූයේ ප්‍රමාණයෙන් බෝංචි ඇටයක් තරම් වූ නිල් පැහැයෙන් බබලන කුඩා මාණික්‍යයකි. ඒ දෙසට වැටුණු ආලෝක ධාරා නිල් පැහැති කිරණ වශයෙන් සෑම අතටම විසිරුණේ දල්වෙන නිල්පැහැති විදුලි බුබුලකින් පිටවෙන ලෙසයි.

ෂර්ලොක් හෝම්ස් අසුන් ගනිද්දී ඔහුගේ මුවෙන් සිවුරුහන් හඬක් පිටවිය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! ඇත්තෙන්ම මේක මහා අනර්ඝ වස්තුවක් නේ පීටර්සන්. ඔබ දන්නවද මේ ඔබට ලැබිල තියෙන්නෙ මොකක්ද කියල?"

"දියමන්තියක් නේද මහත්මයා? මොකක් වුණත් වටිනා මැණිකක්. මේකෙන් වීදුරු කපන්න පුළුවන්, බටර් කපනවා වගේ."

"වටිනා මැණිකක් විතරක් නෙමෙයි මේක තමයි වටිනාම මැණික."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකා ආදිපාදවරියගෙ ඉන්ද්‍රනීල මාණික්‍යය වත්ද?" මම ඇසීමි.

"හරියට හරි වොට්සන්! මං ඒකෙ ප්‍රමාණයත්, හැඩයත් හරියටම දන්න නිසා මට කියන්න පුළුවනි. ඒ මොකද මෑතකදී මේක ගැන තොරතුරක් ඇත්නම් දනුම් දෙන්න කියලා දන්වීම්, දිගින් දිගටම ටයිම්ස් පත්තරේ පළවුණා. මේ වගේ මැණිකක් ලෝකෙ කොහෙවත් නෑ. මේකේ වටිනාකම කොයිතරමක්ද කියල හිතාගන්නවත් බෑ. මේ මැණික ගැන ආරංචියක් දෙන කෙනෙකුට රන් පවුම් දහසක තෑග්ගක් දෙනවා කියල ප්‍රසිද්ධ කළා. නමුත් ඒක මේකෙ වෙළඳ මිලෙන් විස්සෙන් පංගුවකටත් අඩුයි."

"පවුම් දාහක්? දෙයි හාමුදුරුවනේ!"

ආරක්ෂක භටයා පුටුවක් මතට ඇදවැටුණේ ක්ලාන්ත ගතියෙන් මෙනි. ඔහු කිසිවක් අදහාගැනීමට නොහැකිව මාරුවෙන් මාරුවට අප දෙදෙනාගේ මුහුණු දෙස බැලිය.

"මේක සොයා දුන් කෙනෙකුට දෙනවා කියන තෑග්ග විතරක් පවුම් දාහයි. නමුත් මැණික, ආදිපාදවරියගේ ජීවිතය හා බැඳුණු වැදගත් සිදුවීම් ඇති එකක්. ඒ නිසා, ඇය තවත් තෑගිබෝග දෙන එකේ පුදුමයක් නෑ, මැණික සොයා දුන් සන්තෝෂයට. ඇය ඇගේ ධනයෙන් භාගයක්ම දුන්නොත්, ඒකෙත් පුදුම වෙන්න දෙයක් නෑ."

"මගේ මතකය හරි නම්, ඕක නැතිවුණේ කොස්මොපොලිටන් හෝටලයේදී නේද?"

"අන්න හරි වොට්සන්. ඒක වුණේ දනට දවස් පහකට කලින් දෙසැම්බර් 22 වැනිදා. ආදිපාදවරියගෙ කාමරයේ අලුත් වැඩියා කටයුත්තක් කරන්න ආවා ජෝන් හෝනර් නම් කාර්මිකයෙක්. ඇයගේ ආභරණ පෙට්ටියෙන් ඔහු මේක හොරකම් කරන්න ඇති කියලයි චෝදනා කළේ. ඔහුට විරුද්ධව ඇති සාක්ෂිවල ප්‍රබලතාවය නිසා, නඩුව ඉහළ උසාවියට යොමු කරලයි තියෙන්නෙ. මං හිතන්නෙ මේක ගැන පුවත්පත් වල පළවුණු වාර්තාවක් මා ළඟ ඇති."

තම පුවත්පත් ගොඩ ඇවිස්සූ හෝම්ස්, එයින් එකක් දිගහැර කියවීමට පටන් ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com



21. "මෝකා ආදිපාදවරියගේ ඉන්ද්‍රනීල මාණික්‍යය වත්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

# කොස්මොපොලිටන් හෝටලයේ මැණික් මංකොල්ලය

මෝකා ආදිපාදවරියගේ ස්වර්ණාභරණ පෙට්ටියෙන් ඉන්ද්‍රනීල මාණික්‍යය නමින් හඳුන්වන මැණික සොරාගත්තේ යයි චෝදනා කොට, ජෝන් හෝනර් නම් තැනැත්තකු 22 වැනිදා අත්අඩංගුවට ගන්නා ලදී. වෘත්තියෙන් ඊයම් පැස්සුම්කරුවකු වන ඔහු විසිහය හැවිරිදි පුද්ගලයෙකි. ආදිපාදවරියගේ කාමරයේ, ගිනි උදුනේ යකඩකූරු ගැළැවී තිබීම නිසා, ඒවා පැස්සීමට ජෝන් හෝනර් කැඳවාගෙන ආ බව, හෝටලයේ සේවක ජේම්ස් රයිඩර් සාක්ෂි දෙමින් පවසා ඇත. තමා හෝනර් සමග සුළු වේලාවක් රැඳී සිටි නමුත්, ඉක්මනින් වෙනත් කාරණයක් සඳහා යෑමට සිදුවූ බව රයිඩර් පැවසුවේය. තමා ආපසු එම කාමරයට පැමිණි විට, හෝනර් අතුරුදන් වී සිටි බවත්, ආදිපාදවරියගේ වටිනා දේ ගබඩාකොට තිබූ ලාච්චුවක අගුළු කඩා, එය විවෘත කර ඇති බවත් ඔහුට දකින්නට ලැබිණි. ආදිපාදවරිය ආභරණ දැමීමට භාවිතා කළ කුඩා හම් පසුම්බිය, කණ්ණාඩි මේසය මත තිබී රයිඩර්ට හමුවී ඇත. එහි කිසිවක් නොතිබූ බවත්, මෙය දුටු වහාම තමා හෝටලයේ ප්‍රධානීන්ට දැනුම් දුන් බවත් ජේම්ස් රයිඩර් පැවසුවේය.

එදා හවස්වරුවේ ජෝන් හෝනර් අත්අඩංගුවට ගන්නා ලදී. කෙසේ වෙතත් ඔහු ළඟ හෝ ඔහුගේ කාමරයේ මැණික නොතිබිණි. ආදිපාදවරියගේ සේවිකාව වූ කැතරින් කුසැක් ද සාක්ෂි දුන්නාය. රයිඩර්ගේ කෑගැසීම අසා කාමරයට පැමිණි තමාට ද ඔහු විස්තර කළ ආකාරයේ දේවල් සිදුවී තිබෙනු දකින්නට ලැබුණු බව ඇය පැවසුවාය.

හෝනර් අත්අඩංගුවට ගැනීම පිළිබඳ සාක්ෂි දීම ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ බී අංශයේ පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් අතින් සිදු විය. හොරකම සම්බන්ධයෙන් හෝනර් අත්අඩංගුවට ගැනීමට උත්සාහ කරද්දී ඔහු ඊට තදින්ම විරුද්ධවී, තමා අහිංසකයෙකු බව පවසමින් ගැළැවී යාමට තැත්කළ බව, පොලිස් පරීක්ෂකවරයා කීය. සොරකමක් සම්බන්ධයෙන් ජෝන් හෝනර් මීට පෙර ද දඬුවම් ලබා ඇත්තෙකු බව මේ අවස්ථාවේදී උසාවියට දැනුම් දෙන ලදී. එම හේතුව නිසා නඩු විභාගය ඉහළ උසාවියට තැබීමට මහේස්ත්‍රාත්තුමා විසින් තීරණය කරන ලදී. මහේස්ත්‍රාත් උසාවියේ සාක්ෂි විභාග වෙද්දී, විත්තිකරුවා

http://sherlockholmesinvestigations.blogspot.com

අභිශයින්ම කම්පනයට පත්ව සිටි බව දකින්නට ලැබුණු අතර නඩු විභාගය අවසානයේදී ඔහු ක්ලාන්ත විය. ඒ නිසා ඔහු ඉවතට ඔසවාගෙන යෑමට බන්ධනාගාරයේ නිලධරයන්ට සිදුවිය."

"හ්ම්. පොලිස් උසාවියේදී හෙළිවී තිබෙන්නේ එපමණයි." හෝම්ස් පැවසුවේ පුවත්පත ඉවතට දමමිනි.

"හෝටලයේදී හොරුන් කැඩූ ආභරණ පෙට්ටියෙන් නැතිවුණු මැණික, ටොටින්හැම් කෝට් පාරෙන් හමුවුණු පාත්තයාගේ බඩට ගියේ කොහොමද? අන්න ඒකට විසඳුම හෙවීමයි දැන් අප ඉදිරියේ තියෙන ප්‍රශ්නය. පෙනෙනවා නේද වොට්සන්. මෙච්චර වෙලා කිසිම වැදගත්කමක් ප්‍රයෝජනයක් නොතිබුණු අපේ නිරීක්ෂණ හා නිගමන වලට, එක්වරම වැදගත් මුහුණුවරක් ලැබුණු හැටි.

මෙන්න තියෙනවා මැණික. මේක එළියට ආවෙ පාත්තයාගෙ බඩේ තිබිල. පාත්තයාගේ අයිතිකාරයා පරණ හිස්වැස්මක් අයිති හෙන්රි බේකර් මහත්මයා. දැන් අපි සම්පූර්ණ උත්සාහය යොදන්න ඕන, මෙන්න මේ මහත්තයා කොහොම හරි හොයා ගන්න. එතකොට අපට දැනගන්න පුළුවනි, මේ පුංචි අභිරහසේ ඔහුට රඟපාන්න සිදුවුණේ මොන වගේ භූමිකාවක්ද කියල. ඒ සඳහා අපි මුලින්ම සරල උපක්‍රමයක් යොදල බලමු. හවස පත්තරේක කුඩා දැන්වීමක් පළකරල බලමු. ඒක අසාර්ථක වුණොත් අපට වෙන මොනවා හරි ක්‍රියාමාර්ගයක් ගන්න සිදුවෙනවා. මට ඔය පැන්සලයයි, කොළයකුයි දෙන්න."

"ගුජ් වීථියේ කෙළවර තිබී පාත්තයෙක් හා කළු පැහැති ෆෙල්ට් හිස්වැස්මක් හමුවී ඇත. අද සවස 6.30 ට බේකර් වීථියේ අංක 221 බී දරන ස්ථානයට පැමිණියහොත්, හෙන්රි බේකර් මහතාට එය ලබාගැනීමට හැකිවනු ඇත."

"ඒක කෙටියි. ඒ වගේම පැහැදිලියි."

"ඇත්තෙන්ම ඔව්. නමුත් ඔහු මේක දකීවිද?"

"කිසිම සැකයක් නෑ. ඔහු පත්තරවල "නැතිවීම් - සම්බවීම්" දැන්වීම ගැන, හොඳ සෝදිසියකින් ඇත්තෙ. මේ නැතිවුණු දේ දුප්පත් කෙනෙකුට විශාල පාඩුවක්. ඔහු අතින් වීදුරුව බිඳුණු වෙලාවෙ, නිල ඇඳුම් හැඳගත්තු පීටර්සන් දුටු නිසා වැඩිදුර කල්පනා නොකොට ඔහු පැන දිව්වා. නමුත් පසුව ඔහු ඒ ගැන බොහොම

http://sherlockholmesinvestigations.blogspot.com

කම්පාවෙන්න ඇති; විශේෂයෙන්ම පාත්තයා අහිමිවීම ගැන. අපි දැන්වීමේ ඔහුගේ නමත් සඳහන් කරන නිසා, මේකට ඔහුගේ විශේෂ අවධානයක් යොමුවේවි. ඔහු හඳුනන අය පවා, මේ ගැන ඔහුට දැනුම් දෙන බවට සැකයක් නෑ.

මෙන්න පීටර්සන් මේකත් අරගෙන දැන්වීම් කාර්යාලයට දුවලා හවස පුවත්පත් වල මේක පළකරන්න කියන්න."

"මොන පුවත්පතේද මහත්මයා?"

"ආ. . . . ග්ලෝබ්, ස්ටාර්, පෝල්මෝල්, ඊවිනිං නිව්ස්, ස්ටෑන්ඩර්ඩ්. . . . මේවා සහ ඔබට තවත් පුවත්පත් වල නම් මතක් වුණොත් ඒවලත්."

"හොඳමයි මහත්මයා. එතකොට මේ මැණික්ගල?"

"ආ ඔව්. ඒක මම තියාගන්නම්. ආ මට කියන්න බැරිවුණා පීටර්සන්. හොඳ ලොකු පාත්තයෙකුත් අරගෙන එන්න. ඔබේ පවුලෙ අය මේ වෙලාවෙ සතුටින් අනුභව කරන එකා වෙනුවට අපි මේ මහත්මයාට පාත්තයෙක් දෙන්න ඕනෑ නේ."

පීටර්සන් පිටත්ව ගිය පසු, මැණික අතටගත් හෝම්ස්, එය හිරු එළියට අල්ලා පරීක්ෂා කර බැලුවේය.

"මේක හරිම අලංකාර වස්තුවක්. බලන්න හිරු එළියෙන් බැබලෙන හැටි. ඒ වගේම අපරාධවල උල්පතක්. හැම වටිනා මැණිකක්ම ඒ වගෙයි. යක්ෂයා විසින් අපරාධ ඇතිකිරීම සඳහා දමන්න කැමති ඇම තමයි වටිනා මැණික්. ඔය පැරණි විශාල මාණික්‍ය තිබෙනවා නේද වොට්සන්? ඒවල කපලා, ඔපදමලා තිබෙන හැම පැත්තක් ගණනටම දරුණු අපරාධ සිදුවෙලා තිබෙනවා.

මේ මැණික හොයාගෙන තවම අවුරුදු විස්සක් ගතවුණේ නෑ. ඒක හමුවුණේ දකුණු චීනයේ ආමොයි ගඟේ ඉවුරෙන්. මේකෙ ඇති සුවිශේෂත්වය ගැන කියනවා නම්, මෙහි තිබෙනවා රතු කැටයක තිබෙන දිළි බව. නමුත් වර්ණයෙන් නිල්. හොයාගෙන ඒ තරම් කාලයක් ගත නොවුණාට, මේකට තියෙන්නේ දරුණු ඉතිහාසයක්. මිනීමැරුම් දෙකක් සිදුවුණා. ඇසිඩ් ගැසීමක් වුණා. සියදිවි නසාගැන්මක්. මංකොල්ලකෑම් ගණනාවක්. ඒ හැම දෙයක්ම කරන්න සමත්වුණේ, මේ ස්ඵටිකරණය වුණු, ග්‍රාන් හතලිහක් බර ගල් අඟුරු කැබැල්ල. මේ තරම් ලස්සන සෙල්ලම් බඩුවකට මිනිස්සු

Reading Purpose Only... Print

http://sherlockholmesinvestigations.blogspot.com

එල්ලුම් ගස් යවන්න, හිරේ යවන්න, හැකියාවක් තියෙනවා කියල කාටද හිතන්න පුළුවන්? මං මේක මගේ යකඩ සේප්පුවේ දමලා, මා ළඟ මෙය තිබෙන බවට ආදිපාදවරියට පණිවුඩයක් යවන්නම්."

"ඔබ හිතන්නේ මේ හෝනර් කියන මිනිහා නිර්දෝෂයි කියලද?"

"ඒක කියන්න බෑ."

"එහෙම නම් මේ අනික් මනුස්සයා හෙන්රි බේකර් මේකට සම්බන්ධ ඇති කියල ඔබ හිතනවාද?"

"හෙන්රි බේකර් නම් මං හිතන්නේ සම්පූර්ණයෙන්ම අහිංසකයෙක්. ඔහු කරේ තියාගෙන ගිය පාත්තයා, දඹ රත්තරනින් හැදූ පාත්තයෙකුට වඩා වටිනා බව ඔහු දැනගෙන හිටියෙ නෑ. අපේ දැන්වීමට ප්‍රතිචාරයක් ලැබුණොත් ඒක සුළු පරීක්ෂණයකින් මට හොයාගන්න පුළුවනි."

"එහෙනම් ඒ වෙනතුරු ඔබට මොකුත් කරන්න හැටියක් නෑ?"

"මොකුත් කරන්න බෑ."

"හොඳයි. එහෙම නම් මං ගිහින් එන්නම්. මට ලෙඩුන් කිහිපදෙනෙක්ම පරීක්ෂා කරන්න තියෙනවා. ඒවා ඉවර කරලා හැන්දෑවෙ හයහමාරට විතර මං එන්නම්. මේ අවුල් ජාලයට විසඳුම මොකක්ද කියල බලාගන්න මාත් කැමැතියි."

"ඒ වෙලාවට ඔබව දකින්න මාත් බොහොම කැමැතියි වොට්සන්. මම රෑ කෑම කන්නෙ හතට. මං හිතන්නේ අද රෑ කෑමට තියෙන්නේ හබන් කුකුළු මස්. මේ දකින්න ලැබෙන දේවල් එක්ක හැටියට උන්ගෙත් බොක්ක හොඳින් සෝදිසි කරල බලන්න කියල ගෙහිමි කාන්තාවට කියන්න ඕනා."

රෝගියකු පරීක්ෂා කිරීමට බොහෝ වේලා ගතවූ නිසා, සිතූ තරම් ඉක්මනින් බේකර් වීථියට යාමට මට ඉඩක් නොලැබිණ. මා එහි ළඟාවන විට සවස හයයි තිහ පසුවී තිබිණි. අපේ නිවහනේ ඉදිරි දොරටුව අසල උස පුද්ගලයෙකු බලා සිටින අයුරු මම දුටුවෙමි. බෙල්ල ළඟටම එනතුරු කබායේ බොත්තම් පියවා සිටි ඔහු, හිස ආවරණය වන සේ "ස්කොච් බොනට්" හිස් ආවරණයක් පැළඳ සිටියේය. මා එහි යද්දීම දොර විවෘත විය. අප දෙදෙනා

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස්ගේ විසිත්ත කාමරය වෙත කැඳවාගෙන යනු ලැබුවේ එකටමය.

"හෙන්රි බේකර් මහත්මයා වෙන්නැති?" කියමින් හෝම්ස් ඔහුට අතට අත දුන්නේය.

"ගිනි උදුන ළඟම පුටුවෙන් වාඩිවෙන්න බේකර් මහත්මයා. අද හරි සීතල හැන්දෑවක්. ඔබ ශීත ඍතුවට වඩා ගිම්හාන ඍතුවට හුරුපුරුදු කෙනෙක් වගෙයි මට පෙනෙන්නෙ. ආ. . . . වොට්සන්. ඔබ ආවෙත් හරි වෙලාවට. අර හිස්වැස්ම ඔබේද බේකර් මහත්මයා?"

"ඔව් මහත්මයා. කිසි සැකයක් නෑ. ඒක මගේ හිස්වැස්ම."

හෙන්රි බේකර් උස මෙන්ම, පළල් උරහිස් සහිත පුද්ගලයෙකු විය. ඔහුගේ හිස ප්‍රමාණයෙන් විශාල වූ අතර, මුහුණේ තිබුණේ බුද්ධිමත් පෙනුමකි. මුහුණ වැසී තිබුණු දුඹුරු පැහැති රැවුළ තැනින් තැන සුදු පැහැ වී තිබිණි. ඔහු අතට අතදීම සඳහා දිගුකළ අතේ වෙවුලන ස්වභාවයක් පැහැදිලිවම දකිය හැකි විය. ගුණධර්ම වල පිරිහීමක් ඇතැයි හෝම්ස් පැවසූ වදන් මට සිහිවිය. ප්‍රවේශමින් වචන තෝරා ගනිමින්, වාක්‍ය අතර මැද නවත්වමින්, හෙන්රි බේකර් කථා කළ බව සැබෑය. එහෙත් ඔහුගෙන් මට දිස්වූයේ අවාසනාවන්ත කාලයකට මුහුණ දී ඇති උගත් බුද්ධිමත් කෙනෙකි.

"අපි මේ දේවල් දුන් දවස් ගණනක් තිස්සෙ පරෙස්සම් කරගෙන බලාගෙන හිටියා. ඒ මොකද අපි හිතුවෙ, ඔබේ ලිපිනය සඳහන් කරල, ඔබ දැන්වීමක් පළකරාවි කියල. ඔබ එහෙම නොකලෙ ඇයි කියල මට හිතාගන්න අමාරුයි."

අපේ අමුත්තාගේ මුවට නැඟුණේ ලැජ්ජාශීලි සිනහවකි.

"ඉස්සර තරම් දැන් මගේ අතේ සල්ලි බාගෙ නෑ මහත්තයා. මට පහර දුන් චණ්ඩි ටික, මගේ හිස්වැස්මයි, පාත්තයයි අරන් යන්න ඇති කියලයි මං හිතුවෙ. ඒ ගැන මට කිසිම සැකයක් තිබුණේ නෑ. ඉතින් දැන්වීමක් පළකරලා මොකට මුදල් අපතේ යවනවද කියලා මට හිතුණා මහත්තයා."

"ඒක හැබෑව. ඒ වුණත් අර පාත්තයාව නම් අපට කෑමට ගන්න සිදුවුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"කැමට ගත්තද?" අපේ අමුත්තා කොතරම් කලබල වූයේද යත් ඔහු පුටුවෙන් නැගිටුනේ නිතැතිණි.

"අපි එහෙම නොකළා නම් කාටවත් ඒ පාත්තයාගෙන් වැඩක් නොවෙන්න ඉඩ තිබුණා. බලන්න ඔය සයිඩ්බෝඩය උඩ තිබෙන පාත්තයා කොහොමද කියල. ඌ ඔබේ එකාගෙම ප්‍රමාණයේ අලුත් එකෙක්. මං හිතන්නේ ඒකෙන් ඔබේ ප්‍රශ්නෙ විසඳේවි."

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. ඇත්තෙන්ම ඔව්."

හෙන්රි බේකර් පැවසුවේ අපමණ සැනසීමට පත්වය.

"ඒ කොහොම වුණත් අපි ඔබේ පාත්තයාගේ පිහාටු, බොක්ක, කකුල් ආදී කොටස් විසිනොකර තබාගත්තා. ඔබට උවමනා නම්. . . ."

අපේ අමුත්තා මහ හඬින් සිනාසීමට පටන් ගත්තේය.

"මට මුහුණ දෙන්න වුණු අත්දැකීම මතක් වෙන සිහිවටන හැටියට නම්, ඒව ප්‍රයෝජනවත් වේවි. නමුත් ඒ සතාගේ අහක දමන අපද්‍රව්‍ය වලින් මට ඇති ප්‍රයෝජනය මොකක්ද? එහෙම නෙමෙයි මහත්මයා. අර සයිඩ්බෝඩය උඩ තිබෙන පාත්තයා ඔබ මට දෙන්න කැමැති නම්, මං ඒක සතුටින් භාරගන්නවා."

ෂර්ලොක් හෝම්ස් මා දෙස හොරැහින් බැල්මක් හෙළුවේ, තම විමතිය ක්ෂණිකව හංගවමිනි.

"මෙන්න බේකර් මහත්මයා. එහෙනම් ඔබේ හිස්වැස්මයි, පාත්තයයි අරගන්න. ඒක නෙමෙයි. ඔබට කරදරයක් නැතිනම් මට කියන්න අර කලින් පාත්තයා මිලදී ගත්තෙ කොහෙන්ද කියලා. මමත් මේ වර්ගයේ පක්ෂීන්ට බොහොම කැමැති කෙනෙක්. ඔබේ ඒ පාත්තයා තරම් හොඳට වැඩුණු එකෙක්, දකින්න ලැබෙන්නෙ කලාතුරකින්."

"ඇත්තෙන්ම ඔව් මහත්මයා." බේකර් කථාව පටන් ගත්තේ ඔහුට ලැබුණු දේවල් කිහිල්ලේ ගසාගෙන අලුතෙන් නැගිටිමිනි.

"ලන්ඩන් කෞතුකාගාරය කිට්ටුවම තියෙනවා "ඇල්ෆා ඉන්" කියල අවන්හලක්. අපි කීපදෙනෙක් ඉන්නවා නිතර එතැන ගැවසෙන අය. දවල් දවසට අපි වැඩි කාලයක් ගතකරන්නේ කෞතුකාගාරයේ. අවන්හල අයිතිකාරයාගේ නම වින්ඩිගේට්. මේ අවුරුද්දේ වින්ඩිගේට්

http://sherlockholmesinvestigations.blogspot.com

මහත්මයා "පාත්ත සිට්වුවක්" දැම්මා. සතිපතා පැන්ස කීපයක් විතරයි ගෙවන්න තිබුණේ. එතකොට අවුරුද්ද අන්තිමට, නත්තලට පාත්තයෙක් ලැබෙනවා. මගේ සල්ලි මං වෙලාවට ගෙව්වා. ඒකෙනුයි මට උඹ හිමිවුණේ. තේරුණා නේද? මගේ හිස්වැස්ම හොයාදීම ගැන මං ඔබට බෙහෙවින් ණයගැතියි මහත්මයා. මේ "ස්කොච් බොනට්" ඒක මගේ වයසට කොහොමටවත් ගැළපෙන්නේ නෑ."

පැවසූ හෙන්රි බේකර්, හිස නමා අප දෙදෙනාට ආචාර කොට පිටවී ගියේය.

"හෙන්රි බේකර් ගැන එතැනින් ඉවරයි." හෝම්ස් පැවසුවේ දොර වසා දමමිනි.

"පාත්තයාගේ බඩේ තිබුණු දේවල් ගැන" ඔහු කිසිත් නොදන්නා බව දැන් අපට හොඳටම පැහැදිලියි. ඔබට බඩගිනිද වොට්සන්?"

"නෑ. ඒ හැටි බඩගින්නක් නෑ."

"එහෙම නම් අපි මෙහෙම කරමු. රෑ කෑම කන එක අපි නුභාක් එහාට දමමු. අපට ලැබුණු හෝඩුවාව උණු උණුවේ තිබෙද්දීම ඒ ගැන වැඩිදුර හොයා බලමු."

"හරි මං සූදානම්."

එළිමහනේ පැවතියේ දැඩි ශීතලකි. ඝනලෝම කබා හැඳගෙන, බෙල්ල සම්පූර්ණයෙන්ම ආවරණය වනසේ මප්ලර ඔතාගතිමු. වලාකුළෙන් තොර අහසේ තාරකා දීප්තිමත්ව බැබළෙමින් තිබිණි. වෛද්‍ය ව්‍යාත්තිකයන් නිසා ප්‍රසිද්ධියට පත්, විම්පෝල් වීථිය හා හාර්ලි වීථිය පසුකොට අපි ඔක්ස්පර්ඩ් වීථියට පැමිණියෙමු. එහි පැය කාලක් ඉදිරියට ගමන් කළ පසු බ්ලූම්ස්බරියේ පිහිටි ඇල්ෆා අවන්හලට ළඟාවීමට අපට හැකිවිය. හෝල්බෝන් දෙසට යා හැකි පටුමඟක මංසන්ධියේ පිහිටි එය, මත්පැන් සංග්‍රහය සඳහාම වෙන්වුණු අවන්හලකි. බාගදොර තල්ලු කරගෙන එහි තැබෑරුමට හෝම්ස් ඇතුළුවෙද්දී මම ද ඔහු අනුගමනය කළෙමි.

අවන්හලේ අයිතිකරුවා සුදු පැහැති ඒප්‍රනයක් හැඳගත් මුහුණ රතුපැහැති තැනැත්තෙකි. හෝම්ස් නොපමාව බීර වීදුරු දෙකක් ඇණවුම් කළේය.

"ඔබේ මේ බීරත් ඔබේ පාත්තයින් වගේම අනර්ඝ ඇති කියල මං හිතනවා මහත්මයා." හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.



19. "වින්ඩියේට් මහත්මයා පාත්ත සිට්ටුවක් දැම්මා;"

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ පාත්තයෝ?" අවන්හල් හිමියා ඇසුවේ පුදුමයෙනි.

"ඔව්. දැන් පැය භාගයකට කලින් මං හෙන්රි බේකර් මහත්මයා එක්ක කථාකර කර හිටියා. උන්නැහේ ඔබේ "පාත්ත සීට්ටුවේ" සාමාජිකයෙක් නේද?"

"ආ. . . . ඔව්. ඒ වුණාට මහත්මයා ඒ අපි ඇතිකරන පාත්තයින් නෙමෙයි."

"හැබැට? කාගෙන්ද ඔබ උන්ව ගත්තෙ?"

"කොවෙන්ට් උද්‍යානයේ වෙළෙන්දෙකුගෙන්. මං පාත්තයින් දුසිම් දෙකක් මිලට ගත්තා."

"හැබැට? මං අඳුනනවා ඔය වෙළෙන්දන් කීපදෙනෙක්ම. කාගෙන්ද ඔබ ගත්තේ?"

"බ්‍රෙකන්රිජ්ගෙන්."

"ආ. . . . මං එයාව නම් අඳුනන්නෙ නෑ. එහෙනම් ඔබේ සැපතට, ආයතනයේ දියුණුවට, මෙන්න අපි සව්දිය පුරනවා. ඔබට ශුභ රාත්‍රියක් මහත්මයා."

"දැන් ඉතින් අපි යමු බ්‍රෙකන්රිජ් මහත්මයා හොයාගෙන."

හෝම්ස් පැවසුවේ අවන්හලෙන් එළියට පැමිණ ශීතලෙන් ආරක්ෂා වීමට කබාය යළි සකස් කර ගනිමිනි.

"මතක තියාගන්න වොට්සන්. මේ දම්වැලේ එක කෙළවරක ඉන්නේ මැරුණු පාත්තයෙක්. එය බොහොම සුළු දෙයක්. නමුත් අනික් කෙළවරේ ඉන්න මිනිහා අහිංසකයෙක් වෙන්නත් පුළුවනි. එහෙම වෙලා, ඒ බව අපට ඔප්පු කරන්න බැරිවුණොත් ඔහු යනවා හත් අවුරුද්දකට හිරේ. බාගවෙලාවට අපේ මේ පරීක්ෂණය නිසා, අපරාධය ඔහු විසින් කළ බව තහවුරු වෙන්නත් ඉඩ තියෙනවා. කොහොම වුණත් පරීක්ෂණය දිගටම කරගෙන යෑම සඳහා, පොලීසියට නොලැබුණු සුවිශේෂ අවස්ථාවකුයි අපට අහම්බෙන් වගේ ලැබිලා තියෙන්නේ. කොතරම් අමිහිරි වුණත් අපි ඒක අන්තිම කෙළවරටම පරීක්ෂා කරල බලමු. දැන් දකුණට හැරෙනු! ඊළඟට ගමනේ යා!"

හෝල්බෝන් පසුකොට අපි එන්ඩෙල් වීථිය දිගේ ඉදිරියට ගමන් කළෙමු. මීළඟට මුඩුක්කු පෙළක් පසුකර ගොස් කොවෙන්ට්

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only. Not For Print.

උද්‍යානයේ වෙළඳපොළ වෙත පැමිණියෙමු. බ්‍රෙකන්රිජ්ගේ නාම පුවරුව දක්නට ලැබුණේ සෑහෙන තරම් විශාල වෙළෙඳසලකයි. සැරපරුෂ පෙනුමක් තිබූ එහි හිමිකරුවා වෙළඳසැල වසාදැමීමට පටන් ගෙන තිබිණි. ඔහු ඒ සඳහා සේවක ළමයාට උදව්වෙමින් සිටියේය.

"සුභ සන්ධ්‍යාවක් මහත්මයා. අද බොහොම සීතල රැයක්" හෝම්ස් ආචාර කළේය.

වෙළෙන්දා හෝම්ස් වෙත හෙළුවේ ප්‍රශ්නාර්ථ බැල්මකි.

"පාත්තයො ඔක්කොම විකිණිලා ඉවරයි වගෙයි මට පෙනෙන්නෙ?"

හෝම්ස් කීවේ හිස්ව් තිබුණු මේසය දෙසට අත දිගු කරමිනි.

"ඔහේට ඕනෙ නම් හෙට උදේට දෙන්නම් පාත්තයො පන්සීයක්?"

"වැඩක් නෑ."

"ආ එහෙම නම් අන්න අර කඩේ බලන්න. අර තවමත් ගෑස් ලාම්පු දල්වෙන තැන."

"ඒ වුණාට මට රෙකමදාරුව ලැබුණෙ අනර්ඝ පාත්තයො ඉන්නෙ ඔහේ ළඟයි කියල."

"ඒ කාගෙන්ද?"

"ඇල්ෆා එකේ අයිතිකාරයාගෙන්."

"ආ ඔව්. මං එයාට දුසිම් කීපයක් විකිණුවා."

"ඔහේගෙ පාත්තයො නම් ඉතාම අනර්ඝ සත්තු. ඔබට කොහෙන්ද උන් ලැබුණේ?"

මෙම ප්‍රශ්නයෙන් කඩහිමියා බලවත් ලෙස කෝපයට පත්විය.

"මේ උන්නැහේ" ඔහු පැවසුවේ දෑත් හිණේ තබාගෙන ඔරවා බලමිනි.

"තමුසෙ මොකාටද එන්න හදන්නෙ? මට කෙළින්ම කියනවා ඒක"

"ඇයි මං කෙළින්ම කිව්වේ. ඔබ ඇල්ෆා අවන්හලට විකිණූ පාත්තයො ඔබ මිලට ගත්තේ කාගෙන්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com
For Reading Purpose Only

"හා ඒකද? ඒක මං තමුසෙට කියන්නෙ නෑ. කතාව එතනින් ඉවරයි!"

"මේක බොහොම සුළු ප්‍රශ්නයක්. ඔහේට ඔය තරම් කේන්ති ගන්න දෙයක් මං කිව්වයැ?" හෝම්ස් කීය.

"කේන්ති? ඔය විදියට ප්‍රශ්න අහන්න පටන් ගත්තොත් මට වගේම තමුසෙටත් කේන්ති යාවි. හොඳ බඩුවකට මං වැඩි මිලක් ගෙව්වා. ගනුදෙනුව එතනින් ඉවරයි.

පාත්තයො කීය ගණනේද ගත්තෙ? ගත්තෙ කොහෙන්ද? පාත්තයො කාටද විකිණුවෙ? ඒක ඒක්කෙනා ඔහොම ප්‍රශ්න අහනකොට කාටද කේන්ති නොයන්නෙ. අහං ඉන්න කෙනෙකුට හිතේවි මේ ලෝකෙ ඉතුරුවෙලා ඉන්නෙ පාත්තයො විතරද කියලා."

වෙළෙන්දා කීවේ තවමත් නොනිවුණු කෝපයෙනි. එයට පිළිතුරු වශයෙන් හෝම්ස් කථා කළේය.

"පාත්තයො ගැන ප්‍රශ්න අහන්න තවත් අය ආව නම් එයාල එක්ක මගේ සම්බන්ධයක් නෑ. ඔබ ඒ කාරණාව මට කියන්නෙත් නැත්නම් කථාකරල වැඩක් නෑ. මම ඔහොම වෙලාවක පවුම් පහක ඔට්ටුවක් අල්ලන්න ලෑස්තියි; අපි කෑමට ගත්තු පාත්තයා ගම්බද ගොවිපොළක හැදූ එකෙක් කියලා."

"එහෙනම් ඔහේ පවුම් පහ පරාදයි. ඌ නගරයේ ගොවිපොළක හැදූ එකෙක්."

"ඒක වෙන්න බෑ?"

"බැරි මොකද? මම තේ කියන්නෙ. ඌ නගරයේ හැදුණු එකෙක්."

"මං විශ්වාස කරන්නෙ නෑ."

"ඔහේ හිතාගෙන ඉන්නෙ ඔහේ පාත්තයො ගැන මට වඩා දන්නවා කියලද? මං පොඩි කොල්ල කාලෙ ඉඳලමයි ඔය සත්තු ඇතිදැඩි කළේ. මම ආයෙත් සැරයක් තමුසෙට කියන්නෙ ඇල්ෆා එකට දුන්නු සත්තු ඔක්කොම නගරයේ හැදුණු එවුන්."

"ඔහොම කිව්වට මං විශ්වාසෙට ගනීවි කියලද හිතන්නෙ?" හෝම්ස් ඇසීය.

"තමුසෙ ලෑස්තිද ඔට්ටුවක් අල්ලන්න?"

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ අභියෝගය බ්‍රෙකන්රිජ් ගෙනි.

"නිකං තමුසෙගෙ සල්ලි ගන්නෙ කොහොමද? මං දන්නවා මං කියන එක හරි කියලා. ඒත් තමුසෙට පාඩමක් උගන්වන්න, රන්පවුමක් ඔට්ටුයි. ඌ ගමේ හැදුණු පාත්තයෙක්."

හෝම්ස් අභියෝගය භාරගත්තේය. බ්‍රෙකන්රිජ්ට සිනාපහළ විය.

"මගේ ගනුදෙනු පොත් අරං එනවා බිල්."

සේවක ළමයා පොත් දෙකක් ගෙන ආවේය. එකක් කුඩා පොතක් වූ අතර, අනෙක සැහෙන තරම් විශාල පැරණි පොතක් විය. ඔහු ඒවා පහන කෙළින්ම වූ මේසය මත තැබුවේය.

"අතිපණ්ඩිත උන්නැහේ."

වෙළෙන්දා හෝම්ස් ඇමතීය.

"මේ පොඩි පොත පෙනෙනවා ද?"

"ඔව්. ඉතින්?"

"මේකෙ ලියල තියෙනවා මං පාත්තයො මිලට ගන්න මිනිසුන්ගෙ නම් සහ ලිපින. තමුසෙට පෙනෙනවද? මේකෙ ඉන්නෙ ගම්බද ගොවියො. ඒ අයගෙ නම් වලට ඉදිරියෙන් අංකයක් තියෙනවා නේද? ලොකු ලෙජර් පොතේ ඒ අංකයත් එක්ක තියෙන්නේ අර පුද්ගලයින් සමග කළ ගනුදෙනු. හරි දැන් බලන්න අනික් පිටුව. ඒක රතු තින්තෙන්. ඒ තමයි මට සතුන් සපයන නගරබද ගොවියෝ. මේකෙ තියෙන තුන්වැනි නම කියවනවා බලන්න."

"ඕක්ෂොට් මහත්මිය - අංක 117 බ්‍රික්ස්ටන් පාර 24 යි."

"හරි. දැන් ඔය සම්බන්ධව ලෙජර් පොතේ ඇති සටහන හරවන්න."

හෝම්ස් නියමිත පිටුව පෙරළුවේය.

"හරි මේ තියෙන්නෙ.

ඕක්ෂොට් මහත්මිය - 117 බ්‍රික්ස්ටන් පාර. බිත්තර සහ කුකුළු ආදී සතුන් සපයන්නිය."

"ඒකෙ අන්තිමට තියෙන සටහන මොකක් ද?"

"දෙසැම්බර් 22 වැනිදා - එකෙක් සිලිං 7 යි පැන්ස 6 ගණනේ පාත්තයින් 24 යි."

http://sherlockholmesinvestigations.blogspot.com

"හරි. දැන් බලනවා ඊට යටින් මොනවද ලියල තියෙන්නේ කියල."

"ඇල්පාහි වින්ඩිගේට් මහත්තාට විකිණුවා එකෙක් සිලිං 12 ගණනේ."

"හරි. දැන් මොකක්ද තමුසෙ කියන්නේ?"

ෂර්ලොක් හෝම්ස්ගේ මුහුණේ දිස්වූයේ දැඩි පරාජයකට පත් ලකුණුය. සාක්කුවෙන් පවුමේ රන් කාසියක් ගත් ඔහු එය බ්‍රෙකන්රිජ්ගේ මේසය මතට දැම්මේය. අකුතුරුව, වචනයක් වත් කථාකිරීමට නොහැකි තරමට කලකිරුණු පුද්ගලයෙකු මෙන් නිහඬව ඔහු පාරට බැස්සේය.

අපි යාර කිහිපයක් ඉදිරියට ගමන් කළෙමු. පහන් කණුවක් ළඟ නැවතුණු හෝම්ස් මහත් ප්‍රීතියෙන් සිනාසීමට පටන් ගත්තේය.

"මුහුණ දෙපැත්තෙන්ම "සයිඩ්බර්න්ස්" මෝස්තරේට රැවුල වවාගනිපු මිනිහෙක්, ඕනෙම වේලාවක, ඕනෙම දෙයක් ගැන ඔට්ටුවකට පොළොඹවා ගන්න පුළුවන් වොට්සන්. මං ඒක දැන හිටියා. ඔය මිනිහගේ ලෙජරයේ තිබුණු තොරතුරු ටික ඉල්ලලා, මං පවුම් සීයක් ඔහු ඉදිරියෙන් තැබුවත්, ඔහු ඒ තොරතුරු දෙන්නෙ නෑ. නමුත් ඔට්ටුවක් නම් තත්ත්වය වෙනස්. වොට්සන් දැන් නම් මට හිතෙන හැටියට අපේ ගවේෂණයේ අවසානයට අපි ළං වෙලා. දැන් අපට තීරණය කරන්න තියෙන්නේ මේ ඕක්ෂොට් මහත්මිය හමුවෙන්න අද රෑම යනවද, නැත්නම් ඒක හෙටට කල් තබමුද යන්නයි. අර බ්‍රෙකන්රිජ් කිව්ව කථාවෙ හැටියට, අපට අමතරව තවත් අයත් මේ ගැන උනන්දුවක් දක්වන බවයි පෙනෙන්නෙ. මං හිතන්නේ. . . ."

හෝම්ස්ගේ කතාබහ අතරමඟ නැවැත්වීමට සිදුවිය. බ්‍රෙකන්රිජ්ගේ වෙළඳසැල දෙසින් කිසිවෙකු කෝපයෙන් කෑගසන හඬක් ඇසිණි. අපි ආපසු හැරී ඒ දෙසට ළංවූයෙමු.

ලන්තෑරුමක් අතින් ගත් පුද්ගලයෙක් එම වෙළඳසැල ඉදිරියේ සිටගෙන සිටියේය. ලන්තෑරුමෙන් නිකුත් වූ එළියෙන් ඔහු මීයෙකුගේ වැනි මුහුණක් තිබූ, රතු, කෙට්ටු, කුඩා මිනිසෙකු බව අපි දුටුවෙමු. ඒ අතර දෑත් මිට මොළොවා ගෙන තර්ජනාත්මක අයුරින් බ්‍රෙකන්රිජ් එම පුද්ගලයාට බැණ වදිමින් සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com



"හරි. දැන් මොකක්ද තමුසෙ කියන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"උඹයි උඹේ පාත්තයෝයි ගැන කතාව මට දන් තිත්ත වෙලයි තියෙන්නේ. මං ප්‍රාර්ථනා කරනවා තොපි ඔක්කොම එක පැරේම යක්ෂයාට බිලිවෙච්චා කියල. මීට පස්සෙ ඔය මෝඩ ප්‍රශ්න අහමින්, මට කරදර කරන්න ආවොත්, ලිහනවා බල්ලව. ප්‍රශ්නයක් තියෙනවා නම් ඕක්ෂොට් නෝනව මෙහාට එක්ක වරෙං. මං එයාට උත්තර දෙන්නම්. තමුසෙත් එක්ක මගේ ඇති ගනුදෙනුව මොකක්ද? මොකද මං තමුසෙගෙන් පාත්තයින් ගත්ත යැ?"

"මගෙන් ගත්තෙ නැහැ තමා. නමුත් උන්ගෙන් එකෙක් මට අයිතිව තිබුණු එකෙක්."

"ඒක ඕක්ෂොට් නෝනා එක්ක බේර ගන්නවා."

"ඇය කිව්වා ඔබෙන් අහන්න කියල"

"මගෙන? ගිහිං අහනවකො ප්‍රෂියාවෙ මහරජ්ජුරුවන්ගෙන්. මට දන් ඔය කතාව අහල ඇතිවෙලයි ඉන්නේ. පලයං මිනිහෝ යන්න මෙතැනින්!"

බ්‍රෙකන්රිජ් ඒ පුද්ගලයා වෙත කඩා පැන්නේය. ඔහු ඉක්මනින් අඳුරට වී වෙළෙන්දාගෙන් බේරීමට සමත් විය.

"හ හා! අපට බ්‍රික්ස්ටන් පාරට අමුතුවෙන් ගමනක් යන්න උවමනා වෙන එකක් නැහැ වගේ වොට්සන්. එන්න අපි ගිහිං බලමු ඔහුගෙන් දනගන්න පුළුවන් මොනවද කියල."

අපි ඉක්මනින් ඉදිරියට ගමන් කළෙමු. වසා දමන වෙළඳසල් අතර එකතු වී සිටි සෙනග පසුකර ගොස්, කෙසඟ මිනිහා ළඟටම යෑමට හෝම්ස් සමත්විය. ඔහු ඒ මිනිසාගේ උරහිස මත අත තැබිය. ඒ පුද්ගලයා එක් ක්ෂණයකින් ආපසු හැරිණ. ඔහුගේ මුහුණ භීතියෙන් සුදුමැලි වූ බැව් ගෑස් පහනේ ආලෝකයෙන් අපි දුටුවෙමු.

"තමුසෙ කවුද? මොකවද තමුසෙට ඕන කරන්නෙ?" ඔහු ඇසුවේ වෙව්ලන කටහඬිනි.

"මට සමාවෙන්න" හෝම්ස් හිතවත් ආකාරයෙන් පැවසීය.

"ඔහේ අර කඩකාරයාගෙන් ඇහුව ප්‍රශ්නෙ මටත් අහම්බෙන් වගේ ඇහුණා. මං හිතන්නෙ මට පුළුවන් වේවි ඔහේට උදව් කරන්න."

http://sherlockholmesinvestigations.blogspot.com



37. "තමුසෙ කවුද? මොනවද තමුසෙට ඕන කරන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"තමුසෙට පුළුවන්ද? තමුසෙ කවුද? මට දැනගන්න ඕන කරන දේවල් තමුසෙ දන්නෙ කොහොමද?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. අනෙක් අය නොදන්න දේවල් දැනගැනීම මගේ රස්සාව."

"ඒ වුණත් මේක ගැන තමුසෙ කිසිදෙයක් දැන හිටින්න විදියක් නෑ."

"තරහ වෙන්න එපා කිව්වට. මං ඔය කාරණය ගැන හැමදෙයක්ම දන්නවා. ඔබ මේ හොයන්නේ, බ්‍රික්ස්ටන් පාරේ ඕක්ෂොට් මහත්මිය විසින් බ්‍රෙකන්රිජ් නම් වෙළෙන්දාට විකිණූ පාත්තයින් වගයක් ගැන නේද? බ්‍රෙකන්රිජ් උනුත් ඇල්ෆා අවන්හලේ වින්ඩිගේට් මහත්මයාට විකිණුවා. ඔහුගෙන් පාත්තයෝ මිලදී ගත්තේ හෙන්රි බේකර් මහත්මයා"

"අනේ මහත්මයා. මට හමුවෙන්න උවමනාම පුද්ගලයා ඔබ තමයි. මං මේ කාරණය ගැන කොයි තරම් උනන්දුවක් දක්වනවද කියල ඔහේට කියන්න මට තේරෙන්නෙ නෑ."

ෂර්ලොක් හෝම්ස් අත දිගු කොට රෝද හතරේ ලොකු කුලීරියක් නවත්වා ගත්තේය.

"එහෙම නම් අපි සුවපහසු කාමරේකට ගිහිං මේ ගැන කතාබහ කරමු. සීතල සුළඟ හමන, වෙළඳපොළක සිටගෙන කොහොමද ඕව කතාබස් කරන්නෙ? තමුන් වැඩිදුර යන්න ඉස්සර වෙලා කියන්න, කාටද මං මේ උදව්කරන්න හදන්නේ කියලා?"

අමුත්තා එක් නිමේෂයක් නිහඬව සිටියේය. "මගේ නම ජෝන් රොබින්සන්" ඔහු කීවේ අප දෙස හොරැහින් බලමිනි.

"නෑ. නෑ. ඇත්ත නම කියමුකෝ බලන්න. මේ බොරු නම් යොදාගෙන ගනුදෙනු කරන්න ගියාම හරි කරදරයි."

අමුත්තාගේ සුදුමැලිව තිබූ කම්මුල රතුපැහැ විය.

"කමක් නෑ. මගේ ඇත්ත නම ජේම්ස් රයිඩර්."

"අන්න හරි. කොස්මොපොලිටන් හෝටලයේ කාමර භාර ප්‍රධාන සේවකයා. කරුණාකරල අශ්වකරත්තයට නගින්න මහත්මයා. ඔබට දැනගන්න උවමනා කාරණා ඔක්කොම, මං කියන්නම් වැඩි ප්‍රමාදයක් නැතුවම."

http://sherlockholmesinvestigations.blogspot.com

කුඩා මිනිසා අප දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බැලීමට පටන් ගත්තේය. ඔහු සෑහෙන තරම් භයට පත්ව ඇති සැටිත්, යම් බලාපොරොත්තුවක සලකුණක් ඔහුගේ දෑසේ ඇති සැටිත් මම දුටුවෙමි. තමාට මේ මුහුණපෑමට සිදුවන්නේ නොසිතූ විරුද්ධවාසියකටද, එසේත් නැත්නම් දරුණු ඉරණමකටද යන්න තේරුම් ගත නොහැකි බැල්මක් ඔහුගේ මුහුණේ විය. අනතුරුව ඔහු අප සමග කුලීරියට නැගුණේය. පැය භාගයක් ගතවෙද්දී, අපි බේකර් වීථියේ නිවහනට ළඟාවූයෙමු. ගමනේදී කිසිදු කතාබහක් නොකෙරිණි. ඔහුගේ හුස්ම උස් හඬින් ඉහළ පහළ වැටිණි. ඒ අනුව ඔහු අපමණ කැළඹීමට පත්ව සිටි බව අපි සිතාගත්තෙමු.

"මන්න අපි ආවා" හෝම්ස් කීවේ ප්‍රීතිමත් අයුරෙනි. අපි එකා පිටිපස එකා උඩුමහලට නැගුණෙමු.

"මේ කාලෙ තිබෙන සීතලේ හැටියට ගිනි උදුන හරිම අත්‍යවශ්‍යයි. ඔබට බොහොම සීතල දැනෙනවා වගෙයි රයිඩර් මහත්මයා. අර ගිනි උදුනට ළඟම තියෙන වේවැල් පුටුවෙන් වාඩිවෙන්න. ඉතින් ඔබට දැනගන්න උවමනා කරන්නේ අර පාත්තයින්ට සිද්ධවුණේ මොකක්ද කියන එකයි?"

"ඔව් මහත්මයා"

"හරියටම කියනවා නම් එයින් එක් පාත්තයෙකුට නේද? මං හිතන්නේ ඔබේ උනන්දුව තියෙන්නේ, අර වලිගය පැත්තට කළු ඉරක් තියෙන සුදු පාත්තයා ගැන පමණයි. එහෙම නේද?"

රයිඩර් මහත්මයා දැඩි කැළැඹීමකට පත්වූ බව පෙනිණ. ඔහුගේ කටහඬේ තිබුණේ වෙව්ලන ස්වරයකි.

"අනේ මහත්මයා. මට කරුණාකරල කියන්න ඒ පාත්තයට මොකද වුණේ කියල"

"ඌ ආව නේ මෙහේට."

"මෙහේට?"

"ඔව්. ඌ නම් හරි පුදුමාකාර පක්ෂියෙක්. මේ මහත්තය ඌ ගැන උනන්දුවක් දක්වන එකේ පුදුමයක් නෑ. ඌ දැම්මා බිත්තරයක්. හැබැයි මැරුණට පස්සේ. ඒ තරම් අලංකාර, පුංචි, දීප්තියෙන් බබලන නිල්පාට බිත්තරයක් මං ජීවිතේට දැකල නෑ. මා ළඟ

http://sherlockholmesinvestigations.blogspot.com

තියෙනවා ඒක. මගේ පුංචි කෞතුකාගාරයේ මං පරෙස්සමට අරං තිබ්බා."

අසුනෙන් ඉහළට රයිඩර් එසැවුණේ තිතැතිනි. එහෙත් ඔහුට නැගිට සිටීම අපහසු විය. ඔහු දකුණු අතින් ගිනිළඳුනේ ඉහළ පඩිය අල්ලා ගත්තේය. යකඩ පේප්පුව විවෘත කළ හෝම්ස් එතුළින් ඉන්ද්‍රනීල මාණික්‍යය එළියට ගත්තේය. දීප්තිමත් නිල් ආලෝක ධාරා දසත විහිදුවමින් එය බැබළුණේ තාරකාවක් විලසිනි. රයිඩර් ඒ දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය. ඒ, එයට අයිතිවාසිකම් කියම්දෝ නොකියම්දෝ යන්න තීරණය කරගැනීමට නොහැකි වූ අයුරෙනි.

"වැඩේ ඔක්කොම එළිවෙලා රයිඩර්. ඔහොම ඉන්නවා මනුස්සයො! තමුසෙ වැටේවි ගිනි උදුනට! වොට්සන් ඔය මිනිහව අල්ලාගෙන ගිහින් අර පුටුවෙන් වාඩිකරන්න. මිනිහගෙ ඇගේ ලේ වතුර වෙලයි ඉන්නෙ. දෙන්න ඔහුට බ්‍රැන්ඩි ටිකක්. අපරාධයක් කරන්න පණ තිබුණාට ඔහේට ඒකෙ චෝදනා එල්ල වෙනකොට ඒවට මුහුණ දෙන්න පණක් නෑ? හරි! බ්‍රැන්ඩි ටික ඇඟට වැටුණාම යන්තම් පණක් ආව වගේ."

ක්ලාන්ත වී වැටෙතැයි මා සිතූ ඒ පුද්ගලයා, මඳ වේලාවක් ගතවෙද්දී ක්‍රමෙන් යථා තත්ත්වයට පත්විය. සුදුමැලිව තිබූ කම්මුල් රත්පැහැ වූ අතර, තමාට චෝදනා එල්ල කරන්නාට මුහුණදීමට සූදානම්ව ඔහු පුටුවේ වාඩිවී සිටියේය.

හෝම්ස් කථාව ඇරැඹුවේය.

"මේ සිද්ධියේ හැම සිදුවීමක්ම, හැම පුරුකක්ම මා ළඟ තියෙනවා. ඒවා ඔප්පු කරන්න උවමනා වෙන සාධකත් හැම එකක්ම වගේ මා ළඟ තියෙනවා. ඔහේට කියන්න ඉතිරිවෙලා තියෙන්නෙ බොහොම ටිකයි. මෝකා ආදිපාදවරියගේ මේ ඉන්ද්‍රනීල මාණික්‍යය ගැන තමුසෙට අහන්න ලැබුණා. එහෙම නේද?"

"මට ඒක මුලින්ම කිව්වෙ කැතරින් කුසැක්."

"අහා! ආදිපාදතුමියගේ හිතවත්ම සේවිකාව. හරි. ඉතින්, මහා විශාල ධන සම්භාරයක් ක්ෂණිකව අත්පත් කරගෙන මහා පොහොසතෙක් වීමේ චේතනාව ඔහේටත් ඇතිවුණා. ඒ වුණත් ඒ සඳහා ඔහේ අනුගමනය කළ ක්‍රමය නම් සාධාරණ එකක් නෙමෙයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මට නම් හිතෙන්නේ තමුසෙ මේකැනදී අන්තිම නින්දා සහගත, දුෂ්ටයෙක් බවට පත්වුණා. තමුසෙ දැනගෙන හිටියා මේ ජෝන් හෝනර් ගැන. ඔහු මීට කලින් හොරකමකට දඬුවම් විඳලා තියෙන නිසා, සැකය එල්ලවෙන්නෙ ඔහුට බව තමුසෙ දන හිටියා. තමුසෙයි ආධාරකාරියයි මොකද කළේ? ඊයම් වලින් පෑස්සිය යුතු වැඩක් කාමරය තුළ සකස් කළා. එහෙම කරලා ගෙන්නුවා හෝනර්ව. ඔහු වැඩේ අවසන් කරලා පිටවෙලා ගියාට පස්සෙ ලාච්චුවේ අගුළ කැඩුවා. ඊළඟට ආභරණ පෙට්ටිය එළියට අරගෙන මැණික හොරකම් කළා. ඊට පස්සේ ප්‍රධානීන්ට දැන්නුවා හොරකමක් සිදුවෙලා කියලා. . . ."

ඉදිරියට පැමිණි රයිඩර් හෝම්ස් සමීපයේ වැඳවැටුණේය. ඉන්පසු හෝම්ස්ගේ දණහිස් අල්ලාගෙන ආයාචනා කිරීමට පටන් ගත්තේය.

"දෙවියන් වහන්සේගේ නාමයෙන් මට සමාව දෙන්න. මගේ තාත්තාට අම්මාට මුහුණදෙන්න වෙන තත්ත්වය ගැන හිතන්න මහත්මයා. ඔවුන් පපුව පැළිල මැරේවි. මං මීට කලින් කවදාවත් අපරාධයක් කරල නෑ. මින් ඉදිරියට කරන්නෙත් නෑ. මං ඒ ගැන ඔබට දිවුරා පොරොන්දු වෙන්නම්. බයිබලයේ අත තියලා දිවුරන්නම්. ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන්, මාව හිරේ යවන්නේ නැතිව, මට සමාව දෙන්න මහත්මයා."

"ගිහින් වාඩිවෙනව තමුසෙගෙ පුටුවෙන්."


හෝම්ස් බැණවැදුණේ අනුකම්පා රහිතවයි.

"දැන් වැඳවැටිලා සමාව ඉල්ලන්නයි, දෙවියන් ගැන මතක්කරන්නයි බොහොම පහසුයි. ඔය අපරාධ කරල හෝනර්ව පටලවන කොට තමුසෙ ඒ මිනිහ පත්වෙන තත්ත්වය ගැන හිතුවද? ඔහු කිසිම දෙයක් නොදන්න අපරාධයකට විත්තිකූඩුවට නංවන කොට, තමුසෙගෙ හිතේ කිසිම අනුකම්පාවක් තිබුණද?"

"මං මේ රටෙන් පැනලා යන්නම් මහත්මයා. ඔහුට විරුද්ධව සාක්ෂි නැතිවුණාම නඩුව බිඳ වැටේවි. ඔහු නිදහස් වේවි."

"හ්ම්. අපි ඒ ගැන පස්සෙ කථා කරමු. දැන් කියනවා බලන්න තමුසෙගෙයි කැතරින් කුසැක්ගෙයි නාටකයේ, දෙවැනි ජවනිකාව මොකක්ද කියලා? හොඳට මතක තියාගන්නවා. සම්පූර්ණ

http://sherlockholmesinvestigations.blogspot.com



42. ". . . . මාව හිරේ යවන්නෙ නැතිව මට සමාව දෙන්න මහත්මයා."

Reading Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇත්ත මිසක් බොරු එහෙම කියන්නු එපා. මැණික් ගල කොහොමද පාත්තයාගේ බඩට ගියේ? පාත්තයා කොහොමද වෙළඳපොළට ආවෙ? තමුසෙට දඬි දඬුවම් නොලබා බේරෙන්න, පොඩි ඉඩක් හරි තියෙන්නෙ ඇත්ත කිව්වොත් විතරයි."

"මං සිද්ධවුණු හැම දෙයක්ම ඒ හැටියෙන්ම ඔබට කියන්නම් මහත්මයා. හෝනර් හිරභාරයට ගන්න වෙලාවෙ මැණික තිබුණෙ මා ළඟයි. පුළුවන් ඉක්මනින් මං ඒක කොහේ හරි හංගුවොත් හොඳයි කියන එක මගේ ඔලුවට ආවා. ඒ මොකද කොයි මොහොතේ හෝ පොලීසිය මේ ගැන වැඩිදුර සෙවීමට මගේ කාමරයත් සෝදිසි කරාවි කියන කරුණ මට වැටහුණා.

මැණික හංගා තබන්න එරිස්සම් සහිත තැනක් හෝටලයේ තිබුණෙ නෑ. පෞද්ගලික කටයුත්තක් ඇති බව පෙන්වලා මං හෝටලයෙන් පිටවී ගියා. මං ගියේ මගේ සහෝදරියගේ ගෙදරට. ඇය ඕක්ෂොට් නම් මිනිහෙක් සමඟ විවාහ වෙලා, පදිංචිව ඉන්නේ බ්‍රික්ස්ටන් පාරේ. ඔවුන් කුකුළන් ආදී සතුන් ඇතිකරලා මස් පිණිස වෙළඳපොළට විකුණනවා. මං එහේ යද්දී මට දකින්න ලැබුණු හැම මිනිහෙක්ම, මට පෙනුණේ පොලිස්කාරයෙක් වගේ. නැත්නම් රහස් පරීක්ෂකයෙක් වගේ. එදා හරිම ශීතල දවසක්. ඒ වුණත් මං බ්‍රික්ස්ටන් පාරට යන්න කලින් ඉඳන් මගේ මුහුණෙන් ඩහදිය වැගිරුණා. මගේ මුහුණ හොඳටම සුදුමැලි වෙලා. ඒ බව දකපු මගේ සොහොයුරිය ඇහුවා මොකක්ද මට හැදිලා තියෙන අසනීපෙ, කියලා. මං ඇයට කිව්වා, හෝටලයේ සිදු වූ මැණික් හොරකම නිසා මගේ හිත ලොකු කැළඹීමකට පත්වී ඇතිබව. මං ඇයගේ ගේ පිටි පස්සට ගිහිං, පයිප්පයක් දල්වාගෙන කල්පනා කළා, මීළඟට ගතයුතු හොඳම පියවර මොකක්ද කියලා.

මගේ මිතුරෙක් හිටියා මෝඩ්ස්ලි කියල. ඔහු නරක ආශ්‍රයට වැටීම නිසා අපරාධ වලට අනුබල දීමට නියම වූ කෙනෙක්. ඔහු කාලයක් පෙන්ටන්විල් සිරගෙදර සිරදඬුවම් වින්දා. කලකට ඉහතදී මට ඔහු හමුවුණු වෙලාවක ඔහු කිව්වා, සොරුන් සොරකම් කරගන්නා බඩු වලට කරන දේ. ඔහු විශ්වාසයට ගතහැකි පුද්ගලයෙක් බව මට මතක්වුණා. ඒ මොකද ඔහුගෙත් රහසක් දෙකක් මං දන හිටියා. ඉතින් මං තීරණයක් ගත්තා. මෝඩ්ස්ලි ජීවත්වුණු කිල්බර්න් ප්‍රදේශයට ගිහිං ඔහු හමුවෙලා උපදේශයක්

http://sherlockholmesinvestigations.blogspot.com

ගන්න. මැණික විකුණලා මුදල් කරගන්නෙ කොහොමද කියලා ඔහු මට සැක නැතුව කියාවි. ඒත් කොහොමද ඔහු හම්බවෙන්න යන්නේ? මං හෝටලයෙන් ආවෙත් මොන තරම් භයෙන්ද? කොයි මොහොතේ මාව අල්ලාගෙන සෝදිසි කරාවිද කියන්න බැහැ. ඒ මොහොතේ මැණික තිබුණේ මගේ ඇතුළුකබායේ සාක්කුවේ. මං බිත්තියට හේත්තු වෙලා කල්පනා කළා. ඒ වෙලාවෙ පාත්තයො හැමතැනම, මගේ දෙපා වටේත් ඇවිදිමින් හිටියා. එක්වරම මගේ හිතට අදහසක් ආවා. අක්ෂම අපරාධ පරීක්ෂකයෙකු වුණත් පරාජය කළ හැකි අදහසක් තමයි මගේ හිතට ආවෙ.

නත්තලට සති කිහිපයකට කලින් මගේ සොහොයුරිය මට කියා තිබුණා, නත්තල් තෑග්ගක් හැටියට ඇගේ හොඳම පාත්තයා මට තෑගි කරන බව. ඇය කිව් දේ නොවැරදීම ඉටුකරන බව මං දැන හිටියා. මට කරන්න තියෙන්නේ මගේ පාත්තයා අරගෙන, මැණික උගේ බඩට යවලා, ඌව අරගෙන කිල්බර්න් වලට යන්නයි.

වත්ත පහළ පොඩි මඩුවක් තිබුණා. මං ඒක පිටිපස්සට ගිහිං, හොඳ තර පාත්තයෙක් අල්ලා ගත්තා. උගේ වලිගය පැත්තට කළුපාට ඉරක් තිබුණා. මං උගේ කට ඇරලා, මැණික් ගල උගේ කටතුළට දමලා, ඇඟිල්ලෙන් පුළුවන් තරම් ඇතුළට තල්ලු කළා. උගේ ගලනාළය දිගේ මැණික බඩට ගිය හැටි මගේ අතට දැනුණා. පාත්තයා ශබ්දයක් කරලා, තටු ගහලා, දඟලලා මගේ අතෙන් ගැළවෙන්න උත්සාහ කළා. මොකක්ද ශබ්දය කියලා බලන්න මගේ සොහොයුරිය දුවගෙන ආවා. මං ඇය සමග කථාකරන්න හැරුණා විතරයි, ඒ කාලකණ්ණි සතා මගේ අතින් ගැළැවිලා, තටුගහමින් අනෙක් පාත්තයින් අතරට ගියා.

"මොනවද ජේම්ස් ඔබ අර පාත්තයට කළේ?" ඇය ඇහුවා.

"ඇයි ඔබ මට නත්තලට පාත්තයෙක් දෙනවා කිව්ව නේ. ඉතින් මං මේ උන්ව අල්ලලා බැලුවේ, වැඩියෙන්ම තරබාරු කොයි එකාද කියලයි."

"ආ ඒකද? අපි දැන්මම එකෙක් ඔබට වෙන්කරලයි තියෙන්නේ. අපි ඌට කියන්නේ ජේම්ගේ පාත්තයා කියලා. අර ඇත ඉන්න සුදු පාට තර එකා. . . . අන්න ඌ. පාත්තයින් විසිහය දෙනෙක් ඉන්නවා. ඔබට එකයි අපට එකයි. ඉතුරු විසිහතර දෙනා වෙළඳ පොළට."

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම ස්තුතියි මැගී. මං වැඩිය කැමැතියි ටිකකට කලින් මම අල්ලාගෙන හිටි එකාට. ඒකට කමක් නැහැ නේද?"

"අපි ඔබට වෙන් කළ එකා රාත්තල් තුනක් බරෙන් වැඩියි. ඔබට දීම සඳහා වැඩිපුර කෑම විශේෂයෙන් දීලා අපි ඌව මහත් කළා."

"ඒකට කමක් නෑ. මං කිව්ව එකාම මම ගන්නම්. මං ඌව දැන්ම ගෙනියන්නම්" මම කිව්වා.

"ඔබේ කැමැත්තක්. ඔබට ඕනෙ කරන්නෙ කොයි එකාද?"

"අර පාත්තයො රංචුව මැද්දෙම ඉන්නෙ. . . . වලිගය පැත්තට කළු ඉරක් තියන සුදුපාට එකා."

"හා හොඳයි. එහෙනම් ඌව මරලා අරගෙන යන්න."

ඉතින් හෝම්ස් මහත්මයා, ඇය කිව් විදියට මං ඌව මරලා, කිල්බර්න් වෙත අරගෙන ගියා. මං කළ වැඩේ මගේ මිත්‍රයාට කිව්වා. ඒක අහලා ඔහු පණයන්න හිනාවුණා. ඊට පස්සේ අපි පිහියක් අරගෙන පාත්තයාගේ බඩ පළා බැලුවා. උගේ බඩ ඇතුළ දැක්කාම මගේ පපුව පත්තු වුණා. උගේ බොක්කෙ මැණික තිබුණෙ නෑ. මෙතැන මොකක් හරි වැරැද්දක් ඇතිවෙලා බව මං තේරුම් ගත්තා. මං වහාම මගේ සහෝදරියගේ ගෙදරට ගියා. පාත්තයන් හිටි තැනට ගිහිං බැලුවා. එක සතෙක් වත් හිටියේ නෑ.

"මැගී අර පාත්තයින්ට ඔබ මොකද කළේ?"

"මං උන්ව විකිණුවා ජේම්"

"විකිණුවා? කාටද?"

"කොවෙන්ට් උද්‍යානයේ වෙළඳපොළේ බ්‍රෙකන්රිජ්ට."

"අර මං තෝරාගත්තු එකා වගේම වලිගයේ කළු ඉරක් තිබුණු තවත් පාත්තයෙක් හිටියද?"

"ඔව් ජේම්. ඒ වගේම තවත් එකෙක් හිටියා. මට කොයි වෙලාවක වත් උන් වෙන්ව අඳුනාගන්න පුළුවන් කමක් තිබුණේ නෑ. එක වගේමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

එතකොට මට ඔක්කොම තේරුම් ගියා. මං බ්‍රෙකන්රිජ් හමුවෙන්න ආවා. ඔහු ඒ වෙනකොටත් පාත්තයො ටික විකුණලා. ඔහු උන්ව වික්කේ කාටද කියලා එක වචනයක් කිව්වේ නෑ. ඔබට ඇහුණා නේද අදත් ඔහු මට කථා කළ හැටි. ඔහු දිගින් දිගටම කථා කළේ ඒ විධියටයි. මගේ සොහොයුරිය හිතන්නේ මගේ මලුව නරක්වෙලා කියලයි; මට පිස්සු වැටිගෙන එනවා කියලයි. වෙලාවකට මටත් හිතෙනවා මට පිස්සුද කියලා. දැන් අන්තිමට කිසිම වාසියකුත් නොලැබී මං මහා අපරාධකාරයෙක් වෙලා. දෙවියනේ! මාව බේරාගන්න මහත්මයා. දෙවියනේ!"

දෑත් වලින් මුහුණ වසාගත් රයිඩර් ඉකිගසමින් වැළපෙන්නට පටන් ගත්තේය.

ඉන්පසුව ඇතිවූ නිශ්ශබ්දතාවය දීර්ඝ වේලාවක් පැවතිණ. විටෙක එය බිඳුණේ රයිඩර් ඉතා අපහසුවෙන් හුස්ම ගත් හඬෙන් පමණි. අවසානයේදී මගේ මිත්‍රයා පුටුවෙන් නැගිට්ටේය. ඔහු දොර වෙත ගොස් එය හැර දැම්මේය.

"බැහැපන් එළියට!" හෝම්ස් කීය.

"මොනවා මහත්මයා! මොනවා? ඔබට දේවාශීර්වාද ලැබේවී මහත්මයා!"

"එක වචනයක් කථා කරන්න එපා. බැහැපන් එළියට!"

තවත් කිසිවක් කීමට අවශ්‍ය නොවීය. තරප්පු පෙළ දිගේ පහළට දිවගිය රයිඩර්, දොර වසා දමා, පාර දිගේ දුවන හඬ අපට අසන්නට ලැබිණ. හෝම්ස් තම පයිප්පය අතට ගත්තේය.

"මොනවා වුණත් වොට්සන්, මං පොලීසියෙන් පත්කළ අපරාධ පරීක්ෂකයෙක් නෙමෙයි නේ. ඔවුන්ගේ ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීමේ රාජකාරියක් මට භාරදීලා නැහැනෙ. ජෝන් හෝනර්ට දඬුවම් නියම වීමේ අවදානමක් තියෙනවා නම් ඒක වෙනත් කරුණක්. නමුත් එය සිදුවෙන්නෙ නැහැ. ඒ මොකද රයිඩර් ඔහුට විරුද්ධව සාක්ෂි දෙන්න ඉදිරිපත් වෙන්නෙ නෑ. ඒ නිසා නඩුව බිඳ වැටේවි. මං මේ කරන වැඩෙත් යම් වැරැද්දක් තිබෙන බව ඇත්තයි. නමුත් මින් ඉදිරියට ඔහු කිසිදු අපරාධයක් කරන එකක් නැහැ. ඒ නිසයි මං ඔහුගේ ආත්මය බේරා ගැනීමට කටයුතු කළේ. ඔහුව හිරේට

http://sherlockholmesinvestigations.blogspot.com

ගැටවොත්. ඔහු ජීවිතේටම අපරාධකාරයෙක් ලෙස හංවඩු ගැහේවි. මේ නත්තල් කාලය, වැරදි අමතක කරල සමාව දෙන කාලය නේ. මේ සැරේ ඉතාම සුවිශේෂ ආකාරයේ විස්මයජනක පරීක්ෂණයක් අපට ලැබුණේ අහම්බෙන්. ඒක සාර්ථකව විසඳා ගැනීමම අපට ලැබුණු ත්‍යාගයක්. දොස්තර මහත්මයා කරුණාකර සීනුව නාද කරන්න. එතකොට අපේ මීළඟ පරීක්ෂණය අරඹන්න පුළුවනි. ඒකෙත් ප්‍රධානම ලක්ෂණය ඒකට සම්බන්ධව පක්ෂියෙක් සිටීම."

Reading Purpose Only. Not For

http://sherlockholmesinvestigations.blogspot.com

# උමං දුම්රියේ අභිරහස් මරණය

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# උමං දුම්රියේ අභිරහස් මරණය

1895 වසරේ නොවැම්බර් මාසයේ තුන්වැනි සතියේදී, මුළු ලන්ඩන් නගරයම කහ පැහැති ඝන මීදුමකින් වැසී ගියේය. සඳුදා පාන්දර මුලින්ම දක්නට ලැබුණු මීදුම බ්‍රහස්පතින්දා දක්වා නොඅඩුව පැවතිණ. බේකර් වීථියේ අපේ නිවහනේ කවුළුව තුළින් පාරෙන් එහා පැත්තේ පිහිටි ගෙවල් පවා දකීමට අපහසු විය. මෙම මීදුම ගලා ආවේ ඒ තරමට ම ඝන තිරරෙද්දක් විලසිනි.

ඒ සතියේ පළමුවැනි දවස හෝම්ස් ගතකළේ ඔහුගේ යෝධ විමර්ශන ග්‍රන්ථයට සූචියක් පිළියෙළ කරමිනි. දෙවැනි හා තුන්වැනි දින දෙකම ඔහු අලුත් විනෝදාංශයක් ගැන පොත් කියවීමට වෙන් කළේය. ඒ විනෝදාංශය, මධ්‍යකාලීන යුගයේ සංගීතයයි. හතරවැනි දවසේ උදේ ආහාරය නිම කළ අපි, පුටුවලින් නැගිට ජනේලයෙන් එබී බැලුවෙමු.

"අදත් මේ මීදුමේ අවසානයක් දකින්න ලැබෙන්නේ නෑ හෝම්ස්. දන් මීදුම තද දුඹුරු පාටයි. ජනේලය උඩින් හෙමින් හෙමෙහ ඝන මීදුම ගලාගෙන යද්දී, වීදුරුව මතුපිට කුඩා තෙල් බින්දු එකතු වෙනවා." මම කීවෙමි.

"මීදුමේ ඉවරයකුත් නෑ. අපට කරන්න වැඩකුත් නෑ." මගේ මිත්‍රයා කීය. නිවස තුළට කොටු වී සිටීමට වීම ගැන නොඉවසිල්ලෙන්, ඔහු සිටියේ, විසිත්ත කාමරයේ වේගයෙන් ඉහළ පහළ සක්මන් කරමිනි. ඉතා ක්‍රියාශීලී පුද්ගලයෙකු වූ හෝම්ස්ට, මොළය හෝ කය වෙහෙසීමක් නොමැතිව අක්‍රියව සිටීම ඉවසුම් නොදෙන්නක් විය. නියපොතු සපමින්, ලීබඩු වලට ඇඟිලි තුඩින් තට්ටු කරමින් ඔහු පෙන්වූයේ යටපත් කරගැනීමට නොහැකි ක්‍රියාශීලීත්වයයි.

"සිත් ඇදගන්නා කිසිම දෙයක් පුවත්පත් වල වත් නෑ නේද වොට්සන්?"

http://sherlockholmesinvestigations.blogspot.com

සිත් ඇදගන්නා දෙයක් යනුවෙන් හෝම්ස් අදහස් කළේ, අපරාධ හෝ විසඳාගත නොහැකි අභිරහස්ය.

"ළඟදීම එංගලන්තයේ සිදුවීමට ඉඩ ඇති විප්ලවයක් ගැන තියෙනවා. කොයි මොහොතේ හෝ ඇතිවිය හැකි ලෝක යුද්ධයක් ගැනත් ඉඟියක් තියෙනවා. ඒ ඇරෙන්න ආණ්ඩුව පෙරළීමේ අවදානමක් ගැනත් පත්තර වල සඳහන් කරලා තියෙනවා. ඒත් ඉතින් මේවා ඔබේ සිතේ උනන්දුවක් ඇති කරන දේවල් නෙමෙයි නේ. අපරාධයක් කියල සැක හිතුන්න පුළුවන් එකම දෙයක් වත් සඳහන් වෙලා නෑ."

හෝම්ස් තම අප්‍රසාදය පළකිරීමට ගෙරෙව්වේය.

"ලන්ඩනයේ අපරාධකාරයා, දැන් ඇත්තටම මහා අලස මිනිහෙක් වෙලා. ජනේලයෙන් එළිය බලන්න වොට්සන්. ඝන මීදුම අතරින් මිනිසුන් එහා මෙහා යන හැටි අපට පෙනෙන්නෙ බොහොම යන්තමින්. ඊළඟට යළිත් ඔවුන් මීදුම් වලාකුළු වලින් වැහිල යනවා. මේ වගේ අවස්ථාවක හොරෙකුට හෝ මිනීමරුවෙකුට ලන්ඩන් නගරය පුරා නිදහසේ සැරිසරන්න පුළුවනි; හරියට ගොදුරක් හොයාගෙන ව්‍යාඝ්‍රයෙක්, රූස්ස ගස් වලට මුවාවෙලා වනාන්තරයේ සැරිසරනවා වගේ."

"සුළු සුළු හොරකම් නම් විශාල වශයෙන් සිදුවෙලා තියෙනවා." මම කීවෙමි.

"යොබා දහමෙන් මේ වේදිකාව සකස් කරලා තියෙන්නේ, ඊට වඩා මහා විශාල භයානක රඟදැක්මකට, සුදුසු විදියට. මං අපරාධකාරයෙක් නොවුණු එක, මුළු මහත් සමාජයේම වාසනාවක්."

"ඒක නම් සම්පූර්ණ ඇත්ත." මම සිනාමුසු මුහුණෙන් කීවෙමි.

"මාව මරාදමන බලාපොරොත්තුවෙන්, ඒකට අරඅඳින අපරාධකාරයො පනස් ගණනක් ඉන්නවා. ඔබ දන්නවා ඇති බ්‍රූක්ස්, වුඩ්හවුස් ඇතුළු තවත් අය. මං වගේ මිනිහෙක් එතැන හිටියා නම්, ඒ ලුහුබැඳ එන්නන්ගෙන් මට කොයි තරම් කලක් බේරී ඉන්න පුළුවන් වේවිද? බොරු කැඳවීමක්; හමුවීමට ව්‍යාජ ලෙස වෙලාව යොදා ගැනීමක්; එතැනින් ඔක්කොම ඉවරවේවි. ප්‍රංශය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය ආදී රටවල මෙහෙම මීදුමක් නොපවතින්නෙ හොඳ වෙලාවට. ඔවුන් ඝාතන වලට නම ගිය රටවල් නේ.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහෝ! මෙන්න එනවා මොනවා හරි. අපේ ඒකාකාරී ජීවිතය වෙනස් කරන්න, මෙන්න එනවා මොනවා හරි!" හෝම්ස් එක්වරම කෑගැසුවේ අතිශය ප්‍රීතියෙනි.

අප වෙත පැමිණියේ විදුලි පුවතක් රැගත් සේවිකාවය. විදුලි පුවත වහා විවෘත කළ හෝම්ස්, එක් නිමේෂයකින් එය කියවා බැලුවේය.

"අපොයි! අපොයි! මොකකින් මොකක් වෙන්න යනවද මං දන්නෙ නෑ! මගේ අයියා මයික්‍රොෆ්ට් මෙහේ එනවා කියල තියෙන්නෙ."

"ඇයි ඔහු මෙහේ එන එකේ ඇති වැරැද්ද මොකක්ද?" මම ඇසීමි.

"වැරැද්ද? ඒක හරියට නගරයේ පීලි උඩ සෙනග අදින ට්‍රෑම් කාර් එකක්, ගමේ මඩපාරක දුවනවා වගේ. මයික්‍රොෆ්ට්ගේ රේල් පීලි එක් නිශ්චිත මාර්ගයකයි සවිකරලා තියෙන්නේ. මුලටම - පෝල්මෝල් වල නවාතැන, ඊළඟට - ඩයොජිනීස් සමාජය, ඊළඟට - වයිට්හෝල්. ඒ තැන් අතර රේල් පීල්ල උඩ විතරයි එයා දුවන්නෙ. එයාට පීලි පනින්න සිදුවුණේ මොකද දන්නෙ නෑ?"

"මයික්‍රොෆ්ට් කවදාවත්ම මෙහේ ඇවිත් නැද්ද?"

"එකම එක දවසක් ඇවිත් තියෙනවා. ඒ බොහොම කාලෙකට පෙර."

"ඔහු මෙහේ එන්න හේතුව සඳහන් කරල නැද්ද?"

එයට පිළිතුරු ලෙස හෝම්ස් විදුලිපුවත මා අතට දුන්නේය.

***"කාඩෝගන් වෙස්ට් සම්බන්ධයෙන් ඔබ හමුවිය යුතුයි. වහාම පිටත්වෙමි.***

***මයික්‍රොෆ්ට්"***

"කාඩෝගන් වෙස්ට්? මං ඔය නම අහල තියෙනවා" මම කීවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මට නං ඒකෙන් මොකුත්ම මතකයට එන්නෙ නෑ වොට්සන්. මයික්‍රොෆ්ට් ඔහුගේ සාමාන්‍ය ධාවන පථයෙන් ඉවත්වෙලා එන එකෙන් තේරෙන්නෙ, මොකක් හරි ලොකු අවුලක් වගෙයි. ඒක හරියට ග්‍රහලෝකයක්, සාමාන්‍ය පරිභ්‍රමණ පථයෙන් ඉවත්වෙලා, වෙනස් මඟක යනවා වගේ දුර්ලභ දෙයක්. ඒක නෙමෙයි. ඔබ දන්නවද මයික්‍රොෆ්ට් ගැන තොරතුරු?"

"මට මතකයි. අර භාෂා පරිවර්තකයා සම්බන්ධ පරීක්ෂණයේදී, ඔහු ගැන විස්තර ඔබ මට ප්‍රකාශ කළා. ඔබ කිව්වේ ඔහු බ්‍රිතාන්‍ය රජයේ කාර්යාලයක සුළු නිලධරයෙක් බව. . . ."

හෝම්ස්ට සිනා පහළවිය.

"ඒ දවස්වල මං ඔහු ගැන නියම තොරතුරු දැනගෙන හිටියෙත් නෑ. අනෙක රාජ්‍ය තන්ත්‍රයට අදාළ කාරණා කථා කරන කොට, අපි හුඟක් පරෙස්සම් වෙන්නත් ඕන නේ. ඔහු සේවය කරන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙනුවෙන් කියලා ඔබ හිතුවා හරි. ඒ වගේම ඔබට මෙහෙම හිතුණොත් ඒකත් නිවැරදියි. සමහර වෙලාවලදී මයික්‍රොෆ්ට් තමා බ්‍රිතාන්‍ය ආණ්ඩුව!"

"මොනවා හෝම්ස්?"

"මම දැනගත්තා ඒ කථාවෙන් ඔබ පුදුමයට පත්වෙන බව. මයික්‍රොෆ්ට අවුරුද්දකට ලැබෙනවා රන්පවුම් හාරසිය පනහක පඩියක්. ඔහු මහ ලොක්කෙක් වෙන්න උත්සාහ කරන්නෙ නැතුව, ඔහේ ජීවත්වෙනවා. ඉහළ තනතුරකට යන්න, දියුණුවීමට ඔහුට කිසි ආශාවක් නෑ. කිසිම රාජකීය නම්බු නාමයක්, ප්‍රභූ තනතුරක් භාරගන්නෙත් නෑ. ඒ වුණත් ඔහු තමා මේ රටට නැතුවම බැරි මිනිහා."

"ඒ කොහොමද?"

"මයික්‍රොෆ්ට ලැබිලා තියෙන්නේ අද්විතීය තනතුරක්. ඒක ඔහු තමන්ටම නිර්මාණය කරගත්තු එකක්. මීට කලින් ඒ වගේ තනතුරක් තිබිලත් නෑ. අනාගතයේ තිබෙන එකකුත් නැහැ. මයික්‍රොෆ්ට තියෙනවා පුදුමාකාර මොළයක්. මේ ලෝකෙ ජීවත්වෙන කිසිම කෙනෙකුට නොමැති තරම් කාරණා, දත්ත, තොරතුරු මේ මොළයේ ගබඩා කරගන්න ඔහුට හැකියාව තියෙනවා. මං මේ අපරාධ පරීක්ෂණ වෘත්තිය සඳහා යෙදවූ දක්ෂතාවය, ඔහු යොදා ගන්නෙ ඒ කටයුත්තට. රජයේ සෑම දෙපාර්තමේන්තුවකින්ම,

http://sherlockholmesinvestigations.blogspot.com

ආයතනයකින්ම, ගන්නා ප්‍රතිපත්ති, තීරණ සහ සැලසුම් තියෙනවා නෙ. ඔවුන් ඒ හැම එකක්ම මයික්‍රොෆ්ට දන්වනවා. ඔහු ඒවා තමන්ගේ බුද්ධියේ ගබඩා කරගන්නවා. ඒ විතරක් නෙමෙයි ඔහු ඒවා බුද්ධියෙන් විශ්ලේෂණය කරනවා. මගේ අයියා තමා මධ්‍යම තොරතුරු හුවමාරුව සහ නිෂ්කාෂණ කාර්යාලය. අනෙක් හැමෝම යම් යම් දේවල් ගැන විශේෂඥයන් වෙන්න පුළුවනි. ඒත් මයික්‍රොෆ්ට් ඉන්නේ ඒ හැමෝටම ඉහළින්.

ඔහුගේ වැඩ ගැන නිදසුනක් කියන්නම්. අපි හිතමු රජයේ ඇමතිවරයෙකුට මෙවැනි දෙයක් දැනගන්න උවමනා වෙනවා. මොනවද, ඉන්දියාව, කැනඩාව, නාවික හමුදාව, මුදල් වෙනුවට රන් හා රිදී විනිමය හුවමාරුව පිළිබඳ ප්‍රශ්නය. මේ එකක් එකක් ගැන ඇමතිවරයාට වෙනස් දෙපාර්තමේන්තු වලින් උපදෙස් ගන්න පුළුවනි. නමුත් මේ එක් එක් දේවල් අනෙකට බලපාන්නෙ කොහොමද? ඒ ගැන විශ්ලේෂිත පිළිතුරක් ලබාගන්න පුළුවන් මයික්‍රොෆ්ට් ගෙන් විතරයි. ඒ පිළිතුර දෙන්න ඔහුට ගතවෙන්නෙ එක් නිමේෂයක් විතරයි.

රජයේ නිලධරයන් ඔහුව මුලින්ම යොදාගත්තේ, නොයෙකුත් ප්‍රශ්න විසඳීම සඳහා කෙටි මඟක් හැටියට. නමුත් දැන් ඔහු අත්‍යවශ්‍ය පුද්ගලයෙක් බවට පත්වෙලා. අපට හිතාගන්නවත් බැරිතරම් කරුණු සම්භාරයක්, ඔහුගේ මොළයේ ගබඩාවෙලා තියෙනවා. නමුත් මයික්‍රොෆ්ට්ට හිතුණු හැටියේ පුළුවන් අවශ්‍ය දේ එක් ක්ෂණයකින් තෝරල බේරල දෙන්න.

අප්‍රමාණ ප්‍රශ්න වලදී ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්තිය මොකක්ද කියල තීරණය කරන්න සිදුවුණා. මයික්‍රොෆ්ට්ගේ තීරණය තමා ජාතික ප්‍රතිපත්තිය වුණේ. ඒක නැවත නැවතත් සිදුවුණු දෙයක්. ඔහුගේ ජීවිකාව ඒකයි. ඔහු වෙන කිසි දෙයක් ගැන කල්පනා කරන්නේ නැහැ. නමුත් මං ගිහින් මගේ මොනවා හරි ගැටලුවක් ගැන ඇහුවොත් ඔහු අර සිතුවිලි දාමයෙන් මිදිලා, මං ඇහැව්ව දේ ගැන හිතයොමු කරන්න පටන්ගන්නවා. අද නම් බ්‍රහස්පතී ග්‍රහයා පොළෝතලයට ප්‍රවිශ්ඨවීමක් සිදුවෙන්නේ. මොන අරුම පුදුම හේතුවක් නිසා ඔහුට මෙහේට පහත්වෙන්න හිතුණද දන්නෙ නෑ. කවුද වොට්සන් මේ කාඩොගන් වෙස්ට්? මයික්‍රොෆ්ට් ඔහුත් එක්ක සම්බන්ධ වෙන්නෙ කොහොමද?"

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් ඇසීය.

ඒ නම පිළිබඳව මට යන්තමින් මතක තිබිණ. මම පසුගිය පුවත්පත් එකින් එක පරීක්ෂාකර බැලීමට පටන්ගත්තෙමි.

"මට හම්බවුණා!" මම ජයග්‍රාහී හඬින් කෑගැසුවෙමි. සෝපාව මත එකතු වී තිබූ පුවත්පත් ගොන්න අතුරින්, අවශ්‍යව තිබූ එක තෝරාගැනීමට මට හැකිවිය.

"ඔව් ඔව්! මේ තියෙන්නෙ! කාඩොගන් වෙස්ට් කියන්නෙ කවුද දන්නවද? ගිය අඟහරුවාදා උදේ උමං දුම්රිය මාර්ගයක් අසල මියගිහින් හිටි තරුණයෙක් හමුවුණේ? අන්න ඔහු."

හෝම්ස් සිරුවෙන් හිඳගත්තේය. ඔහුගේ මුවට යමින් තිබූ පයිප්පය අතර මග නැවතිණ.

"මේක බොහොම බරපතල වැඩක් වගෙයි වොට්සන්. මේ මරණය නිසා මගේ අයියට ඔහුගේ දින චර්යාව වෙනස් කරන්න සිදුවුණා? එහෙම නම් ඒ මරණය සාමාන්‍ය සුළුපටු එකක් වෙන්න බෑ. ඔය මියගිය තැනැත්තාට මයික්‍රොෆ්ට්ගේ තියෙන්න පුළුවන් සම්බන්ධය මොකක්ද? ඕක කිසි අභිරහසක් නැති සිදුවීමක් බව දන් මට මතකයි. ඔය ඉලන්දාරියා, දුම්රියෙන් ඇද වැටිලා මියගිහින් තියෙනවා. ඔහු සතු කිසි දෙයක් මංකොල්ල කාල තිබුණෙ නෑ. සාහසිකයෙකු විසින් කළ අපරාධයක් කියල හිතන්න සාක්ෂි මොනවා හරි තිබුණෙත් නෑ. එහෙම නේද?"

හෝම්ස් ඇසීය.

"මේ ගැන ඉන්ක්වෙස්ට් විභාගයක් තිබුණා ලු. ඒකෙන් වැදගත් සාක්ෂි රැසක් මතුවී තියෙනවා. වඩාත් හොඳින් බැලුවොත්, හිතේ සැකයක් උපදවන අභිරහසක් වගෙයි පෙනෙන්නෙ." මම කීවෙමි.

"මයික්‍රොෆ්ටට මේ මරණය නිසා ඇතිවෙලා තියෙන බලපෑමෙ හැටියට මටත් හිතාගන්න පුළුවනි මරණය අසාමාන්‍ය එකක් කියල. ඒ ගැන පුවත්පතේ සඳහන් වෙන්නේ මොනවද කියල මට කියන්න වොට්සන්." හෝම්ස් පැවසුවේ හාන්සි පුටුවේ වැතිරෙමිනි.

"ඔහුගේ නම ආතර් කාඩොගන් වෙස්ට්. වයස අවුරුදු විසිහතයි. අවිවාහකයි. වූලිච් යුද්ධායුධ නිෂ්පාදනාගාරයේ ලිපිකරුවෙක්. . . ."

http://sherlockholmesinvestigations.blogspot.com

". . . . රජයේ සේවකයෙක්! අන්න මයික්‍රොෆ්ට් සම්බන්ධවුණු හැටි."

"සඳුදා රෑ ඔහු හදිසියේම වූලිච් වලින් පිටත්වී ගියා. අන්තිම වරට ඔහුව පණපිටින් දකල තියෙන්නේ, ඔහුගේ පෙම්වතිය වන වයලට් වෙස්ට්බරි මෙනෙවියයි. එදා හැන්දෑවේ ඔවුන් කතාබහ කරමින් ඉඳල තියෙනවා පාරේ. ඒ ඝන මීදුම තියෙන වෙලාවෙ - රෑ හතහමාරට. ඔහු, ඇයව හැරදමා පිටවෙලා ගිහින් තියෙන්නේ එක්වරම. ඔවුන් අතර කිසිම රණ්ඩුවක් සිදුනොවුණු බවට ඇය සහතික කරනවා. ඔහුට මෙහෙම ඉරණමක් අත්වෙන්න හේතුවක්, ඇයට හිතාගන්නවත් බැහැ. ඊළඟට අපට ඔහු ගැන අහන්න ලැබෙන්නේ, මේසන් නම් දුම්රියමාර්ගයේ වැඩකරන සේවකයෙකුගෙන්. කාඩෝගන් වෙස්ට්ගේ මළසිරුර මේසන්ට හමුවුණා. ඒ, ලන්ඩන් උමං දුම්රිය සේවයට අයිති ඇල්ගේට් දුම්රියපොළ සමීපයේ තිබිල."

"කවද ද?"

"මළසිරුර හමුවුණේ අඟහරුවාදා අාන්දර හයට. එය තිබුණේ රේල්පීලි වලට සෑහෙන තරම් ඈතින්. නැගෙනහිර දිශාවට අපි ගමන් කරනවා නම්, රේල්පාරෙ වම් පැත්තෙයි මිනිය වැටී තිබුණේ. හරියටම ඒ තැන ගැන කියනවා නම්; එය දුම්රිය පොළට හුඟක් ළඟින්, රේල් පාර උමඟෙන් එළියට මතුවෙන තැනම වගේ.

ඔහුගේ හිසට බරපතල තුවාල සිදුවී තිබුණා. දුම්රියෙන් ඇදවැටීමෙන් මේ වගේ දෙයක් සිදුවෙන්න පුළුවනි. රේල් පාර අයිනේම තිබී, මේ තැනැත්තාගේ මළසිරුර හමුවෙන්න පුළුවන්, එකම හේතුවත් එයයි. ළඟ තියෙන වීථියක සිට කවුරු හරි මළසිරුර පහළට ඔසවා ගෙන ආවත්, ඒ කාටහරි දුම්රිය පොළේ බාධකය පහුකරගෙන යන්න සිදුවෙනවා. නමුත් ටිකට් පරීක්ෂා කරන්නෙක් හැම විටම එතැන රැඳී ඉන්නවා. ඒ නිසා ඔහුට නොපෙනී උමං දුම්රිය මාර්ගයට එන්න ක්‍රමයක් නෑ. ඒ කාරණය ස්ථිර වශයෙන්ම පැහැදිලියි."

"බොහොම හොඳයි. මේ ටික අපට හිතාගන්න පුළුවනි. මේ මිනිහා පණපිටින් හෝ මියගොස් දුම්රියකින් ඇදවැටුණා. නැත්නම්

http://sherlockholmesinvestigations.blogspot.com

ගෙනැත් දමනු ලැබුවා. මට ඒ ටික පැහැදිලියි. දන් ඉතිරි ටිකත් කියන්න වොට්සන්."

"මළසිරුර වැටී තිබුණු හරියේ දුම්රිය මාර්ගයේ ධාවනය කෙරෙන්නේ, නැගෙනහිර සිට බටහිරට යැවෙන දුම්රිය. මෙයින් සමහරක් නගරබද සේවා. අනෙක් ඒවා විල්ස්ඩන් සහ නගරාසන්න දුම්රිය මංසන්ධි සිට එන ඒවා. මෙන්න මේ කරුණ ගැන පැහැදිලි නිගමනයකට එන්න පුළුවනි. මේ තරුණයා ඔහුගේ මරණය සිදුවෙද්දී ඒ දිශාවට ගමන් කරමිනුයි හිටියෙ. එය සිදුවෙලා තියෙන්නේ හොඳටම රෑ වුණාට පස්සේ. නමුත් ඔහු දුම්රියට නැඟුණේ කොහෙන්ද කියන එක හිතාගන්න අමාරුයි."

"ඔහුගේ දුම්රිය ප්‍රවේශ පත්‍රයෙන් ඒක බලාගන්න තිබුණා."

"ඔහු ළඟ ප්‍රවේශ පතක් තිබුණේ නෑ."

"ප්‍රවේශ පතක් තිබුණෙ නෑ? අයියෝ වොට්සන්. මේක හරිම අසාමාන්‍ය සිදුවීමක්. මගේ අත්දැකීම් වල හැටියට නම්, තමන්ගේ ප්‍රවේශපත්‍රය පෙන්වන්නේ නැතුව, උමං දුම්රියපොළකටවත් එන්න බෑ. මං හිතන්නේ තරුණයා ළඟ ප්‍රවේශ පතක් තියෙන්න ඇති. එහෙම නම් ඔහු දුම්රියට ගොඩනැඟුණු දුම්රියපොළ අනෙක් අයට හංගන්න කවුරු හරි ඒක ඉවත් කළා ද? ඒකත් වෙන්න පුළුවනි. කොහොම වුණත් ඒක අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක්. මට මතක හැටියට ඔහු සතු මොකක් වත් කොල්ල කාල තිබුණෙ නැහැ. එහෙම නේද?"

"ඔව්. ඔහු සතුව තිබූ දේවල් පිළිබඳ ලේඛනයක් තිබෙනවා. ඔහුගේ මුදල් පසුම්බියේ පවුම් දෙකයි සිලිං පහළොවක මුදලක් තිබී හමුවුණාලු. තව කැපිටල් සහ කවුන්ටීස් බැංකුවේ වුලිච් ශාඛාවෙන් නිකුත් කළ චෙක් පොතක්; ඔහුව හඳුනාගැනීමට උදව් වුණේ එයයි. වුලිච් නෘත්‍ය ශාලාවේ නාට්‍ය දර්ශනයක් නැරඹීම සඳහා, ආසන දෙකක් වෙන් කරවාගත් ප්‍රවේශ පත්‍ර දෙකක්; ඒවා එදාම හැන්දෑවේ දර්ශනය සඳහා. තවත් කඩදාසි කිහිපයක් අඩංගු පැකට්ටුවක්. ඒවා තාක්ෂණික යමක් සටහන් කර තිබූ ඒවා බවයි සඳහන් කර තිබුණේ."

හෝම්ස් එයින් අතිශයින්ම සෑහීමට පත්වූ බවක් පෙන්විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔන්න වොට්සන් අපට අහුවුණා පොට! බ්‍රිතාන්‍ය ආණ්ඩුව - වුලිච් ආයුධ නිෂ්පාදනාගාරය - තාක්ෂණික ලියකියවිලි - අයියා මයික්‍රොෆ්ට්. එතකොට දම්වැල සම්පූර්ණයි. අහා! මට වැරදීමක් නොවෙයි නම් ඔය තරප්පුව නැගගෙන උඩට එනව ඇහෙන්නෙ මයික්‍රොෆ්ට් විය යුතුයි. එයාම කියන්නෙ නැතෙයි විස්තරේ."

මොහොතක් ගතවෙද්දී උස, තරබාරු මයික්‍රොෆ්ට් හෝම්ස්, විසිත්ත කාමරය තුළට කැඳවාගෙන එන ලදී. උස්ව වැඩුණු ඇඟිබැම, විනිවිද යන බැල්මක් හෙළිය හැකි තියුණු නෙත් යුවළ, මයික්‍රොෆ්ට්ගේ කැපී පෙනෙන ලක්ෂණ විය. පළමු බැල්මෙන්ම ඔහුගේ අනෙක් සියලු ලක්ෂණ අභිභවා, කෙනෙකුගේ අවධානයට හසුවන්නේ මයික්‍රොෆ්ට්ගේ බුද්ධිමත් ස්වභාවයයි. ඔහුට පිටුපසින් අපේ කාමරයට ඇතුළුවූයේ ස්කොට්ලන්ඩ්යාඩ්හි අපේ හිතවත් ලෙස්ට්‍රේඩ්ය.

ඔවුන් දෙදෙනාගේම මුහුණු වල තිබුණේ බැරෑරුම් ස්වභාවයකි. එයින් පිළිබිඹු වූයේ උද්ගත වී ඇති ප්‍රශ්නයේ බරපතලකමයි. ලෙස්ට්‍රේඩ් අපට අතට අත දුන්නේ වචනයක් හෝ නොදොඩමිනි. තම බාහිර කබාය අපහසුවෙන් ඉවත් කළ මයික්‍රොෆ්ට් අසුනක හිඳගත්තේය.

"මේක අපේ ඔලූ අවුල් කරන විදියේ වැඩක් ෂර්ලොක්. මගේ සාමාන්‍ය පුරුදු ජීවිතය වෙනස් කරන්න මං කොහොමටවත් කැමැති නෑ. ඒ වුණාට මේ වගේ ඉහළ පෙළේ ප්‍රශ්නයක් මතු වුණාම මගේ අපහසුකම් කියල හරියන්නෙ නෑ. සියම් රට අද දවසේ මුහුණදෙන කලබල වල හැටියට, මා එක මොහොතක්වත් කාර්යාලයෙන් බැහැර වෙලා ඉන්න එක අවදානම්. නමුත් මේක බරපතල අර්බුදයක්. අග්‍රාමාත්‍යතුමා මේ තරම් කලබල වෙලා ඉන්නවා මං කවදාවත් දැකල නෑ. නාවික හමුදා මූලස්ථානය, අනෙක් පැත්ත පෙරළුණු මීවදයක් වගේ කැළැඹිලා. ඔබ මේ සිද්ධිය ගැන පුවත්පත් වල කියෙව්වද?"

"අපි මේ දැන් කියවා බැලුව විතරයි. මොනවද අර තාක්ෂණික කඩදාසි වගයක් කියල තිබුණේ?"

"අන්න ඒක තමයි ප්‍රශ්නෙ! වාසනාවකට වගේ ඒක හරියටම මොකක්ද කියන ආරංචිය පිටවී ගිහින් නැහැ. ඒ ආරංචිය දැනගත්ත

http://sherlockholmesinvestigations.blogspot.com

නම් පත්තර කාරයො මුළු රටම ගිනි තියාවි. අර ඉලන්දාරියගෙ සාක්කුවෙ තිබුණු ලියවිලි මොනවද දන්නවද? ඒ තමයි බ්රූස් - පාටිංටන් සබ්මැරීනයේ තාක්ෂණික සැලැසුම්."

මයික්රොෆ්ට් හෝම්ස් ගැඹුරු ලෙස කථාකළ විලාසයෙන්, එම මාතෘකාව වැදගත් එකක් විය යුතුයයි අපි සිතාගත්තෙමු. ඔහුගේ සොහොයුරාත් මමත් තවතත් විස්තර ඇසීමේ බලාපොරොත්තුවෙන් නිහඬව බලාසිටියෙමු.

"ඔබ ඒක ගැන අහල නැද්ද? මං හිතුව මේක හැමෝම දන්න දෙයක් කියල."

"නම පමණයි අපි අහල තියෙන්නෙ."

"මේ තරම් වැදගත් කාරණයක් අද දවසේ රාජ්‍ය තන්ත්‍රයටම නැහැ කිව්වොත් බොරුවක් නොමෙයි. ආණ්ඩුවේ තියෙන රහස් වලින්, වැඩියම උත්සාහයක් යොදා ආරක්ෂා කරන රහස බ්රූස් - පාටිංටන් සබ්මැරීනය ගැන තොරතුරුයි. මේක කොයිතරම් බලවත් යාත්‍රාවක්ද කිව්වොත්, ඒක තිබෙන පැත්ත පළාතක, සතුරෙකුට මුහුදේ යුද්ධ කරනවා තියා හිතන්නවත් බෑ. මේක නිෂ්පාදනය කිරීමේ තාක්ෂණික රහස්, බ්‍රිතාන්‍යයට පමණක් හිමිකරගැනීමයි අපේ අරමුණ. ඒ වෙනුවෙන් මහ විශාල ධන සම්භාරයක් අපි හොර රහසේම යෙදෙව්වා. ඒ, සබ්මැරීනය නිෂ්පාදනයේ ඒකාධිකාරය අපට ලබාගැනීමේ අරමුණෙන්. ඒකෙ නිෂ්පාදන සැලසුම් බොහොම සංකීර්ණ ඒ වගේම සියුම් ඒවා. සම්පූර්ණ සබ්මැරීනයේ යාන්ත්‍රණය සකස් වෙන්නේ මේ දක්වාත් ලෝකයේ කිසිම රටක් නොදන්න, නවීන සොයා ගැනීම් තිහක් ඒකාබද්ධ වීමෙන්.

ඒ රහස් සඟවලා තියෙන්නේ, වූලිච් යුද්ධායුධ නිෂ්පාදනාගාරයට අනුබද්ධ රහස්‍ය කාර්යාලයකයි. ලියවිලි ගබඩා කරල තියෙන්නෙ, කාටවත් පහසුවෙන් විවෘත කරන්න බැරි යකඩ සේප්පුවක. ගොඩනැගිල්ලේ දොරවල් ජනෙල් කිසිම ආකාරයකින් හොරෙකුට කඩන්න බෑ. මොනම හේතුවක් නිසාවත් ඒ සැලැසුම් කාර්යාලයෙන් පිටතට ගෙන යාම තහනම්. නාවික හමුදාවේ ඉහළම ඉංජිනේරුවාට සැලසුමක මොකක් හරි බලාගන්න උවමනා වුණොත්, ඔහු පෞද්ගලිකවම වූලිච් වල කාර්යාලයට ගිහිං ඒක බලාගන්න ඕන. නීතිරීති ඒ තරම් තදයි. ඒ වුණත් මෙන්න ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

ලියවිලි අපට හම්බ වෙනවා. රේල්පාරක් අයිනේ මැරී වැටී ඉන්න කනිෂ්ඨ ලිපිකරුවෙකුගේ සාක්කුවේ තිබිල. රාජකාරි මට්ටමෙන් බැලුවොත් මේක පිස්සු හැදෙන වැඩක්."

"ඉතින් ලියවිලි හැම එකක්ම ආපහු ලැබුණ ද?"

"නෑ ෂර්ලොක් නෑ. අන්න ඒක තමයි ප්‍රධානම ප්‍රශ්නෙ. අපට ඔක්කොම ලැබිල නෑ. වූලිච් වල සේප්පුවෙන් සැලැසුම් පිටු දහයක් අතුරුදන් වෙලා. කාඩෝගන් වෙස්ට්ගේ සාක්කුවේ තිබී හතක් හමුවුණා. අත්‍යාවශ්‍යම පිටු තුන එතැන නැහැ. හොරකම් කරල! අතුරුදන් වෙලා!

ෂර්ලොක්. ඔබ භාරගෙන තියෙන වැඩ, පටන් අරගෙන තියෙන වැඩ ඔක්කොම ඇත්තකට දමන්න. පොලිස් උසාවියේ කරන කුතුහලය උපදවන ගැටලු ඔක්කොම අහකට විසිකරන්න. මේක ජාතික ප්‍රශ්නයක්. අත්‍යාවශ්‍යයෙන්ම ඔබ විසඳා දිය යුතු ජාතික ප්‍රශ්නයක්. කාඩෝගන් වෙස්ට් සැලැසුම් හොරෙන් ගත්තෙ ඇයි? අර නැතිවුණු පිටු කෝ? ඔහු මියගියේ කොහොමද? මළසිරුර රේල්පාරක් අයිනට වැටුණේ කොහොමද? සිදුවෙලා තියෙන විනාශය, ආපහු යථා තත්ත්වයට හරවන්න කළ යුත්තේ මොකක්ද? හොයාගන්න ඔය ප්‍රශ්න වලට උත්තර. අන්න එතකොට ඔබ ඔබේ රට වෙනුවෙන් විශිෂ්ට සේවයක් කළා වෙනවා."

"මයික්‍රොෆ්ට් මොකද ඔය ප්‍රශ්නෙ ඔබම විසඳන්නෙ නැත්තෙ? මට පෙනෙන හැම දෙයක්ම ඔබටත් පෙනෙනවා නේද?"

"එහෙම වෙන්න පුළුවන් ෂර්ලොක්. නමුත් මට තියෙන ප්‍රශ්නය, මේකට අදාල තොරතුරු හොයාගන්න මහන්සි වෙන එකයි. ඔබ හොයාගන්න තොරතුරු. ඒවා මගේ අතට පත්කරන්න. මං හාන්සි පුටුවකට වෙලා ඒ ටික විශ්ලේෂණය කරන්නම්. එහෙම කරලා, දෙන්නම් විශේෂඥ අදහසක්. ඒ වුණාට අරහෙ මෙහේ දුවපැන ඇවිදින වැඩේ මට කරන්න අමාරුයි. දුම්රිය ගාඩ්වරුන්ගෙන් හරස් ප්‍රශ්න අහන ඒවා, උත්තල කාචයක් ඇහැට ළංකරගෙන බිම පෙරළිලා අඩි සටහන් සෝදිසි කරන ඒවා. ඒ දේවල් කරන්න මට ශක්තියක් නැහැ. ඒව මගේ පිළිවෙළේ වැඩ නෙමෙයි. මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් එකම මිනිහා ඔබයි ෂර්ලොක්. මහරැජිනගේ මීළඟ, ප්‍රභු ගෞරව සම්මාන ප්‍රදාන ලැයිස්තුවේ ඔබේ නමත් දකිමට කැමැති නම්. . . ."

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයා සිනාසෙමින් හිස සෙලෙව්වේ එයට තම එකඟතාවයක් නොමැති බව පෙන්වමිනි.

"මං මේ ගැටලු විසඳීම, අපරාධ පරීක්ෂණය කරන්නේ ඒ ක්ෂේත්‍රයට ඇති කැමැත්ත නිසා. සොහොම වුණත් මේකෙත් තියෙනවා, උනන්දුව ඇතිකරවන යම් යම් ලක්ෂණ කිහිපයක්. මේක පරීක්ෂණයට ලක්කරලා බලන්න මං බොහොම කැමැත්තෙන් භාරගන්නවා. මට තවත් විස්තර කියන්න බලන්න."

"ඉතාම වැදගත් අත්‍යවශ්‍යම කරුණු කිහිපයක් මං මේ කඩදාසියේ සටහන් කරගත්තා. ඔබට ප්‍රයෝජනවත් වියහැකි ලිපිනයන් කිහිපයකුත් එතැන තියෙනවා.

නාවික සැලැසුම් නිල වශයෙන් භාර නිලධරයා සර් ජේම්ස් වෝල්ටර්. ඔහුට ලැබී ඇති නම්බුනාම, පදක්කම් ලැයිස්තුව පමණක් ලියන්න, චරිතාපදාන විශ්වකෝෂයේ පේළි දෙකක් යනවා. ඔහු රජයේ සේවයේම ඉඳලා, වෘත්තියෙන්ම වයසට ගිය කෙනෙක්. ඒ හැම එකකටම වඩා, අචල දේශප්‍රේමයෙන් යුත් නියම අවංක මහත්මයෙක්. ඒ ගැන අපට කිසිම සැකයක් නෑ. මෙම යකඩ සේප්පුවට යතුරු තිබෙන දෙදෙනාගෙන් එක් කෙනෙක් ඔහු. සඳුදා කාර්යාල වේලාව තුළදී, මේ ලියවිලි කාර්යාලය ඇතුළත තිබුණු බවට කිසිම සැකයක් නෑ. ඊළඟට සවස තුනට විතර තමන්ගේ යතුරත් අරගෙන, සර් ජේම්ස් ලන්ඩනය කරා යන අදහසින් වූලිච් වලින් පිටත් වී ගියා. මේ සිද්ධිය වෙනකොටත් ඔහු මුළු හැන්දෑ වරුවම ගත කළේ, බාක්ලේ චතුරශ්‍රයේ පිහිටි අද්මිරාල් සින්ක්ලෙයාගේ ගෙදර."

"ඒ කාරණය කිසිදු සැකයකින් තොරව තහවුරු වී තියෙනවද?"

"ඔව්. ඔහුගේ සොහොයුරා, කර්නල් වැලන්ටයින් වෝල්ටර් සහතික කරනවා, සර් ජේම්ස් වූලිච් වලින් පිටත්වී ගිය බවට. ඔහු ලන්ඩනයට පැමිණි බවට, අද්මිරාල් සින්ක්ලෙයා සහතික වෙනවා. ඒ නිසා මේ ගැටලුවේ සැකය එල්ල වෙන අය අතරට සර් ජේම්ස් මැදිවන්නේ නෑ."

"සේප්පුවේ අනෙක් යතුර තිබුණේ කා ළඟද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු තමා සැලැසුම්කරු සහ ජ්‍යෙෂ්ඨ ලිපිකරු සිඩ්නි ජොන්සන් මහතා. ඔහු වයස අවුරුදු හතළිහක කෙනෙක්. විවාහකයි. ළමයි පස්දෙනෙක් ඉන්නවා. ඔහු සමාජ ආශ්‍රයට ප්‍රිය නැති, නිහඬ කෙනෙක්. නමුත් මහජන සේවයේ යෙදී සිටි කාලය පිළිබඳව ඔහුට විශිෂ්ට වාර්තාවක් තියෙනවා. සගයින් අතර ඒ හැටි ජනප්‍රිය කෙනෙක් නෙමෙයි. නමුත් ඉතා මහන්සි වී සේවය කරන්නෙක්. ඔහු දුන් කට උත්තරය ස්ථිර කිරීමට තිබුණේ, ඔහුගේ බිරිඳ දුන් සාක්ෂිය පමණයි. ඒකෙ හැටියට ජොන්සන් මහත්මයා සඳුදා හවස කාර්යාල වෙලාවෙන් පස්සේ ගෙදරින් පිටත ගියේ නැහැ. අර යතුර ඔහු සවිකර තියෙන්නේ සාක්කු ඔරලෝසුවේ දම්වැලට. ඒක එක මොහොතකටවත් එතැනින් ඉවත්වුණේ නැහැ."

"කාඩෝගන් වෙස්ට් ගැනත් අපට කියන්න."

"ඔහු අවුරුදු දහයක් මේ ආයතනයේ සේවය කරලා තියෙනවා. ඔහු හොඳින් රාජකාරි කළ අයෙක්. තදින් කේන්ති යන කෙනෙක් බවටත් ප්‍රසිද්ධයි. ඒ වගේම, ඉක්මන් තීරණ අරගෙන, ඉක්මනින් ක්‍රියාත්මක වෙන කෙනෙක්ලු. නමුත් ඔහු සම්පූර්ණයෙන්ම අවංක පුද්ගලයෙක් ලෙසයි හැඳින්වෙන්නේ. ඔහුට විරුද්ධව කිසි දිනෙක චෝදනාවක් එල්ල වෙලා නැහැ. සිඩ්නි ජොන්සන්ගේ දෙවැනියා හැටියට කටයුතු කළේ මේ තරුණයා යි. ඔහුගේ රාජකාරියේ හැටියට මේ රහස් සැලසුම් නිතරම පරිහරණය කරන්න ඔහුට සිදුවුණා. ඒවා වෙනත් කිසිකෙනෙකුට ඒ විදියට පරිහරණය කරන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ."

"එදා හැන්දෑවේ සැලසුම් ටික සේප්පුවට දමලා යතුරු දැම්මේ කවුද?"

"සිඩ්නි ජොන්සන්. ජ්‍යෙෂ්ඨ ලිපිකරු."

"නමුත් ඒක ඉවතට ගෙන ගියේ කවුද කියන එක හොඳටම පැහැදිලියි. එහෙම නේද? ඒවා කාඩෝගන් වෙස්ට්ගේ සාක්කුවේ තිබී හමුවුණා. ඒකෙන් ප්‍රශ්නයට විසඳුම ලැබෙනවා නේද?"

"ලැබෙනවා තමයි ෂර්ලොක්. නමුත් එතකොට අපට තේරුම් ගන්න අමාරු ප්‍රශ්න කිහිපයකුත් මෙතනදී මතුවෙනවා. එක්වරම අපට හිතෙනවා, ඇයි ඔහු ඒවා ඉවතට ගෙන ගියේ?"

"ඒවා බොහොම වටිනා ඒවා නිසා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඔහුට බොහොම පහසුවෙන් පවුම් දහස් ගණනක් ලබාගන්න තිබුණා." මයික්‍රොෆ්ට් කීය.

"මේවා ලන්ඩන් නගරයට ගෙනයන්න ඇත්තේ විකුණන අදහසින් කියනවා ඇරෙන්න, වෙනත් මොකක් හරි අරමුණක් ඔබට හිතන්න පුළුවන්ද?" ෂර්ලොක් හෝම්ස් ඇසීය.

"මට එහෙම මොකුත් හිතුන්න බෑ."

"හොඳයි එහෙම නම් අපේ උපකල්පනය ගොඩනැගීමේ පදනම හැටියට ඒක ගන්න පුළුවනි. තරුණයා සැලැසුම් හොරකම් කළා. හැබැයි ඔහුට ඒ සඳහා හොර යතුරක් උවමනායි. එහෙම නේද?"

හෝම්ස් ඇසුවේය.

"එකක් නෙමෙයි. හොර යතුරු කිහිපයක් උවමනායි. ඔහු පළමුව ගොඩනැගිල්ල විවෘත කළ යුතු වෙනවා. ඊළඟට යකඩ සේප්පුව තබා ඇති කාමරය විවෘත කළ යුතුවෙනවා." මයික්‍රොෆ්ට් පිළිතුරු දුන්නේය.

"එහෙම නම් ඔහු සතුව හොර යතුරු කිහිපයකුත් තිබුණා. ඔහු සැලැසුම් ටික ලන්ඩන් නගරයට ගෙන ගියා. ඒ, රහස විකුණා මුදල් ලබාගැනීමේ අරමුණෙන්. නමුත් සැකයක් නෑ; ඔහු බලාපොරොත්තු වෙන්න ඇති සැලැසුම් ටික පහුවදා උදේම ආපහු සේප්පුවට දමන්න. නැත්නම් ඒවා සේප්පුවේ නොමැති බව අහුවෙනවානෙ. මෙම චංචාකාරී කටයුත්තේ යෙදීමට ලන්ඩනයේ සිටියදී ඔහු මරණයට පත්වුණා." ෂර්ලොක් හෝම්ස් පැවසුවේය.

"ඔහු මරණයට පත්වුණේ කොහොමද?"

"අපි හිතමු ඔහු ලන්ඩන් සිට ආපහු වුලිච් බලා යමින් හිටිය කියල. දුම්රිය මැදිරියෙන් එළියට විසිවෙලා ඔහු මියගියා."

"නමුත් එතකොට මෙහෙම ප්‍රශ්නයක් එනවා" මයික්‍රොෆ්ට් කථාව ඇරඹුවේය.

"ඔහු ලන්ඩන් සිට වුලිච් යනවා නම්, මළසිරුර හමුවුණු ඇල්ගේට් වලට යන්න උවමනා නැහැ. ඒක තියෙන්නේ, වුලිච් පහුකරලා තවත් හුඟක් දුර යද්දී, කලින් කිව් දුම්රිය ස්ථාන දෙකට හුඟක් පිටින්."

Pending Permission for Print

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි මයික්‍රොෆ්ට් අපි මෙහෙම හිතමු. අදාළ දුම්රිය පොළේ බහින්නේ නැතුව, තරුණයා තවත් ටිකක් ඉදිරියට යනවා. ඒ මොකටද? දුම්රිය මැදිරියේ සිටි තවත් කවුරු හරි සමග ඔහු බොහොම ආකර්ෂණීය සාකච්ඡාවක් කරමිනුයි ඉන්නෙ.

මේ සාකච්ඡාව ටිකක් දරුණු ස්වභාවයක් ගත්තා. එහෙම වෙලා අන්තිමට ඒක ඔහුගේ මරණයෙන් කෙළවර වුණා. බොහොම වෙලාවට ඔහු දුම්රිය මැදිරියෙන් පිටවෙන්න උත්සාහ කරන්න ඇති. එනකොට දුම්රිය මාර්ගයට ඇදවැටී මියගියා. අනෙකා උදාර වහන්න ඇති. මේ දවස් වල ඝන මීදුම නිසා කිසිවක් නොපෙනී ගියා. එහෙම වෙන්න බැරිද මයික්‍රොෆ්ට්?"

"නැහැ ෂර්ලොක්. දනට අපට ලැබිලා තියෙන දත්ත වලට අනුව ඔය ඒකට වඩා පැහැදිලි නිගමනයක් ගන්න පුළුවනි. අපි දනට මෙහෙම හිතමු. කාඩොගන් වෙස්ට් තීරණය කරගෙන හිටියා, සැලැසුම් ටික හොරකම් කරලා ලන්ඩනයට රැගෙන එන්න. ඔහු මේ රහස් විදේශිකයෙකුට විකුණන්න බලාපොරොත්තු වුණා. ඒ විදේශ නියෝජිතයා හමුවෙන්න, වෙලාවක් නැනක් කල් ඇතිව තීරණය කර තියෙන්න ඇති. තරුණයා හැන්දෑවම මේ සඳහා වෙන් කරගෙන ඉන්න ඇති. නමුත් ඔහු රංග ශාලාවේ දර්ශනය සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් මිලට ගත්තා. ඒවා අරගෙන පෙම්වතියත් කැඳවාගෙනයි නගරයට ගියේ. නමුත් අතරමගදී එක්වරම අතුරුදන් වුණා. ඒ මොකටද?"

"අහික් අයට කොළේ වහන්න."

මෙතෙක් වෙලා නොඉවසිල්ලෙන් සිටි ලෙස්ට්‍රේඩ් කීය.

"ඉතාම සුවිශේෂ එකක්. ඒකයි පළමුවැනි විරෝධතාවය. දෙවැනි විරෝධතාවය මෙකයි. අපි උපකල්පනය කරමු ඔහු, ලන්ඩනයට ළඟාවෙලා විදේශ නියෝජිතයා හමුවුණා කියලා. නමුත් ඔහුවදා උදේ වෙන්න කලින් ඔහු සැලැසුම් ආපහු ගෙන ආ යුතුව තිබුණා. නැත්නම් ඔක්කොම හොරකම් අහුවෙනවා. ඔහු සැලැසුම් දහයක් ඉවතට ගෙන ගියා. නමුත් සාක්කුවේ ඉතිරි වී තිබුණේ හතයි. අනෙක් තුනට මොකද වුණේ? ඔහු කැමැත්තෙන්ම නම් කිසිසේත් ඒව කොහේ හරි දමලා එන්නෙ නෑ. ඊළඟට මේ ද්‍රෝහී ක්‍රියාව වෙනුවෙන් ඔහුට ලැබුණු තෑග්ග කෝ? ඔහු ඒ සැලැසුම් විකිණුවා නම් විශාල තෑගි මුදලක් ඔහු ළඟ තියෙන්න ඕනෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

මයික්‍රොෆ්ට් කරුණු ඉදිරිපත් කළේය.

"සිද්ධවුණේ මොකක්ද කියල මට නම් පැහැදිලිවම හිතාගන්න පුළුවනි." ලෙස්ට්‍රේඩ් තම අදහස පැවසීය.

"කිසිම සැකයක් නෑ. මෙන්න මේකයි වුණේ. ඔහු සැලැසුම් ටික ගෙනාවා, විකුණන අරමුණෙන්. විදේශ නියෝජිතයාව හමුවුණා. තරුණයා ඒකට ඉල්ලුවා විශාල මුදලක්. නියෝජිතයා ඒ ගණන ගෙවන්න සූදානම් නැහැ. මුදල ගැන එකඟතාවයකට එන්න ඔවුනට බැරිවුණා. තරුණයා ගෙදර එන්න පිටත් වුණා. නමුත් ඔහුට හොරෙන් විදේශිකයා, කාඩෝගන් වෙස්ට් පසුපස ආවා. දුම්රියේදී විදේශිකයා තරුණයාව මරා දැම්මා. විදේශිකයාට අත්‍යවශ්‍ය කඩදාසි ටික අරගෙන, මළසිරුර දුම්රියෙන් ඉවතට විසිකළා. මේක හැමදේකටම ගැළපෙනවා. එහෙම නේද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"ඔහුට මොකද දුම්රිය ප්‍රවේශ පත්‍රයක් නොතිබුණේ?" හෝම්ස් හරස් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය.

"ප්‍රවේශ පත්‍රය තිබුණා නම්, විදෙස් නියෝජිතයාගේ ගෙදරට කිට්ටුම දුම්රියපොළ මොකක්ද කියලා අපට හෙළිවෙනවා. ඒ නිසා ඔහු මියගිය තැනැත්තාගේ සාක්කුවෙන් ප්‍රවේශ පත්‍රය ඉවත්කර ගන්න ඇති."

"හොඳයි ලෙස්ට්‍රේඩ්. බොහොම හොඳයි" ෂර්ලොක් හෝම්ස් කීය. "ඔබේ කතාව ඇත්ත නම් පරීක්ෂණය එතැනින් ඉවරයි. ඒ මොකද එක පැත්තකින් ද්‍රෝහියා මැරිලා. අනෙක් පැත්තෙන් සබ්මැරීනයේ රහස් සැලැසුම් දැනටම විදේශ රටකට - යුරෝපා මහාද්වීපයට ගිහිං. අපට තවත් මොනවද කරන්න ඉතිරි වෙලා තියෙන්නේ?"

"ක්‍රියාත්මක වෙන්න ෂර්ලොක්! වහාම ක්‍රියාත්මක වෙන්න!" පැවසූ මයික්‍රොෆ්ට් අසුනෙන් නැගිට්ටේය.

"මට ඉවෙන් වගේ තේරෙනවා, ලෙස්ට්‍රේඩ්ගේ උපකල්පනය නම් සම්පූර්ණයෙන්ම වැරදියි කියලා. ඔබේ සම්පූර්ණ උත්සාහය මේකට යොදන්න ෂර්ලොක්. යන්න මළසිරුර හමුවුණු තැනට. අදාළ පුද්ගලයින් හමුවෙලා කතාබහ කරන්න. කරන්න පුළුවන් හැම දෙයක්ම කරන්න. ඔබ මේ වෘත්තියේ යෙදෙන්න පටන් ගත්තට

http://sherlockholmesinvestigations.blogspot.com

පස්සේ කිසිම දවසක, තමන්ගේ රට වෙනුවෙන් සේවය කළ හැකි මේ වගේ අවස්ථාවක් ඇවිල නෑ."

"හොඳයි. හොඳයි" හෝම්ස් පැවසුවේ දෙඋර හකුළුවා, අවිනිශ්චිත භාවය පළකරමිනි.

"වොට්සන් ලෙස්ට්‍රේඩ්. අපට තියෙනවා පැයක දෙකක වැඩ. අපි මුලින්ම ඇල්ගේට් දුම්රියපොළට ගිහිං බලමු. එහෙනම් ආයුබෝවන් මයික්‍රොෆ්ට්. හවස් වෙන්න කලින් ඔබට වාර්තාවක් සපයන්නම්. නමුත් මං දැන්ම කියන්න කැමතියි ඒ හැටි දෙයක් බලාපොරොත්තු වෙන්න එපා කියලා."

පැයක් ගතවෙද්දී අප තිදෙනාට ඇල්ගේට් දුම්රියපොළ වෙත ළඟාවීමට හැකිවිය. ඊළඟට අපි මළසිරුර හමුවූ ස්ථානයට ගියෙමු. එය දුම්රිය මාර්ගය ළඟම ඇතුළේ සිට එළියට මතුවෙන හරියේ, දුම්රියපොළට කිට්ටුම තැනකි. රතු පැහැති මුහුණක් තිබූ ආචාරශීලී වයසක මහත්මයෙක් දුම්රිය සමාගම වෙනුවෙන් අපට කරුණු කියා දුන්නේය.

"හරියටම මෙන්න මෙතැන තමයි තරුණයාගේ මළසිරුර තිබුණේ"

ඔහු කීවේ රේල්පීල්ලට අඩි තුනක් පමණ පිටතින් පිහිටි තැනක් පෙන්වමිනි.

"මිනිය ඉහළින් මෙතැනට වැටුණා වෙන්න බැහැ. ඒ මොකද ඔබට පෙනෙනවා නේ, වටේටම ඇති බිත්ති, ජනෙල් කවුළු කිසිවක් නොමැති සම්පූර්ණයෙන්ම වැහුණු ඒවා බව. ඒ නිසා ඒක මෙතැනට එන්න පුළුවන් එකම ක්‍රමය දුම්රියක් මගින්. අපට සොයාගන්න පුළුවන් හැටියට, ඒ සඳුදා මධ්‍යම රාත්‍රියේ පමණ මෙතැනින් ගිය දුම්රියක් විය යුතුයි."

"දුම්රිය මැදිරියක ඇතුළේ, පහරදීමක් නිසා ඇතිවූ ලේ ගලායාමක ලකුණු තිබෙනවාද කියල පරීක්ෂා කරල බැලුවද?"

"එහෙම කිසිවක් දකින්න ලැබුණෙත් නෑ. ප්‍රවේශ පත්‍රයක් තිබුණෙත් නෑ."

"මැදිරියක දොරක් විවෘත කර දමල තිබුණු බවක?"

"ඒත් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"අද උදේ අපට අලුත් සාක්ෂියක් ලැබුණා." ලෙස්ට්‍රේඩ් කිවේය.

"සඳුදා රෑ 11.40 ට ඇල්ගේට් පහුකර ගිය දුම්රියක මගියෙක් මෙක කිව්වෙ. ඔහුට ඇහුණාලු, බර යමක් - මිනිස් සිරුරක් වැනි දෙයක් ඇද වැටෙන හඬ. ඒ ඇහුණේ දුම්රිය ඇල්ගේට් දුම්රිය පොළට ළඟාවීමට මොහොතකට කලින්ලු. ඒ වෙලාවේ මීදුම සනව තිබුණු නිසා කිසිම දෙයක් දැකගන්න ලැබිලා නැහැ. ඔහු ඒ ගැන කිසිවෙකුට පැමිණිලි කරලා නැහැ. ඇයි ඒ සැරේ ෂර්ලොක් හෝම්ස් මහත්තයාට මොකද වෙලා තියෙන්නේ?"

මගේ මිත්‍රයා ඇසිපිය නොහෙළා බලා සිටියේ දුම්රිය මාර්ගයේ පිලි දෙසයි. උමග තුළින් එළියට ඇදුණු රේල්පිලි, වංගුව නිසා නැමී ඉදිරියට ආ ආකාරය ඔහුගේ අවධානයට ලක්විය. ඇල්ගේට් යනු දුම්රිය මං සන්ධියකි. නොයෙක් මාර්ග වලට දුම්රිය හරවා යැවෙන, මාර්ග ජාලයක් මෙහි පිහිටා තිබිණ. දෙතොල් එකට තදකරගෙන, ඇහිබැම ඉහළට ඔසවාගෙන, නාස්පුඩු පුම්බමින් හෝම්ස් බලා සිටියේ මාර්ග කිහිපයක් මේ ජාලය තුළ පිහිටා ඇති සැටියි.

"මොකද හෝම්ස් මහත්මයා, මොකක් හරි හෝඩුවාවක් තියෙනවාද?"

"අදහසක් ගන්න පුළුවන් යමක් තියෙනවා. ඊට වඩා මොකුත් නැහැ. නමුත් පරීක්ෂණයේ සිත් ඇදගන්නා බව එන්න එන්නම වැඩිවෙනවා. හරිම සුවිශේෂයි. දුම්රිය මාර්ගය අසල ලේ ගලා ගිය බවට සලකුණක් නම් නැහැ."

"ඔව්. කියන්න තරම් ලේ ගලාගිහින් තිබුණේ නැහැ." ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේය.

"ඒ වුණත් මට අහන්න ලැබුණේ තුවාලය ඉතා විශාල එකක් බවයි?"

"අස්ථිය සම්පූර්ණයෙන්ම පුපුරලා, කුඩුවී ගොස් තිබුණා. නමුත් එළියට ඒ තරම් විශාල තුවාලයක් දකින්න ලැබුණේ නැහැ."

"ඒ වුණත් ලෙස්ට්‍රේඩ්, යම් ප්‍රමාණයක ලේ ගැලීමක් තිබිය යුතුමයි. අර ආරංචිය දුන් මගියා පැවසූ දුම්රිය, මට පරීක්ෂා කරල බලන්න පුළුවන්ද?" හෝම්ස් ඇසුවේ දුම්රිය නිලධාරියාගෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මට කණගාටුයි හෝම්ස් මහත්මයා. මේ වෙනකොට ඒ දුම්රියේ පෙට්ටි වෙන්කරල, වෙනත්, වෙනත්, දුම්රිය එන්ජින් සමග විවිධ දිශා වලට යවල අවසන්."

"මං ඔබට සහතික වෙන්නම් හෝම්ස් මහත්මයා. . . ." ලෙස්ට්‍රේඩ් කීය.

". . . . සෑම දුම්රිය මැදිරියක්ම ඉතා හොඳින් පරීක්ෂා කරනු ලැබුවා. ඒ වැඩේ කෙරුණේ මගේ අධීක්ෂණය යටතේයි."

මගේ මිත්‍රයා සතු එක් පැහැදිලි දුර්වල කමක් විය. එනම් තමා අතින් තරම් බුද්ධිමත්ව, හොඳින්, අන් අය අතින් කටයුතු සිදුනොවුණු කල, ඒ ගැන දක්වන නොසන්සුන් භාවයයි.

"ඔව් වෙන්න පුළුවනි. නමුත් මට උවමනා වුණේ දුම්රිය මැදිරිය තුළ පරීක්ෂා කරන්න නෙමෙයි. වොට්සන් අපි මෙහේ කරන්න තියෙන වැඩකටයුතු ඔක්කොම අවසන්. ඔබට තවත් කරදර කරන්න අපට උවමනා වෙන්නේ නැහැ ලෙස්ට්‍රේඩ් මහත්මයා. දැන් පරීක්ෂණයේ ඉතිරි වැඩ සඳහා වුලිච් වලට යා යුතුයි."

ලන්ඩන් පාලම දුම්රියපොළේදී හෝම්ස් සිය සොහොයුරා වෙත යැවීම සඳහා විදුලිපුවතක් ලිව්වේය. එය යැවීම සඳහා භාරදීමට පෙර මට ද කියවීමට ලැබිණ.

***"අන්ධකාරය මධ්‍යයේ ආලෝකයක් දකිමි. එහෙත් එය ද නිවී යා හැකිය. එංගලන්තයේ සිටින විදේශික ඔත්තු කරුවන්ගේ, ලිපිනයන් සහිත සම්පූර්ණ ලේඛනයක්, පණිවුඩකරුවකු අත බේකර් වීථියට එවන්න.***

***ෂර්ලොක්"***

"මේකෙන් අපට සෑහෙන ප්‍රයෝජනයක් ලැබිය යුතුයි වොට්සන්." ඔහු පැවසුවේ වුලිච් බලායෑමට අප දුම්රියේ අසුන් ගනිද්දීයි.

"අයියට මං ස්තුතිවන්ත වෙන්න ඕනෙ. ඉතාම සංකීර්ණ පරීක්ෂණයක් අපට .භාරදීම ගැන."

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස්ගෙන් දිස්වූයේ බලාපොරොත්තු කඩ නොවුණු, තවමත් දැඩි උනන්දුවකින් හා ශක්තියකින් පිරුණු මුහුණකි. අලුත් ඉවක් ලැබුණු සුනඛයෙකු මෙන් ඔහුගේ අලුත් පිබිදීමක් විය. ඔහුට කරුණු වටහාගත හැකි අයුරෙන් නව මං පෙත් විවෘත වී ඇතුවා විය යුතුය.

"මට නම් තවමත් කිසිම දෙයක් පැහැදිලි නැහැ හෝම්ස්."

"අර මිනිහා මැරිල තියෙන්නේ වේන කොහේදි හරි වොට්සන්. ඔහුගේ මිනිය මෙහේට ආවේ දුම්රිය මැදිරියක වහල උඩ!"

"වහල උඩ?"

"හරිම පුදුමයි. එහෙම නේද? දුම්රිය අර පීලි ජාලය හරහා ගමන් කරමින් වංගුවලු ගන්නවා. එතකොට එය දෙපැත්තට පැද්දෙනවා. එහෙම තැනකදී මළසිරුර හමුවීම අහම්බෙන් සිදුවුණු දෙයක්ද? මැදිරියක වහළ උඩ තිබුණු දෙයක්, පැත්තකට පෙරළී විසිවෙන්න ඉඩ තියෙන්නෙ, ඒ වගේ තැනකදී නෙමෙයි ද? නමුත් දුම්රිය මැදිරිය ඇතුළෙ තිබුණු දේකට මේ වගේ බලපෑමක් ඇතිවෙන්නෙ නෑ. එක්කෝ මළසිරුර වහලෙන් පහතට වැටුණා එහෙමත් නැත්නම් පුදුමාකාර විදියේ අහඹු සිදුවීමක් වුණා.

ඊළඟට හිතන්න ලේ ගලායාම පිළිබඳ ප්‍රශ්නය. ලේ ගලායාම වෙනත් තැනකදී සිදුවුණු නිසා තමයි, දුම්රිය මාර්ගයේ ලේ ගැලීමක් සිදුනොවුණේ. හැම සාක්ෂියකින්ම අලුත් මහකට අපව යොමුකරවනවා. මේ ඔක්කොම එකතු වෙද්දි එතැන සෑහෙන බලයක් රැඳෙනවා."

"ඇයි ප්‍රවේශ පත්‍රය?" මම ඇසීමි.

"හරියට හරි. ප්‍රවේශ පත්‍රයක් නොතිබීමට හේතුවක් තිබුණේ නෑ. මේ විදියට වුණා නම් ඒකත් හරි. හැමදෙයක්ම එකිනෙකට ගැළපෙනවා."

"ඒක එහෙම වුණත්, අපට තවමත් මේ මරණය පිටුපස තියෙන අභිරහස සොයාගන්න අමාරුයි. දන් ඒක තිබුණටත් වඩා සංකීර්ණ වෙනවා." මම කීවෙමි.

"ඔව්, සමහරවිට" කී හෝම්ස් නිහඬව කල්පනා කිරීමට පටන් ගත්තේය. අපේ දුම්රිය වූලිච් දුම්රියපොළට ළඟාවෙනතුරුම ඒ නිහැඬියාව එලෙසම පැවතිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only Not For Print

දුම්රිය පොළේ දී කුලීරියක් කැඳවාගත් හෝම්ස්, මයික්‍රොෆ්ට් දුන් කඩදාසිය අතට ගත්තේය.

"අද හවස් වරුවේ අප යා යුතු තැන් කිහිපයක්ම තියෙනවා වොට්සන්. මුලින්ම යමු සර් ජේම්ස් වෝල්ටර් හමුවෙන්න."

මෙම ප්‍රසිද්ධ නිලධාරියාගේ නිවස ඉතා අලංකාර එකක් විය. හෝම්ස් ගඟ දක්වා විහිදුණු පුළුල් තණපිට්ටනි නිවස අවට පිහිටා තිබිණි. අප එහි ළඟා වෙද්දී මීදුම ක්‍රමක්‍රමයෙන් ඉවත් වී යාමට පටන්ගත්තා පමණය. සීනුව නාද කළ වහාම ගෘහසේවකයා අප පිළිගැනීමට ඉදිරියට පැමිණියේය.

"මහත්මයා. . . . සර් ජේම්ස්. . . ."

ඔහු කීවේ බැරෑරුම් හැඟුම් පළවූ මුහුණකින්.

"සර් ජේම්ස් අද උදේ මියගියා!"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! කොහොමද ඔහු මියගියේ?" හෝම්ස් ඇසුවේ පුදුමයෙනි.

"මහත්වරුනි. ගේ ඇතුළට ඇවිත් අසුන් ගන්න. ඔබට එතුමාගේ සොහොයුරා කර්නල් වැලන්ටයින් හමුවෙන්න පුළුවනි."

"ඔව්. ඒක වඩා හොඳයි."

මඳ ආලෝකයක් පැවැති විසිත්ත කාමරය වෙත අප කැඳවාගෙන යන ලදී. මොහොතකට පසු, මියගිය විද්‍යාඥයාගේ බාල සොහොයුරා අප වෙත පැමිණියේය. ඉතා උස්, කඩවසම් ශරීරයක් තිබූ ඔහුගේ වයස අවුරුදු පනහක් පමණ වන්නට ඇත. කර්නල් වැලන්ටයින්ගේ අවුල් වූ හිසකෙස්, දුර්වර්ණ වූ කම්මුල් හා විඩාපත් දෙනෙත් කියාපෑවේ, ඔහුනට හදිසියේ මුහුණදීමට සිදුවූ ඛේදජනක සිදුවීමයි. මරණය ගැන කථා කරද්දී කර්නල් වැලන්ටයින්ට වචන ගළපාගැනීමට පවා නොහැකි විය.

"මේකට හේතුවුණේ ඊයෙ පෙරේදා වුණු අපකීර්තිමත් සිදුවීම. මගේ අයියා සර් ජේම්ස්, ආත්ම ගරුත්වය ජීවිතය සේ සැලකූ සංවේදී පුද්ගලයෙක්. මෙවැනි දෙයක් සිදුවීම ඔහුට ඉවසගන්න බැරිවුණා. ඒකෙන් ඔහුට හෘදයාබාධයක් සැදුණා. ඔහු හැමදාමත් බොහොම ආඩම්බරයෙන් කථා කළේ, තමන්ගේ දෙපාර්තමේන්තුවේ

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණු කාර්යක්ෂම භාවය ගැන, මේ සිදුවීම ඔහුට හෙණ පහරක් වගේ වුණා."

"අපි බලාපොරොත්තුවෙන් ආවෙ, මේ ගැටලුව විසඳාගත හැකි තොරතුරු මොනවා හරි ඔහු අපට කියාවි කියල."

"මං ඔබට සහතික වෙන්නම්. ඔබටත් මටත් වගේම මගේ අයියටත් මේක අභිරහසක්ව පැවතුණා. දැනගෙන හිටි හැම දෙයක්ම ඔහු පොලීසියට දැනුම් දුන්නා. මේ සම්බන්ධයෙන් වරදකාරයා කාඩෝගන් වෙස්ට් බවයි, සර් ජේම්ස්ගේ මතය වුණේ. ඒ ගැන ඔහුගේ කිසිම සැකයක් තිබුණේ නෑ. නමුත් ඉතිරි හරිය කිසිදෙයක් ඔහුට හිතාගන්නවත් හැකියාවක් තිබුණෙ නැහැ."

"මේ ගැටලුව පැහැදිලි කිරීමට උදව් වියහැකි අදහසක් කියන්න ඔබට හැකියාවක් නැද්ද?" හෝම්ස් ඇසීය.

"මමත් ඒ හැටි දෙයක් දන්නෙ නැහැ මහත්මයා. පුවත්පත් වලින් දැනගත්ත හරිය පමණයි. ඊට අමතරව අහන්න ලැබුණු කාරණා. මං මේ ඔබට සහයෝගය නොදක්වනවා කියල හිතන්න එපා. හෝම්ස් මහත්මයා. ඔබට තේරෙනවා නේද? මේ අවස්ථාවෙ අපි හැමදෙනෙක්ම හරිම කම්පනයකට පත්වෙලයි ඉන්නෙ. ඒ හින්දා මං ඔබෙන් ඉල්ලා හිටිනවා මේ සාකච්ඡාව මෙතැනින් අවසන් කරමු කියලා."

"මේක අපි කොහොමටවත් බලාපොරොත්තු නොවූ දෙයක්."

මගේ මිත්‍රයා පැවසුවේ අප යළිත් කුලීරියට නැගගත් පසුයි.

"මං දන්නෙ නෑ, ඒ අසරණ මනුස්සයා ස්වාභාවික විධියට මියගියාද, එහෙමත් නැත්නම් සියදිවි හානිකර ගත්තද කියල. එයින් පසුව කිව් එක නම්, ඒක, වගකීම් පැහැර හැරීම ගැන තමාටම කරගත් දඬුවමක් වගෙයි. ඒ ප්‍රශ්නය විසඳීමට අපි අනාගතයට භාරකරමු. දැන් අපි ආයෙත් හැරෙමු කාඩෝගන් වෙස්ට් පැත්තට."

තරුණයාගේ නිවස පිහිටියේ ලන්ඩනයට ආසන්න පෙදෙසකයි. එය පිළිවෙළට තබාගත් කුඩා නිවසක් විය. අපට මුලින්ම හමුවූයේ ශෝකයෙන් කම්පාවට පත්වූ සිටි වෙස්ට් තරුණයාගේ මවය. ප්‍රයෝජනවත් යමක් අපට දැනගැනීමට නොහැකි තරමට, වයස්ගත කාන්තාව සොවින් වැළපෙමින් සිටියාය. ඇය අසලින්ම මුහුණ

http://sherlockholmesinvestigations.blogspot.com

සුදුමැලි වූ තරුණ කාන්තාවක් සිටියාය. තමා වයලට් වෙස්ට්බරි නම් වූ මියගිය තැනැත්තාගේ පෙම්වතිය බව ඇයම හඳුන්වා දුන්නාය.

"ඒක ඔබට කොහොම පහදල දෙන්නද කියල, මට නම් තේරෙන්නෙ නෑ හෝම්ස් මහත්තයා. මේ අපරාධය වුණු දවසෙ ඉඳල මට එක මොහොතක් නින්ද ගියේ නෑ. මං හිතනවා, හිතනවා, හිතනවා. කෙළවරක් නෑ. රෑ දවල් දෙකේම නොයෙක් දේවල් මගේ හිතට එනවා. මොකක්ද මෙතන ඇත්ත? ආතර් කියන්නෙ, වචනයෙන් විස්තර කරන්න බැරි තරම් තමන්ගෙ රටට ආදරය දැක්වූ අවංක කෙනෙක්. ඔහුට භාර දීල තිබුණු මේ රටේ වැදගත් රහසක් මුදලට විකුණන්න? එහෙම දෙයක් කරන්න කලින් ඔහු තමන්ගේ දකුණු අත කපා දමල ඉඳීවි. මේක මහ බොරුවක්. ආතර් ගැන හරිහැටි දන්න කෙනෙක් කිසිදාක මේව විශ්වාස කරන්නෙ නෑ."

"ඒ වුණත් වෙස්ට්බරි මෙනෙවිය, ඔහුගේ සාක්කුවේ තිබී ලියවිලි වගයක් හමුවුණා."

"ඔව් ඒක ඇත්තයි. නමුත් එවැන්නක් සිදුවුණේ කොහොමද කියල, මට හිතාගන්නවත් බෑ."

"ඔහුට මුදල් අගහිඟකමක් තිබුණද?"

"නෑ. ඔහුට තිබුණේ වියහියදම් ස්වල්පයයි. ලැබුණු පඩිය ඔහොවටත් වඩා වැඩි තරම්. ඔහු පවුම් සියගණනක් ඉතිරි කරගෙන තිබුණා. අපි ලබන අලුත් අවුරුදු දවස්වලට විවාහ වෙන්නයි හිටියේ."

"ඔහු මොනවා හරි කරුණක් නිසා මානසික කැළඹීමකට පත්වෙලා හිටියද? වෙස්ට්බරි මෙනෙවිය. මං ඔබෙන් ඉල්ලා හිටිනවා. දන්නා දෙයක් තියෙනවා නම් අපට අවංකව හෙළි කරන්න."

ඇගේ ස්වභාවයේ යම් වෙනසක් මගේ මිත්‍රයාගේ තියුණු ඇසට නිරීක්ෂණය වී තිබිණි. රතු පැහැ ගැන්වුණු ඇය, මඳක් පැකිළුණාය.

"ඔව්. එදා මට හිතුණා ඔහුගේ ඔලුවෙ මොකක් හරි ප්‍රශ්නයක් තිබුණා කියල."

"හුඟක් කල් ඉඳලද ඔබට එවැනි තත්ත්වයක් පෙනුණේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නෑ. පහුගිය සතියක විතර ඉඳන්. ඔහු කල්පනාවකට වැටිලා, නිතරම හිතේ කණගාටුවෙන් හිටියේ. වරක් මං ඔහුට තදින්ම කරදර කරලා මේ ගැන ඇහුවා. හිතේ කරදරයක් ඇති බවත්, ඒක කාර්යාලයේ ප්‍රශ්නයක් බවත් ඔහු මට කිව්වා."

"ඒක මහා බැරෑරුම් දෙයක්. ඒක ගැන මං ඔයාටවත් කියන්නෙ කොහොමද?"

ඔහු කිව්වා. ඒ ඇරෙන්න වෙන කිසිවක් මට ඔහුගෙන් අහගන්න බැරිවුණා."

"කියන්න වෙස්ට්බරි මෙනෙවිය. දිගටම කියාගෙන යන්න. ඔහුට විරුද්ධව යමක් වගේ පෙනෙන්න පුළුවනි. නමුත් කියන්න. ඒ මොකද ඒක යොමුවෙන්නෙ වෙනත් කෙනෙකුට වෙන්න පුළුවනි."

"ඇත්තමයි. මට කියන්න වෙනත් යමක් නෑ. සැරයක් දෙකක් මට හිතුණා ඔහු මොනවා හරි දෙයක් මට හෙළිකරන්න සූදානම් වෙනවා වගේ කියල. ඒක දවසක් හවස ඔහු කිව්වා, රහස් ලියවිලි වල ඇති වැදගත්කම ගැන. මට මතකයි ඔහු සඳහන් කළා, විදෙස් ඔත්තුකාරයෝ මේ ලියවිලි ගන්න විශාල මුදල් සම්භාරයක් ගෙවාවි කියල."

මගේ මිත්‍රයාගේ මුහුණේ දිස්වූයේ කණගාටුදායක බැල්මකි.

"වෙන මොනවද?"

"ඔහු කිව්වා මේවා ආරක්ෂා කරන්න රජයෙන් පියවර අරගෙන තියෙන හැටි හොඳ මදි; කවුරු හරි ද්‍රෝහී පුද්ගලයෙකුට ඒවා අරගන්න එක පහසු වැඩක් කියලා."

"එහෙම දෙයක් ඔහු සඳහන් කළේ හොඳටම ළඟදි දවසකද?"

"ඔව්. බොහොම මෑතකදි."

"ඒ අන්තිම දවසෙ හැන්දෑවේ මොකද වුණේ කියල දන් අපට කියන්න."

"රංග ශාලාවේ නාට්‍යයක් නරඹන්න යන්නයි අපි මුලින් තීරණය කරගෙන හිටියේ. මීදුම ඝනවූ නිසා, කුලීරියෙන් යාම ප්‍රයෝජනයක් නැහැ වගේ පෙනුණා. ඉතින් අපි පයින් ඇවිදගෙන ගියා. අපට යන්න තිබුණේ ඔහුගේ කාර්යාලය ළඟින්ම වැටී තිබුණු පාරේ. එක්වරම ඔහු ඝන මීදුම ඇතුළට දිව ගියා."

"එක වචනයක් වත් කථා නොකරම?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නුදුමයට පත් වූ බව හඟවන ශබ්දයක් ඔහුගේ කටින් පිටවුණා. එපමණයි. මං නුහක් වෙලා බලාගෙන හිටියා. නමුත් ඔහු ආපහු ආවෙ නෑ. ඊට පස්සේ මං ආපහු ගෙදර එන්න පිටත්වුණා. පහුවදා උදේ ඔවුන්ගේ කාර්යාලය විවෘතකරාම ඔවුන් ඇවිත් මගෙන් ප්‍රශ්න කළා. ඛේදජනක ආරංචිය අපට අහන්න ලැබෙද්දි දවල් දොළහ විතර වෙන්න ඇති. අනේ හෝම්ස් මහත්මයා! ඔහු තමන්ගේ ආත්ම ගෞරවය ගැන හිතූ කෙනෙක්. අන්න ඒ දේ ඔහු වෙනුවෙන් ලබා දුන්නොත් ඒක ලොකු සැනසීමක්."

එයට පිළිතුරු ලෙස හිස සෙලවූ හෝම්ස් ඇයගෙන් සමුගත්තේ දැඩි ශෝකයට පත් විලසිනි.

"අපි යමු වොට්සන්. අපට තවත් යන්න තැන් තියෙනවා. ඊළඟට අපි යන්න ඕනෙ කඩදාසි අතුරුදන් වූ කාර්යාලයට."

පැවසූ හෝම්ස් කුලීරියට නැඟුණේය.

"කලින් ලැබී තිබුණු සාක්ෂි වලින් මේ ඉලන්දාරියට විරුද්ධව චෝදනා එල්ල වී තිබුණා තමා. නමුත් අපේ පරීක්ෂණ වලින් පෙනෙන්නේ, ඔහුට විරුද්ධව කාරණා තව තවත් එකතු වෙන බවයි."

හෝම්ස් පැවසුවේ කුලීරිය ඉවතට යද්දීය.

"ළඟ එන විවාහ මංගල්‍යය නිසා, ඔහුට මුදල් උවමනායි. ඒ නිසා මෙවැනි අපරාධයක් කිරීමේ අරමුණක් තිබුණා කියල හිතන්න පුළුවනි. මේ සැලැසුම් විකුණන්න පුළුවන් කියන අදහස ඔහුගේ ඔළුවේ තිබුණා. ඇයි ඔහු ඒ ගැන වෙස්ට්බරි මෙනෙවිය සමග කියල තිබුණ නේ. තමන්ගේ වැඩපිළිවෙළ ගැන කියලා, තව ටිකෙන් ඔහු ඇයවත් මේ අපරාධයට හවුල්කරුවෙකු කරගන්නවා. හරිම නින්දා සහගතයි."

"ඒ වුණත් හෝම්ස් ඔහු බොහොම හොඳ චරිතයක් තිබුණු කෙනෙක්. අනෙක් කාරණය, ගැහැනු ළමයව මහපාරේ තනිකර දමල ඔහු මෙවැනි වංචනික ක්‍රියාවක් කරන්න යන්නෙ ඇයි?"

"ඒකත් බොහොම හරි! ඇත්තකින්ම ඔහුට පක්ෂවත් යම් යම් කාරණා නැතුව නෙමෙයි. නමුත් ඔහුට විරුද්ධව ඇති කාරණා බොහොම ශක්තිමත්."

http://sherlockholmesinvestigations.blogspot.com

ජොණ්ය ලිපිකරු වූ සිඩ්නි ජොන්සන් මහතා, ඔහුගේ කාර්යාලයේදී අප පිළිගත්තේය. මගේ මිත්‍රයාගේ ආගන්තුක පතේ සඳහන්ව තිබූ තනතුරට, නිසි ගෞරවය ලබාදීමට ජොන්සන් අමතක නොකෙළේය. මැදිවියේ සිටි ඔහුගේ, ගති පැවතුම් වල දකින්නට තිබුණේ රළු බවකි. ඔහු උපැස් යුගළක් පැළැඳි, කෙට්ටු උස පුද්ගලයෙකු විය. ජොන්සන් මහතාගේ දෑත් වෙව්ලමින් තිබූ ආකාරය මම දුටුවෙමි. ඒ ඔහුට අත්විඳින්නට සිදුවූ මානසික වධය නිසා ඇතිවූ කැළැඹීමෙන් සිදුවූවක් විය යුතුය.

"හරිම අවාසනාවක් හෝම්ස් මහත්මයා, හරිම අවාසනාවක්! අපේ ලොක්කගේ මරණය ගැන ඔබටත් අහන්න ලැබුණද?"

"අපි දැන් ටිකකට කලින් ඔහුගේ නිවසට ගියා."

"මේ කාර්යාලය දැන් සම්පූර්ණයෙන්ම අවුල් ජාලයක් වෙලා. ප්‍රධානියා මියගිහින්. කාඩොර්ගන් වෙස්ට් මියගිහින්. අපේ ලියකියවිලි හොරකම් කරලා. ඒ වුණත් පහුගිය සඳුදා හවස කාර්යාලය වහද්දි තත්ත්වය මෙහෙම නොවෙයි. රජයේ ඕනෑම කාර්යාලයක ගණනට අපි කාර්යක්ෂමව හිටියා. අනේ දෙවියනේ! මෙව හිතන්නවත් පුළුවන් වැඩද? මෙතරම් මිනිස්සු අතරින්, වෙස්ට් මෙහෙම වැඩක් කළා කියන එක අදහාගන්න පුළුවන්ද?"

"ඔහු මේ අපරාධය කළා කියලද ඔබ හිතන්නෙ?"

"වෙනත් විධියක් මට හිතාගන්න බෑ. ඒ වුණත් මට මාව විශ්වාස තරමටම තදබල විශ්වාසයක් ඔහු ගැනත් තිබුණේ."

"සඳුදා කාර්යාලය වැහැව්වේ කීයටද?"

"හවස පහට."

"ඔබද වැහැව්වෙ?"

"ඔව්. හැමදාම අන්තිමට මෙතැනින් පිටවෙලා යන්නෙ මමයි."

"සැලැසුම් තිබුණෙ කොහේද?"

"අන්න අර යකඩ සේප්පුවේ. මමයි ඒව ඒක ඇතුළට දැම්මේ."

"මේ ගොඩනැගිල්ලට මුරකරුවෙක් නැද්ද?"

"ඉන්නවා. නමුත් ඔහුට මේකට අමතරව අනෙක් ගොඩනැගිලි ගැනත් බලන්න සිදුවී තිබෙනවා. ඔහු හිටපු යුද්ධ හටයෙක්. බොහොම

http://sherlockholmesinvestigations.blogspot.com

විශ්වාසවන්ත මිනිහෙක්. එදා හැන්දෑවෙ ඔහුට කිසිම අමුතු දෙයක් දකින්න ලැබිල නෑ. නමුත් එදා බොහොම ඝන මීදුමක් මේ අවට පැවතුණා."

"අපි මෙහෙම හිතමු ජොන්සන් මහත්මයා. රාජකාරි වෙලාවෙන් පස්සෙ මේ කාර්යාලයට ඇතුළුවෙන්න කාඩෝගන් වෙස්ට්ට උවමනා වුණා. නමුත් සැලැසුම් ටික ගැනීමට අවශ්‍ය නම් ඔහුට ඒ සඳහා යතුරු තුනක් අවශ්‍ය වෙනවා. එහෙම නේද?"

"ඔව්. ඒක හරි. ගොඩනැගිල්ලේ පිටත දොරේ යතුර, මේ කාර්යාල දොරේ යතුර, සේප්පුවේ යතුර."

"ඔව්."

"නමුත් ඔය යතුරු තිබුණේ සර් ජේම්ස් වෝල්ටර් ළඟත්, ඔබ ළඟත් පමණයි?"

"මා ළඟ තියෙන්නේ යකඩ සේප්පුවේ යතුර පමණයි. දොරවල් දෙකේ යතුරු මා ළඟ නැහැ."

"සර් ජේම්ස් බොහොම පිළිවෙළකට වැඩකරන කෙනෙක්ද?"

"ඔව්. මං හිතන්නේ ඔහු පිළිවෙළකට වැඩ කළා. ඔහු ඒ යතුරු තුනම තබාගෙන හිටියේ එකම යතුරු කැරැල්ලක. මං ඒක ඕනෙ තරම් දැකල තියෙනවා."

"ඒ යතුරු කැරැල්ල ඔහු ලන්ඩනයට රැගෙන ගියා?"

"ඔහු එහෙමයි කිව්වෙ."

"ඔබේ යතුර කිසිම දවසක ඔබේ භාරයෙන් පිටවුණේ නැහැ?"

"කිසිදවසක එහෙම වුණේ නැහැ."

"හොඳයි. මේ වැඩේ කළ තක්කඩියා වෙස්ට් නම්, ඔහු ළඟ සේප්පුවට හොර යතුරක් තියෙන්න ඇති. ඒ වුණත් ඔහුගේ සාක්කුවල තිබී එවැන්නක් හමුවුණේ නැහැ. තවත් කාරණයක් තියෙනවා මහත්මයා. අපි හිතමු සබ්මැරීනයේ රහස් සැලසුම් කාට හරි හොරෙන් විකුණන්න, ලිපිකරුවෙකුට උවමනා වුණා කියල. එතකොට මුල් පිටපත් හොරකම් කරගෙන යනවට වැඩිය පහසු නැද්ද, ඒවා පිටපත් කරගෙන යන් එක?"

Reading Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

"සාර්ථක පිටපතක් සාදාගන්න නම් ඒකට මේ ක්ෂෙත්‍රය ගැන හොඳ තාක්ෂණික දැනුමක් තියෙන කෙනෙක් වෙන්න ඕන. සාමාන්‍ය කෙනෙකුට ඒක කරන්න බෑ."

"මං විශ්වාස කරනවා සර් ජේම්ස්ටත්, ඔබටත්, වෙස්ට්ටත් ඒ තාක්ෂණික දැනුම තියෙනවා කියල?"

"සැකයක් නෑ ඒ දැනුම අපට තියෙනවා. ඒ වුණත් මං ඔබට ආයාචනය කර සිටිනවා, හෝම්ස් මහත්මයා. කරුණාකරල මාව මේකට පටලවා ගන්න එපා. නැතිවූ සැලැසුම් වෙස්ට්ගේ සාක්කුවේ තිබිල හමුවුණා නේ. මෙහෙම සැක පහළ කරමින් අනුමාන කිරීමේ ඇති තේරුම මොකක්ද?"

"හොඳයි ජොන්සන් මහත්මයා. මෙන්න මේක ගැන ඔබ මොනවද කියන්නේ? මුල් පිටපත වගේම ප්‍රයෝජනයක් ගන්න පුළුවන් පිටපතක් සකස් කරගන්න දැනීමක් ඔහුට තිබුණා නම්, කාඩෝගන් වෙස්ට් ඇයි මුල් පිටපත්ම හොරකම් කළේ? එහෙම අවදානම් කාර්යක් ඔහු කරාවි කියල හිතන්න අමාරුයි නේද?"

"හිතන්න අමාරුයි. නමුත් ඔහු ඒක කළා" ජොන්සන් පිළිතුරු දුන්නේය.

"මෙම සිද්ධිය ගැන කළ හැම පරීක්ෂාවක දීම තේරුම් ගන්න බැරි යමක් එළියට ආවා. අර රහස් සැලසුම් දහයෙන් හතයි නේද හමුවුණේ? තුනක් තවමත් අතුරුදන්. මට අහන්න ලැබුණු විදියට වැදගත්ම ඒවා තමා ඒ තුන?"

"ඔව් ඒක හරි."

"එයින් ඔබ අදහස් කරන්නේ, ඒ සැලැසුම් තුන ලැබුණු පුද්ගලයින්ට, මේ සැලැසුම් හත නැතිවුණත් බිරූස්-පාටිංටන් සබ්මැරීනය හදන්න පුළුවන් කියලද?"

"නාවික හමුදාවේ ප්‍රධානීන්ට මං වාර්තා කළේ එහෙමයි. නමුත් අද මම අර සැලසුම් තවදුරටත් පරීක්ෂා කරල බැලුවා. දැන් මට හිතෙනවා, අර තුනෙන් විතරක් සබ්මැරීනය හදන එක ලේසිවෙන එකක් නැහැ කියල. ඒකට හේතුව, සබ්මැරීනයේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වෙන ද්විත්ව කපාට පද්ධතියක් තියෙනවා. ඒක ස්වයංක්‍රියව ඇරෙන-වැහෙන විදියටයි මේ නව නිර්මාණයේ සැලසුම් කරලා තියෙන්නෙ. ඒක අලුත්ම සොයා ගැනීමක්. වෙංට්ගේ

http://sherlockholmesinvestigations.blogspot.com

සාක්කුවක තිබිලා ආපහු ලැබුණු කඩදාසියක තමයි, ඒ ස්වයංක්‍රීය කපාට වල සැලැස්ම හා තාක්ෂණික විස්තර තියෙන්නෙ. එතකොට අර අනෙක් සැලැසුම් අහුවුණාට, විදේශිකයන්ට සම්මැර්නය හදන්න ලැබෙන්නෙ නෑ. ස්වයංක්‍රීය කපාට ක්‍රමය ඔවුනට අමුතුවෙන්ම හොයාගන්න සිදුවෙනවා. නමුත් ඉතින් ඒ හොයාගැනීම ඉක්මන් කරන්න බැරිවේවි කියල මා කියන්නේ නෑ."

"කොහොම වුණත් නැතිවී ඇති සැලැසුම් තුනයි හුඟක්ම වැදගත්?"

"ඔව්. ඒකෙ කිසිම සැකයක් නෑ."

"දන් ඔබේ අවසරය ඇතිව මේ කාර්යාලයේ ඇවිදලා, පරීක්ෂා කර බලන්න මං කැමතියි. ඔබගෙන් ඇසිය යුතු වෙනත් ප්‍රශ්නයක් මගේ සිහියට එන්නෙ නෑ."

හෝම්ස් යකඩ සේප්පුවේ අගුළු, දොරගුළු හා යකඩෙන් තනා තිබූ ජනෙල් ආවරණ පරීක්ෂා කර බැලුවේය. එහෙත් ඔහුගේ උනන්දුව වඩාත් තියුණු මුහුණුවරක් ගත්තේ, අප ගොඩනැගිල්ලෙන් පිටතට පැමිණ, ඒ සමීපයේ පිහිටි තණකොළ මිදුලට පා තැබූ පසුවයි. ජනේලයෙන් පිටත විශාල මල් පඳුරක් විය. එහි අතු කිහිපයක්ම කැඩී, බිඳී ඇඹරී ගොස් ඇති බව දක්නට ලැබිණි. හෝම්ස් තම කාචයෙන් අතු වල එම පළුදුවීම් පරීක්ෂා කර බැලුවේය. ඉන්පසු පොළොවේ වූ යම් නොපැහැදිලි සටහන් කිහිපයක් කෙරෙහිද ඔහු අවධානය යොමු කළේය. අවසන් වශයෙන් ඔහු ප්‍රධාන ලිපිකරුවාගෙන් ඉල්ලා සිටියේ, ජනෙල් ආවරණය කිරීමට ඇති දිගු යකඩ පියන් වසන ලෙසයි. එවිට එම පියන් දෙක, මැදින් එකිනෙකට ළං නොවෙන බව හෝම්ස්, මට පෙන්වා දුන්නේය. ගොඩනැගිල්ලෙන් පිටත සිටි අයෙකුට, ඒ විවරය තුළින් ආරක්ෂක කාමරය තුළ සිදුවන දේ නැරඹීමට හැකියාවක් තිබිණ.

"දවස් තුනක ප්‍රමාදයෙන් සාක්ෂිවාවල් ඔක්කොම විනාශ වෙලා. ඒවායෙන් ප්‍රයෝජනයක් වෙන්නත් තිබුණා; නොවෙන්නත් තිබුණා. ඉතින් වොට්සන්, මං හිතන්නේ නෑ වුලිච් වලින් අපට හොයාගත හැකි තවත් මොනවා හරි ඇති කියල. මෙහෙන් හෙළාගැනීමට හැකි වූ අස්වැන්න ප්‍රමාණය බොහොම ස්වල්පයයි. බලමු ලන්ඩන් නගරයේදී මීට වඩා යමක් කළ හැකි වේවිද කියල."

http://sherlockholmesinvestigations.blogspot.com

එහෙත් වුලිච් දුම්රියපොළෙන් පිටත්වී යාමට පෙර අපේ අස්වැන්නට තවත් කරුලක් එකතුකර ගැනීමට හැකිවිණි.

"මහත්මයා පසුගියදා ඇල්ගේට්හි දුම්රිය මාර්ගය අසල මියගොස් සිටි කාඩොගන් වෙස්ට් නම් තරුණයා පිළිබඳවයි අප පරීක්ෂණ පවත්වන්නේ. සඳුදා රාත්‍රී ප්‍රවේශපත්‍ර කවුළුවේ රාජකාරී කළ මහත්මයා හමුවෙන්න පුළුවන්ද?"

හෝම්ස් දුම්රිය ස්ථානාධිපතිගෙන් විමසුවේය. එම ප්‍රවේශ පත්‍ර නිකුත් කරන්නා හමුවීමට අපට අවස්ථාව සලසා දෙන ලදී.

"ඔව් මහත්මයා. වෙස්ට් මහත්මයාට ප්‍රවේශ පත්‍රය අලෙවි කළේ මමයි. දීර්ඝ කාලයක් තිස්සේ මේ දුම්රියපොළෙන් රැකියාවට යන එන කෙනෙක් නිසා මං ඔහුව හොඳට අඳුනනවා."

"ඔහු පිටත්වී ගියේ කොයි වෙලාවේද?"

"ඔහු ගියේ රෑ අටයි කාලේ දුම්රියෙන්."

"ඔහු ප්‍රවේශ පත්‍රයක් මිලට ගත්තද?"

"ඔව් මහත්මයා. මට හොඳට මතකයි. ඔහු මිලට ගත්තේ ලන්ඩන් පාළම දුම්රියපොළට ප්‍රවේශ පතක්."

"ඔබට හොඳට විශ්වාසයි?"

"ඔව්."

"ඔහු ප්‍රවේශ පත්‍ර කීයක් ගත්තද?"

"එකයි. එක් තුන්වැනි පංතියේ ප්‍රවේශ පත්‍රයක්. ඒ වෙලාවේ ඔහු සිටියේ හරිම කැළැඹීමෙන්. හරි කලබලයකින්. ඔහුගේ ඉතිරි මුදල් වශයෙන් කාසි හතඅටක් මම දුන්නා. කලබලගතිය නිසා ඒවා එකතුකර ගැනීමේ හැකියාවක් ඔහුට තිබුණේ නෑ. පස්සේ මං ඒ කාසි ටික එකතුකරලා ඔහුගේ අතලෙන් තැබුවා."

දුම්රිය කාලසටහන පරීක්ෂා කිරීමේදී අපට මෙම කරුණ සහිටුහන් විය. රාත්‍රී 7.30 ට පමණ වෙස්ට්බරි මෙනෙවිය හැරදමා පැමිණි තරුණයාට පිටත්වී යාමට තිබූ පළමුවැනි දුම්රිය රාත්‍රී 8.15 දුම්රියයි.

"අපට ලැබී ඇති කරුණු අනුව උපකල්පනයක් ගොඩනගන්න උත්සාහ කරල බලමු වොට්සන්."

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් පැවසුවේ පැය භාගයක පමණ නිහඬතාවයකට පසුවයි.

"අපි දෙන්නා හවුලේ පරීක්ෂණ කීයක් නම් කළාද? ඒත් තීරණයකට එන්න මේ තරම් අමාරු එකකට අපි මුහුණ දුන්නද කියලා මට නම් මතක නැහැ. මොනවා හරි අලුත් දෙයක් සොයාගෙන ඉදිරියට යන්න හදනකොට, ඉක්මනින් තවත් අලුත් බාධකයක් මතුවෙනවා. ඒ වුණත් අපි සෑහෙන තරම් සතුටුදායක ලෙස ඉදිරියට ගිහින් තියෙනවා.

වුලිච් වලදී අපට අහන්න ලැබුණු දේවල් හැම එකක්ම වගේ කාඩොගන් වෙස්ට්ට එරෙහිව ඉදිරිපත් වූ ඒවා. නමුත් ඔහුගේ කාර්යාලයේ ජනේලය අවටින් දකින්න ලැබුණු දෙයින් නම් තරුණයාට වාසිදායක යමක් සිදුවී ඇති බව හිතන්න පුළුවන්.

නිදසුනක් වශයෙන් අපි හිතමු, විදේශික ඔත්තුකාරයෙක් මේ තරුණයා හම්බවෙලා කතාබහ කළා කියල. එහෙම සාකච්ඡාවක් කෙරුණ නම්, ඒක වෙන්නෙ එක කොන්දේසියක් උඩයි. එනම් ඒ ගැන කිසිම දෙයක්, වචනයක් වත් කාටවත් හෙළිකරන්න එපා කියන පොරොන්දුව උඩ. මය කරුණු නිසා ඔහු මානසික වශයෙන් යම් කැළැඹීමකට පත්වෙනවා. ඔහු තමන්ගේ පෙම්වතියට කියා තිබූ දෙයින් ඒ බව සනාථ වෙනවා.

ඊළඟට අපි මෙහෙම හිතමු. ඔහු තමන්ගේ පෙම්වතිය සමග රඟහලට යමිනුයි ඉන්නෙ. හදිසියේම මීදුම තුළින් ඔහු දකිනවා, අර විදේශීය නියෝජිතයා තමන්ගේ කාර්යාලය පැත්තට යනවා. වෙස්ට් බොහොම ඉක්මනින් හදිසි තීරණ ගන්න කෙනෙක්. ඔහුගේ හිතට එන්නෙ තමන්ගේ රාජකාරිය, වගකීම. ඔහු පෙම්වතිය අමතක කරල තමන්ගේ යුතුකම් සිහිකරනවා. තරුණයා අර මිනිහා පස්සෙන් යනවා. ජනේලයට ළඟාවෙනවා. රහස් ලියවිලි ටික විදේශිකයා ගන්න හැටි දකිනවා. හොරා පස්සෙන් ලුහුබැඳ යනවා. ඔන්න එතකොට අපට මුලදී මුහුණ දෙන්න වුණු දුෂ්කර තාවයක් මඟහැරී යනවා. ඒ මොකක්ද? සැලැසුම් වලින් පිටපත් සකස්කරගන්න තමන්ට හැකියාව තියෙද්දී, අවදානම් විදියට මුල් පිටපත් හොරකම් කරගන්න කෙනෙක් පෙළඹෙන්නෙ නැහැ. නමුත් විදේශික

http://sherlockholmesinvestigations.blogspot.com

ඔත්තුකාරයා නම් මුල් පිටපත හොරා ගත යුතුමයි. ඒ තරම් දුරට අපේ උපකල්පනය ශක්තිමත්."

"එතකොට සැඟැසුම් හොරකම් කළේ තරුණයා වෙන්න බැහැ. එහෙම නේද?" මම ඇසීමි.

"ඔව්."

"ඔබේ ඊළඟ පියවර මොකක්ද?"

"ඔන්න එතකොටයි අපට ඊළඟ අමාරුකම් වලට මුහුණපාන්න වෙන්නෙ. කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවනි. අර වගේ දෙයක් දුටුවාම කාඩෝගන් වෙස්ට්ගේ පළමුවැනි ප්‍රතිචාරය මොකක්ද? ඔහු තක්කඩියාව අල්ලාගෙන කෑගහලා අනතුරු අඟවනවා. ඔහු එහෙම නොකළෙ ඇයි? එහෙම නම් සැලසුම් හොරකම් කළේ කාර්යාලයේ ඔහුගේම ලොක්කෙක්ද? අන්න එතකොට වෙස්ට් මෙහෙම හැසිරුණේ ඇයි කියන එක පැහැදිලියි.

එහෙමත් නැත්නම් මෙහෙමද? ලොක්කා වෙස්ට්ට අහුනොවී, මීදුම් පටලයේ සැඟවිලා පැනලා යනවා. ඔහු යන්නේ ලන්ඩනයට බව තරුණයා දන්නවා. හොරාව අල්ලා ගැනීමේ අරමුණෙන් ඔහුත් යනවා, හොරා පිටුපසින් ලන්ඩනයට. තරුණයා දන්නවා, ලොක්කා ලන්ඩනයේ නැවතී ඉන්නේ කොහේද කියලා. ඒ වෙලාවෙ වහාම පිටත්වී යන එක තරුණයාට අත්‍යවශ්‍ය වුණා. එහෙම නැත්නම් තමන්ගේ පෙම්වතිය ඝන මීදුමේ තනිකරලා, ඔහු කොහොමටවත් යන්නෙ නැහැ. ඇයට විස්තර කර කර ඉන්න හෝ ආපහු ඇවිත් දැනුම්දීල යන්න ඔහු ප්‍රමාද වුණෙත් නෑ. එච්චරයි. මෙතැනින් එහාට අපට මොකුත් හිතාගන්න අමාරුයි.

අපට මෙතැනින් ඉදිරියට යාමට, ප්‍රමාණවත් තරම් හෝඩුවාවක් ලැබිල නැහැ. මෙතැන සිට, දුම්රියක වහලේ ඔහුගේ මළසිරුර හමුවුණු තැන දක්වා සියල්ල නොපැහැදිලියි. දැන් මම හිතාගත්තේ කරුණු හොයා බැලීම අනික් කෙළවරෙන් පටන් ගන්න. මයික්‍රොෆ්ට් අපට අවශ්‍ය ලිපිනයන් ලබාදී තියෙනවා නම්, උවමනා කරන මිනිහා හොයාගෙන යෑමට අපට හැකිවිය යුතුයි."

අප බේකර් වීථිය වෙත පැමිණෙන විට හෝම්ස් නමට ලිපියක් ලැබී තිබිණ. නැපෑලේ වේගය පරදවමින් එය රැගෙන විත් තිබුණේ රජයේ පණිවුඩකරුවකු විසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"සුළු පරිමාණයේ උන් හුගක් ඉන්නවා. නමුත් මේ වගේ මහා පරිමාණයේ එකකට අතගැසීමට ඉඩ ඇති අය ඉන්නේ කිහිපයයි. මේ අය ගැන සලකා බැලීම වටී.

| | | |
|---|---|---|
| ඇඩොල්ෆ් මේයර් | - | 13 ග්‍රේට් ජෝර්ජ් වීථිය වෙස්ට්මින්ස්ටර් |
| ලුවී ලා රෝතියර් | - | කැම්ඩන් මන්දිරය නොටිංහිල් |
| හියුගෝ ඔබර්ස්ටයින් | - | 13 කෝල්ෆීල්ඩ් උද්‍යානය, කෙන්සිංටන්. |

අන්තිමට සඳහන් කර ඇති පුද්ගලයා සඳුදා ලන්ඩන් නගරයේ ගැවසුණු බවට වාර්තා වී ඇත. නමුත් දැන් ඔහු පිටව් ගොස් ඇතිබවට ආරංචියි. යම්කිසි දියුණුවක් ඔබ ලබා ඇති බව ඇසීමටත් සතුටුයි. ඔබගේ අවසන් වාර්තාව ලැඹෙන තුරු කැබිනට් මණ්ඩලය නොඉවසිල්ලෙන් බලා සිටියි. පාලන තන්ත්‍රයේ ඉහළින්ම ඔබට සහයෝගය පළවී ඇත. ඔබට අවශ්‍ය නම්, රජයේ සම්පූර්ණ ආරක්ෂක ශක්තිය ඔබ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ඕනෑම මොහොතක සූදානමින්.

මයික්‍රොෆ්ට්."

"වොට්සන්. අර හම්ටි ඩම්ටි ළමා ගීතයේ වගේ මෙතැනදීත් රජතුමාගේ අශ්වයින්ටයි, රජතුමාගේ සේවකයින්ටයි මේ ප්‍රශ්නය විසඳීමට මොකුත්ම කරන්න බෑ." හෝම්ස් කීවේ සිනාසෙමිනි.

ඔහු ලන්ඩන් නගරයේ විශාල සිතියමක් මේසය මත දිග හැරියේය. මීළඟට දැඩි අවධානයකින් තැන් තැන් සෝදිසි කිරීමට පටන් ගත්තේය. මඳ වේලාවක් ගතවෙද්දී ඔහු යමක් සොයාගෙන සෑහීමට පත් වූ බවක් පෙනිණ.

"ඔන්න බඹරය අපේ පැත්තටත් යන්නම්න් කැරකෙන්න පටන් ගන්නා හැඩයි වොට්සන්. මට අවංකවම හිතෙනවා මොන තරම් කරදර වෙලා හරි, අන්තිමේදී අපට මේ ගැටලුව ලිහාගන්න හැකිවේවි

http://sherlockholmesinvestigations.blogspot.com

කියල. "හෝම්ස් මගේ පිටට පහරක් ගැසුවේ හිතේ එක්වරම ඇතිවූ අතිශය සතුටකිනි.

"මං දැන් ටිකකට එළියට යනවා. නමුත් ඒ, සතුරන්ගේ පා සටහන් වැටී තිබෙන්නේ මොන පැත්තටද, ප්‍රහාරය අරඹන්න පුළුවන් මොන පැත්තෙන්ද කියල පරීක්ෂා කරල බලන්න විතරයි. මගේ විශ්වාසවන්ත මිත්‍රයා සහ චරිතාපදාන සටහන්කරුවා අත ළඟින්ම නැතුව කිසිම වැදගත් කටයුත්තක් මම අරඹන්නෙ නෑ. ඔබ මෙහේ දිගටම රැඳී ඉන්නවද? බාග වෙලාවට තවත් පැයක් හෝ දෙකක් ගතවෙද්දී මං ආපහු එන්නත් ඉඩ තියෙනවා. මං හුහක් ප්‍රමාද නම් කඩදාසියි පෑනයි ළඟට අරගෙන, කථාවක් ලියන්න පටන් ගන්න වොට්සන්. මාතෘකාව; අපි රට බේරා ගත් හැටි. . . ."

ඔහුගේ සිතේ ඇතිවූ ප්‍රමෝදය මගේ සිතේ ද සැහැල්ලුවක් ඇති කළේය. හෝම්ස්, තම සිතේ ඇතිවන තෘප්තිමත් හැඟීමක් එතරම් පහසුවෙන් පිටතට පෙන්වන පුද්ගලයෙක් නොවේ. එසේ වුවත් අද ඔහු ඒ ප්‍රතිපත්තියෙන් ඈත්වී ඇත. එයට සැහෙන තරම් විශේෂ හේතුවක් තිබිය යුතුය. හැන්දෑවරුව පුරා මම නොඉවසිල්ලෙන් ඔහු එනතුරු බලා සිටියෙමි. රෑ නවය පසුවෙද්දී ලියුම් කැබැල්ලක් රැගත් පණිවුඩ කරුවෙක් අපේ නිවසට පැමිණියේය.

***"කෙන්සිංටන්හි ග්ලෝස්ටර් පාරේ ගෝල්ඩිනි අවන්හලේ රෑ කෑම ගනිමින් සිටිමි. මා සමග කෑම ගැනීමට වහාම පැමිණෙන්න. ඔබ එනවිට නියනක්, අඳුරු කළ හැකි ලන්තෑරුමක්, අගුළු අරින කටුවක් සහ ඔබේ රිවෝල්වරය ගෙන එන්න.***

***එස්. එච්"***

මුළු නගරයම මීදුමෙන් වැසී ඇත. ගෑස්ලාම්පු වලින් විහිදෙන්නේ මඳ ආලෝකයකි. හෝම්ස් මට ගෙන ඒමට නියම කළ උපකරණ කට්ටලය මගේ සිතේ බරක් ඇති කිරීමට සමත් විය. ඒවා මෙවැනි මහත්මයෙකු විසින් ගෙනයෑමට කිසිසේත් සුදුසු ඒවා නොවේ. මගේ පිට කබායේ ඇතුළු සාක්කුවක ඒවා සඟවාගෙන, කුලීරියක නැඟී, ගෝල්ඩිනි අවන්හල බලා පිටත්වී ගියෙමි. එහි

http://sherlockholmesinvestigations.blogspot.com

ඉදිරි දොරටුව කිට්ටුව රවුම් මේසයක් අසල මගේ මිතුරා වාඩිවී සිටියේය.

"වොට්සන් ඔබ මොනව හරි කෑවද? අපි තිත්ත දොඩම් වලින් රසකළ කෝපි බොමු. මේ අවන්හල් හිමියාගේ විශේෂ සුරුට්ටුවක් තියෙනවා. එකක් බීල බලන්න. කෝ ආයුධ ටික ගෙනාවද?"

"ඔව් මගේ පිටකබා සාක්කුවේ."

"විශිෂ්ටයි. ඉස්සර වෙලා මං ඔබට කියන්නම්, මේ දක්වා මම මොනවද කරල තියෙන්නෙ කියල. ඊට පසු මම කියන්නම්, මීළඟට අපි කරන්න බලාපොරොත්තු වෙන්නෙ මොනවද කියල. මේ වෙනකොට ඔබට පැහැදිලි ඇති වොට්සන්, කාඩෝගන් වෙස්ට් තරුණයාගේ සිරුර වැටී තිබුණු තැන ගැන මං කිව්ව දේ. සැකයක් නෑ. මිනීමරුවා ඒක දුම්රිය මැදිරියක වහල උඩින් තැබුවා. සිරුර බිමට ඇදවැටුණේ, දුම්රිය මැදිරියක වහළ උඩ තිබිල මිස, එය ඇතුළතින් නොවන බව මට මුල ඉඳලම පැහැදිලි වුණා."

"එය දුම්රිය පාළමක් උඩ ඉඳලා දම්මා වෙන්න බැරිද?"

"ඒක වෙන්න විධියක් නෑ. ඔබ දුම්රිය මැදිරියක වහළක් පරීක්ෂා කළොත් ඔබට පෙනේවි. එහි මතුපිට හැඩය තරමක් රවුම් බව. එහි අයින්වල ආරක්ෂක වැටවල් වැනි දේ නැහැ. ඒ නිසා අපට කියන්න පුළුවනි, තරුණයාගේ සිරුර ස්ථිර වශයෙන්ම දුම්රිය මැදිරියේ වහළ උඩ තැබුවා කියල."

"ඔහුව එවැනි තැනක තැබුවේ කොහොමද?"

"අන්න ඒක තමයි අපට පිළිතුරු දෙන්න තියෙන ප්‍රශ්නෙ. මෙය කළ හැකි එක ක්‍රමයක් තියෙනවා. ඔබ දන්නවා ඇති ලන්ඩනයේ වෙස්ට් එන්ඩ් ප්‍රදේශයේ තැන් කිහිපයකදී, උමං දුම්රිය උමගෙන් එළියට ඇවිත්, එළිමහනේ ගමන් කරනවා. එහෙම දුම්රියක ගමන් කරද්දී මං දැකල තියෙනවා, කෙළින්ම මගේ හිසට උඩින් ගෙවල් වල ජනේල. ඒ මහපොළොව මට්ටමේ හදල තිබෙන ගෙවල් වල ජනේල. හොඳයි. යම් විධියකින් මේ හරියේදී, දුම්රියක් හරියටම එවැනි ජනේලයක් යටින් නැවැත්තුවා කියල හිතමු. එතකොට මළසිරුරක් දුම්රියේ වහල උඩින් තියන්න අපහසු ද?"

"මට නම් හිතෙන්නේ ඒක වෙන්න බැහැ කියල."

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙහෙම වෙලාවට අපේ පුරණ මූලධර්මයට යන්න ඕන වොට්සන්. විය හැකියි කියල අප කරන උපකල්පන හැම එකක්ම අසාර්ථක නම්, කොයිතරම් විය නොහැකියි කියල හිතුවත්, ඉතිරි වී ඇති එක තමා සත්‍යය. මේ වෙලාවෙ අනෙක් හැම උපකල්පනයක්ම පරාජය වුණා. ලන්ඩනයෙන් හදිසියේ පිටවී ගිය අර විදේශික ඔත්තුකාරයා පදිංචිව හිටියේ, උමං දුම්රිය මාර්ගයකට ඉහළින් ජනෙල් පෙනෙන නිවාසයක බව සිතියම බැලුවාම මට අවබෝධ වුණා. මගේ හිතේ ඇතිවුණු ක්ෂණික සතුටට ඔබට පුදුමත් හිතුණා."

"ආ ඒක නිසා ද ඔබ මහත් සන්තෝෂයට පත්වුණේ?"

"ඔව් ඒක නිසා තමයි. අංක 13 කෝල්ෆීල්ඩ් උද්‍යානයේ හියුගෝ ඔබර්ස්ටයින් මහත්මයා ගැන තමයි මගේ අවධානය යොමුවුණේ. මගේ වැඩකටයුතු පටන් ගත්තේ ග්ලෝස්ටර් මාවතේ දුම්රියපොළෙන්. බොහොම කරුණාවන්ත දුම්රිය නිලධරයෙක්, මා සමඟ දුම්රිය මාර්ගය දිගේ ඉදිරියට ඇවිදගෙන එන්න ඉදිරිපත් වුණා. කෝල්ෆීල්ඩ් උද්‍යානයේ සමහර ගෙවල් වල, පිටුපස්සේ ජනේල වලට කෙළින්ම පහතින් තිබෙන්නේ, උමං දුම්රිය මාර්ගයේ ඉහළින් විවෘත කොටස. අර කරුණාවන්ත නිලධරයා ඒ බව මට පෙන්වා දුන්නා. මෙතැන දුම්රිය මංසන්ධියක්. ඒ නිසා මෙම විවෘත ස්ථානයේ උමං දුම්රිය නිසොල්මන් වී මිනිත්තු කිහිපයකට නවතින බවත් ඔහු මට කිව්වා."

"විශිෂ්ටයි හෝම්ස්! ඔබට අනුවුණා පොට."

"ඔව්. මේ දක්වාත් මං නිවැරදියි වොට්සන්. නමුත් අපි ටිකෙන් ටික ඉදිරියට යනවා. ඒත් අපේ ඉලක්කය බොහොම ඈතයි. කෝල්ෆීල්ඩ් උද්‍යානයේ පිටුපස කොටස බලාගැනීමට මට හැකිවුණා. ඊළඟට මම නිවසේ ඉදිරිපසින් ගියා, එහි පදිංචි කාරයා හමුවෙන්න. මට දකින්න ලැබුණේ මොකක්ද? කුරුල්ලා ඉගිලී ගිහින්!

ඒක ගෘහභාණ්ඩ නොතිබුණු විශාල නිවසක්. එක සේවකයෙක් පමණක් වැඩට තියාගෙන, ඔබර්ස්ටයින් මෙහි තනිවමයි ජීවත්වෙලා තියෙන්නේ. සමහර විට මේ සේවකයාත්, ස්වාමියාගෙ රැකියාව ගැන දන්න උදව්කාරයෙක් වෙන්න ඇති. අපි මතක තබාගත යුතුයි, ඔහු හොයාගත් "බඩු තොගය" භාරදීමට ඔබර්ස්ටයින්

http://sherlockholmesinvestigations.blogspot.com

යුරෝපා මහාද්වීපයට ගොස් ඇති බව. නමුත් එහෙම යන්න ඇත්තේ රටෙන් පැන යන අදහසකින් නොවෙයි. ඒ මොකද ඔහුට භයවෙන්න කාරණයක් නැහැ. ඔහු අත්අඩංගුවට ගන්න කියලා විශේෂ බලපත්‍රයක් නිකුත් කරලාත් නැහැ. ඒ වගේම තිල නොවන රහස් පරීක්ෂකයෙක් හදිසියේ ඔහුගේ නිවස සෝදිසි කරාවි කියල, ඔහුට නිකමට වත් හිතෙන එකක් නැහැ. ඒ වුණත් අපි දන් කරන්න හදන්නේ එයයි."

"අපට අවසර පත්‍රයක් අරගෙන මේක නීත්‍යානුකූලව කරන්න බැරිද හෝම්ස්?"

"අපට ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන්න සාක්ෂියක් නැතිතරම්. ඒ කාරණාවල හැටියට බලපත්‍රයක් ගැනීම හරි අමාරුයි."

"අපට ගෙට ඇතුළුවෙලා, මොනවා හරි කරගන්න පුළුවන් වේවි කියලා ඔබ හිතනවද?"

"ඒක දන්ම කියන්න බැහැ. ඔහුට ලැබුණු ලිපි ලේඛන මොනව හරි ගේ ඇතුළෙ තියනවද කියල අපි දන්නෙ නැහැ නෙ."

"මේ වැඩේ මගේ හිතට නම් අල්ලන්නෙ නැහැ හෝම්ස්."

"මගේ හිතවත් මිත්‍රයා. ඔබට තියෙන්නේ වීථිය අයිනට වෙලා, කවුරු හරි එනවද කියලා සෝදිසියෙන් සිටීම පමණයි. අපරාධ කාරයාගෙ කොටස මං කරන්නම්. මේක පුළු පුළු නීතිරීති ගැන හිතමින් පහුබහින්න වෙලාව නොවෙයි. මතකද මයික්‍රොෆ්ට්ගේ ලියුම? නාවික හමුදාව, කැබිනට් මණ්ඩලය, තවත් ඉහළම කෙනෙක් අපෙන් සතුටුදායක තොරතුරක් ලැබෙනතුරු නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නවා. අපට වෙන කරන්න දෙයක් නෑ. මේ පියවර ගතයුතුමයි."

මම වාඩිවී සිටි තැනින් නැගිට්ටෙමි.

"ඔව් හෝම්ස්. අප යා යුතුමයි."

මගේ මිත්‍රයා නැගිට, මට අතට අත දුන්නේය.

"මං දනගත්තා ඔබ කොහොමට වත්, පස්සට යන්නේ නැතිබව. මෙතැන ඉඳන් එහේට හැතැක්ම භාගයක් දුරයි. ඒත් හදිසි වෙන්න ඕනෙ නෑ. අපි පයින් ඇවිදගෙන යමු. අපේ ගෙවල් බිඳීමේ උපකරණ ටික බිම අතහරින්න එපා. සැකසහිත පුද්ගලයන් හැටියට හිරභාරයට ගැනුණොත් ප්‍රශ්නය දික් ගැස්සෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

ලන්ඩනයේ වෙස්ට් එන්ඩ් ප්‍රදේශයේ තිබූ කෝල්ෆීල්ඩ් උද්‍යානයේ නිවාස පෙළ, මධ්‍යම වික්ටෝරියානු යුගය සිහිගන්වන එකක් විය. අප යා යුතු නිවසට අල්ලපු වත්තේ, කුඩා දරුවන්ගේ ප්‍රිය සම්භාෂණයක් පැවැත්වෙමින් තිබිණි. ළමා ගීතවල මියුරු නාදය, පියානෝවකින් නැඟුණු සුමිහිරි සංගීතය, කෙළි කවට සිනා හඬ, රාත්‍රිය පුරා රැව් පිළිරැව් දුන්නේය. තවමත් පැතිර පැවැති මීදුම, අප වටා ගලා ගොස් මිත්‍රශීලී ආවරණයක් සකසා දුන්නේය. තම ලන්තෑරුම දල් වූ හෝම්ස්, එහි ආලෝකය විශාල දොර වෙත එල්ල කළේය.

"මෙතන දොර ඇරගන්න එක සෑහෙන අමාරු වැඩක්. යතුරු වලින් පමණක් නොමෙයි, ඇතුළෙන් සොයිබ වලිනුත් මේක සම්පූර්ණයෙන්ම අගුළු දමලයි තියෙන්නෙ. අපට මීට වඩා පහසුවෙන් ඇතුළු වෙන්න හැකිවේවි, ගේ අනෙක් පැත්තෙන්, බිම්මහලට බැස්සොත්. මුර සංචාරයේ යෙදෙන පොලිස් භටයෙක් එබී බැලුවොත් අපි අර ආරුක්කුව පිටුපස හැංගෙමු. ඔබේ අත දෙන්න වොට්සන්. මං පහළට බැහැල, ඊළඟට ඔබවත් ගන්නම්.

මිනිත්තුවකින් අපි එතැනට ළඟාවීමු. අප අඳුරු සෙවණැලි අස්සේ සැඟවී ගත්තා පමණි. නිවස අසල පාරේ ගමන්ගත් පොලිස් භටයෙකුගේ සපත්තු ශබ්දය පැහැදිලිවම ඇසෙන්නට විය. එය කෙමෙන් අඩුවී ගියේය. පහළින් පිහිටි දොර වෙත ගිය හෝම්ස් ඔහුගේ රාජකාරිය පටන් ගත්තේය. සෑහෙන වේලාවක් අගුළ දෙසට නැමී ඔහු දැඩි උත්සාහයක් ගන්නා අයුරු මම දුටුවෙමි. අන්තිමේදී ශබ්දයක් නඟමින් දොර විවෘත විය. ඉක්මනින් අඳුරු බරාඳය දෙසට පැන, අපි දොර වසා දැමුවෙමු. රවුම් තරප්පු පෙළ දිගේ අප ඉහළට නැඟුණේ හෝම්ස් අතේ වූ ලන්තෑරුමේ එළියෙනි.

"මෙන්න මේක වෙන්න ඕනෑ තැන."

මගේ මිත්‍රයා පැවසුවේ ලන්තෑරුමේ කහ පැහැ එළිය බිම් මට්ටමේ පිහිටි කුඩා ජනේලයක් දෙසට යොමුකරමිනි. ඔහු එය විවෘත කළා පමණි. සියුම් දෙදරුම් හඬක් ලෙස ඇරැඹුණු ශබ්දයක්, ඉතා ඉක්මනින් ඝෝෂාවක් බවට පෙරළෙන හඬ, ජනේලයට පහළින් ඇසිණි. ඒ නිසැකවම දුම්රියක හඬ බව හඳුනාගත හැකිවිය. දුම්රියෙන් නැඟුණු ඝෝෂාව කන් බිහිරිකරවන තරම් තියුණුව මට දැනිණි. ඉන්පසු එය ක්‍රමයෙන් අඩු වී ගියේය. හෝම්ස් ජනෙල්

http://sherlockholmesinvestigations.blogspot.com

පඩිය අයිනට ලන්තෑරුම ළං කළේය. දුම්රිය එන්ජින් වලින් නිකුත් වූ ගල් අඟුරු දුමෙන්, එහි ඝනකම් දලි තට්ටුවක් සැදී තිබිණි. එහෙත් එහි සමහර තැන්වල මැතදී යමක් ඇතිල්ලීම නිසා, දලි පිස දමී ගොස් ඇති සැටි අපි දුටුවෙමු.

"ඔබට පෙනෙනවා නේද මළසිරුර තියාගෙන හිටියෙ කොහේද කියල? ඔහෝ! වොට්සන් මේ මොකක්ද? කිසිම සැකයක් නෑ. මේක ලේ පැල්ලමක්." හෝම්ස් ජනෙල් පඩියේ දව රාමුව මත ඇඳී තිබුණු දුඹුරු පැහැති පැල්ලමක් වෙත මගේ අවධානය යොමු කළේය.

"ඒ පැල්ලම මේ තරප්පුවේ ගල් පඩි මතත් දිගටම තියෙනවා. සිද්ධිය වුණු අයුරු මේකෙන් පැහැදිලිව ප්‍රදර්ශනය වෙනවා. දැන් ඉතින් දුම්රියක් නවත්වන තුරු අපි බලා ඉඳිමු."

අපට බොහෝ වේලාවක් බලාසිටීමට සිදුනොවිය. ඊළඟට පැමිණි දුම්රිය බිහිසුණු හඬක් නංවමින් උමගෙන් එළියට ඇදී ආවත්, විවෘත පෙදෙසට එද්දී වේගය අඩු කළේය. ඊළඟට එය තිරිංග තද කළේ අමිහිරි හඬක් නංවමිනි. දැන් අපට හරි කෙළින්ම පහළින් දුම්රිය මැදිරියේ වහළ දැකිය හැකි විය. ජනෙල් කවුළුවේ සිට එතැනට අඩි හතරක් වත් නොතිබිණ. හෝම්ස් ජනේලය හෙමින් වසා දැම්මේය.

"අප කරල තියෙන සොයාගැනීම් මේ දක්වාම නිවැරදියි. ඔබට මොනවද හිතෙන්නෙ?"

"විශිෂ්ට සොයා ගැනීමක් හෝම්ස්. ඔබ මේ තරම් සාර්ථක ලෙස, පැටළුණු ගැටලුවක කරුණු සොයාගත් බවක්, මට නම් සිහිකරන්න වත් බැහැ." මම කීවෙමි.

"මට ඒකට එකඟවෙන්න අමාරුයි. මළසිරුර දුම්රිය මැදිරියේ වහලේ තියෙන්න ඇති කියල මම කිව්ව නේ. ඒ නිගමනය බොහොම අමාරුවෙන් ලබාගත් එකක් බව ඇත්තයි. එතැන සිට ඉදිරියට අනෙක් දේවල් මතුවෙන්න පටන් ගත්තෙ උත්සාහයකින් තොරවයි. අපට මුහුණපාන්න වෙන දුෂ්කරතා තවමත් ඉවර නැහැ. අපට ප්‍රයෝජනවත් විය හැකි තවත් යමක් හොයාගන්න පුළුවන්ද කියල බලමු."

http://sherlockholmesinvestigations.blogspot.com

කුස්සියෙන් පටන්ගත් පියගැට පෙළ දිගේ අපි ඉහළටම නැග්ගෙමු. එය අවසන් වූයේ, පළමුවැනි තට්ටුවේ කාමර සමූහයක් ඉදිරියේ ආලින්දයකටයි. ඉන් මුල්ම කාමරය, කෑම කන කාමරයයි. ගෘහ භාණ්ඩ වලින් පිරී තිබුණු එහි වැදගත් යමක් දක්නට නොලැබිණ. දෙවැන්න නිදන කාමරයකි. එහි ද සිත් අදනා සුලු බවක් නොවීය. තුන්වැන්නේ ප්‍රයෝජනවත් යමක් සොයා ගැනීමට හැකි බවක් දිස්විය. මගේ මිත්‍රයා එය ක්‍රමානුකූලව පරීක්ෂාවට ලක්කිරීම ඇරැඹිය.

කාමරය පුරා සෑම තැනකම පොත්පත් හා කඩදාසි ගොඩගසා තිබිණි. ඒ සියල්ල අවුස්සා දැමීම නිසා අවුල් ගොඩක් බවට පත්වී තිබිණ. මෙය කිසිවෙකු විසින් කන්තෝරු කාමරයක් ලෙස යොදාගත් එකක් බැව් පැහැදිලිය. හෝම්ස් ඉතා ඉක්මනින් සෑම ලාච්චුවක්ම, සෑම අල්මාරියක්ම සියුම් සෝදිසියකට භාජනය කළේය. එහෙත් ඔහුගේ දැඩි අධිෂ්ඨානශීලී මුහුණ, ඔප වැටෙන අන්දමේ ආලෝකයක් දක්නට නොලැබිණි. සම්පූර්ණයෙන්ම පැයක් ගත වී ගියත්, අප සිටියේ සෝදිසිය පටන් ගත් තැනමයි.

"මේ කපටි හිවලා, ඌ ගිය පාර හඳුනාගන්න බැරිවෙන්න, අඩි සටහන් මකා දමලා. ඔහු වරදක් කළ බවට චෝදනා නැගිය හැකි කිසිවක් නෑ. ඔහුගේ රාජ්‍ය විරෝධී බිහිසුණු ලිපි හුවමාරුව එක්කෝ විනාශ කරලා; එහෙමත් නැත්නම් මෙතැනින් ඉවත්කරගෙන ගිහින්. අපට තවත් බලන්න ඉතිරි වෙලා තියෙන්නෙ මෙච්චරයි."

හෝම්ස් කීවේ කුඩා යකඩ පෙට්ටියක් පෙන්වමිනි.

ලියනමේසය මත තිබූ එය, මුදල් දැමීමට භාවිතකරන තාලේ කුඩා යකඩ පෙට්ටියකි. ඒ තුළ රෝල් කළ කඩදාසි කිහිපයක් විය. ඒවායේ සටහන්ව තිබුණේ යම්කිසි අංක සමූහයක් හා ගණනය කිරීම් පමණකි. එහි සමහර තැන්වල, "ජලයේ පීඩනය" සහ "වර්ග අඟලකට ඇතිවන තෙරපුම" ආදී වචන ලියා තිබිණි. ඒ නිසා එය සබ්මැරීන නිෂ්පාදනයට සම්බන්ධ යමක් බව අපි වටහා ගතිමු. හෝම්ස් ඒ සියල්ල පසෙකට දැම්මේය. පෙට්ටියේ අඩියේ වූයේ තරමක් ලොකු ලියුම් කවරයකි. හෝම්ස් එය යටිකුරු කර, ඇතුළත වූ දෑ මේසය මතට හැළීය. එහි වූයේ පුවත්පත් වලින් කපාගන්නා ලද කොටස් කිහිපයක් පමණි. හෝම්ස්ගේ

http://sherlockholmesinvestigations.blogspot.com

මුහුණේ එක්වරම, බලාපොරොත්තුවක සේයා පහළවෙන අන්දම මම දුටුවෙමි.

"මේ මොනවද වොට්සන් මේ? පුවත්පතක පළවන දැන්වීම් ආකාරයට යැවූ රහස් පණිවුඩ කිහිපයක් නේද? මේව පළවෙලා තියෙන්නේ "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පතේ පෞද්ගලික තීරයේ. දිනයන් කිසිවක් නැහැ. නමුත් පණිවුඩ මෙතැන අමුණලා තියෙන්නේ එකකට පසු එකක් පිළිවෙළින් විය යුතුයි. මේක වෙන්න ඇති පළමුවෙනි එක.

*"මීට කලින් තොරතුරක් ලැබේවි යයි බලාපොරොත්තුවෙන් සිටියෙමි. කොන්දේසි වලට එකඟයි. කාඩ්පතේ ලිපිනයට සම්පූර්ණ විස්තර ලියා දන්වන්න.*

*පියරෝ."*

මෙන්න ඊළඟ එක

*"තේරුම් ගත නොහැකි තරම් සංකීර්ණයි. සම්පූර්ණ වාර්තාවක් ඕනෑ. බඩු ලබාදෙන තුරු ද්‍රව්‍ය සූදානමින් ඇත.*

*පියරෝ."*

ඊට පසු,

*"කාරණය ඉතාම වැදගත්. පොරොන්දු වූ ලෙස සම්පූර්ණ නො කළොත් අත්හැර දැමීමට සිදුවේවි. වේලාවක් හා තැනක් ලිපියකින් දන්වන්න. දැන්වීමකින් එය ස්ථිර කරමි.*

*පියරෝ."*

අවසන් වශයෙන්,

*"සඳුදා රෑ නවයෙන් පසු. දෙවරක් තට්ටු කරන්න. ඔය තරම් අවිශ්වාස කරන්න එපා. අප පමණයි. බඩු ලබාදුන් විට, ගෙවීම සම්පූර්ණයෙන්ම මුදලින්*

*පියරෝ"*

සෑහෙන තරම් දුරට සම්පූර්ණ වාර්තාවක් වොට්සන්. අපට අනික් කෙළවරේ ඉන්න තක්කඩියා අල්ල ගන්න පුළුවන් නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

මේසයට තට්ටු කරමින් හෝම්ස් කල්පනාවකට වැටුණේය. අවසානයේ ඔහු පුටුවෙන් නැගිට්ටේ, තීරණයක් ගත් ආකාරයටයි.

"කමක් නෑ. බාගවෙලාවට මේක අපි හිතන තරම් අමාරු වෙන එකක් නැහැ. මෙහේ තවත් කරන්න දෙයක් ඉතිරිවෙලා නැහැ වොට්සන්. අපි "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පත් කාර්යාලයටත් ගොඩවැදිලා ආපහු යමු. අපි සාර්ථක ලෙස වැඩ කළ දවස එතැනින් නිමා කරමු."

* * *

පසුදා උදෑසන ආහාරය ගැනීම අපි අවසන් කරමින් සිටියෙමු. අප හමුවීමට මයික්‍රොෆ්ට් හෝම්ස් සහ ලෙස්ට්‍රේඩ් දෙදෙනා පැමිණියහ. කලින් දිනයේ අප විසින් කරන ලද කටයුතු පිළිබඳව මගේ මිත්‍රයා ඔවුනට විස්තරයක් කළේය. ගෙට ඇතුළුවීම සඳහා අප දොර අගුළු කැඩූ අයුරු විස්තර කරද්දී ලෙස්ට්‍රේඩ් හිස සැලුවේ එය අනුමත නොකරන අයුරෙනි.

"පොලිස් සේවයේ ඉන්න රහස් පරීක්ෂකයන්ට නම්, මේ වගේ දේවල් කරන්න අවසර ලැබෙන්නේ නැහැ හෝම්ස් මහත්තයා. ඔබ, අප පරදවමින් හොඳ ප්‍රතිඵල අත්කරගැනීමේ පුදුමයක් නෑ. ඒ වුණත් ඔය වැඩේ දිගින් දිගටම කරන්න යන්න එපා. එහෙම කළොත් ඔබත් ඔබේ මිත්‍රයාත් ළඟදීම ලොකු අමාරුවක වැටේවි."

මේසය මත වූ එදා උදයේ ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පත හෝම්ස් අතට ගත්තේය.

"ඔබ දුටුවද අද පත්තරේ පියරෝ පළකර ඇති දැන්වීම?"

"මොනවා? තවත් එකක්?"

"ඔව්. මේ බලන්න."

***"අද රාත්‍රියේදී. එම ස්ථානයේදීම. එම වේලාවටම. අතිශයින්ම වැදගත් කරුණක්. ඔබේ ආරක්ෂාවට එල්ල වී ඇති අවදානමක් ගැන.***

***පියරෝ."***

"දෙවියන්ගේ නාමයෙන්! ඌ අද ආවොත් නම් කොහොම හරි ඌව අල්ලා ගන්නවා." ලෙස්ට්‍රේඩ්ට කෑගැසිණ.

Reading Purpose Only Not For

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මේ දන්වීම පළකිරීම සඳහා භාරදෙද්දී මගේ අරමුණ වුණෙත් ඒකයි. ඔබ දෙදෙනාටත් රෑ අට වෙනකොට කෝල්ෆීල්ඩ් උද්‍යානයට එන්න පුළුවන්ද? මේ ගැටලුව විසඳීමට අපට තවත් ඉදිරියට යා හැකියි."

* * *

ෂර්ලොක් හෝම්ස් සතුව තිබූ තවත් අතිවිශේෂ ගුණාංගයක්, මෙහිදී සඳහන් කිරීම වටී. මොනවා හෝ බැරෑරුම් කටයුත්තක යෙදීම ඔහුට භාර වී ඇතැයි සිතමු. ඒ වෙනුවෙන් ඔහුට තවත් කළ යුතු සූදානමක් ඉතිරි වී නොමැති නම්; එවිට හෝම්ස් තම මොළය අර ප්‍රශ්නයෙන් සම්පූර්ණයෙන්ම ඉවත්කර ගැනීමට සමත් විය. ඔහු එම කටයුත්තට සම්පූර්ණයෙන්ම පරිබාහිර එකක් සඳහා සිත යොමු කළේ, ඉතා සැහැල්ලුවෙනි. මේ අයුරෙන් මගේ මිත්‍රයා එදා සවස් වරුවම ගතකළේ, ලැසස්ගේ බහුධ්වනික භක්ති ගීත ගැන පොත් පිංචක් රචනා කරමිනි. මට මෙවැනි හැකියාවක් නොතිබිණි. එහෙයින් සවස් වනතුරු මා බලා සිටියේ නොඉවසිල්ලෙනි. මෙම ගැටලුව ජාතික ප්‍රශ්නයක් බවට පත්වී ඇති සැටි, රජයේ ඉහළම ප්‍රභූවරුන් සංත්‍රාසයට පත්ව ඇති අයුරු, අප විසින් අත්හදා බැලීමට යන පරීක්ෂණයේ ස්වභාවය, ආදී කරුණු නිසා, මම දැඩි මානසික පීඩනයකට පත්ව සිටියෙමි.

සැහැල්ලු රාත්‍රි ආහාරයකින් පසු, අපේ ගවේෂණය සඳහා පිටත්වී යාම මගේ සිතට සහනයක් විය. කලින් යොදාගත් පරිදි මයික්‍රොෆ්ට්, ලෙස්ට්‍රේඩ් දෙදෙනා, ග්ලෝස්ටර් පාරේ දුම්රිය පොළ අසලදී අප හමුවූහ.

පහළ වූ බිම්මහල තුළින් ගෙට ඇතුළු විය හැකි දොර, කලින්දා රාත්‍රියේ අගුළු කඩා විවෘත කළ අයුරින්ම අපි තැබුවෙමු. එහෙත් සිරුර තරබාරු මයික්‍රොෆ්ට්, යකඩ වැටේ ඉනි වල එල්ලී පහළට බැසීම ප්‍රතික්ෂේප කළේය. එහෙයින් මම පහළට බැස, ඒ දොරෙන් ගෙට ඇතුළු වී, ඉහළට නැග ඉදිරි දොර විවෘත කළෙමි.

පැයෙන් පැය ගතවී ගියේය. නුදුරෙන් වූ දෙව්මැදුරේ රාත්‍රි එකොළහ ද නාදවිය. අපේ බලාපොරොත්තු කඩවී යන ලකුණු පහළ විය. එක් ඉරියව්වක බොහෝ වේලාවක් ගතකිරීමෙන් තිබූ අපහසුකම නිසාදෝ, මයික්‍රොෆ්ට් හා ලෙස්ට්‍රේඩ් දෙදෙනාම සිටියේ

http://sherlockholmesinvestigations.blogspot.com

අත් පා වල හිරි අරිමිනි. ඊට අමතරව මිනිත්තුවකට දෙවරක් වත් ඔරලෝසුව දෙස බැලීමට ඔවුහු අමතක නොකළහ. ෂර්ලොක් හෝම්ස් සම්පූර්ණයෙන්ම නිහඬය. ඔහු නිශ්චලව වාඩිවී සිටියේ දෑස් අඩවන් කරගෙනයි. එහෙත් ඔහුගේ මොළය දැඩි අවධානයෙනි. එක්වරම හෝම්ස් තිගැස්සී හිස එසෙව්වේය.

"මිනිහා එනවා!" හෝම්ස්ගේ මුවෙන් පිටවිය.

නිවසේ ඉදිරි දොරටුව පසුකරගෙන, කිසිවෙකු පාරේ සෙමින් පා නැඟූ අඩි ශබ්දයක් ඇසිණි. යළිත් ඒ අඩි ශබ්දය ආපසු පැමිණියේය. දොර අසලටම පැමිණි කිසිවෙකු, දොර ඉදිරියේ ඒ මේ අත හැරෙද්දී පාවහන් වලින් නිකුත්වෙන හඬක් නැගිණි. ඉන්පසු දොරට දෙවරක් තට්ටු කරන හඬක් අසන්නට ලැබුණේය.

හෝම්ස් ඉතා සෙමින් පුටුවෙන් නැගිට්ටේ, නොසැලී සිටින මෙන් අපට සංඥා කරමිනි. සාලයේ තිබූ ගෑස් ලාම්පුවේ ආලෝකය කණාමැදිරි එළියක් දක්වා අඩුකර ඇත. හෝම්ස් ශබ්දයක් නොනැඟෙන සේ දොර විවෘත කළේය. අමුත්තා අඳුරේම ඉදිරියට පැමිණ, ගෙට ඇතුළුවන ඡායාව අපි දුටුවෙමු. යළිත් දොර වෙත ගිය මගේ මිත්‍රයා දොර වසා යතුරු දැම්මේය.

"මේ පැත්තට එන්න."

හෝම්ස් අමුත්තාව අප සිටි පැත්තට කැඳෙව්වේය. මොහොතකින් අමුත්තා අප ඉදිරියේය. හෝම්ස් පැමිණියේ ඔහුට සමීපයෙන්ම පිටිපසිනි.

අවදානමක් ගැන ඉව වැටුණු අමුත්තාට එක්වරම කෑගැසිණ. එතැනින් පැනදිවීම සඳහා ඔහු එක් ක්ෂණයකින් ආපසු හැරුණේය. එහෙත් ඔහුගේ කමිස කොලරයෙන් දැඩිව අල්ලා ගත් හෝම්ස් අමුත්තා විසිත්ත කාමරයේ ඇතුළට තල්ලුකර දැම්මේය. බිම ඇද වැටුණු ඔහු යළි නැගී සිටීමට පෙර, විසිත්ත කාමරයේ දොර ද අගුළු දමා වසන ලදී. තමා සතුරනට කොටු වූ බව දැනගත් අමුත්තා මහ පොළොව මත ඇදවැටුණේ සිහි විසඥ වූ අයුරෙනි. ඒ සමගම ඔහුගේ හිසේ තිබූ හිස් වැස්ම ඉවත් විය. මුහුණේ යට කොටස වසා තිබූ කර ලේන්සුව ගිලිහී ගියේය. අපට දක්නට ලැබුණේ දිගු යටි රැවුලක් ද සහිත කර්නල් වැලන්ටයින් වෝල්ටර්ගේ මුහුණයි.

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස්ගේ මුවෙන් සිවුරුහන් හඬක් පිටවූයේ අතිශයින් පුදුමයට පත් විලසිනි.

"මේ සැරේ නං මම වැඩේ වරද්ද ගත්තා කියල ලිව්වට කමක් නැ වොට්සන්. මං බලාපොරොත්තුවෙන් හිටි පක්ෂියා මේකා නෙමෙයි."

"මේ කවුද?" මයික්‍රොෆ්ට් ඇසීය.

"සබ්මැරීන නිෂ්පාදන අංශයේ ප්‍රධාන, නැසීගිය සර් ජේම්ස් වෝල්ටර්ගේ බාල සොහොයුරා.. හරි! හරි! දැන් මට තේරෙනවා ක්‍රීඩාව කෙරිල තියෙන්නේ කොහොමද කියල්. මිනිහට සිහිය එනව වගෙයි. ප්‍රශ්න ඇසීම මමං කරන්නම්."

අපි බිම වැතිරී සිටි පුද්ගලයා ඔසවාගෙන ගොස් සෝපාව මත තැබුවෙමු. මඳ වේලාවක් ගතවෙද්දී, ඔහු එහි හිඳගත්තේය. කර්නල් වෝල්ටර් භයෙන් භ්‍රාන්ත වූ දෙනෙතින් වටපිට බැලුවේ, මේ කිසිවක් ඔහුට විශ්වාස කිරීමට අපහසු අයුරෙනි.

"මොකක්ද මේ වැඩේ තේරුම? මං ආවෙ ඔබර්ස්ටයින් මහත්මයා හම්බ වෙන්න."

"හැමදෙයක්ම එළිවෙලයි තියෙන්නෙ කර්නල් වෝල්ටර්. ඉංග්‍රීසි ජාතික මහත්මයෙකුට මේ වගේ නින්දා සහගත විදියට තමන්ගේ රට ජාතිය පාවා දෙන්න පුළුවන් වුණේ කොහොමද? ඒක මට නම් තේරුම් ගන්නවත් බැහැ. ඒ වුණත් ඔහේ ඔබර්ස්ටයින් සමග ගනුදෙනු කළ ලිපිලේඛන හා පැවැත්වූ සම්බන්ධතා ගැන ඔක්කොම සාක්ෂි අප ළඟ තියෙනවා. කාඩොගන් වෙස්ට් තරුණයාට මරණය අත්වුණු හැටි ගැන සාක්ෂිත් අපට ලැබිල තියෙනවා. ඒ වුණත් පසු තැවීමක් හා පාපෝච්චාරණයක් මඟින් සුළු සහනයක් ලබාගත හැකියි. එතකොට අපි තවමත් නොදන්න කුඩා සිද්ධීන් පවා තේරුම් ගැනීමට හැකිවේවි."

දැත් වලින් මුහුණ වසාගෙන කෙඳිරි ගෑ අමුත්තා නිහඬවිය.

"මං ඔබට සහතික කරලා කියන්නම්."

හෝම්ස් යළිත් කීවේය.

"අත්‍යවශ්‍ය තොරතුරු හැම එකක්ම අපි දැනටමත් දන්නවා. ඔබ විශාල වශයෙන් මුදල් හදල් අමාරුකම් වලට මුහුණපා සිටි

http://sherlockholmesinvestigations.blogspot.com

බවත් අපි දන්නවා. ඔබේ අයියා ළඟ තිබුණු යතුරු කැරැල්ලේ යතුරු වල අච්චු අරගෙන, හොර යතුරු හදාගත් බවත් අපි දන්නවා. ඔබර්ස්ටයින් සමග ඔබ ලිපි හුවමාරු කරගත් බවත්, ඔහු ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පතේ පළකළ දැන්වීම් මගින් පණිවුඩ දුන් බවත් අපි දන්නවා. ඊළඟට ගිය සඳුදා රෑ මීදුම වැටුණු වෙලාවෙ ඔබ රහස් කාර්යාලයට ගියා. නමුත් ඔබ දුටු කාඩෝගන් වෙස්ට් ඔබ පිටුපසින් ආවා. බාග වෙලාවට, මොකක් හරි කරුණක් නිසා, ඔහු ඔබ ගැන සැකයක් ඇතිකරගෙන තිබෙන්නත් ඇති. ඔබ යකඩ සේප්පුවෙන්, සැලැසුම් හොරකම් කරන හැටි තරුණයා දුටුවා. නමුත් ඔහු කෑගැහුවෙ වත් කාටවත් පැමිණිලි කළේ වත් නැහැ. ඒ මොකද ඔහු හිතුවා ඔබ ඔබේ අයියා වෙනුවෙන් ලියවිලි ලන්ඩනයට ගෙන යනවා වෙන්න ඇති කියලා. තමන්ගේ පෙම්වතිය ගැන පවා අමතක කරලා, නියම රටඩැසියෙක් හැටියට වෙස්ට් කළේ මොකක්ද? ඔහු මීදුමට ආවරණය වෙලා, ඔබ ළඟින්ම ඔබේ පිටුපසින් ආවා. ඔබත් ඔහුත් ආවා මේ ගෙදර ළඟටම. නමුත් එතැනදී ඔහු ඔබ කරන්න හැදූ වැඩේට අවහිර කළා. අන්න එතැනදී තමයි කර්නල් ඔබ අපේ රටට එරෙහිව කළ අපරාධයට අමතරව මිනිමෙකුත් මැරුවේ."

"මම නෙමෙයි! මම නෙමෙයි! මං ඒ දේ කළේ නැහැ. දෙවියන් ඉදිරියේ දිවුරා හිටින්නම්. මං ඔහුව මැරුවේ නැහැ!" අපේ සිරකරුවා විලාප නැඟුවේය.

"එහෙනම් අපට කියන්න, කාඩෝගන් වෙස්ට් මරණයට පත්වුණේ කොහොමද කියලා. ඊට පස්සේ ඔබ මළසිරුර දුම්රිය මැදිරියක වහල උඩට දැමූ හැටි."

"මං කියන්නම්. මං දිවුරා කියන්නම්. මං මේ කියන්නෙ ඇත්තයි. කොටස් වෙළඳපොළ සඳහා මා ගත් විශාල ණයක් ගෙවීමට තිබුණා. මුදල් අවශ්‍ය වෙලා මං පිස්සු වැටිලයි හිටියේ. ඔබර්ස්ටයින් මට පවුම් පන්දහසක් දෙන්න පොරොන්දු වුණා. මගේ ජීවිතය විනාශයෙන් බේරෙන්නයි මං මේ දේ කළේ. මිනීමැරුම සම්බන්ධයෙන් නම් මං අහිංසකයෙක්."

"මොකක්ද එහෙනම් සිද්ධ වුණේ?"

"ඔහු කලින් ඉඳලම මා ගැන සැක කරල තිබුණා. ඔබ දන් කිව්වා වගේ මීදුමේ සැඟවිලා, ඔහු මා පසුපස ඇවිත් තියෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

මං ඒක දැනගෙන හිටියේ නැහැ. මේ ගෙදර දොර ළඟට එනතුරු මට ඒක තේරුණේවත් නැහැ. ඒ වෙලාවේ තිබුණේ ඝන මීදුමක්. කෙනෙකුට යාර තුනක් එහාට පෙනෙන්නේ නැහැ.

ඒ වෙනකොට මං දෙපාරක් දොරට තට්ටු කරලා ඔබර්ස්ටයින් දොරකඩට ඇවිත් හිටියේ. තරුණයා අප හිටි තැනට කඩා වැදුණා. "සැලැසුම් මෙහි ගෙනැවිත් කරන්න බලාපොරොත්තු වෙන්නේ මොකද්ද කියලා හෙළි කරන්න" යයි ඔහු බලකළා.

ඔබර්ස්ටයින් ළඟ කෙටි මුගුරක් තිබුණා. එහි කෙළවරක ඊයම් පුරවා ආයුධයක් ලෙස සකස් කළ එකක්. ඔහු ඒක නිතරම ළඟ තබා ගත්තා. අපේ විරුද්ධත්වය නොතකා වෙස්ට්, ගෙට ඇතුළු වෙන්න උත්සාහ කළා. එවිට ඔබර්ස්ටයින් වෙස්ට්ගේ හිසට පහර දුන්නා. එය දරුණු පහරක්. මිනිත්තු පහක් ඇතුළත තරුණයා මියගියා. ඔහු සාලයේ මියගිහින් හිටියේ. ඔහුගේ මළසිරුරට කළ යුත්තේ මොකද්ද කියලා හිතාගන්න බැරුවයි අපි හිටියේ. ඊට පස්සේ මේ අදහස ඔබර්ස්ටයින්ගේ හිතට ආවා. ඔහුගේ ගේ පිටුපස ජනේලයට පහළින් දුම්රිය නවතිනා බව ඔහු කිව්වා. නමුත් ඒ වැඩට කලින් ඔහු මා ගෙනා සැලැසුම් පරීක්ෂා කළා. ඔහු කිව්වා තුනක් අත්‍යවශ්‍ය නිසා ඔහු ළඟ තබාගත යුතු බව."

"තමුසෙට මේව තියාගන්න දෙන්න බැහැ. මේවා අතුරුදන් වෙලා බව දැනගත්තම වුලිච් වල මහ කලබලයක් ඇතිවේවි." මං කිව්වා.

"නැහැ. මා එය තබාගත යුතුයි." ඔහු කිව්වා.

ඒවා තාක්ෂණික වශයෙන් සංකීර්ණ ලියවිලි නිසා, කෙටි කාලයක් ඇතුළත පිටපත් සකස් කරගැනීමට හැකියාවක් නැති බවයි ඔහු කිව්වේ.

"එහෙම නං මං ඔක්කොම ආපසු අරගෙන යනවා." මං කිව්වා.

ඉතිං ඔහු මඳ වේලාවක් කල්පනා කළා.

"අපි මෙහෙම කරමු. සැලැසුම් තුනක් මා ළඟ තියාගන්නම්. ඉතිරි ඒවා අපි ඔහුගේ සාක්කුවට දමමු. ඔහුව සොයාගන්නා විට,

http://sherlockholmesinvestigations.blogspot.com

අතුරුදන් වූ ලියවිලි ගැන සම්පූර්ණ චෝදනාව එල්ල වෙන්නේ ඔහුටයි."

"ඊට වඩා හොඳ විසඳුමක් ගැන මගේ සිහියට ආවේ නැහැ. ඉතින් මම ඒ යෝජනාවට එකඟ වුණා. දුම්රියක් ඇවිත් නවත්වන තුරු අපි පැය භාගයක් විතර බලාගෙන හිටියා. ඝන මීදුමක් තිබුණු නිසා වෙස්ට්ගේ මළසිරුර දුම්රියේ වහළ මතට දමන්න අපට අපහසු වුණේ නැහැ. මං දන්නේ එපමණයි."

"එතකොට ඔබේ සොහොයුරා?"

"ඔහු මොකුත්ම කිව්වේ නැහැ. නමුත් මීට කලින් ඔහුගේ යතුරු මං අරගෙන ඉඳලා, ඔහුගේ අතටම අහුවී තිබෙනවා. මං හිතන්නේ ඔහු මාව සැක කළා. ඔහුගේ දෑසෙන් ඒ බව මට වැටහුණා. එයින් ඇතිවුණු කම්පනයෙන් තමයි අයියා මියගියේ."

කාමරයේ නිහඬතාවය මඳ වේලාවක් පැවතිණ. එය බින්දේ මයික්‍රොෆ්ට් හෝම්ස්ය.

"පාපොච්චාරණයක් ඉදිරිපත් කරලා මේක යම් තත්ත්වයකට හරි නිවැරදි කරන්න ඔබට කළ හැකි දෙයක් නැද්ද? එහෙම කළොත් ඔබේ හෘද සාක්ෂියටත් යම් සහනයක් ලැබෙනවා. සමහරවිට දඬුවමටත් සහනයක් ලැබෙන්න පුළුවනි."

"මං කොහොමද ඒ වැරැද්ද හරි ගස්සන්නෙ?"

"ඔබර්ස්ටයින් ඔහුගේ භාරයට ගත් කඩදාසි කෝ?

"මං දන්නෙ නෑ."

"ඔහුගේ ලිපිනයක් ඔබට දීල නැද්ද?"

"ඔහු කිව්වා, පැරීසියේ ලූවර් හෝටලයට ලියුම් එව්වොත්, ප්‍රමාද වී හෝ ඔහුට ලැබේවි කියල."

"එහෙනම් මේක යථා තත්ත්වයට පත් කරන්න තවමත් ඔබට පුළුවනි."

"මට පුළුවන් හැම දෙයක්ම මං කරන්නම්. ඔබර්ස්ටයින් කියන පුද්ගලයාට මගේ හිතවත්කමක් හෝ ණයගැතිකමක් නැහැ. ඔහු තමා මගේ විනාශයට මුල් වුණේ."

"මෙන්න කඩදාසියයි පෑනයි. මෙහෙන් වාඩිවෙලා මම කියනදේ ලියන්න." හෝම්ස් ලිවිය යුතුදේ කීමට සූදානම් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ප්‍රිය මහත්මයාණනි,

අප කළ ගනුදෙනුව සම්බන්ධයෙනි. අත්‍යවශ්‍ය තොරතුරු අඩංගු එක් සැලැසුමක් ඔබට ලැබී නොමැති බව දැනටමත් ඔබට වැටහී ඇතුවා නොඅනුමානයි. එම සැලැස්මේ පිටපතක් දැන් මා සතුව ඇත. මෙය ලබාගැනීම සඳහා මට අමතරව කරදර වීමට සිදුවිය. එහෙයින් ඒ සඳහා තවත් පවුම් පන්සියයක් ඔබගෙන් ලබාගැනීමට මට අවශ්‍යයි. එය තැපෑලෙන් ලබා ගැනීම ගැන මට විශ්වාසයක් තැබිය නොහැකියි. මේ සම්බන්ධයෙන් පවුමේ රන්කාසි හෝ නෝට්ටු මිස වෙනත් ආකාරයක ගෙවීමක් භාර නොගැනීමට මම තීරණය කර සිටිමි. මට ඔබ හමුවීම සඳහා රටින් පිටවී ආ හැකියි. නමුත් මේ වෙලාවේදී මා රටින් පිටවුවහොත් ඔවුන් මා ගැන සැක සිතාවි. ඒ නිසා සෙනසුරාදා දවල් චාරිංක්‍රොස් හෝටලයේ දුම්බොන කාමරයේ දී ඔබව හමුවීමට බලාපොරොත්තු වෙමි. භාරගන්නේ එංගලන්තයේ නෝට්ටු හෝ රන්කාසි පමණක් බව කාරුණිකව සලකන්න."

ඒක සෑහේවි. ලියුම් කවරයේ ඔබ කිව් අර ලිපිනය ලියන්න. මේකෙන් අපට ඕනෑ කරන මිනිහා ගෙන්වා ගන්න බැරිවුණොත්, ඒක පුදුමයට කරුණක්."

* * *

එම උපාය සාර්ථක විය! දැන් ඒ සිද්ධිය ඉතිහාසයට එක්වී ඇත. ජාතියක රහසිගත ඉතිහාසය, ප්‍රසිද්ධියට පත් ඉතිහාසයට වඩා සිත්ගන්නා සුලු නොවේද?

ඔබර්ස්ටයින් බලාපොරොත්තු වන්නට ඇත්තේ සැලැස්මේ ඉතිරි කොටස ද ලබාගෙන, තම කර්තව්‍යය සම්පූර්ණ කර රහස් ඔත්තු සේවාවේ ඉහළටම නැඟීමටයි. ඒ නිසා නියමිත දිනයේ නියමිත වේලාවට, ඔහු චාරිංක්‍රොස් හෝටලයට පැමිණියේය. ඉතා පහසුවෙන් ඔහු අල්ලා ගන්නා ලදී. ඔහු පහළොස් අවුරුද්දකට බ්‍රිතාන්‍යයේ බන්ධනාගාරයට නියම විය. ඔහුගේ ට්‍රන්ක පෙට්ටියේ තිබී, මිල කළ නොහැකි තරම් අගනා, නැතිවූ බ්‍රූස් - පාටිංටන් සැලසුම් තුන හමු විය.

http://sherlockholmesinvestigations.blogspot.com

කර්නල් වැලන්ටයින් වෝල්ටර් ඔහු සිරගෙදර ගතකළ දෙවැනි අවුරුද්දේ දී මියගියේය. හෝම්ස් යළිත් වරක් ලැසස්ගේ භක්ති ගී පිළිබඳ පොත් පිංච රචනා කිරීම පටන්ගත්තේය.

මගේ මිත්‍රයා, වින්ඩ්සර් රජමාළිගයේ දවසක් ගත කර ආපසු පැමිණි බව සති කිහිපයකට පසු මට අසන්නට ලැබිණි. එහිදී ඔහුට තෑගි ලැබුණු මරකත මැණිකක් ඇල්लූ ටයිකටුවක් මට දකින්නට ලැබිණි.

"හෝම්ස් ඔබ මේක සල්ලි වලට ගත්ත ද?"

"නෑ වොට්සන්, මේක මට තෑගි ලැබුණා. ඒ එක්තරා කාන්තාවකගෙන්. ඇය වෙනුවෙන් යම් කටයුත්තක යෙදිල සාර්ථක ප්‍රතිඵල ලබන්න තරම් මං වාසනාවන්ත වුණා."

ඔහු කීවේ එපමණකි.

එම කාන්තාවගේ නම කුමක්දැයි සිතාගැනීම මට අපහසු නැත. මැණිකක් ඇල්ලූ එම ටයි කටුව, බෲස් - පාටිංටන් වික්‍රමය මගේ මිත්‍රයාගේ සිහියට නැංවීමට සැමදා සමත්වනු ඇත.

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# අයිරින් ඇඩ්ලර්

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# අයිරින් ඇඩ්ලර්

ෂර්ලොක් හෝම්ස් නම් ඇය හැඳින්වූයේ "නියම ගැහැනිය" යනුවෙනි. වෙනත් නමකින් ඔහු ඇයව හඳුන්වනු මට අසන්නට ලැබී ඇත්තේ ඉතාමත් කලාතුරකිනි. හෝම්ස් ඇය එලෙස හැඳින්වූයේ, ඇය පිළිබඳව ඇතිවූ ආදර හැඟීමකින් නොවේ. ඔහුගේ අනුකම්පා විරහිත, තැන්පත්, සමබර මනසට, ආදරය වැනි හැඟීම් පිළිකුල් සහගතය.

කරුණු නිරීක්ෂණය කිරීමටත්, ඒවා තර්කානුකූලව විශ්ලේෂණය කොට නිගමනයන්ට පැමිණීමටත්, ලෝක වාසීන්ට දකින්නට ලැබුණු විශිෂ්ටතම යන්ත්‍රය ෂර්ලොක් හෝම්ස් විය. එහෙත් පෙම්වතෙකු වූවා නම් ගතයුතු පියවර, කළ යුතු දේ, ගැන කිසිදු වැටහීමක් නැතිව, ඔහු අතරමං වෙනු ඇත. මෙම අපරාධ පරීක්ෂකයා තම සංවේදී ඉන්ද්‍රියයන්, තර්කානුකූලව ගැටලු විශ්ලේෂණය සඳහා සකස් කරගෙන ඇත්තේ එක්තරා සියුම් පිළිවෙළකටයි. ආදරය වැනි සිත් කළඹවන හැඟීමක් ඔහුගේ සිතට ඇතුළු වූවහොත්, ඔහුගේ සියුම් තාර්කික ඥානය පසුබෑමකට ලක්වනු නොඅනුමානය. එසේ වුවත් ඔහුගේ අවධානයට ලක්වීමට එකම ගැහැනියක් සමත් වූවාය. ඇය අයිරින් ඇඩ්ලර් මෙනෙවියයි.

මෑත කාලයේ මට හෝම්ස් දකින්නට ලැබුණේ ඉඳහිටය. මගේ විවාහය නිසා අප දෙදෙනාට එකිනෙකාගෙන් තරමක් ඈත්වීමට සිදුවිණි. බිරිඳ සමග ගෙදරදී සතුටින් ගෙවූ ජීවිතයත්, පෞද්ගලික චිකිත්සාගාරයේ කටයුතුත් සඳහා මගේ සම්පූර්ණ කාලය මිඩංගු කිරීමට සිදුවිය. මේ අතර හෝම්ස් සමාජයෙන් තවතවත් ඈත් වෙමින්, බේකර් වීථියේ නිවහනේ තනිවිය. සමාජයේ සිරිත් විරිත් වලට නොනැමී, ඔහු නිදහස්, සැහැල්ලු තනිකඩ දිවියක් ගත කළේය. විටෙක ඔහු තමාගේ පැරණි පොත්පත් අතර ඇලී ගැලී විසූ අතර, තවත් විටෙක කොකේන්වල පිහිට සෙවීය.

http://sherlockholmesinvestigations.blogspot.com

කෙසේ වෙතත් අපරාධ පරීක්ෂණය සඳහා ඔහුගේ තිබූ ආකර්ෂණය නම් කිසිලෙසකිත් වත් අඩු නොවීය. නිරීක්ෂණය සඳහා හෝම්ස් සතුවූයේ පුදුමාකාර ශක්තියකි. කිසිසේත් විසඳිය නොහැකි යයි පොලීසිය විසින් අත්හැර දමා තිබූ ගැටලු, හෝම්ස් භාරගත්තේය. නිරීක්ෂණයන්ට හා නිගමනයන්ට පැමිණීමට ඔහුගේ ඇති සුවිශේෂ හැකියාව මගින් ඔහු හෝඩුවාවන් පසුපස හඹාගියේය. එමගින් අභිරහස් සාර්ථක ලෙස විසඳීමට හෝම්ස් සමත්විය. ඒ කාලයේ ඔහු කළ සමහර පරීක්ෂණ ගැන මට වරින් වර අසන්නට ලැබිණ.

ට්‍රෙපෝෆ්ගේ මිනීමැරුමේ සුලමුල සොයාගැනීම සඳහා වරක් හෝම්ස් ඔඩෙසා නගරය වෙත කැඳවන ලදී. ත්‍රිකුණාමලයේදී ඇට්කින්සන් සහෝදරයන්ට අත්වූ ඛේදජනක ඉරණම පිළිබඳ අභිරහස ද හෝම්ස් විසින් විසඳන ලදී. ඊට අමතරව ඕලන්ද රජපවුල හා බැඳුණු ගැටලුවක්, ඔහු රහසින්, සාර්ථකව විසඳා දුන්නේය. මේ තොරතුරු වලට අමතරව මගේ හිතවත් මිත්‍රයා ගැන මට දැනගන්නට ලැබුණේ කරුණු ඉතා ස්වල්පයකි. ඒ අනෙක් හැමදෙනාටම කියවන්නට ලැබී ඇති, පුවත්පත් වල සඳහන් වූ කරුණුයි.

එදා 1888 මාර්තු විසිවැනි දාය. රෝගියකු පරීක්ෂා කිරීමට ගොස්, රාත්‍රියේ මම ආපසු නිවස බලා එමින් සිටියෙමි. මගේ ගමන් මඟ වැටී තිබුණේ බේකර් වීථිය හරහායි. අපේ නිවහනේ මට හොඳට හුරු පුරුදු ඉදිරි දොරටුව මම පසුකර යමින් සිටියෙමි. මා විවාහ වීමට පෙර කාලයේ හා ලෝහිත පරීක්ෂණය අවධියේ, අප දෙදෙනා මුහුණ දුන් අත්දැකීම් පිළිබඳව මගේ සිහියට නැඟිණ. ෂර්ලොක් හෝම්ස් යළිත් දැකීමට මගේ සිතේ ඇතිවූයේ යටපත් කළ නොහැකි ආශාවකි.

ඔහුගේ කාමරය දීප්තිමත් අයුරින් ආලෝකමත් වී තිබිණි. වීථියේ සිට බලද්දී හෝම්ස්ගේ උස් සිරුරේ ඡායාව ජනෙල් වීදුරුවට වැටිණි. ඔහු හිස ඉදිරියට නමාගෙන, දෑත් පිටිපසට බැඳගෙන කාමරයේ ඉහළ පහළ සක්මන් කරමින් සිටියේය. ඔහුගේ පිළිවෙළ ගැන හොඳින් දැනසිටි මට, ඒය හොඳ ලකුණකි. එනම් හෝම්ස් යළිත් සුපුරුදු ලෙස අපරාධ පරීක්ෂණ කටයුතු වල නිරත වී ඇති බවයි. ඔහුගේ සිහින ලෝකය හැරදමා, අලුත් ගැටලුවක් පසු

http://sherlockholmesinvestigations.blogspot.com

පස්සේ, උණුසුම් හෝඩුවාවක් පස්සේ ලුහුබඳින්නට පටන් අරගෙන ඇති. මම පීනුව නාද කළෙමි. කලකට පෙර අප දවස ගත කළ විසිත්ත කාමරය වෙත මා කැඳවාගෙන යන ලදී.

මා දකීමෙන් හෝම්ස් අතිශය ප්‍රීතියට පත්විය. එහෙත් ඔහු කලබල වූයේ නැත. ඔහුගෙන් එවැන්නක් දක්නට ලැබුණේ කලාතුරකිනි. මා දකින්නට ලැබීම ගැන සතුටට පත්වුණු ඔහු, වචනයක් හෝ නොදොඩා මා දෙස කාරුණික බැල්මක් හෙළුවේය. අනතුරුව මට අසුන්ගන්නා මෙන් ඔහු සංඥා කළේය. කටේ තිබූ සුරුට්ටුව ඉවතට විසිකළ හෝම්ස්, මේසය දෙසට අත දිගු කළේය. එහි වූයේ මධුපානය බෝතලයක් හා සෝඩා සාදාගන්නා උපකරණයයි. මීළඟට මඳ වේලාවක් ගිනි උදුන අසල සිටගෙන සිටි මගේ මිත්‍රයා, මා ඉදිරියට පැමිණියේය. ඔහු මා වෙත සුපරීක්ෂාකාරී බැල්මක් හෙළුවේය.

"විවාහය ඔබට හොඳට ගැළපෙනවා වොට්සන්. මං හිතන්නේ මං අන්තිමට ඔබ දකිද්දීට වඩා, ඔබ රාත්තල් හතහමාරක් විතර බරෙන් වැඩිවෙලා."

"රාත්තල් හතයි."

"හැබෑට? මට හිතුණේ ඊටත් ටිකක් වැඩිවෙලා වගෙයි. යළිත් ඔබ වෙදකම පටන් අරගෙන. ඒ බවක් ඔබ මට කිව්වෙ නම් නෑ."

"හරි. ඔබ කොහොමද එය දැනගත්තෙ?

"මට ඒක පෙනෙනවා. මං ඒක නිගමනය කළා. එහෙම නම් මං කොහොමද දන්නේ, ඔබ මෑතකදී මහ වැස්සකට තෙමුණු බව? ඔබේ ගෙදර පරෙස්සමෙන් වැඩ නොකරන වැඩකාර කෙල්ලක් ඉන්නා බව?"

"මගේ හිතවත් මිත්‍රයා. මේව ඔබ කොහොම හොයා ගත්තද කියල මට නම් හිතාගන්නවත් බැහැ. සියවස් කීපයකට කලින් ඔබ ජීවත්වුණා නම් මිනිස්සු ඔබව පුළුස්සලා දාන්න ඉඩ තිබුණා, මන්තරකාරයෙක් කියල. පහුගිය බ්‍රහස්පතින්දා මං ඇවිදින්න ගිහිං, මහ වැස්සකට අහුවුණු බව ඇත්තයි. නමුත් මං අද ඒ ඇඳුම් හැඳගෙන ආවෙ නැහැ. ඉතින් ඔබ ඒක දැනගත්තේ කොහොමද කියල මට හිතාගන්න අමාරුයි. වැඩකාර කෙල්ල මේරි ජේන් ගැන කියනවා නම්, ඒකි හදන්න බෑ. මගේ බිරිඳ කෙල්ලට රස්සාවෙන්

http://sherlockholmesinvestigations.blogspot.com



103. මඳ වේලාවක් ගිනි උදුන අසල සිටගෙන සිටි මගේ මිත්‍රයා. . .

http://sherlockholmesinvestigations.blogspot.com

ඉවත්කරන බව දැනුම් දීලයි තියෙන්නෙ. ඔබ මේව හොයා ගත්තේ කොහොමද? ඒක මට හිතාගන්න වත් බෑ."

සිනාවෙ යටපත් කළ හෝම්ස්, සතුටින් දෑත් පිරිමැද්දේය.

"ඒක බොහොම සරලයි. ඔබේ වම් සපත්තුවේ ඇතුළු පැත්ත ගිනි උදුනේ එළියෙන් මට පෙනෙනවා. එතැන සපත්තුවේ හම, එකිනෙකට සමාන්තර කැපුම් පාරවල් හයක් ලෙසින් සීරී ගොස් ඇති සැටි දිස්වෙනවා. මේ වගේ දෙයක් ඇතිවෙන්නේ, සපත්තුවට ඇලී තිබුණු මඩ, නොසැලකිලිමත් ලෙස ඉවත්කිරීමට තැත් කළ නිසා බව පැහැදිලියි. ඉතින් බලන්න මගේ ද්විත්ව නිරීක්ෂණය. ඔබ අයහපත් කාලගුණයක එළියට ගිය හැටිත්, හදන්න බැරි ජාතියේ වැඩකාර කෙල්ලක් ඇති බවත්. ඊළඟට ඔබ වෙදකම යළි පටන් අරගෙන ඇති බව. මහත්මයෙක් මගේ කාමරේට ඇතුළු වෙනවා. ඔහු වෙතින් හමන්නේ අයඩොෆෝම් වල සුගන්ධය. සිල්වර් නයිට්‍රේට් පරිහරණය නිසා ඇති වූ කළු පැහැති රිදී පැල්ලමක්, ඔහුගේ දකුණු අතේ දබරැඟිල්ලේ තිබෙනවා. හිස්වැස්මේ දකුණු පැත්තේ පිම්බී ඇති තැනක් මට පෙනෙනවා. ඒ රෝගීන් පරීක්ෂා කරන නළාව තබා ඇති තැන. මේ හැම දේම නිරීක්ෂණය කරලත්, ඔහු වෛද්‍ය වෘත්තියේ යෙදෙන බව කිව නොහැකි නම්, මගේ ඇති දක්ෂකම මොකක්ද?"

ඔහු තර්කානුකූලව එම නිගමනයට පැමිණි ආකාරය, හෝම්ස් විස්තර කළේ ඉතා සැහැල්ලුවෙනි. ඒ දුටු මට සිනාව නවතාගත නොහැකි විය.

"ඔබ කාරණා ඉදිරිපත් කරන්න පටන් ගත්තම නම්, මට හිතෙන්නේ මේව මොන තරම් සරල නිගමනද, මට වුණත් පහසුවෙන් කරන්න තිබුණා නේද කියලයි. ඒ වුණත් ඔබ කරුණු පෙන්වා දීල පැහැදිලි කරන තුරු, මට කිසිම දෙයක් තේරුම් ගන්නවත් බැහැ. කොහොම වුණත් මට විශ්වාසයි, මගේ ඇස් පෙනීම ඔබේ ඇස් පෙනීම තරමටම හොඳ බව."

"ඇත්තෙන්ම ඔව්." හෝම්ස් පැවසුවේ දුම්වැටිය ඉවත දමා හාන්සිපුටුවේ වැතිරෙමිනි.

"ඔබ හැමදෙයක්ම දකිනවා. නමුත් ඔබ කිසිදෙයක් නිරීක්ෂණය කරන්නේ නෑ. අන්න ඒකයි වෙනස. අපි නිදසුනක් ගමු. පහළ

http://sherlockholmesinvestigations.blogspot.com

තට්ටුවේ සිට උඩුමහලට නගින අපේ පියගැට පෙළ ඔබ නිතර නිතර දැක තිබෙනවා නේද?"

"අපොයි ඔව්."

"කී වාරයක් විතරද?"

"වාර සිය ගණනකට වැඩි ඇති."

"එහෙම නම් එතැන තරප්පු කීයක් තිබෙනවද?"

"කීයක්? ඒක නම් මම දන්නේ නෑ."

"අන්න හරි. ඔබ තරප්පු ගණන නිරීක්ෂණය කරලා නෑ. අන්න එයයි මා කියූ කාරණය. එතැන තරප්පු 17 ක් තිබෙනවා. ඒ මොකද මා එය දුටුවා පමණක් නොමෙයි, නිරීක්ෂණයත් කළා.

ඒක නොමෙයි. ඔබ මේ සියුම් ගැටලු ගැන උනන්දුවක් දක්වන නිසාත්, මගේ පරීක්ෂණ ලියා තබන නිසාත්, මං කැමතියි ඔබට අලුත් යමක් පෙන්වන්න. මේ ගැන අධ්‍යයනය කරන්න ඔබ කැමැති වෙයි වොට්සන්."

ඔහු මේසය මත තිබූ කඩදාසියක් මා වෙතට විසි කළේය. එය රෝස පැහැය මිශ්‍ර වූ, සුදු පැහැති, තරමක් ඝන කඩදාසියකි.

"අද තැපෑලෙන් මට මේක ලැබුණේ. මටත් ඇහෙන්න කියවන්න."

මෙ ලියුමේ දිනයක් නොවූ අතර එවූ තැනැත්තාගේ ලිපිනය හෝ අත්සනක් නොවීය.

**"ඉතාම වැදගත් කරුණක් සම්බන්ධයෙන්, ඔබ හමුවීම සඳහා අද රාත්‍රි අටට කාලක් තිබියදී මහත්මයෙකු ඔබ වෙත පැමිණෙනු ඇත. පෞද්ගලික මෙන්ම ඉතා වැදගත් කරුණු ගැන ඔබ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබිය හැකි බව, මෑතකදී යුරෝපයේ රජ පවුල් කිහිපයකට ඔබ ලබාදුන් සේවාවෙන් පෙනී යයි. මේ බවට සහතික, අපට සෑම අංශයකින්ම ලැබී ඇත. එම වේලාවට ඔබගේ කාමරයේ රැඳී සිටින්න. ඔබේ අමුත්තා, මුහුණ ආවරණය කරන වෙස් මුහුණක් පැළඳ සිටියොත් ඒ ගැන වැරැදි වැටහීමක් ඇතිකර නොගන්න."**

"මේක ඇත්තෙන්ම මහා අභිරහසක්. මෙකෙ තේරුම මොකක් කියලද ඔබ හිතන්නේ?" මම ඇසීමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මට තවමත් ප්‍රමාණවත් තරම් දත්ත ලැබිලා නෑ. කෙනෙකු දත්ත ලැබෙන්න කලින් උපකල්පන ගොඩනගනවා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. එතකොට අපි නොදැනුවත්වම, ඒ උපකල්පන වලට ගැළපෙන විදියට සාක්ෂි වෙනස් කර ගන්නවා. නමුත් කළ යුත්තේ සාක්ෂි වලට අනුව උපකල්පන ගොඩනැගීමයි.

මේ ලියුම් කැබැල්ලෙන්ම කාරණා ටිකක් හොයාගන්න පුළුවනි. මොනවද වොට්සන් ඔබට මේකෙන් හොයාගන්න පුළුවන්?"

මම ලියුම් කැබැල්ල ඉතා සැලකිල්ලෙන් පරීක්ෂා කර බැලීමි.

"මේක ලියූ තැනැත්තා සල්ලි බාගෙ ඇති කෙනෙක්." මා පැවසුවේ මගේ මිත්‍රයාගේ නිගමනයන්ට පැමිණීමේ පිළිවෙළ අනුගමනය කිරීමට උත්සාහ දරමිනි.

"මේ වර්ගයේ කඩදාසි, මිලෙන් වැඩියි. කඩදාසිය සෑහෙන්න ඝනකමයි. මෙයින් පැකට්ටුවක් ක්‍රවුන් භාගයකටවත් මිලට ගන්න බැහැ." මම කීවෙමි.

"හරිම අමුතු ආකාරයක කඩදාසියක්. මේක එංගලන්තයේ හැදූ කඩදාසියක් නම් නොවෙයි. ආලෝකයට අල්ලා බලන්න." හෝම්ස් කීය.

මම එසේ කළෙමි. එවිට මට කඩදාසියේ දිය සලකුණු යොදා තිබූ ආකාරය පැහැදිලිවම දකගත හැකි විය. එහි මෙසේ සඳහන් විය.

**Eg P Gt**

"සැකයක් නෑ. මේ කඩදාසි නිෂ්පාදකයාගේ නම වෙන්න ඇති?" මම ඇසීමි.

"කොහොමටවත් නෑ. Gt යන කෙටි යෙදුම ජර්මන් භාෂාවේ යොදාගන්නා එකක්. "ගෙසෙල් ෂාෆ්ට්" යන ජර්මන් වචනය කෙටියෙන් හැඳින්වීමටයි, එය යොදන්නේ. ඒ ජර්මන් වචනයේ තේරුම, "සමාගම" නැත්නම් "ආයතනය" යන්නයි. ඊළඟට P අකුර යොදා ඇත්තේ "පේපියර්" යන වචනයට; එනම් කඩදාසි බව හැඟවීමට. ඊළඟට තියෙනවා Eg. ඒක අපි බලමු මහාද්වීපික කෝෂ ග්‍රන්ථයේ"

හෝම්ස් ඔහුගේ රාක්කයෙන් දුඹුරු පැහැති විශාල පොතක් එළියට ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"එග්ලොව්, එග්ලොනිට්ස්. . . . . ආ මේ තියෙන්නේ Eg - එගර්යා. බොහිමියාවේ ජර්මන් භාෂාව කථාකරන ප්‍රදේශයට අයත් නගරයකි. මෙය කාල්ස්බාඩ් නගරයට නුදුරින් පිහිටා ඇත. වොලන්ස්ටයින්ගේ මරණය සිදුවුයේ මේ ප්‍රදේශයේ දීය. වීදුරු හා කඩදාසි කර්මාන්තශාලා විශාල ගණනක් මෙම ප්‍රදේශයේ ඇත.

හා හා! ඒකෙන් අපට හිතාගන්න පුළුවන් මොකක්ද ලන්දාරියා?"

ඇසූ හෝම්ස් ඔහුගේ දුම්වැටියෙන් දුම් වලාවක් පිට කළේය.

"කඩදාසිය නිෂ්පාදනය කරල තියෙන්නෙ බොහිමියාවෙ?"

"හරියට හරි. අනික මේක ලියූ තැනැත්තා ජර්මන් ජාතිකයෙක්. ඔබට පෙනෙනවා නේද, මේකෙ වාක්‍ය තනා ඇති ආකාරය. ප්‍රංශ ජාතිකයෙක් හෝ රුසියානු ජාතිකයෙක් මේ වගේ වාක්‍යයක් ලියුවා කියල කොහොමටවත් හිතන්න බැහැ. තමන්ගේ ක්‍රියාපද ගැන කිසිම සැලකිල්ලක් නොදක්වන්නේ ජර්මන් කාරයෝ. එතකොට අපට දැනට හිතාගන්න පුළුවන් මෙන්න මේ ටිකයි. මුහුණ වැහෙන්න වෙස්මුහුණක් පැළඳගෙන එන, බොහිමියාවේ නිෂ්පාදිත කඩදාසි වල ලියුම් ලියන, ජර්මන් ජාතිකයාට උවමනා වෙලා තියෙන්නෙ මොනවද?"

ඔහු එය කියද්දී, අශ්වයන්ගේ කුර ගැටෙන හඬත්, කරත්ත රෝද වල ශබ්දයත් අසන්නට ලැබිණි. ඉක්මනින්ම අපේ සීනුව නාදවිය. හෝම්ස්ගේ මුවෙන් සිවුරුහන් හඬක් පිටවිය.

"ශබ්දෙ හැටියට අශ්වයො ජෝඩුවක් වගෙයි." පැවසූ ඔහු ජනේලයෙන් එබී බැලුවේය.

"හරි. ආවරණය කළ අලංකාර අශ්වකරත්තයක්. ඒ වගේම අලංකාර අශ්වයින් ජෝඩුවක්. එකෙක් ගිනි එකසිය පනහක් වත් වේවි. මේ පරීක්ෂණයේ වෙන මොනවා නැතිවුණත් සල්ලි නම් තියේවි වොට්සන්."

"මං හිතන්නේ මං මෙතැනින් ඉවත් වෙලා ගියොත් හොඳයි හෝම්ස්."

"කොහොමටවත් එපා. ඔය ඉන්න තැන ඔහොමම ඉන්න. මගේ හොඳම මිත්‍රයා නැතුව මට මොකුත් කරගන්න බෑ. මේක

http://sherlockholmesinvestigations.blogspot.com

හොඳ සිත් ඇදගන්නා සුලු පරික්ෂණයක් වෙනවා. කිසිම සැකයක් නෑ. මේක මහහැරුණොත් ලොකු පාඩුවක්."

"ඒ වුණත් ඔබේ අනුග්‍රාහකයා. . . ."

"ඔහු ගැන හිතන්න එපා. මට ඔබේ උදව් උවමනා වෙන්න, ඉඩ තියෙනවා. ඔහුටත් උදව් උවමනා වෙන්න පිළිවන්. අර හාන්සි පුටුවේ වාඩිවෙන්න වොට්සන්. ඊළඟට මේ ගැන ඔබේ අවධානය හොඳින් යොමු කරන්න."

තරප්පුවේ බරට අඩි තබා, හෙමින් හෙමින් ආ තැනැත්තා අපේ දොර ළඟ නැවතී එයට තට්ටු කළේය.

"ඇතුළට එන්න." හෝම්ස් කීය.

"ඇතුළට ආ පුද්ගලයා උසින් අඩි හයයි අඟල් හයක් වත් උස් කෙනෙකු විය යුතුය. අත් පා වල හොඳින් වැඩුණු මාංශ පේශී සහ පපුවේ ප්‍රමාණය නිසා, ඔහු හර්කියුලීස් නම් යෝධයා සිහිගැන්විය. ඔහුගේ ඇඳුමේ, ධනවත් බවේ සංකේත පිරී ඉතිරී යමින් තිබිණි. එංගලන්තයේ කෙනෙකු, මේ අමුත්තා ඇඳුම් පැළඳුම් තෝරා ගෙන ඇති ආකාරය ගැන මවිතය පළකළොත් එය පුදුමයක් නොවේ. ඔහුගේ කබා අත් මෙන්ම කබාය ඉදිරිපස ද, ඉතා වටිනා ඇස්ට්‍රකාන් සම්පටි යොදා අලංකාර කොට තිබිණි. ඔහු තද නිල් පැහැති පිට කබායක් ද හැඳ සිටියේය. එහි උරහිස් ප්‍රදේශය ගින්දර රතු සිල්ක් වලින් ආවරණය කර තිබූ අතර, බෙල්ල ළඟදී දෙපැත්ත එකතු වනසේ ගැසූ කටුව, බබලන මැණිකක් ඇල්ලූ එකක් විය. බූට් සපත්තු දණ හිස් කිට්ටුවටම දිගු වූ අතර, ඒවා ද දුඹුරු පැහැති ලෝම යොදා අරසා තිබිණි. තම මුහුණේ ඉහළ කොටස සම්පූර්ණයෙන්ම වැසෙන සේ, අපේ අමුත්තා කළු පැහැති වෙස් මුහුණක් පැළැඳ සිටියේය. ඔහු එය පළඳින්නට ඇත්තේ අපේ කාමරයට ඇතුළු වීමට මොහොතකට පෙර විය යුතුය. ඔහුගේ එක් අතක පුළුල් වාටියක් සහිත හිස්වැස්මක් ද විය. මුහුණේ පහළ කොටසෙන් මට අනුමාන කරගත හැකි වූයේ, මොහු නොසැලෙන චිත්ත ස්වභාවයක් ඇති පුද්ගලයෙකු බවයි.

"ඔබට මගේ ලිපිය ලැබුණද?"

ඔහු ඇසුවේ ජර්මන් උච්චාරණය මිශ්‍ර ගැඹුරු කටහඬකිනි.

http://sherlockholmesinvestigations.blogspot.com



109. අපේ අමුත්තා කළුපාට වෙස්මුහුණක් පැළඳ සිටියේය.

"මං ඒකෙ කියා එච්චා මෙහි පැමිණෙන බව." අමුත්තා විමතියෙන් මෙන් මාරුවෙන් මාරුවට අප දෙදෙනා දෙස බැලුවේය. ඒ, තමා ඇමතිය යුත්තේ කාටදැයි තේරුම් ගැනීමට අපහසු අයුරෙනි.

"කරුණාකරල මෙහෙත් වාඩිවෙන්න මහත්මයා" හෝම්ස් කීය.

"මේ මගේ මිත්‍රයා මෙන්ම වෘත්තීය සහකාරයා දොස්තර වොට්සන්. ඔහු තමා මගේ පරීක්ෂණ සඳහා සමහර වෙලාවලට මට උදව් වෙන්නේ. මා මේ අමතන්නේ කාටද කියා මං කැමතියි දැනගන්න?"

"මං ෆොන්ක්‍රාම් සිටුවරයා. බොහිමියාවේ ප්‍රභූ පෙළපතක කෙනෙක්. මං විශ්වාස කරනවා ඔබේ මේ මිත්‍රයා, වැදගත් කරුණක් ගැන සම්පූර්ණ විශ්වාසය තැබිය හැකි අවංක කෙනෙක් කියල. එහෙම නොවෙයි නම් මං කැමතියි මේ කතාබහ ඔබ සමඟ තනිවම කරන්න."

කාමරයෙන් පිටවී යාමේ අදිටනෙන් මම පුටුවෙන් නැගිට්ටෙමි. මගේ අතින් අල්ලා ගත් හෝම්ස්, යළිත් මා පුටුව මතටම තල්ලු කළේය.

"ඔබ කියන දෙයක් එක්කෝ අප දෙදෙනාටම කිව යුතුයි. එහෙම නැතුව එක් අයෙකුට පමණක් කියන්න ඔබට ඉඩක් ලැබෙන්නේ නෑ. ඔබ මා සමග කිවයුතු හැමදෙයක්ම, මේ මහත්මයා ඉදිරියෙත් කියන්න." හෝම්ස් පැවසීය.

"එහෙනම් මං පටන් ගන්නම්. ඔබ දෙදෙනා මේක සම්පූර්ණ රහසක් ලෙස අවුරුදු දෙකක කාලයක් රැකගැනීමට බැඳී සිටිනවා. ඒ කාලය ගතවුණාට පස්සේ මේකෙ වැදගත්කම නැතිවී යනවා. දැනට තත්ත්වය මෙහෙමයි. මේ කාරණය යුරෝපා ඉතිහාසයේ වෙනස්කමක් කිරීමට තරම් බරපතල එකක් කිව්වොත් අතිශයෝක්තියක් නෙමෙයි."

"එය රහසක් ලෙස රැකගන්නා බවට මං පොරොන්දු වෙනවා." හෝම්ස් කීය.

"මමත් පොරොන්දුවෙනවා" මම කීවෙමි.

"මම මේ විධියට වෙස් මුහුණක් පැළැඳ සිටීම ගැන මට සමාවෙන්න. මා යම් කිසි පුද්ගලයෙකුගේ නියෝජිතයෙක්. ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

කැමැති නැහැ, ඔහුගේ නියෝජිතයා වත් වෙනත් කෙනෙක් හඳුනාගන්නවාට. ඇත්තම කියනවා නම් මං ඔබට කලින් කිව්වේ මගේ ඇත්ත නම නෙමෙයි."

"ඒ බව මං දැන හිටියා. හෝම්ස් කීය.

"මේක අතිශයින්ම රහසිගත කාරණයක්. යුරෝපයේ එක් රටක රජ පවුලේ සාමාජිකයෙකුට අපකීර්තියක් ගෙන ආ හැකි දෙයක්. ඒ නිසා මේ කටයුත්ත රහස්‍ය අයුරින් කරන්න අපි හැම පියවරක්ම ගන්නවා. කෙටියෙන් කියනවා නම් මේක අදාළ වෙන්නේ බොහිමියාවේ පරම්පරාගත රජ පවුල වන ඕම්ස්ටයින් රාජ පරම්පරාවටයි."

"මං ඒකත් දැන සිටියා." යයි කෙඳිරි ගෑ හෝම්ස් හාන්සි පුටුවේ වකුටුවී දෙනෙත් පියා ගත්තේය.

යුරෝපයේ සිටින විශිෂ්ටතම රහස්පරීක්ෂකයා යයි කියනු ලබන පුද්ගලයා, අසුනේ වකුටුවී සිටින්නේ නිදිබර ගතියකින් මෙනි. තම කථාවට සවන් දීමට ඔහු සූදානම් වූ ආකාරය ගැන අමුත්තා බැලුවේ පුදුමයෙනි. ඔහුගේ මුවින් වචන කිසිවක් නොඇසුණු කල හෝම්ස් ඇස් ඇර, අමුත්තා දෙස බැලුවේ නොඉවසිල්ලෙනි.

"මහ රජතුමනි. ඔබේ ප්‍රශ්නය මා සමග වඩාත් සුහදව හෙළි කරන්න ඔබට පුළුවන්නම්, මට පුළුවනි වඩාත් හොඳින් ඔබට උපදෙසක් දෙන්න."

අසුනෙන් එක් වරම නැඟී සිටි අමුත්තා, වේගයෙන් කාමරයේ එහා මෙහා ඇවිදීමට පටන්ගත්තේය. ඔහුගේ සිත අතිශයින්ම කැළඹීමට පත් වූ බව එයින් මම වටහා ගතිමි. නොඉවසිලිමත් බවක් පළ කළ ඔහු මීළඟට, වෙස් මුහුණ අතින් ඉරා ඉවත් කොට, එය පොළොවේ ගැසුවේය.

"ඔබ හරි." ඔහුට කෑගැසිණ.

"මම තමයි රජතුමා. මොකටද මං ඒක හංගන්නෙ?"

"ඇත්තෙන්ම ඔබතුමා කථාව පටන් ගන්න කලින්ම මං දැනගත්තා, මේ බොහිමියාවේ පරම්පරාගත රජ පෙළපතේ කාස්ල් - ෆෙල්ස්ටයින් හි යුවරාජ ධුරය දරන, විල්හෙල්ම් ගොට්ස්රයිෂ් සිගිස්මොන්ඩ් ෆොන් ඕම්ස්ටයින් කුමාරයා බව."

http://sherlockholmesinvestigations.blogspot.com



112. වෙස්මුහුණ අතින් ඉරා ඉවත්කොට එය පොළොවේ ගැසුවේය.

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට තේරෙනවා නේද?" අපේ අමුත්තා ඔහුගේ සුදු පැහැති නළල් තලය මතින් අත යවා, පුටුවේ හිඳගනිමින් කීය.

"මේ වගේ වැඩවල යෙදිලා මට කිසිම පුරුද්දක් නෑ. ඒ වුණත් මේ වැඩේට මට වෙනත් කෙනෙක් යොදවන්නත් බෑ. ඒ මොකද මේ බොහොම රහසිගත සියුම් කරුණක්. මේ රහස මං තවත් කෙනෙකුට හෙළි කළොත් මට ඉස්සරහට, ඔහු කියන කියන හැටියට කටයුතු කරන්නත් සිදුවේවී. ඒ නිසා මං ප්‍රාග් නුවර ඉඳලා කිසිවෙකුට නොකියා හොර රහසේම ආවා ඔබව හමුවෙන්න."

"ඔන්න එහෙම නම් හමුවුණා." හෝම්ස් කීවේ යළිත් තම දෙනෙත් පියා ගනිමිනි.

"කෙටියෙන් කියනවා නම් කාරණා ටික මෙහෙමයි. අවුරුදු පහකට කලින්, මං පෝලන්තයේ වෝසෝ නුවර නිවාඩුවක් ගත කරන්න ගියා. එහිදී මට හඳුනාගන්න ලැබුණා විනෝදකාමී තරුණියක්. ඇය තමා අයිරින් ඇඩ්ලර් මෙනෙවිය. සැකයක් නෑ මේ නම ඔබට අහල හුරුපුරුදු ඇති?"

"දොස්තර මහත්තයා. කරුණාකරල මගේ සූචිය පරීක්ෂා කර ඇය ගැන සඳහන් තොරතුරු මොනවද කියල කියන්න."

වැදගත් පුද්ගලයින් හා සිද්ධීන් ගැන තොරතුරු ෂර්ලොක් හෝම්ස් අවුරුදු ගණනාවක් තිස්සේ එක්රැස් කළේය. ඒවා ක්‍රමානුකූලව සූචිගත කර තිබීම නිසා අවශ්‍ය වූ විටෙක තොරතුරු සොයා ගැනීම අපහසු වූයේ නැත. යුදෙව් ආගමික පූජකයෙකුගේ සහ ගැඹුරු මුහුදේ මසුන් ගැන ලිපි ලියූ හමුදා නිලධාරියෙකුගේ නම් අතරේ තිබී මට ඇගේ නම හමුවිය.

"කෝ බලන්න! හ්ම්. 1858 දී එක්සත් ජනපදයේ නිව්ජර්සි ජනපදයේ උපත ලැබුවාය. කොන්ට්‍රාල්ටෝ හ්ම්! ලාස්කාලා හ්ම්! වෝසෝහි ඉම්පීරියල් ඔපෙරා ඔව්. ඔපෙරා නෘත්‍ය රඟපෑමෙන් විශ්‍රාම ගත්තාය. හා! ලන්ඩනයේ ජීවත් වෙයි. හරියට හරි.

රජතුමනි. මං කියන්නම්. මට තේරෙන හැටියට ඔබ මේ තරුණිය එක්ක පැටළුණා. ඇයට ලිව්වා ලියුම් කිහිපයක්. දැන් ඒ ලියුම් ටික ආපහු ඕනෙ කරල තියෙනවා."

"හරියට හරි. නමුත් කොහොමද ඒක කරන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"රහසිගතව ඔබ හා ඇය අතර විවාහයක් ලියාපදිංචි කෙරුණාද?"

"නැහැ."

"නීත්‍යානුකූල ලියවිල්ලක් හෝ සහතික කිරීමක් සිදුවුණාද?"

"ඒත් නැහැ."

"එහෙම නම් ඉතින් මෙතැන ප්‍රශ්නයක් ඇති බවක් මට පෙනෙන්නේ නැහැ. මේ තැනැත්තිය ඔබේ ලියුම් ප්‍රසිද්ධියට පත් කරනවා කියලා තර්ජනය කරනවා කියල හිතමු. ඒවා ඇත්ත ලියවිලි බවට ඇය කොහොමද ඔප්පු කරන්නෙ?"

"මගේ අත්අකුරු, මගේ අත්සන?"

"පූඃ හොර අත්සන් කාරයෙකු ලවා ඒ ටික කරවා ගන්න පුළුවනි."

"මගේ පෞද්ගලික ලියන කඩදාසි?"

"හොරකම් කර ගත හැකියි."

"මගේ පෞද්ගලික මුද්‍රාව?"

"එහෙම එකක් හදාගන්න බැරි කමක් නෑ."

"මගේ ඡායාරූපය?"

"මිලට ගන්න පුළුවනි."

"අපි දෙදෙනාම එකම ඡායාරූපයේ?"

"අනේ දෙවියනේ! එහෙම වුණොත් නම් අවුලක්. රජතුමනි ඔබතුමා බොහොම දරුණු විධියට පැටලිලයි ඉන්නේ."

"මං ක්‍රියා කළේ පිස්සෙක් වගේ."

"ඔබ නොදැනුවත්වම මහ බරපතල අවදානම් තත්ත්වයකට මුහුණදීලයි ඉන්නෙ."

"ඒ කාලෙ මං ඔටුන්න හිමි කුමාරයා පමණයි. ඒ තරුණ කාලේ. දැන් නම් මට වයස තිහක් වෙනවා."

"ඒ ඡායාරූපය කොහොම හරි අප ගත යුතුයි."

"අපි ඒක උත්සාහ කළා මහත්මයා. නමුත් අසාර්ථක වුණා."

"රජතුමනි. මුදල් ගෙවා ඒක මිලට ගන්න බලන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇය ඒක විකිණීම ප්‍රතික්ෂේප කරනවා."

"එහෙනම් හොරකම් කරන්න."

"පස්වාරයක් අපි උත්සාහ කළා. දෙවරක් මම මුදල් ගෙවා, පලපුරුදු ගෙවල් බිඳින්නන් දමලා ඇගේ ගෙයි බඩු සම්පූර්ණයෙන්ම අනිත් පැත්ත පෙරළුවා. එක සැරයක් ඇගේ ගමන් බඩු වෙනත් තැනකට යවලා සෝදිසි කෙරෙව්වා. තවත් දෙසැරයක් ඇය අස්ව කරත්තයෙන් යද්දී, මගදී මංකොල්ල කන ආකාරයට බඩු අවුස්සා සෝදිසි කර බැලුවා. කිසිම ප්‍රයෝජනයක් වුණේ නැහැ."

"ඡායාරූපය ගැන කිසිම සලකුණක් නෑ?"

"මොකුත් ලකුණක් නෑ."

"මේක කුඩා, එහෙත් සංකීර්ණ ගැටලුවක්." කිව් හෝම්ස් සිනාසුණේය.

"ඒ වුණාට මට බොහොම බරපතල ප්‍රශ්නයක්." රජතුමා කීය.

"ඒක සම්පූර්ණ ඇත්ත. ඉතින් මේ ඡායාරූපයෙන් ඇය මොකද්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මාව විනාශ කරන්න."

"ඒ කොහොමද?"

"මං ළඟදිම විවාහ වෙනවා."

"මටත් ඒ බව අහන්න ලැබුණා."

"මං විවාහ වෙන්න බලාපොරොත්තු වෙන්නේ, ස්කැන්ඩිනේවියාවේ මහ රජතුමාගේ දෙවැනි දුවණිය වන, ක්ලොටිල්ඩා ලොත්මන් සැක්සිමෙනින්ජන් කුමරිය සමඟ. ඔබ අහල ඇති ඇගේ පවුලේ දැඩි විනය හා නීති රීති ගැන. ඇය පැරණි සිරිත් විරිත් ගරු කරන බොහොම ලාමක තැනැත්තියක්. මේක ගැන ආරංචියක් වත් පැතිරුණොත් මගේ විවාහය එතැනින් කෙළවර වෙයි."

"එතකොට දැන් අයිරින් ඇඩ්ලර් මොකද්ද කියන්නෙ?"

"ඡායාරූපය ස්කැන්ඩිනේවියානු රජ පවුල වෙත යවන බවට ඇය තර්ජනය කරනවා. මං හොඳටම දන්නවා. කිසි සැකයක් නෑ. ඈ ඒක කරාවි. ඔබ දන්නෙ නෑ ඇය ගැන. අයිරින්ට තියෙන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

වානේ වාගේ දැඩි හිතක්. ඇයගේ මුහුණ නම් ඉතාම ශෝභන මුහුණක්. නමුත් හිත, පිරිමින්ට තියෙන කාලේ උණු නොවෙන ගල් හිතක්. මං වෙනත් කවුරු හරි ගැහැණියක් විවාහ කරගන්න එක වළක්වන්න ඇයට පුළුවන් හැම දෙයක්ම කරාවි."

"ඇය තවමත් මේ පිංතූරය යවා නැති බව ඔබට විශ්වාසද?"

"මට හොඳට විශ්වාසයි."

"කොහොමද ඒක හරි හැටි කියන්නෙ?"

"ඒ මොකද අයිරින් කිව්වා, මගේ විවාහය ගැන නිල වශයෙන් ප්‍රසිද්ධියට පත් කළ දවසේ, ඡායාරූපය ස්කැන්ඩිනේවියානු රජ පවුල වෙත යවනවා කියල. නිල වශයෙන් ප්‍රසිද්ධ කිරීම ලබන සඳුදා සිදුවෙනවා."

"එහෙම නම් අපට තව තියෙන්නේ දවස් තුනයි." හෝම්ස් කීවේ ඇනුමක් හරිමිනි.

"හොඳ වෙලාවට මට මේ දිනවල යෙදෙන්න තියෙන්නේ තවත් වැදගත් වැඩ එකක් හෝ දෙකක් අමණයි. රජතුමනි ඔබතුමා මේ දිනවල ලන්ඩනයේ නේද නතර වී ඉන්නේ?"

"සත්තකින්ම ඔව්. මං ලැංහැම් හෝටලයේ නැවතී ඉන්නේ පොන්ක්‍රාම් සිටුවරයා නමින්. ඔබට එතැනදී මාව හමුවෙන්න පුළුවන්."

"හොඳයි. අපේ ඉදිරි ගමනේ සාර්ථකත්වය ගැන කියලා මං ඔබට ලිපියක් එවන්නම්."

"කරුණාකර එය කරන්න. මං ඉන්නේ හරිම මානසික කැළැඹීමකට පත් වෙලා."

"මේ සඳහා වියදම් කිරීමට මුදල්?"

"මං ඔබට අත්සන් කළ හිස් චෙක්පතක් දෙන්නම්. කැමති ගණනක් ලියා ගන්න."

"හැබෑට?"

"මේ ඡායාරූපය ලබාදිය හැකිනම් මගේ රාජධානියෙන් එක් පළාතක් තෑගි දෙන්නම්."

"දැනට වියදමට?"

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ පිටකබාය ඇතුළතින් රජතුමා, බර, හම් පසුම්බියක් එළියට ගෙන මේසය මත තැබුවේය.

"මෙතැන පවුම් දහසක් තිබෙනවා. තුන් සියයක් රන්පවුමෙ කාසි. හත්සියයක් පවුමේ නෝට්ටු."

"අයිරින් ඇඩ්ලර් මෙනෙවියගේ ලිපිනය මොකක්ද?"

"බ්‍රියොනි මන්දිරය, සර්පන්ටයින් මාවත, සැන් ජෝන්ස් වුඩ්."

හෝම්ස් එය සටහන් කර ගත්තේය.

"තවත් එක් ප්‍රශ්නයක් තිබෙනවා. ඡායාරූපය කැබිනට් ප්‍රමාණයේ එකක්ද?"

"ඔව්"

"එහෙනම් ඔබට ශුභ රාත්‍රියක් රජතුමනි. මං විශ්වාස කරනවා ඔබට සතුටුදායක ආරංචියක් ඉක්මනින්ම ලබාදීමට අපට හැකිවේවි කියල."

රජතුමා පිටවී ගියේය. රාජකීය අශ්වකරත්තය ඉදිරියට ගමන්ගත් අයුරු හෝම්ස් බලා සිටියේය.

"ඔබටත් ශුභ රාත්‍රියක් වොට්සන්. හෙට හවස තුනට මෙහේට එන්න පුළුවන් නම් මං කැමතියි ඔබ එක්ක මේ ගැන වැඩිපුර කතාබහ කරන්න."

* * *

හරියටම සවස තුනට මම බේකර් වීථියට පැමිණියෙමි. එහෙත් ඒ වනවිටත් හෝම්ස් ආපසු පැමිණ සිටියේ නැත. උදේ අට පසුවී මඳ වේලාවකින් හෝම්ස් නිවසින් පිටත් වී ගිය බව ගෙහිමි කාන්තාව මට දැනුම් දුන්නාය. හෝම්ස් ආපසු පැමිණීමට කොතරම් ප්‍රමාද වුණත්, ඔහු එනතුරු රැඳී සිටින්නෙමැයි මම අදිටන් කරගත්තෙමි. මෙම පරීක්ෂණය පිළිබඳව දැනටම මගේ සිතේ දැඩි ආශාවක් ඇතිවී තිබිණි. මෙහි යම්කිසි අපරාධයක් හෝ ඛේදජනක සිදුවීමක් නොමැති බව සැබෑය. එහෙත් හෝම්ස්ගේ අනුග්‍රාහකයා රාජකීයයෙකු වීම නිසාම, මෙය සුවිශේෂ මුහුණුවරක් ගෙන ඇත.

නිවසේ දොර විවෘත වෙද්දී සවස හතර වී තිබිණි. රස්තියාදුකාරයෙකුගේ ඇඳුමෙන් සැරසුණු, මුහුණ පුරා රැවුලක් වැවුණු,

http://sherlockholmesinvestigations.blogspot.com

අපිරිසිදු පෙනුමක් තිබූ, වෙරිමතින් සිටි, පුද්ගලයෙකු කාමරයට ඇතුළු විය. මගේ මිත්‍රයාට වෙස්වලා ගැනීමට තිබූ දක්ෂතාවය ගැන මම හොඳින් දැන සිටියෙමි. එහෙත් මේ ඔහුම දැයි සැකහැර දැනගැනීමට, මට දෙතුන් වරක් මේ පුද්ගලයා දෙස බැලීමට සිදුවිය. මා වෙත හිස නමා ආචාර කොට ඔහු නිදන කාමරයට ඇතුළුවිය.

මිනිත්තු පහකින් හෝම්ස් ආපසු ආවේ සුපුරුදු පෙනුමෙනි. හාන්සි පුටුවේ වැතිරුණු ඔහු ගදපා ගිනි උදුන දෙසට දිගුකොට, මිනිත්තු කිහිපයක් එක දිගටම සිනාසුණේය.

"ඇත්තටම වොට්සන්. . . ."

හෝම්ස් යළිත් වරක් සිනාසීමට පටන් ගත්තේය. මෙවර ඔහුට හුස්ම ගැනීමට ද අපහසු වූ අයුරක් මම දුටුවෙමි. ඔහු පුටුවේ පිටුපසට හේත්තු වූයේ මුළු ශරීරයම අප්‍රාණික වූ කලක මෙනි.

"ඇයි මොකද මොකද?"

"මහා විහිළුවකටයි මට මුහුණ දෙන්න සිද්ධවුණේ. මං හිතන්නෙ නෑ ඔබට කොහොමටවත් හැකිවෙවි කියලා මං උදේ වරුව ගත කළේ කොහොමද කියලි කියන්න. ඊළඟට මං මොනවද අවසාන වශයෙන් කළේ කියල හිතන්න?"

"මට හරියටම කියන්න බෑ. නමුත් මම හිතන්නේ ඔබ අයිරින් ඇඩ්ලර් යන එන තැන්, ඇගේ නිවස ගැන සෝදිසියෙන් ඉන්න ඇති?"

"හරියට හරි. නමුත් ඒක සිද්ධවුණේ වෙනත් පිළිවෙළකට. උදේ අට පහුවෙද්දී මං මේ ගෙදරින් පිටවෙලා ගියා. මං සැරසිලා ගියේ රක්ෂාවක් නැති රස්තියාදු කාරයෙකුගේ ඇඳුමෙන්. මට පුළුවන් වුණා ඇගේ ගෙදර ඉස්තාලයේ සුළු සුළු වැඩ ටිකක් කරන්න. ඒ මොකද අශ්වයින් බලාගන්නා මිනිස්සු රැකියාවක් නැති අය ගැන හරියට අනුකම්පා කරනවා.

බ්‍රියොනි මන්දිරය තට්ටු දෙකේ මැඳුරක්. ප්‍රධාන පාර ළඟටම එනකං නිවස පිහිටා තියෙනවා. මල් උයන තිබෙන්නේ ගේ පිටිපස. ඉස්සරහ දොරට සවිකර තියෙන්නේ කඩන්න බැරි අගුළක්. නිවසේ දකුණු පැත්තේ විශාල විසිත්ත කාමරයක්. එහි ලී බඩු හුහක් තියෙනවා. ජනේල පොළොව මට්ටමේ සිට සිවිලිම කිට්ටුවටම

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



119. ". . . . අපිරිසිදු පෙනුමක් තිබූ වෙරිමතින් සිටි පුද්ගලයෙකු කාමරයට ඇතුළුවිය."

http://sherlockholmesinvestigations.blogspot.com

පිහිටි දිගු ඒවා. ජනෙල් වලට දාල තියෙන්නේ පුංචි ළමයෙකුට වුණත් අරින්න පුළුවන් ජාතියේ අගුළු. ගේ පිටුපස පැත්තේ ඒ තරම් වැදගත් දෙයක් තිබුණෙ නැහැ. හැබැයි බරාඳයේ ජනේලය තිබෙන තැනට අශ්වගාල පැත්තෙන් ළඟා වෙන්න පුළුවනි. මම ගේ වටේටම ඇවිදලා බැලුවා. හැම කෝණයකින්ම වගේ පරීක්ෂාවෙන් බැලුවා. ඒත් වැදගත් යමක් දැකගන්න ලැබුණෙ නැහැ.

ඊළඟට මම එතැනින් පිටවෙලා පාර දිගේ ඉදිරියට ආවා. ඇඩ්ලර් මෙනෙවියගේ ගේ පිටුපස උද්‍යානයක් තිබෙන බව මං ඔබට කිව්වා නේ. මේ උද්‍යානයට මායිම්ව පාරක් තියෙනවා. මෙකෙ තියනවා විවෘත ඉස්තාලයක්. මං එතැන අශ්වයින් බලන මිනිස්සුන්ට උදව් කළා. ඒකට ගාස්තුව වශයෙන් මට ලැබුණා බීම වීදුරුවක්, දුම්කොළ ටිකක්, පැන්ස දෙකක් සහ තොරතුරු රාශියක්. ඇඩ්ලර් මෙනෙවිය ගැන ඕපාදූප කතා බොහොමයක් එතැන කියැවුණා. ඇයගෙ විතරක් නෙමෙයි අහල පහළ තවත් අයගෙ ජීවන චරිතත් කියැවුණා. අහන්න උවමනාවක් නොතිබුණත් මට ඒවත් අහගෙන ඉන්න සිදුවුණා."

"ඉතින් අයිරින් ඇඩ්ලර් ගැන මොනවද කියැවුණේ?"

"ඇයගේ රූපශෝභාව ගැන නම් මිනිස්සු ඔක්කොම වශීවෙලා. මේ මුළු ග්‍රහලෝකයටම ඉන්න ශෝභා සම්පන්න කාන්තාව ඇයලු. ඇය ගත කරන්නෙ බොහොම නිහඬ ජීවිතයක්. විවිධ ප්‍රසංග වල ගීත ගායනා කරන්න යනවා. හැමදාම හවස පහට අශ්ව කරත්තයේ නැගී පිටත්වෙලා යනවා. හරියට රෑ හතට ආපහු ගෙදර එනවා රෑ කෑමට. ගීත ගායනයක් සඳහා යන්න නොතිබුණොත්, ගෙදරින් පිටවෙලා යන්නෙ කලාතුරකින්. ඇය හමුවෙන්න එන්නෙ එකම පිරිමි අමුත්තයි. ඔහු නම් නිතර නිතර එනවාලු. ඔහු බොහොම කඩවසම් තරුණයෙක්. නොවරදවාම දවසකට වරක්, බොහොම දාට දෙවරක්, එනවාලු. ඔහු තමයි අධිකරණයේ නීතිඥ ගොඩ්ප්‍රි නෝටන් මහතා.

බලන්න, සමීප තොරතුරු ලබා ගැනීමට අශ්වකරත්ත රියදුරෙකුගේ සහාය ලබාගැනීමෙන් සැලසෙන වාසිය. මේ රියැදුරන් දහදොළොස් වතාවක් ඔහුව ගෙදර ගෙනිහින් තියෙනවා, ඇයගේ නිවසේ සිට. ඉතින් ඔහු ගැන හැම විස්තරයක්ම ඔවුන් දැනහිටියා. ඔවුන්ගෙන් ලබාගන්න පුළුවන් හැම තොරතුරක්ම ලබාගත්තට

http://sherlockholmesinvestigations.blogspot.com

පස්සේ, මං බ්‍රියොනි මන්දිරය ළඟින් තවත් සැරයක් ඉහළ පහළ ගමන් කළා. මං කල්පනා කළේ මේ වැඩේ කරන්න මං සැලසුම් කළයුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියලයි.

ගොඩ්ෆ්‍රි නෝර්ටන් නම් මේ පුද්ගලයා මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැදගත් චරිතයක්. ඔහු නීතිඥයෙක්. ඒක ඒ තරම් හොඳ ලකුණක් නෙමෙයි. මොකක්ද ඔවුන් දෙදෙනා අතර ඇති සම්බන්ධය? නිතර නිතර ඔහු ඇය හමුවීමට යන්නේ ඇයි? ඇය ඔහුගෙන් නීති උපදෙස් ලබාගන්නවාද? එහෙමත් නැත්නම් ඔහු මිත්‍රයෙක්ද? නැත්නම් ඇය ඔහුගේ පෙම්වතියද? කාරණාව පළමුවැනි එක නම් අර ඡායාරූපය බොහොම වෙලාවට ඔහුට දීල ඇති පරෙස්සම් කරන්න. කාරණාව අන්තිම එක නම් එහෙම භාරදීල ඇති කියල හිතන්න අමාරුයි. මෙන්න මේක උඩ තමයි මං ඊළඟට ගත යුතු පියවර තීරණය වෙන්නෙ.

මං බ්‍රියොනි මන්දිරයට ඇතුළුවිය හැකි ක්‍රමයක් ගැන දිගටම කල්පනා කරනවද? එහෙමත් නැත්නම් මේ නීතිඥ මහත්මයාගේ කාර්යාලය ගැන මගේ අවධානය යොමු කරනවාද? මේක මා කොහොම හරි විසඳා ගතයුතු සියුම් ප්‍රශ්නයක් වුණා. ඒකෙන් වුණේ මා විසින් කළ යුතු විමසීම් වඩාත් පුළුල්ව කිරීමට සිදුවීමයි."

"ඉතින් ඊළඟට?"

"හරි. මම බ්‍රියොනි මන්දිරය අසලට වෙලා කල්පනා කරමිනුයි හිටියේ. එක්වරම අශ්වකරත්තයක් ඇවිත් මැඳුර ඉදිරිපිට නැවැත්තුවා. ඒකෙන් එළියට බැස්සෙ මහත්මයෙක්. ඒ පුද්ගලයා උඩු රැවුළක් එහෙම තිබුණු හොඳ කඩවසම් කෙනෙක්. මේ මං අහල තිබුණු නීතිඥ මහත්මයා වෙන්න ඇති කියලයි මට හිතුණෙ. ඔහු සිටියේ බොහොම ලොකු හදිස්සියකින් වගෙයි. අශ්වකරත්ත රියැදුරාට රථය රඳවාගෙන ඉන්න කියල කෑගහල කිව් ඔහු, බ්‍රියොනි මැඳුර පැත්තට දිව්වා. ගෙයි දොර විවෘත කළ සේවිකාවත් පසුකරගෙන ඔහු ගේ ඇතුළට කඩාවැදුණා, හොඳ පුරුදු කාරයෙක් වගේ.

ඔහු ගේ ඇතුළේ ඉන්න ඇති පැය භාගයක්. විසිත්ත කාමරයේ ජනෙල් තුළින්, මේ මහත්මයා කලබලයෙන් මෙන් ඉහළ පහළ ඇවිද්ද හැටි මට දකින්න ලැබුණා. ඊට අමතරව ඔහු කැළැඹීමකට පත්වී ඇති ආකාරයෙන්, අත් එහෙ මෙහෙ දිගුකරමින් කථා කළ

http://sherlockholmesinvestigations.blogspot.com

හැටිත් මා දුටුවා. අයිරීන් ඇඩ්ලර් මෙනෙවිය මට දකින්න ලැබුණේවත් නැහැ. ඊළඟට ඔහු නිවසෙන් එළියට ආවා. ඒ ආවෙ ඉස්සර වෙලාටත් වඩා කලබලයෙන්. ඒ එද්දි ඔහු රත්තරන් ඔරලෝසුවක් සාක්කුවෙන් එළියට ඇදලා අරගෙන වෙලාව බැලුවා.

"යක්ෂයෙක් කරත්තය දක්කනවා වගේ දක්කන්න. මුලින් යමු රීජන්ට් වීථියේ ග්‍රොස් ඇන්ඩ් හැන්කීස් සමාගමට. ඊළඟට යමු එඩ්ග්වෙයා පාරේ සෙන්ට් මොනිකා දෙව් මැඳුරට. ඉක්මන් කරනවා. මිනිත්තු විස්සකින් ගියොත් මං තමුසෙට ගිනි බාගයක් තෑගි දෙනවා."

ඔවුන් විදුලි වේගයෙන් පිටත්වෙලා ගියා. ඔවුන් පසුපස යම්දෝ නොයම්දෝ කියල කල්පනා කර කර, මං පාර අයිනට වෙලා හිටියේ. ඔන්න එක්වරම ආවා නවත් පුංචි අශ්ව කරත්තයක්. ඒකෙ රියැදුරා තමන්ගෙ ඇඳුම් පැළඳුම් වත් හරිහැටි ඇඳගෙන හිටියෙ නැහැ. කබායේ බොත්තම් පවා බාගෙට දමාගත්තු ගමන්. ඇය කරත්තයට ගොඩවුණා. එතකොට මට ඇගේ මුහුණ යන්තමින් දකින්න ලැබුණා. යන්තමට දුටුවත් ඒක හරිම ලස්සන මුහුණක්. ඒ මුහුණ වෙනුවෙන් මිනිහෙක් දිවි පුදන්න වුණත් ඉඩ තියෙනවා.

"ජෝන්. වහාම යමු සෙන්ට් මොනිකා දෙව් මැඳුරට. ඉක්මන් කරන්න. විනාඩි විස්සෙන් ගියොත් පවුම් භාගයක් දෙනවා."

ඇය කෑගැසුවා.

මේක ලෙහෙසියෙන් අත්හැර දමන්න පුළුවන් අවස්ථාවක් නෙමෙයි වොට්සන්. මං කල්පනා කරමින් හිටියෙ මමත් ඇය පසුපස යනවද කියලයි. එතකොටම කුලීරියක් එතැනට ආවා. මගේ රස්තියාදුකාර පෙනුමට, මාව නග්ග 'ගන්න රියැදුරාගේ කැමැත්තක් නැති බව පෙනුණා. ඒ වුණත් ඔහු බැහැ කියන්න කලින් මං කුලීරියට නැගුණා.

"සෙන්ට් මොනිකා දෙව් මැඳුරට! මිනිත්තු විස්සෙන් ගියොත් පවුම් භාගයක් දෙනවා." මාත් කෑගැහුවා.

මගේ රියැදුරා අශ්වකරත්තය බොහොම වේගයෙන් ධාවනය කළා. මං හිතන්නෙ නෑ මං කවදාවත් ඒ තරම් වේගයකින් අශ්ව කරත්තයක ගමන් කරලා ඇති කියල. ඔවුන් මට කලින් එතැනට ගොස් සිටියා. රියැදුරාට මුදල් ගෙවල මං ඉක්මනට දෙව් මැඳුර

http://sherlockholmesinvestigations.blogspot.com

තුලට ගියා. ඒ දෙන්නත් පූජකතුමෙකුත් ඇරෙන්න දෙව් මැදුර තුල වෙන එක මනුස්සයෙක් වත් හිටියෙ නැහැ. ලෝගුවකින් සැරසී සිටි පූජක තුමා අර දෙදෙනා විසින් කළ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර, කරුණු පහදාදීමක් කරමින් හිටි බවයි මට පෙනුණේ. ඔවුන් තුන්දෙනාම අල්තාරය ඉදිරිපිට සිටගෙනයි උන්නෙ.

නිකං රස්තියාදු වෙන මිනිහෙක් පල්ලියකට ඇතුළුවුණා වගේ මං ඔහේ ඉදිරියට ඇවිදගෙන ගියා. මාව පුදුමයට පත්කරමින් ඔවුන් තුන්දෙනාම එක්වරම මා දිහා බැලුවා. ගොඩ්ෆ්‍රි නෝටන් වහාම මා දිහාවට දුවගෙන ආවා.

"දෙවියන්ට ස්තුති වේවා! ඔබට පුළුවන්. එන්න! එන්න! ඔබට මේක පුළුවන්." ඔහු කෑගැසුවා.

"මොකක්ද?" මං ඇහුවා.

"එනවා මනුස්සයෝ එනවා! තව මිනිත්තු තුනයි තියෙන්නේ. ඒ වෙලාව ඇතුළත නොකොළොත් මේකෙ නීතිමය බව අවලංගු වෙනවා."

මෙහෙම කිව් නෝටන් මාව අල්තාරය දිහාවට ඇදගෙන ගියා. මං මේ ඉන්නෙ කොහේද කියල වත් තේරුම් ගන්න මට වෙලාවක් තිබුණේ නෑ. මගේ කන්වලට ප්‍රශ්න වගයක් කෙඳිරි ගෑවා. මමත් ඒවට උත්තර දුන්නා. ඔවුන් දෙදෙනා ගැන කිසිදෙයක් නොදන්නවා වුණත්, ඔවුන් හඳුනන බවත්, අවිවාහක තරුණියක වන අයිරින් ඇඩ්ලර්, අවිවාහක ගොඩ්ෆ්‍රි නෝටන් සමග විවාහයට සාක්ෂිකරුවකු බව මම දිවුරා අවංකව සහතික කළා. විවාහ මඟුල සිදුවෙන්න ගතවුණේ එක මොහොතයි කිව්ව හැකි. ඊළඟට ඔවුන් දෙදෙනාම මට ස්තුති කළා. මේක මගේ ජීවිතේටම මං මුහුණදුන් පිස්සු විකාරම සිදුවීම. ඒක මතක් වෙලයි මං දිගින් දිගටම හිනාවුණේ.

මට පෙනුණු හැටියට ඔවුන් දෙදෙනාගෙ විවාහ ගිවිසුමේ, මොකක් හරි අඩුපාඩුවක් තිබිල තියෙනවා. මං හිතන්නේ, සාක්ෂිකාරයෙකු නොමැතිව විවාහය සිදුකිරීම දේවගැතිතුමා ප්‍රතික්ෂේප කරන්න ඇති. ඊළඟට මාව අහම්බෙන් දුටුවාම ඔවුන්ගේ ප්‍රශ්නය විසඳුණා. මනාලිය මට රත්තරන් පවුමක් තෑගි දුන්නා. ඒ අවස්ථාව සිහිවීමට ඒ පවුම, මගේ ඔරලෝසු දම්වැලේ එල්ලා ගන්නයි මං බලාපොරොත්තු වෙන්නෙ වොට්සන්."

http://sherlockholmesinvestigations.blogspot.com

"සිද්ධිය හැරිල තියෙන්නේ අපි කිසිසේත් බලාපොරොත්තු නොවූ පැත්තට නේ. ඉතින් ඊට පස්සේ මොකද වුණේ?"

"මගේ සැලසුම් ඔක්කොම අවුල් වුණු බව මට තේරුම් ගියා. මට පෙනුණු හැටියට ඔවුන් බොහොම ඉක්මනින් රටින් පිටවෙලා යාවි. ඒ නිසා මගේ වැඩ කටයුතු බොහොම ඉක්මනටත්, සාර්ථකවත් කරගත යුතු බව පෙනුණා. දේවමැඳුරේ දොර ළඟදී ඔවුන් දෙදෙනා වෙන්වී ගියේ දෙපැත්තට. ඇය ආපහු ගෙදර ගියා. ඔහු නීතිඥ කාර්යාලයට ගියා.

"වෙනදා පුරුදු විදියට හවස පහට මං එනවා උද්‍යානයට." වෙන්වෙද්දී ඇය ඔහුට කිව්වා. වෙන මොකුත් මට අහගන්න ලැබුණෙ නැහැ. ඔවුන් දෙපැත්තට ගියපසු මං මගේ වැඩ සඳහා පිටත්වෙලා ආවා."

"මොනවද ඒ වැඩ කටයුතු?"

"මස් ටිකක් සහ කිරි වීදුරුවක් ගෙනෙන්න."

සීනුව නාද කළ හෝම්ස්, සේවක ළමයාට කීය.

"මට අද කෑම ගැන හිතන්නවත් වෙලාවක් තිබුණෙ නෑ. අද හැන්දෑ වරුවෙ මගේ වැඩකටයුතු වඩාත් කලබලකාරී වේවි. ඒක නෙමෙයි දොස්තර මහත්මයා. අද හවසට ඔබේ උදව් මට අවශ්‍ය වෙන්න ඉඩ තියෙනවා."

"ඔබේ උදව්වට පැමිණිය හැකි නම් ඒක මට සතුටක්."

"ඔබ මා වෙනුවෙන් නීති විරෝධී වැඩක් කරන්න බය නැහැ නේද?"

"කිසි ප්‍රශ්නයක් නැහැ."

"පොලිස් අත්අඩංගුවට පත්වීමේ අවදානමකුත් තියෙනවා. කමක් නැද්ද?"

"හොඳ අරමුණකින් නම් කමක් නෑ."

"අරමුණ නම් ඉතාම විශිෂ්ට එකක්."

"එහෙම නම් මගේ සම්පූර්ණ සහයෝගය ඔබට ලැබෙනවා."

"මං දනගෙන හිටියා ඔබ වෙත මගේ සම්පූර්ණ විශ්වාසය තබන්න පුළුවන් බව."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකක්ද ඔබට මගෙන් කෙරෙන්න ඕනෑ?"

"ටර්නර් මහත්මිය කෑම බන්දේසිය ගෙනැත් තියල ගියාට පස්සේ මං එය පැහැදිලි කරන්නම්." හෝම්ස් කීය.

ගෙහිමි කාන්තාව කෑම බන්දේසිය මේසය මත තැබුවාය. ඇය එතැනින් ඉවත්ව යනතුරු බලාසිටි හෝම්ස් කෑම මේසයට ළංවූයේ අධික කුසගින්නෙන් පෙළුණු අයෙකු විලසිනි.

"මට ඒ හැටි වෙලාවක් ඉතිරි වෙලා නෑ. ඒ නිසා කෑම කන අතරෙම අපි සාකච්ඡා කරමු. දැන් වෙලාව හවස පහටත් කිට්ටුයි. තව පැය දෙකකින් ඒ කියන්නේ හැන්දෑවේ හතට, අපි මේ කටයුත්ත සිදුවෙන තැන ඉන්න ඕන. අයිරින් ඇඩ්ලර් මෙනෙවිය නැත්නම් "මැඩම්" ඇගේ සංචාරය අවසන් කරලා රෑ හතට ආපහු එනවා. ඒ වෙලාවෙ අපි බ්‍රියොනි මන්දිරය අසල ඉන්න ඕනෑ ඇයව පිළිගන්න."

"ඊට පස්සෙ?"

"ඊට පස්සේ කෙරෙන්න ඕන වැඩ ටික මට භාරයි. එතැන වෙන්න ඕනෙ හැම දෙයක්ම මං සැලසුම් කරලයි තියෙන්නෙ. මං ඔබට එක කරුණක් අවධාරණයෙන් කියන්න කැමතියි. මොකක්ද? එතැන මොනවා සිදුවුණත් ඔබ ඒකට මැදිහත් වෙන්න යන්න එපා. ඔබට තේරුණාද?"

"ඒ කියන්නේ පැත්තක් නොගෙන නිහඬව ඉන්නයි මට තියෙන්නේ?"

"ඔබ කිසිම දෙයක් කරන්න යන්න එපා. එතැන සමහර විට අප්‍රසන්න සිදුවීමක් ඇතිවෙන්න පුළුවනි. ඔබ ඒකට හවුල් වෙන්න හෝ මැදිහත් වෙන්න යන්න එපා. ඒක අවසන් වෙන්නේ මාව නිවස තුළට ගෙන යාමෙන්. මිනිත්තු හතරකට හෝ පහකට පස්සේ විසිත්ත කාමරයේ ජනේලයක් විවෘත වේවි. ඔබ ඒ ජනේලය කිට්ටුවෙන්ම රැඳී ඉන්න."

"ඔව් ඉතින්?"

"ඔබ මා දිහා බලාගෙනම සිටිය යුතුයි. ඔබට මා ඉන්නා හැටි පෙනේවි."

"හරි. ඉතින් ඊළඟට?"

"ඊළඟට මම මගේ අත එසෙව්වාම, මං ඔබට දෙන, මෙන්න මේ දෙය ජනේලයෙන් ගේ ඇතුළට විසිකරන්න. ඊළඟට ඔබ ගින්නක්

http://sherlockholmesinvestigations.blogspot.com

ගින්නක් කියා මහ හඬින් කෑගැසිය යුතුයි. ඔබ ඒක හොඳ හැටි තේරුම් ගත්තද?"

"ඔව් හොඳින් තේරුම් ගත්තා."

"මේක මොකුත් භයානක දෙයක් නෙමෙයි." හෝම්ස් කීවේ සාක්කුවෙන් යමක් ඉවතට ගනිමිනි. එය සුරුට්ටුවක හැඩය ගත් කුඩා වස්තුවකි.

"මේක සාමාන්‍ය පතල් වැඩකරුවන්, ජලනළ කාර්මිකයන් අනතුරු ඇඟවීමට යොදා ගන්නා දුම්රොකට්ටුවක්. මේකෙ දෙපැත්තෙම "කැප්" සවිකරලා තියෙන්නෙ, බිම වැටුණු ගමන් ඉබේම ක්‍රියාත්මක වෙන්න. ඔබට තියෙන්නේ ඒ වැඩේ විතරයි. වොට්සන් ඔබ "ගින්නක්" කියල කෑගැහුවාම, බොහොම දෙනෙක් ඒ වචනය කියලා මහ හඬින් කෑගහන්න පටන් ගන්නවා. ඔබට එතකොට තියෙන්නේ එතැනින් ඉවත්වෙලා යන්න. ගිහින් වීථිය කෙළවරේ රැඳී ඉන්න. මං එතැනදී ඔබට එකතුවෙන්නම්. මං හිතනවා මේ විස්තර කළ දේ ඔබට පැහැදිලි ඇති කියලා?"

"මට තියෙන්නේ මුලින් කිසිදේකට සම්බන්ධ නොවී නිහඬව බලා සිටින්න. ඊට පස්සේ ජනේලයට ළං වෙලා ඔබ දිහා සෝදිසියෙන් බලා ඉන්න. ඊළඟට ඔබෙන් සංඥාවක් ලැබුණාම දුම් රොකට්ටුව ගේ ඇතුළට විසිකරන්න. ඊටත් පස්සේ "ගින්නක්! ගින්නක්!" කියල කෑගහන්න. අන්තිමට ඔබ එනතුරු වීථිය කෙළවර රැඳී ඉන්න?"

"අන්න හරියටම හරි."

"එහෙනම් ඒ වැඩ ටිකට, ඔබට මා ගැන විශ්වාසය තැබිය හැකියි."

"ඒක බොහොම විශිෂ්ටයි. ඊළඟට මට රඟපාන්න තියෙන භූමිකාව සඳහා සූදානම් වෙන්න වෙලාව හරි වගෙයි."

හෝම්ස් තම නිදන කාමරයට ඇතුළු වී මිනිත්තු කිහිපයකින් ආපසු ආවේ වෙස් මාරුකරගෙනයි. නිශ්චිත ආගමික නිකායට අයත් නොවන, ක්‍රිස්තියානි දේවගැතිතුමෙකු මෙන් ඔහු හැඳ පැළඳගෙන සිටියේය. මුහුණෙන් පළවූයේ මිත්‍රශීලී අනුකම්පා සහගත බවකි. කළු පැහැති පුළුල් වාටිය සහිත හිස්වැස්මත්, බුරුල් කලිසමත්, සුදු ටයි පටියත්, ඔහු වෙත ගෙන ආවේ දුකේදී පිහිටවන

http://sherlockholmesinvestigations.blogspot.com

දේවගැතිතුමෙකුගේ පෙනුමයි. ඇඳුමක් පමණක් නොව ක්‍රියාවෙන්, හැඟීමෙන් හා මුළු ආත්මයෙන්ම අලුත් චරිතයට ගැළපෙන ලෙස හෝම්ස් වෙනස් වී සිටි බවක් දුටුවෙමි. ඔහු අපරාධ පරීක්ෂකයෙකු වීම නිසා වේදිකාවට දක්ෂ නළුවෙකු අහිමි විය. නවීන විද්‍යාවට විශිෂ්ට විද්‍යාඥයෙකු අහිමි විය.

අප බේකර් වීථියෙන් පිටත් වී යන විට සවස හයයි කාල වී තිබිණ. සර්පන්ටයින් මාවතට ළඟාවෙද්දී හතට දහයකි. ඇඳිරි වැටෙන්නට පටන්ගෙන තිබූ නිසා මාවතේ ගෑස් ලාම්පු දල්වීම ඇරැඹී තිබිණ. ගෙහිමියා එනතුරු අපි බ්‍රයොනි මන්දිරය ඉදිරිපස පාරේ ඉහළ පහළ සක්මන් කරමින් සිටියෙමු.

නිවසේ පෙනුම නම් හෝම්ස් කළ විස්තරය අනුව මගේ සිතේ මැවුණු චිත්‍රයට සමාන එකකි. එහෙත් ඒ අවට පෙදෙස නම් මා සිතූ තරම් පාළු බවක් ඉසිලුවේ නැත. පෞද්ගලික පදිංචිකරුවනට වෙන්වුණු නිහඬ පෙදෙසක දැකිය හැකි, දැකිය යුතු, පෞද්ගලිකත්වය එහි නොතිබිණි. සර්පන්ටයින් මාවතේ මේ කොටසේ සෑහෙන තරම් ක්‍රියාශීලී බවක් දැකිය හැකි විය. අබිරිසිදු පරණ ඇඳුමෙන් සැරසුණු කිහිප දෙනෙක් වීථියේ එක් මුල්ලක දුම්බොමින්, කතාබහක වැටී සිටියහ. ඔවුන් ශබ්ද නගා සිනාසෙන හඬ ඒ අවට රැව් පිළිරැව් දුන්නේය. කතුරු හා පිහියා මුවහත් කරන්නෙක්, ඔහුගේ කරකැවෙන රෝදය සහිත උපකරණය ද තබාගෙන පාර අයිනේ බලාසිටියේය. ආරක්ෂක භටයෝ දෙදෙනෙක් තවත් තැනක තරුණ ගෙදියක සමග විහිළුතහළු කරමින් පසුවූහ. දල්වාගත් සුරුට්ටු කටේ ගසාගත් තරුණයන් කිහිප දෙනෙක්ම වීථියේ ඉහළ පහළ ඉබාගාතේ ඇවිදිමින් සිටි බව ද මම දුටුවෙමි.

"ඔබට පෙනෙනවා නේද?" හෝම්ස් ඇසුවේ ඉහළ පහළ සක්මන් කරමින් සිටිනා අතරතුරයි.

"මේ විවාහය නිසා ප්‍රශ්නය සෑහෙන තරම් ලිහිල් වෙනවා. ඡායාරූපය දැන් දෙපැත්ත කැපෙන ආයුධයක් වගෙයි. බොහොම වෙලාවට මේක ගොඩ්ෆ්‍රි නෝර්ටන් දකිනවාට වත්, අයිරීන් ඇඩ්ලර් කැමති වෙන එකක් නෑ. දැන් ප්‍රශ්නය තියෙන්නේ ඡායාරූපය හංගලා තියෙන්නේ කොහේද කියන එකයි."

"ඇත්තටම ඒක කොහේ ඇත්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක ඇය යන එන තැන අරගෙන යනවා කියල හිතන්න බෑ. ඒ මොකද එය කැබිනට් ප්‍රමාණයේ එකක්. ඒ නිසා කාන්තාවකගේ ඇඳුමේ පිටතට නොපෙනෙන විදියට හංගලා තියාගන්න අමාරුයි. ඇය හොඳටම දන්නවා රජතුමාට පුළුවනි මිනිසුන් ලවා කොයි වෙලාවක හෝ බලෙන් ඇයව සෝදිසිකරවන්න. දෙවරක් එහෙම දේවල් සිදුවෙලා තියනවා. ඒකෙන් අපට තීරණය කරන්න පුළුවනි, ඇය යන එන තැන ඡායාරූපය ගෙනයන්නෙ නැහැ කියල."

"එහෙනම් ඒක ඇත්තෙ කොහේද?"

"ඇගේ බැංකුවේ සුරක්ෂිතාගාරයේ. එහෙමත් නැත්නම් නීතිඥයා ළඟ. මේ තැන් දෙකේම වෙන්න පුළුවනි. ඒ වුණත් මං හිතන්නේ නෑ, ඒක ඔය එක තැනකවත් ඇති කියලා. ගැහැනුන් ස්වභාවයෙන්ම මේ වගේ වැඩ රහසිගතව කරන්න කැමැති අය. හංගන වැඩේ ඇය කැමැති තැනකම කරන්න බොහොම දුරට ඉඩ තියෙනවා. ඇය මොකටද ඒ වැඩේ වෙන කාටහරි භාරදෙන්නෙ? ඡායාරූපය තමන්ගේ ළඟම හංගාගත්තොත් ඇයට ඒ ගැන භය නැතුව විශ්වාසයක් තබන්න පුළුවනි. නමුත් ඒක ප්‍රවේසම් කිරීම ව්‍යාපාරිකයෙකුට භාර දුන්නොත්? ඔහුට මොනව හරි දේශපාලන බලපෑමක්, රාජ්‍ය තාන්ත්‍රික බලපෑමක් එතුව හෝ ඇතිවුණොත් ඔහු මුහුණ දෙන්නෙ මොන වගේ තත්ත්වයකටද? ඔහු ගැන විශ්වාසයක් තැබිය හැකියි කියල ඇයට සහතික වෙන්න පුළුවන්ද? ඊළඟට අමතක කරන්න එපා. ඇය බලාපොරොත්තු වෙනවා තව දින කිහිපයකින් ඡායාරූපය ප්‍රයෝජනයට ගන්න. ඒ කියන්නේ ඡායාරූපය ඇත්තේ ඇයට හිතූ වෙලාවක පහසුවෙන් ගන්න පුළුවන් තැනක. ඒ කියන්නේ එය තිබිය යුත්තේ ඇගේ නිවස තුළමයි."

"නමුත් දෙපාරක්ම හොරුන් ගේ බිඳලා පරීක්ෂා කරලා බැලුවා."

"ෂෝ උන් දනගෙන හිටියෙ නැහැනෙ පරීක්ෂා කරන්නෙ කොහොමද කියල"

"ඔබ කොහොමද පරීක්ෂා කරන්නෙ?"

"මං ඒක හොයමින් යන්නෙ නෑ."

"එහෙනම්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක හංගල තියෙන තැන මං පෙන්වීම ඇයට භාර දෙනවා."

"ඇය ඒක එකහෙළාම ප්‍රතික්ෂේප කරාවි."

"ඇයට ඒකට ඉඩක් ලැබෙන්නෙ නෑ. මට ඇහෙනවා අශ්ව කරත්තයක් එන හඬ. ඒ ඇගේ අශ්වකරත්තය තමයි. දැන් ඉතින් මං කිව්දේ අකුරටම ඉටු කරන්න වොට්සන්."

ඔහු එසේ කියද්දීම අශ්වකරත්තයක පැති ලාම්පු වල ආලෝක ධාරා වංගුවෙන් මතුවිය. එය රෝද හතරේ කුඩා අශ්ව කරත්තයකි. නිවසේ දොරටුව ඉදිරියටම පැමිණි රථය, නැවැත්වුවා පමණි. එහි දොර ඇර, තඹ කාසියක් ඉල්ලා ගැනීමේ අරමුණෙන් පාරේ සිටි රස්තියාදු කාරයෙක් එතැනට දුව ආවේය. ඒ සමගම තවෙකෙක් ද ඔහු පරදා දුව ආවේ එම අරමුණෙනි. ඔවුන් දෙදෙනා අතර සණ්ඩුවක් ඇතිවිය. ආරක්ෂක භටයින් දෙදෙනා එක් තරුණයෙකුගේ පැත්ත ගැනීම නිසා සණ්ඩුව වඩාත් උග්‍ර විය. කතුරු මුවාත් කාරයා අනික් රස්තියාදු කාරයාගේ පැත්ත ගෙන කෝලාහල කිරීමට පටන්ගත්තේය. කිසිවෙක් තවෙකෙකුට පහරක් එල්ල කළේය. අශ්ව කරත්තයේ දොර විවෘත කරගෙන කාන්තාව එළියට බැස්සාය. ඇය නොදනුවත්වම පාතැබුවේ මේ කලබලය මැදටයි.

රණ්ඩුවෙමින් සිටි පුද්ගලයෝ එකිනෙකාට අතින් හා පොලුවලින් පහර එල්ලකරගැනීමට පටන් ගත්හ. කාන්තාවගේ ජීවිතය මොවුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා හෝම්ස් ඒ මැදට දිවගියේය. ඔහු ඇය සිටි තැනට ළංවුවා පමණි. එක්වරම හෝම්ස් විලාප නගමින් බිම ඇද වැටුණේය. ඔහුගේ මුහුණ පුරා ලේ ගලායන්නට පටන් ගත් හැටි මම දුටුවෙමි. හෝම්ස් ඇද වැටෙද්දී ආරක්ෂක භටයන් එක් පැත්තකට පැනදිවූ අතර, රස්තියාදු කාරයෝ අනෙක් පැත්තට පැනදිවූහ. සණ්ඩුව නිරඹමින් සිටි, එහෙත් ඊට හවුල් නොවූ වැදගත් ලෙස හැඳ පැළඳ ගත් පිරිසක් මේ වෙලාවේ එතැනට ළං විය. ඔවුහු කාන්තාවට ආරක්ෂාව සැලසූ අතර, තුවාල වී ඇද වැටුණු හෝම්ස්ට උදව් කිරීමට ඉදිරිපත් වූහ.

අයිරීන් ඇඩ්ලර් ඉක්මනින් ඇගේ නිවස දෙසට තරප්පු පෙළ නැගීමට පටන් ගත්තාය. එහෙත් ඉහළම පඩියේදී නැවතුණු ඈ වීථිය දෙස හැරී බැලුවාය. එතැන තිබුණු ආලෝකයෙන් ඇගේ රූමත් සිරුර කැපී පෙනුණු හැටි මට තවමත් මතක තිබේ.

http://sherlockholmesinvestigations.blogspot.com

"අනේ ඔය අහිංසක මිනිහ්මයාට හුහක් තුවාලද?" ඇය ඇසුවාය.

"ඔහු මැරිලා!" කිහිප දෙනෙකු කියනු ඇසිණ.

"නෑ නෑ! තවම යන්නම් පණ තියෙනවා. තවෙකෙක් කීය.

"ඔහු නිර්භීත කෙනෙක්" එතැන සිටි ගැහැනියක් කීවාය.

"ඒ මහත්තයා ආවෙ නැත්තම් අර් නෝනාගේ අත්බෑගයයි, රත්තරන් ඔරලෝසුවයි කඩාගෙන පනිනවා. උන් මහා දරුණු මැර කල්ලියක්. ආ ඔහු දැන් ඔන්න ටික ටික හුස්ම ගන්නවා."

"ඔහුට මේ විථියේ පාරේ ඉන්න අරින්න බැහැ නෝනා. අපි ඔහුව ඔබතුමියගේ ගෙදරට අරගෙන එන්නද?"

"අනේ ඔව්. පිසිත්න කාමරයට අරගෙන එන්න. මේ සැප පහසු සෝපාවක් තියෙන්නෙ. මේකෙ හාන්සිකරවන්න."

ඉතා පරෙස්සමෙන් මගේ මිතුයා බ්‍රියොනි මැදුර තුළට ඔසවාගෙන යන ලදී. ඔවුහු හෝම්ස් විසිත්ත කාමරයේ හාන්සිකරවූහ. මේ අතර ඔත්තු බැලීමට මට නියම වූ ජනේලය අසලට වී මම බලාගෙන සිටියෙමි. මේ වනවිට පහන් දල්වා තිබිණි. එහෙත් ජනෙල් ආවරණය කළ තිර තවමත් එසේමය. එහෙයින් හෝම්ස් සෝපාව මත හාන්සිකර තබා ඇති සැටි දකගැනීමට, මට හැකියාවක් නොතිබිණි. මේ කරුණාවන්ත කාන්තාවට එරෙහිව ඔහුට රඟපෑමට තිබූ භූමිකාව ගැන හෝම්ස්ගේ සිතේ පසුතැවීමක් ඇතිවූවා දැයි නොදනිමි. නමුත් මේ රූමත් කාන්තාව තුවාල වූ පුද්ගලයා කෙරෙහි අනුකම්පාවක් දක්වූයේ කොතරම් කරුණාවකින්ද?

ඇයට විරුද්ධව අප ගෙනයන මේ කුමන්ත්‍රණය ගැන මගේ සිතේ ඇතිවූයේ මහත් ලැජ්ජාවකි. එහෙත් හෝම්ස් මට භාරදුන් කටයුත්තේ නොයෙදී මඟහැර යාම ද චපල මෙන්ම දුෂ්ට ක්‍රියාවකි. මගේ සිතට ධෛර්ය ගතිමි. මගේ පතුම්බියේ වූ දුම් රොකට්ටුව අතට ගත්තෙමි. අපේ මේ උත්සාහය ඇය විනාශ කිරීමට නොවේ. ඇය අතින් තවත් කෙනෙකු විනාශයට පත්වීම වැළැක්වීමය.

මේ වන විට ජනේල් තිර පැත්තකට කොට තිබිණි. හෝම්ස් කවිච්චිය මත වැතිර සිටියේය. පිරිසිදු වාතය අවශ්‍ය පුද්ගලයෙකු

http://sherlockholmesinvestigations.blogspot.com

ජනේලය විවෘත කිරීමට සංඥා කරන්නාක් මෙන් ඔහු අත සොලවූ අයුරු මම දුටුවෙමි. සේවිකාව එතැනට පැමිණ වහා ජනේලය විවෘත කළාය. හෝම්ස් ඒ මොහොතේ මට සංඥා කළේය. අත තිබූ දුම් රොකට්ටුව ජනේලය තුළින් විසිකොට ගින්නක්! ගින්නක්! යනුවෙන් හැකි තරම් උස් හඬින් කෑගැසුවෙමි.

ගින්නක් යන වචනය මගේ කටින් පිටවූවා පමණි. හොඳින් හැඳ පැළඳ සිටි, හොඳ ඇඳුම් නොතිබුණු, සැවොම, සේවිකාවෝ කුලීකාරයෝ පවා ගින්නක්! ගින්නක්!! යයි උමතුවෙන් මෙන් කෑගැසූහ.

ඝන දුම් වලලු විසිත්ත කාමරය තුළ එකතු වූ අතර ඉන් සමහරක් විවෘත ජනේලයෙන් එළියට ද පැමිණියේය.

ගෙතුළ සිටි බොහෝ දෙනා මහත් කලබලයෙන් මෙන් එළියට දිවගිය සැටි මට දක්නට ලැබිණි. මේ අතර එය බොරු අනතුරු ඇඟවීමක් බව හෝම්ස් කියනු මට ඇසිණි. කෑගසමින් සිටි සෙනග අතරින් ගොස්, මම වීථියේ කෙළවරට වී සිටියෙමි. මිනිත්තු දහයක් යද්දී මගේ මිත්‍රයා එතැනට පැමිණියේය. ඝෝෂාරාක් වී සිටි සෙනග අතුරින් අපි දෙදෙනා සතුටින් පිටවී ගියෙමු.

ඔහු මගේ අතින් අල්ලාගෙන ඉතා සතුටින් එහෙත් ඉක්මන් ගමනින් ඉදිරියට ගමන් කළේය. මිනිත්තු කිහිපයක් යනතුරු හෝම්ස් කිසිවක් කථා නොකෙළේය. සර්පන්ටයින් මාවතේ සැහෙන දුරක් ගොස්, එඩ්ග්වෙයා පාරට හැරුණු පසුයි හෝම්ස් තම කතාබහ පටන් ගත්තේ.

"ඔබ ඉතා හොඳට ඒ වැඩේ කළා වොට්සන්. ඒකෙ ආයෙ ඊට වඩා හොඳින් කරන්න දෙයක් තිබුණෙ නෑ. හැම දෙයක්ම හරියාකාරව සිද්ධවුණා."

"ඔබට ඡායාරූපය ලැබුණද?"

"මං දන්නවා ඒක තියෙන තැන."

"කොහොමද ඔබ ඒක දැනගත්තේ?"

"ඇය මට පෙන්නුවා එතැන. මං ඔබට කිව්වේ ඇය එය පෙන්වන බව."

"ඔබ මේ කියන කාරණය, මට තවමත් හරිහැටි පැහැදිලි නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක තවදුරටත් ඔබට අභිරහසක් කරන්න උවමනා නෑ වොට්සන්. ඒක සිද්දවුණේ බොහොම සරල ආකාරයට. ඔබ දැක්ක නේද අද පාරෙ හිටි සෙනග? ඒ හැම කෙනෙක්ම මගේ උදව්කාරයෝ. අද හැන්දෑවෙ මේ නාටකය රඟදක්වීමට ඒ ඔක්කොම අය කල් ඇතුව සූදානම් කරගෙන ගෙන ආ අය."

"මං ඒ බව අනුමාන කළා."

"ඉතින් සණ්ඩුව පටන් ගනිද්දි මං මොකද කළේ. අත් දෙකේ තෙත සායම් ගාගෙන සෙනග ගොඩ මැද්දට පැනලා කෑගහගෙන බිම ඇද වැටුණා. දෑතෙන් මුහුණට ගස්සාගත්තා. එහෙම කරලා කාගේත් අනුකම්පාවට ලක්වී ඛේදජනක දර්ශනයක් මවා පෑමට මට හැකිවුණා. මේක ඉස්සර කාලෙ යොදා ගත් ප්‍රයෝගයක්."

"ඒ ටිකත් මට හිතාගන්න පුළුවන් වුණා."

"ඉතින් ඔවුන් මාව ගේ ඇතුළට ගෙන ගියා. ඒකට ඉඩදෙනව ඇරෙන්න ඇයට වෙන කරන්න දෙයක් තිබුණෙ නැහැ. එහෙම ගියේ ඇගේ විසිත්ත කාමරයට. අන්න ඔය තැන තමයි මගේ සැකයට ලක්වී තිබුණු එක් තැනක්. අනෙක් තැන ඇගේ නිදන කාමරය. ඒක තිබුණේ විසිත්ත කාමරයට අල්ලලා. ඡායාරූපය තියෙන්නේ කොයි එකේද කියල කොහොම හරි හොයාගන්න මං දැඩි අධිෂ්ඨානයකින් හිටියේ. ඔවුන් මාව සෝපාව මත හාන්සි කළා. පිරිසිදු වාතාශ්‍රය ඕන බවට මං සංඥා කළා. ඔවුනට සිද්දවුණා ජනේලයක් අරින්න. ඉතින් ඒකෙන් ඔබට අවස්ථාව ලැබුණා.

"ඒක කොහොමද ඔබට ප්‍රයෝජනවත් වුණේ?"

"ඒක තමයි හරිම වැදගත්. තමන්ගේ ගෙය ගිනිගන්නවා කියල අහන්න ලැබුණොත්, ගැහැනියක් ඉබේම දුව යන්නේ ඇය වඩාත්ම අගය කරන දෙය බේරාගැනීමේ අරමුණෙන්. ඒක බොහොම ක්ෂණිකව ඇතිවෙන ප්‍රබල ප්‍රතිචාරයක්. මං මීට ඉහත කීප වාරයක්ම ඒ සංසිද්ධියෙන් ප්‍රයෝජන අරගෙන තියෙනවා. ඩාලිංටන් වංචාවෙදිත්, ආන්ස්වර්ත් මාළිගයේ පරීක්ෂණයේදිත්, මං ඒකෙන් ප්‍රයෝජන ගත්තා. බැඳපු, දරුවන් ඉන්න ගැහැනියක් නම් තමන්ගේ දරුවාව ඔසවා ගන්නවා. අවිවාහක ගැහැනියක් නම් ගන්නේ තමන්ගේ රත්තරන් බඩු පෙට්ටිය. මේ වෙලාවෙදි මට එක් කරුණක් හොඳටම පැහැදිලියි, විශ්වාසයි. ඈඩ්ලර් මෙනෙවියට නම් මේ වෙලාවෙ, ඇගේ ගෙදර

http://sherlockholmesinvestigations.blogspot.com

තිබෙන වටිනාම දේ අර ඡායාරූපය. අනෙක් හැම දෙයක්ම අමතක කරලා ඇය දුවන්නේ ඒක බේරා ගැනීමට.

ගින්න ගැන අනතුරු ඇඟවීම ඉතාම හොඳින් කෙරුණා. එතැනින් නිකුත් වූ ඝන දුමාරයත්, බොහෝ දෙනෙකු ගේ කෑගැසීමත්, ඕනෑම කෙනෙකු කලබලයට පත්කිරීමට සමත්. ඒකට ක්ෂණික ප්‍රතිචාර දක්වීම ඇය අතින් ඉතා අලංකාර ලෙස සිදුවුණා. ඡායාරූපය හංගලා තියෙන්නේ කොතැනද දන්නවද? විසිත්ත කාමරයේ දකුණු පැත්තේ සීනුව නාද කිරීමට තිබෙන තැනට ඉහළින්. එතැන ඉවතට තල්ලු කළ හැකි පියනකින් වැසූ කුඩා විවරයක් තිබෙනවා. ඡායාරූපය තියෙන්නේ අන්න ඒක ඇතුළේ.

මේක බොරු අනතුරු ඇඟවීමක් කියල මං කෑගැහුවාම, ඇය ඒක ආපහු එතැනටම දමලා දුම් වෙඩිල්ල දිහා බලාගෙන හිටියා. ඊළඟට විසිත්ත කාමරයෙන් ඉවතට ගියේ බොහොම ඉක්මනින්. ඊට පස්සේ මට ඇයව දකින්න ලැබුණේ නැහැ. මං හිටි තැනින් නැඟිටලා, පිටවී යන්න උවමනා බව කියලා ගෙදරින් පැනගත්තා. ඒ වෙලාවෙම ඡායාරූපය ගන්න පුළුවන් වේද බලන්න මං එක මොහොතක් එහි නැවතුණා, නමුත් අශ්වකරත්තයේ රියැදුරා විසිත්ත කාමරය තුළට ආවා. ඔහු මා දිහා හොඳින් බලාගෙනයි හිටියේ. ඒ නිසා ඒ වෙලාවෙ එම කටයුත්ත නොකරන්න මං තීරණය කළා. එය මඳක් ප්‍රමාද කිරීම වඩාත් ආරක්ෂා සහිත බව මට පෙනුණා. ඕනෙවට වඩා කලබල වීමෙන් හැමදෙයක්ම අවුල් වී යන්න පුළුවනි."

* "දැන් අපි මොනවද ඊළඟට කළයුත්තේ?"

"අප කළ සෙවීම දැන් ඉතින් අවසන්. මං හෙට රජතුමා හමුවෙන්න යනවා, ඔබ එනවා නම් ඔබත් සමඟ, අප යනවා ඇයව හමුවෙන්න, බ්‍රියොනි මන්දිරයට. එහිදී අපව කැඳවාගෙන යාවි විසිත්ත කාමරයට, ඇය සූදානම් වී එනතුරු රැඳී සිටීමට. බොහොම වෙලාවට ඇය එතැනට එද්දී ඇයට අර වටිනා ඡායාරූපය වත් අප වත් දකින්න ලැබෙන එකක් නැහැ. ඔහුගේ දෑතින්ම ඡායාරූපය ආපසු ගැනීම රජතුමාගේ හිතට ලොකු සැනසීමක් වේවි."

"කොයි වෙලාවෙද ඔබ රජතුමා සමඟ ඇය හමුවෙන්න යන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හෙට උදේ අටට. ඒ වෙලාවට වෙනකොට ඇය අවදි වී සිටින එකක් නෑ. ඉතින් අපට වැඩකටයුතු සඳහා සෑහෙන කාල වේලාවක් ලැබෙනවා. එහෙම නැතත් අපි ප්‍රමාද වෙන්න හොඳ නෑ. ඒ මොකද මේ විවාහය නිසා, ඇගේ ජීවන රටාවෙත්, පුරුදු සිරිත් විරිත් වලත් විශාල වෙනසක් ඇතිවෙන්න පුළුවනි. මං ප්‍රමාද නොවී දැන්ම රජතුමාට විදුලි පුවතක් යවන්න ඕන."

අපි මේ වනවිට බේකර් වීථියට ළඟාවී සිටියෙමු. දොර ළඟ නැවතුණු හෝම්ස් සාක්කුවට අත දමා යතුර සෙවීමට පටන් ගත්තේය. අප පසුකර ගිය කිසිවෙක් ආචාරශීලීව යමක් පවසනු ඇසිණි.

"ශුභ රාත්‍රියක් ෂර්ලොක් හෝම්ස් මහත්තයෝ!"

පදික වේදිකාව මත කිහිප දෙනෙක්ම සිටියහ. එහෙත් එම ආශිංසනය කලිසම් කබා හැඳ, හිස්වැස්මක් පැළැඳ ඉක්මනින් ඉවතට ඇවිද ගිය තරුණයාගෙනි.

"මං ඔය කටහඬ මීට කලින් අහල තියෙනවා. මං මේ කල්පනා කරන්නේ කවුද ඒ පුද්ගලයා කියල." හෝම්ස් කීවේ කණාමැදිරි එළියෙන් ආලෝකමත් වීථිය දෙස බලමිනි.

* * *

මම එදින රාත්‍රිය බේකර් වීථියේ නිවහනේ ගතකළෙමි. උදේ ආහාරය ලෙස අප කර කළ පාන් කා, කෝපි පානය කරමින් සිටියෙමු. බොහීමියාවේ රජතුමා එක්වරම අපේ නිවහනට කඩා වැදුණේය.

"ඔබට ඇත්තටම ඒක හම්බවුණාද එහෙනම්?" ඔහු ඇසුවේ හෝම්ස්ගේ උරහිස් දෙකෙන් අල්ලාගෙන ඔහුගේ මුහුණට එබී බලමිනි.

"තවම හම්බවුණේ නෑ."

"නමුත් විශ්වාස කරනවා හොයාගත හැකි වේවි කියල?"

"ඔව්. මං බලාපොරොත්තු වෙනවා හොයාගැනීමට හැකිවේවි කියල."

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



135. "ශුභ රාත්‍රියක් ෂර්ලොක් හෝම්ස් මහත්තයෝ!"

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් යමු. මට ඉවසුමක් නෑ, මේ වැඩේ ඉවරයක් කරන තුරු."

"අපි කුලීරියක් කැඳවාගන්න තුරු ඉන්න රජතුමනි."

"නැහැ. මගේ අශ්වකරත්තයෙන් යමු."

"එහෙනම් ප්‍රශ්නය තවත් ලිහිල්වෙනවා."

අපි එවේලේම බ්‍රියොනි මන්දිරය වෙත පිටත් වී ගියෙමු.

"අයිරින් ඇඩ්ලර් විවාහ වුණා." හෝම්ස් මහදී කීය.

"විවාහ වුණා? කවද ද?"

"ඊයේ"

"කාවද බැන්දේ?"

"නෝටන් නම් ඉංග්‍රීසි ජාතික නීතිඥයෙක්."

"නමුත් ඔහුට ආදරයක් දක්වන්න ඇයට බැරිවේවි."

"මං විශ්වාස කරනවා ඇයට හැකිවේවි කියලා."

"ඒ මොකද එහෙම හිතන්නෙ?"

"ඒ මොකද, එහෙම වුණොත් ඔබතුමාට අනාගතයේදී කිසි කරදරයක් නැතිවේවි. ඇය ඇගේ සැමියාට ආදරය කරනවා නම් රජතුමාට තවත් ආදරය කරන එකක් නැහැ. ඇය ඔබට ආදරය කරන්නේ නැත්නම්, ඔබතුමා සැලසුම් කරන වැඩ කටයුතු වලට ඇය බාධා කරන්න හේතුවක් නැහැ."

"ඒක හැබැව. ඒ වුණත්. . . .! හොඳයි කමක් නෑ. ඇය මා හා සමාන තත්ත්වයක සිටියා නම් ඇයට මොන තරම් ශ්‍රේෂ්ඨ රැජිනක් වන්න තිබුණා ද?"

පැවසූ රජතුමා නිහඬව කල්පනා කිරීමට පටන්ගත්තේය. ඔහු එයින් අවදිවූයේ අප සර්පන්ටයින් මාවතට පැමිණ, බ්‍රියොනි මන්දිරය අසල රිය නැවැත්වූ විටයි.

බ්‍රියොනි මන්දිරයේ දොරටුව විවෘතව තිබිණ. වයස්ගත කාන්තාවක් පියගැට පෙළ මතට වී බලාගෙන සිටියාය. මඳ වේලාවක් උපහාසාත්මක ලෙස අප දෙස බලා සිටි ඇ, පහළට බැස අශ්වකරත්තය වෙත ළං වූවාය.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා ද?"

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

ඇය ඇසුවාය.

"ඔව්!" හෝම්ස් පිළිතුරු දුන්නේ අතිශයින් පුදුමයට පත්ව ඇය දෙස ප්‍රශ්නාර්ථ බැල්මක් හෙළමිනි.

"හැබෑ නේන්නම්! අපේ නෝනා මහත්තයා කිව්වා, ඔබ උදේම මෙහේ එන්න ඉඩ තියෙනවා කියලා. එතුමිය ඇගේ ස්වාමි පුරුෂයත් එක්ක අද උදේ පිටත්වෙලා ගියා."

"පිටත්වෙලා ගියා?"

"ඔව්. චාරිංක්‍රොස් දුම්රිය පොළෙන් උදේ 5.15 දුම්රියෙන්, ඔවුන් යුරෝපා මහාද්වීපයේ සංචාරයක් සඳහා ගියා."

"මොනවා?"

ෂර්ලොක් හෝම්ස් අඩියක් දෙකක් පිටිපස්සට තැබුවේ සිරුරේ සමබරතාවය නැතිව් ගියාක් මෙනි. අසන්නට ලැබුණු පුදුමාකාර පුවතෙන් ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබිණි.

"ඔබ කියන්නේ ඇය මේ එංගලන්තයෙන් පිටවී ගියා කියලද?"

"ඔව්. යළි කවදාවත් නොඑන්න."

"එතකොට ලියකියවිලි? ඔක්කොම ඉවරයි!" රජතුමා කීවේ ගොරෝසු හඬෙනි.

"අපි ගිහින් බලමු." සේවිකාව ඉවතට තල්ලු කළ හෝම්ස් විසිත්ත කාමරය තුළට ඇතුළු විය. රජතුමා සහ මම ඔහු පසුපසින් ගියෙමු.

ලී බඩු සියල්ල ඒ මේ අත විසිකර දමා තිබිණ. රාක්ක,ලාච්චු, අල්මාරි සියල්ලේ බඩු ඉවතට ඇද දමා තිබුණේ සැම අත අවුල් ජාලයක් කරමිනි. හදිසියේ පැනයාමට පෙර අවශ්‍යම දේ ලහිලහියේ තෝරාගත් බවට සලකුණුයි ඒ. සීනුව නාද කරන තැනට ඉහළින් වූ, තල්ලු කළ හැකි කුඩා පියන අතින් කඩාදමූ හෝම්ස්, විවරය තුළට අත දැම්මේය. ඒ තුළ තිබී ඔහුට ඡායාරූපයක් හා ලිපියක් හමුවිය. එය අයිරින් ඇඩ්ලර් සැඳෑ ඇඳුමෙන් සැරසුණු ඡායාරූපයකි. ලිපියේ කවරයේ මෙසේ සඳහන් කොට තිබිණි.

"ෂර් ාක් හෝම්ස් මහතා වෙත.

(පැමිණ ලබාගැනීමට)"

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයා ලිපිය දිගහැරියේය. එහි දිනය කලින් දා මධ්‍යම රාත්‍රිය ලෙස සඳහන් වී තිබිණි.

*මගේ හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි,*

*ඔබ ඉතා දක්ෂ ලෙස සියල්ලම සිදුකළා. ඔබ මාව සම්පූර්ණයෙන්ම රැවැට්ටුවා. ගින්න ගැන අනතුරු ඇඟවීම අවසන් වන තුරුත් මට ඔබ ගැන සැකයක් පහළ වුණේ නැහැ. මා තවදුරටත් සිතීමට පටන් ගත්තේ කුමන වේලාවකද? ඒ, මා රැකගත් රහස හෙළිවන තැනට කටයුතු යෙදුණු පසුවයි.*

*මීට මාස ගණනාවකට පෙර සිට, ෂර්ලොක් හෝම්ස් ගෙන් පරෙස්සම් වන ලෙස මට අනතුරු ඇඟවීම් ගණනාවක් කර තිබුණා. රජතුමා මේ වැඩේට කෙනෙකු යොදා ගන්නවා නම් ඒ නිසැකවම ඔබ බව තතු දත් අය මට තරුණු අවධාරණය කර තිබුණා. ඔබේ ලිපිනය මට ලැබී තිබුණා. ඒ හැම එකක්ම තිබිලත්, මා රැකගත් රහස දැනගන්නට ඔබ සමත්වුණා. මගේ හිතේ සැකයක් ඇතිවුණු බව ඇත්ත. ඒත් අර වගේ කරුණාවන්ත, වයස්ගත දේවගැතිතුමෙක් ගැන මං සැක කරන්නේ කොහොමද?*

*ඒ වුණත් ඔබ දන්නවා ඇති මම නිළියක් ලෙස පුහුණුව ලබා තියෙන කෙනෙක්. පිරිමියෙකුගේ ඇඳුම් මට ඒ හැටි අමුතු දෙයක් නොවෙයි. එහෙම ඇඳුමක් ඇඳීමෙන් සාමාන්‍යයෙන් ලොකු නිදහසක් ලැබෙනවා. මා ඒ නිදහස ලබාගන්නා අවස්ථා විරල නැහැ. ඔබ ගැන සෝදිසියෙන් සිටීමට මා අශ්වකරත්ත රියැදුරු ජෝන් එව්වා. මං උඩ තට්ටුවට දුවලා ගිහින්, පිරිමියෙක් ලෙස වෙස් මාරුකරගෙන ඉක්මනට පහළට බැස්සා. ඒ ඔබ මගේ ගෙදරින් පිටවෙන මොහොතේ.*

*ඉතින් මං ඔබ පිටුපසින් ඔබේ නිවහනේ දොරකඩ දක්වා ආවා. ඒ ඇවිත් සුප්‍රසිද්ධ ෂර්ලොක් හෝම්ස් මහත්මයාගේ සිතේ අමතක නොවන චරිතයක් බවට පත්වුණා. ඊළඟට ඔබට ශුභ රාත්‍රියක් පතා මගේ සැමියාගේ නීතිවේදී නිල නිවස බලා ගියා.*

*මේ තරම් ප්‍රබල විරුද්ධකාරයෙක් අප ලුහුබඳින නිසා, නුවණැතිම වැඩේ සියල්ල අත්හැර පැන යාම බව අප දෙදෙනා කල්පනා කළා. ඉතින් හෙට උදේ ඔබ මෙහි පැමිණෙද්දී කැදැල්ල හිස්වී ඇති බව ඔබට දකින්න ලැබේවි. අර ඡායාරූපය ගැනත්*

http://sherlockholmesinvestigations.blogspot.com

*කියන්නම්. ඔබේ අනුග්‍රාහකයාට කියන්න, දැන් ඔහුට සාමදානයෙන් ගැනපිය හැකි බව. ඔහුට වඩා හොඳ මිනිහෙකුට මම දැන් ආදරය කරනවා. ඒ පුද්ගලයාත් මට ආදරය කරනවා. ඔබේ අනුග්‍රාහක රජතුමාගේ කුරිරු අසාධාරණයට ලක්වුණු කෙනෙක්, මම. ඔහුට කැමැති දෙයක් කරගන්නවාට මගෙන් බාධාවක් නැහැ. නමුත් ඡායාරූපය මං ආරක්ෂා කරගන්නවා. ඒ මගේ ආරක්ෂාව සඳහා පමණයි. එහෙමත් නැත්නම් අනාගතයේදී ඔහු මට විරුද්ධව පියවරක් ගත්තොත්, එයින් ආරක්ෂා වීමට, හෝ ආයුධයක් ලෙස පාවිච්චි කිරීමට මම ඡායාරූපය තබාගන්නවා. ඒ වෙනුවට මගේ වෙනත් ඡායාරූපයක් මෙහි තබා යනවා. ඒක ළඟ තබාගන්න රජතුමා කැමැති වේවි. එසේ නම් ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි.*

*මා ඔබේ හිතවත්*

*අයිරින් නෝර්ටන්*

*(විවාහයට පෙර ඇඩ්ලර්)*

"යකාගෙ ගෑනියෙක්! මේකි නම් යකාගෙම ගෑනියෙක්!!"

බොහීමියාවේ රජතුමාට කෑගැසිණ.

"මං ඔබට කිව්වා නේද මේ ගෑනි, මොන විධියකටවත් පසු නොබහින, ක්ෂණිකව හිතල, ක්ෂණිකව වැඩකරන ගැහැනියක් කියලා? ඇය මගේ තත්ත්වයේ කෙනෙක් නොවුණු එක මොන තරම් අවාසනාවක්ද? එහෙම වුණා නම් ඇයට කොයිතරම් ශ්‍රේෂ්ඨ රැජිනක් වෙන්න තිබුණද?"

"මට පෙනෙන විධියට නම් ඇය ඔබට වඩා වෙනස්ම තත්ත්වයක කාන්තාවක්. ඔබතුමාගේ කටයුත්තට මීට වඩා සාර්ථක අවසානයක් ලබාදෙන්න බැරිවුණු එක ගැන මං හුඟක් කණගාටු වෙනවා." හෝම්ස් කීය.

"මං ඒකට එකඟවෙන්නෙ නෑ, මගේ හිතවත් මහත්මයා. මීට වඩා මේකෙ ලබන්න පුළුවන් සාර්ථකත්වය මොකක්ද? මං දන්නවා ඇය දැන් ඒ පොරොන්දුව කඩකරන්නෙ නෑ. දැන් ඉතින් ඒ ඡායාරූපය ගින්නේ දාලා පිළිස්සුවා වගේ පරෙස්සම්."

"රජතුමනි. ඔබතුමන් එසේ කියන බව ඇසීමටත් සන්තෝසයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඔබට විශාල ලෙස ණයගැතියි මහත්මයා. ඔබ විසින් කළ සේවයට මං පරිත්‍යාග කළ යුත්තේ මොන ආකාරයෙන්ද කියල මට කියන්න. මේ මුද්ද?"

රජතුමා තමන්ගේ ඇඟිල්ලක පැළඳ සිටි මරකත මැණිකක් සවිකළ මුද්දක් ගළවා, අත්ල මත තබා හෝම්ස්ට දිගු කළේය.

"මං මේ මුද්දටත් වඩා අගය කරන දෙයක් ඔබතුමා ළඟ තියෙනවා." හෝම්ස් කීවේය.

"ඔබට තියෙන්නේ ඒ කුමක්ද කියා මට පැවසීම පමණයි."

"මේ ඡායාරූපය!"

රජතුමා හෝම්ස් දෙස බලාසිටියේ ඉමහත් පුදුමයෙනි.

"අයිරීන්ගේ ඡායාරූපය? ඔබ කැමැති එයට නම් මං එය ඔබට දෙන්නම්."

"ඔබට ස්තුතියි රජතුමනි. මේ සම්බන්ධයෙන් වෙන කළ යුතු යමක් නොමැති නම් මං ඔබට සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා."

රජතුමා අතට අත දීමට සූරන දිගු කරගෙන බලා සිටියත්, එතුමාට හිස නමා ආචාර කළ හෝම්ස්, එතැනින් පිටත්ව මා සමග ආපසු පැමිණියේය.

* * *

බොහීමියා රාජ්‍ය තන්ත්‍රයට අභියෝග කළ හැකි, ආන්දෝලනයක් වීමට ඉඩතිබූ සිද්ධිය අවසන් වූයේ එලෙසයි. ෂර්ලොක් හෝම්ස්ගේ විශිෂ්ට සැලැසුමක් පරාජය කිරීමට කාන්තාවකගේ තීක්ෂණ බුද්ධිය සමත් විය. අයිරීන් ඇඩ්ලර් ගැන කථාකරද්දී හෝ ඡායාරූපය දකිද්දී හෝම්ස් ඇය හැඳින්වූයේ "නියම ගැහැනිය" යනුවෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

# රතු හිසකෙස් ගැටලුව

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# රතු හිසකෙස් ගැටලුව

ගිය අවුරුද්දේ හේමන්ත ඍතුවේ එක් දිනක් මම මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් හමුවීමට ගියෙමි. ඔහු මැදිවිය පසුකළ අමුත්තෙකු සමග යම් කතාබහක නිරතවී සිටියේය. ගින්දර රතු පැහැති හිස කෙස් තිබූ, මේ තරබාරු පුද්ගලයාගේ මුහුණ ද, රතු පැහැයක් ගත්තේය. ඔවුන්ගේ කථාවට බාධාකිරීම ගැන සමාව අයැද, මම එතැනින් පිටවී යාමට සූදානම් වූයෙමි. එහෙත් හෝම්ස් මගේ අතින් අල්ලා, කාමරය තුළට ඇදගෙනැවිත් දොර වසා දැම්මේය.

"ඔබට මා හමුවෙන්න මීට වඩා හොඳ වේලාවක් කොහෙද වොට්සන්?"

ඔහු කීවේ ප්‍රීතිමත් ස්වරයෙනි.

"මං හිතුවා ඔබ මොනව හරි වැදගත් කටයුත්තක නිරත වෙලා කියල?"

"ඒක ඇත්ත. බොහෙම වැදගත් කටයුත්තක්."

"එහෙම නම් මට අල්ලපු කාමරේට වෙලා ඉන්න පුළුවනි."

"කොහොමටවත් එපා. විල්සන් මහත්මයා. මේ තමයි මගේ හවුල්කාරයා, වොට්සන් දොස්තර මහත්මයා. මං පැවැත්වූ සාර්ථක අභිරහස් පරීක්ෂණ ගණනාවකදීම මට සහාය වුණේ මේ මහත්මයා තමයි. කිසිම සැකයක් නෑ. ඔබේ පරීක්ෂණයේදීත් ඔහුගෙන් මට උදව් ලැබේවි."

ඒ තරබාරු මහතා යන්තමින් අසුනෙන් එසවී, මට ආචාර කළේය. එහෙත් ඔහුගේ තරබාරු මුහුණේ පළවූයේ ප්‍රශ්නාර්ථ ලකුණකි.

"ඔය සෝර්පාවෙන් වාඩිවෙන්න වොට්සන්."

http://sherlockholmesinvestigations.blogspot.com

යයි පැවසූ හෝම්ස් තම සැප පුටුවේ යළිත් වරක් වැතිරුණේය. පරීක්ෂණයකට තම අවධානය යොමු කරන විට දක්නට ලැබෙන අයුරින් ඔහුගේ දෑතේ ඇඟිලි තුඩු එකට ළංවී තිබිණි.

"අපට හැමදාම දකින්නට ලැබෙන්නේ ජීවිතයේ ඒකාකාරී සිදුවීම්. ඒවට වඩා වෙනස් ආකාරයේ සිදුවීම් ගැන අහන්න, ඔබත් මං වගේම කැමැති බව, මං දන්නවා වොට්සන්. ඔබ ලියා තබන කථාන්තර වලට එවැනි සිද්ධීන් තෝරා ගැනීමෙන්, ඒක ඔබ හොඳින් පෙන්වල දීල තියෙනවා. මං මෙහෙම කිව්වට කමක් නැහැ නේද? ඔබේ ඒ කථා නම්, අපේ සුළු වික්‍රමාන්විත පරීක්ෂණ, අතිශයෝක්තියෙන් වර්ණනාත්මකව ඉදිරිපත් කිරීම්."

"ඔබේ පරීක්ෂණ හැමවිටම මගේ සිත් ඇදගැනීමට සමත් වුණා."

"අර මේරි සදර්ලන්ඩ් මෙනෙවියගේ ගැටලුව විසඳීම පටන්ගන්න ඉස්සර වෙලා දවසක මං ඔබට කියූ දෙයක් මතකද වොට්සන්? පුදුමාකාර ඉද්වල් අමග අද්භූත සිදුවීම් දකින්න ලැබෙන්නේ, සත්‍ය ජීවිතයේයි කියල මං කිව්වේ? මතකද? ඒවා හැමවිටම ප්‍රබන්ධකරුවෙකුගේ නිර්මාණ වලට වඩා අපූරුයි."

"ඇත්ත. නමුත් ඒ කථාවට මං ඔබ සමග එකඟවුණේ නැහැ."

"ඔව්. ඔබ එකඟවුණේ නෑ. හොඳයි එහෙනම් මේ කථාවට සවන්දීල බලන්න ඔබ මා සමග එකඟවෙනවද කියල.

මේ ඉන්නේ ජේබ්ස් විල්සන් මහත්මයා. මා හමුවෙන්න ඇවිත් ඔහු හරිම අපූරු කථාවක් කියන්න පටන්ගත්තා. ඒක මං සෑහෙන කාලෙකට අහල නැති සුවිශේෂ එකක් බවයි පෙනෙන්නෙ. මං මෙහෙම කියනවා ඔබ අහල ඇති වොට්සන්; පුදුමාකාර වගේම අද්භූත සිදුවීම් බොහෝවිට අපරාධ සමඟ බැඳී පවතිනවා. නමුත් ඒවා අතිවිශාල අපරාධ නොමෙයි. ඉතා සුළු අපරාධ. සමහර වෙලාවට ඒ හා බැඳුණු සිදුවීම අපරාධයක් හැටියට හඳුන්වන්න වත් බැහැ. අපි අද කථා කරන මේ සිද්ධිය ගැන කියනවා නම්, මේකට අපරාධයක් ගැවිලාවත් තියෙනවාද කියල මට තවමත් කියන්න බැහැ. මට අහන්න ලැබුණු කාරණාවල හැටියට එහෙමයි පෙනෙන්නෙ. නමුත් මේක මං අහල තියෙන ඉතාම අසාමාන්‍ය කථාවක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතින් විල්සන් මහත්මයා, කුරුණාකරල ඔබට පුළුවන්ද, මේ කථාව ආයෙමත් මුල ඉඳලා පටන් ගන්න. මං එහෙම කියන්නේ කථාවේ මුල කොටස මගේ හිතමිත්‍ර වොට්සන්ට අහගන්න බැරිවුණු නිසාම නොවෙයි. මේ සිද්ධියේ ඇති කැපී පෙනෙන අසාමාන්‍ය බව නිසා, මං කැමතියි හැම පුංචි සිදුවීමක්ම යළිත් අහගන්න, ඔබේ කටින්ම. ඒ අහල ඒ කරුණු නිවැරදිව මගේ මතකයට ඇතුළු කරගන්න. යම් සිදුවීම් මාලාවක් වුණු ආකාරය හොඳින් වැටහුණාම මෙහෙම ප්‍රයෝජනයක් තියෙනවා. එතකොට මගේ මතකයේ ඇති දහසක් සිදුවීම් අතරින්, මේ ආකාරයේම සිදුවීමක් වුණේ කුමන පරීක්ෂණයකද කොයි කාලෙකද යන්න හඳුනාගැනීමට මට හැකියාවක් ලැබෙනවා. මට මේ දක්වාම අහන්න ලැබුණු කාරණා නම්, මින් පෙර කවදාවත් අහන්න නොලැබුණු අමුතුම ඒවා බව මං පිළිගන්නවා."

අපේ තරබාරු අනුග්‍රාහකයා තරමක් ආඩම්බරයෙන් හුස්මක් ඉහළට ගත්තේ පසුව පිම්බෙන අයුරෙනි. ඊළඟට ඔහු තම කබා සාක්කුවෙන්, කිළිටි වී පොඩිවී ගිය පුවත්පතක් එළියට ඇද්දේය. පුවත්පත් පිටුව දණහිස මත තබාගෙන, ඔහු එහි ලුහුඬු දැන්වීම් තීරය ඉහළ සිට පහළටම පරීක්ෂා කරගෙන ගියේය. ඒ අතර මම අපේ අමුත්තා දෙස සූපරීක්ෂාකාරීව බැලීමි. මගේ මිත්‍රයා නාඳුනන පුද්ගලයන් ගැන නිගමන වලට පැමිණෙන්නේ ඔවුන් හොඳින් නිරීක්ෂණය කිරීමෙනි. මටත් මේ අමුත්තා පිළිබඳව යමක් සොයා ගැනීමට හැකිවේදැයි බැලීමට මට සිත්විය.

එහෙත් සැලකිය යුතු තරම් කිසිවක් සොයාගැනීමට මට හැකි වූයේ නැත. අපේ අමුත්තාගෙන් මට සිතාගත හැකිවූයේ, ඔහු එංගලන්තයේ ඕනෑම තැනක දක්නට ලැබෙන සාමාන්‍ය වෙළෙන්දෙකු බවයි. තරබාරු සිරුර, ක්‍රියාශීලී ගතිය අඩු බව සහ තරමක් උඩඟු ස්වභාවය නිසා මම එසේ සිතුවෙමි. ඔහු හැඳ සිටියේ බුරුල් කලිසමකි. "ෂෙපර්ඩ් චෙක්" නමින් හැඳින් වූ මෝස්තරයේ කොටු වැටුණු එය, අළුපැහැති එකක් විය. ඔහුගේ කබාය නම් එතරම් පිරිසිදු එකක් නොවීය. එය ඉදිරිපසින් බොත්තම් දමා නොතිබූ නිසා ඇතුළු කබාය ද පිටතට පෙනිණි. එහි තිබුණේ කිසිදු අලංකාරයක් නොමැති බාල පොතුමකි. පිත්තලෙන් නිමවූ ඇල්බට් මෝස්තරයේ දම්වැලක්, ආභරණයක් ලෙස පැළැඳ සිටි අතර, අසල

http://sherlockholmesinvestigations.blogspot.com

වූ පුටුවක් මත ඔහුගේ අනෙක් ආම්පන්න තබා තිබිණ. බොහෝ සෙයින් පළුදු වූ ටොප්හැට් වර්ගයේ හිස් වැස්මක්, සායම් ගිය පිට කබායක්, පොඩි වී ගිය කොලරයක් ද ඒ අතර විය. ඔහුගෙන් පළ වූ එකම විශේෂ ලක්ෂණය නම්, ඔහුගේ කේශ කලාපයේ දීප්තිමත් රතු පැහැයයි. ඒ හැරෙන්නට බලාපොරොත්තු කඩ වීමේ ලකුණුත්, යම්කිසි කරුණක් ගැන සෑහීමට පත් නොවූ අයුරුත් මුහුණෙන් ප්‍රකාශ විය.

මා නිරත වූ කටයුත්ත, ෂර්ලොක් හෝම්ස්ගේ ක්ෂණික බැල්මට හසුවිය. ඔහුගේ මුහුණට සිනාවක් නැඟිණ. විල්සන් මහතා තවමත් පුවත්පත දෙස බලාගත් ගමන්ය.

"මොහු ගැන සිතාගත හැක්කේ කුමක්ද?" යන ආකාරයේ ප්‍රශ්නාර්ථ බැල්මක් මම හෝම්ස් වෙත හෙළීමි. මගේ මිත්‍රයා සිනාසෙමින්, ඊට වචනයෙන්ම පිළිතුරු දුන්නේය.

"කලකට ඉහත ඔහු, දෑතේ මහන්සියෙන් වැඩ කළ කෙනෙක්. සිරිතක් ලෙස නිතර දුම්කුඩු උරනවා. ෆ්‍රීමේසන් සංගමයේ සාමාජිකයෙක්. ඔහු චීනයට ගිහින් තියෙනවා. මෑත කාලයේ, විශාල වශයෙන් යමක් ලිවීමේ කටයුත්තක නිරත වී ඉඳල තියෙනවා. ඒ හැරෙන්න වෙන මොකුත් කියන්න අමාරුයි."

පුවත් පතේ තැනකට දබරැඟිල්ල තබාගෙන, එහෙත් මගේ මිත්‍රයා දෙසට මුහුණ හරවාගෙන, ජේබීස් විල්සන් බලා සිටියේ භ්‍රාන්තිමත් වූ අයුරෙනි.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මේ හැම එකක්ම ඔබ දනගත්තෙ කොහොමද හෝම්ස් මහත්මයා? මං කම්කරුවෙකු ලෙස වැඩකර ඇති බව ඔබ කොහොමද දනගත්තෙ? ආගමික දේශනාවක් වගේ, ඔබ කිව්වෙ සම්පූර්ණ ඇත්තක්. මං ජීවිතය පටන් ගත්තේ නැවක වඩුවෙක් විදියට වැඩ කරලා" විල්සන් මහතා නොනවත්වාම කියාගෙන ගියේය.

"මං ඒක දනගත්තේ ඔබේ දෑත් වලින් මගේ හිතවත් මහත්මයා. ඔබේ දකුණු අත, ඔබේ වමතට වඩා ප්‍රමාණයෙන් ඉතා විශාලයි. ඔබ එයින් වැඩකර ඇති නිසා එහි මාංශපේශීන් හොඳින් වර්ධනය වී තිබෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"එතකොට දුම්කුඩු උරන බව? ෆ්‍රීමේසන්ස් සංගමයේ සාමාජිකයෙකු බව?"

"මං එය තේරුම් ගත්තෙ කොහොමද කියන එක කියල දීල, ඔබේ බුද්ධියට අපහාස කරන්න මං කැමැති නැහැ. ඒ වුණත් ඔබ පැලැඳ සිටින ටයිකටුවේ කවකටුව හා වාපය ලකුණෙන් ඔබ අයත් ඒ සංගමය ගැන මා හඳුනාගත්තා."

"ආ. . . . මට ඒක අමතක වුණා. එතකොට මං මෑත කාලයේ යමක් ලියමින් හිටි බව?"

"ඔබේ කබායේ දකුණු අතේ ඉදිරි කෙළවරේ අඟල් පහක් පමණ දිගට කබාරෙද්ද පැහැ ගොස් දීප්තිමත්ව දිලිසෙනවා. ඒක දකුණු අත ලියන ඉරියව්වෙන්, මේසය මත දිගින් දිගටම ඇතිල්ලීම නිසා සිදු වූ දෙයක්. වම් කබා අතේ වැලමිට කෙළින්ම මේසයේ ගැටීම නිසා ගෙවී ගිහින්. ඉතින් ඒකෙන් නිගමනය කරන්න පුළුවන් එකම දෙය ඔබ විශාල වශයෙන් ලිවීමේ වැඩක නිරත වූ බවයි."

"එතකොට මා චීනයට ගොස් ඇති බව?"

"ඔබේ දකුණු අතේ මැණික් කටුවට මදක් ඉහළින් මාළුවෙකුගේ සලකුණ පච්ච කොටා තිබෙනවා නොවැ? පච්ච කෙටීමේදී යොදා ගන්නා සලකුණු පිළිබඳව මං ඉතා ගැඹුරට අධ්‍යයනය කරලා තිබෙනවා. මේ විෂයය ගැන මං සඟරා වලට ලිපි කිහිපයක් පවා ලියල තියෙනවා. මය මාළුවාගේ කොරපොතු රෝස පැහැයට වර්ණවත් කිරීමේ ශිල්පය චීනයට විශේෂයි. ඊළඟට ඔබේ ඔරලෝසු දම්වැලේ චීන කාසියක් එල්ලා ඇති බව දුටුවාම කාරණාව වඩාත් සරල වෙනවා."

ජේබ්ස් විල්සන් මහතා හඬනගා සිනාසුණේය.

"ඔබ මුලින් මේ දේවල් කිව්වාම මං හරිම පුදුමයකට පත්වුණා. මං හිතුවා ඔබ අති දක්ෂයෙක් කියලා. දැන් බලාගෙන ගියාම ඒක මහ ලොකු හපන්කමක් නෙමෙයි."

"වෙලාවකට මට හිතෙනවා වොට්සන්, මං නිගමනවලට පැමිණි හැටි සෑම දෙයක්ම විස්තර කර දෙන එක ලොකු වැරැද්දක් කියල. මං මේ විදියට විවෘතව හැම දෙයක්ම කියන්න ගියාම, දුප්පත් මට ලැබිල තියෙන සුළු කීර්ති නාමයත් සම්පූර්ණයෙන්ම විනාශ

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

වෙලා යනවා. ඔබට තවමත් ඔය දැන්වීම හමුවුණේ නැද්ද විල්සන් මහත්මයා?"

"ඒක මට දැන් හමුවුණා." ඔහු පැවසුවේ තම රතු පැහැති තරබාරු ඇඟිල්ල පුවත්පතට තද කරගෙනයි.

"මේ තියෙන්නෙ. හැම දෙයක්ම පටන් ගත්තෙ මේකෙන් තමා මහත්මයා. ඔබම ඒක කියවලා බලන්න."

ඔහුගෙන් පුවත් පත අතට ගෙන මම එය කියවා බැලීමි.

## රතු හිසකෙස් සංගමයේ සාමාජිකත්වය අපේක්ෂා කරන්නන් වෙතටයි.

**"ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියා ජනපදයේ ලෙබනොන්හි විසූ එසෙකියා හොප්කින්ස් මහතාගේ අන්තිම කැමැති පත්‍රය අනුව දැන් තවත් ඇබෑර්තුවක් තිබෙන බව දැනුම් දෙමු.**

**සංගමයේ සාමාජිකයෙකුට භාරදූර නොවන රැකියාවක් සඳහා සතියකට පවුම් හතරක වැටුපක් හිමිවේ. සිරුරෙන් මෙන්ම මනසෙන් ද නිරෝගී වයස අවුරුදු විසි එකකට වැඩි රතු හිසකෙස් ඇති ඕනෑම කෙනෙක් මේ සඳහා සුදුසු වේ. සංගමයේ කාර්යාලයට සඳුදා උදේ 11 ට පෞද්ගලිකව පැමිණ ඩන්කන් රොස් හමුවන්න. අංක 7, පෝප්ස් කෝට්, ෆ්ලීට් වීථිය."**

"මොකක්ද මේ පුදුමාකාර දැන්වීමේ තේරුම?" මහත් විමතියෙන් මා ඇසුවේ ඒ විස්මය ජනක දැන්වීම දෙවරක්ම කියවීමෙන් පසුවයි.

හද තුළින් නිකුත් වූ හාස්‍යය හිරි සිනාව තද කරගත් හෝම්ස් පුටුවේ, ඒ මේ අතට ඇඹරුණේය. ඒ, ඔහු අතිශයින්ම ප්‍රමෝදයට පත්වී ඇති බවට සලකුණකි.

"අපි හැමදාම ගිහිපු පාරවල් වලට වඩා ටිකක් වෙනස් පාරක්. එහෙම නේද වොට්සන්?

එහෙනම් විල්සන් මහත්මයා ඔබ සම්පූර්ණයෙන්ම, මුල ඉඳලම පටන් ගන්න. ඔබත් ඔබේ පවුල ගැනත් හැම දෙයක්ම අපට

http://sherlockholmesinvestigations.blogspot.com

කියන්න. ඊළඟට මේ දැන්වීමෙන් ඔබට සැලසුණු වාසිය අවාසිය ගැනත් කියන්න. ඔක්කොටම ඉස්සරවෙලා වොට්සන්, පුවත්පතේ නමත් දිනයත් සටහන් කරගන්න."

"ඔව්. මේක 1890 අප්‍රේල් 27 වැනිදා මෝනිං ක්‍රොනිකල් පුවත්පත. මාස දෙකකට විතර කලින් පත්තරයක්."

"බොහොම හොඳයි. ඉතින් විල්සන් මහත්මයා?"

"මං ඔබට කලිනුත් කිව්වා වගේ ෂර්ලොක් හෝම්ස් මහත්තයා . . . ."

විල්සන් ලේන්සුව ගෙන තම නළලේ ඩහදිය පිස දැම්මේය.

". . . . ලන්ඩන් නගරයට නුදුරේ කෝබර්ග් චතුරශ්‍රයේ තිබෙනවා මට අයිති බඩු උකස් ගන්නා කුඩා වෙළඳසලක්. ඒක බොහොම විශාල දියුණු ව්‍යාපාරයක් නෙමෙයි. පහුගිය අවුරුදු වල නම් මට ඒකෙන් ලැබුණේ ජීවත්වීමට යන්තමට ප්‍රමාණවත් සුළු ආදායමක් පමණයි. ඉස්සර නම් මගේ වෙළඳසලේ වැඩට උදව් වෙන්න සේවකයින් දෙදෙනෙක් තියාගන්න මට හැකියාව තිබුණා. නමුත් දැන් ඉන්නෙ එක සේවකයෙක් පමණයි. ඔහුට වැටුපක් ගෙවීම පවා මට බොහොම අමාරු වෙන්න ඉඩ තිබුණා. නමුත් වාසනාවකට වගේ ඔහු කැමැතිවුණා, නියම පඩියෙන් භාගයකට රැකියාව කරන්න. ඒ රැකියාව කරන ගමන් බඩු උගස් ගැනීමේ ව්‍යාපාරයත් ඉගෙන ගැනීමේ බලාපොරොත්තුවෙන්."

"මේ කරුණාවන්ත සේවකයාගේ නම මොකක්ද?" හෝම්ස් ඇසීය.

"ඔහුගේ නම වින්සන්ට් ස්පෝල්ඩිං. ඔහු ඒ තරම් ලාබාල තරුණයෙකුත් නෙමෙයි. කොහොම වුණත් ඔහුගේ වයස කීයක්ද කියලා හරියටම කියන්න අමාරුයි. ඊට වඩා දක්ෂ සේවකයෙක් ගැන මට නම් හිතුන්නවත් උවමනා නැහැ. හෝම්ස් මහත්මයා ඔහු ඒ තරමටම දක්ෂයි. මං මේ දෙන පඩිය වගේ දෙගුණයක පඩියක් ලැබෙන තැනක ඔහුට රක්සාවක් පහසුවෙන් හොයාගන්න පුළුවනි. ඒ වුණත් මං ඒව ඔහුට කියන්න ගියේ නෑ. මං දෙන පඩියෙන් ඔහු සෑහීමකට පත්වෙනව නම්, මං මොනවටද අනවශ්‍ය අදහස් ඔහුගේ ඔලුවට දාන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com



149. "මෙක 1890 අප්‍රේල් 27 වැනිදා මෝනිං ක්‍රොනිකල් පුවත්පත."

Reading Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

"හැබෑ තේන්නං. ඔබ් වගේ දක්ෂ සේවකයෙක් ලැබීමට ඔබ හරිම වාසනාවන්තයි. දැන් කාලයේ මේ වගේ සේවකයෙක් ගැන අහන්නවත් ලැබෙන්නේ නෑ. මට පෙනෙන හැටියට ඔබේ අර දැන්වීම වගේම සේවකයාත් හරිම අපූරු හමුවීමක්."

"ඔහුගේ වැරැදිත් නැතුවාම නෙමෙයි මහත්මයා. ඡායාරූප ශිල්පය ගැන එහෙම පිස්සුවක් තියෙන කෙනෙක්, මං කවදාවත් දැකල නෑ. කැමරාවක් තියාගෙන නොයෙක් ඡායාරූප ගන්නවා. ඊළඟට යම් වැදගත් වැඩක් ගැන හිත යොදවන්න ඕනෙම වෙලාවට මොකද කරන්නෙ? හාවෙක් උගේ ගුලට රිංගනවා වගේ අර දළ සේයා පටය හෝදන්න එයාගෙ අඳුරු කුටියට රිංගනවා. ඒක තියෙන්නේ ගොඩනැගිල්ලේ බිම් මහලට යටින් තිබෙන ගබඩා කාමරයේ. අර සේයා පටිය ශුද්ධකරලා මිසක් ආයෙ අඳුරු කුටියෙන් එළියට එන්නෙ නෑ. ඒක තමයි ඔහුගේ තිබෙන ප්‍රධානම වරද. ඒ ඇරුණාම ඔහු හොඳ සේවකයෙක්. නරක පුරුදු මොකුත් නෑ."

"ඔහු තවමත් ඔබේ සේවයේ ඉන්නවා කියල මං විශ්වාස කරනවා?"

"ඔව් මහත්මයා. ඔහු හැරුණාම තවත් මගේ ගෙදර වැඩට ඉන්නේ අවුරුදු දහහතරක ගැහැනු ළමයෙක් පමණයි. ඔය කෑම පිළියෙල කිරීම හා ස්ථානය පිරිසිදු කිරීමේ වැඩ කරන්නේ ඇයයි. ගෙදර ඉන්නේ මේ අය පමණයි. ඒ මොකද මගේ බිරිඳ කලකට ඉහත මියගියා. මට ළමයින් නැහැ. ඉතින් මහත්මයා අප තුන්දෙනා ගෙවන්නේ බොහොම නිශ්ශබ්ද ජීවිතයක්. අපේ හිසට සෙවණක් ලැබෙන වහලක් තියෙනවා. ඒකෙ ණය ගෙවමින් ජීවත් වෙනවා. එච්චරයි.

අපව කලබලයට පත් කළ මුල්ම දෙය තමා මේ දැන්වීම. එදා, ඒ කියන්නේ සති අටකට කලින් දවසක, මේ පුවත්පතම අතින් අරගෙන ස්පෝල්ඩිං මගේ කාමරයට දුවගෙන ආවා. ඔහු මෙහෙම කිව්වා.

"විල්සන් මහත්මයා! මං අහන්නෙ ඇයි දෙවියනේ මගේ කොණ්ඩෙ රතුපාට වුණේ නැත්තෙ?"

"මොකද? මොකද?" මං ඇහුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකද? මේ බලන්න රතු හිසකෙස් සංගමේ නවත් ඇබෑර්තුවක් ඇතිවෙලා? මේකෙ රස්සාවක් ලැබෙන එක, මිනිහෙකුට පුංචි නිධානයක් පහළ වුණා වගෙයි. ඒ ගොල්ලන්ට හරියට ඇබෑර්තු තියෙනවලු. ඒත් ඒවට ගන්න සුදුසු මිනිස්සු නැතිලු. ඉතින් මේ භාරකාර මණ්ඩලයට තියෙන සල්ලි වලට මොනවා කරන්නද කියල හිතාගන්න බැරිලු. අනේ මගේ කොණ්ඩෙ පාට වෙනස් වෙනවා නම් මොන තරම් වාසනාවක්ද? එහෙනම් මේ සංගමයට බැඳිලා කිසි මහන්සියක් නොවී ලොකු මුදලක් ලබාගන්න පුළුවනි."

"ඉතින් මේක මොකක්ද කියල, මට තේරුම් කරල දෙනවකෝ" මම කිව්වා

"ඔබට මං කියන දේ හිතාගන්න පුළුවන් නේද හෝම්ස් මහත්තයා. මං ගේ ඇතුළට වෙලා දවස ගෙවන මිනිහෙක්. මගේ ක්‍රියාව සඳහා මිනිසුන් මා ළඟට එනවා මිසක්, මං ගෙයින් එළියට බැහීමක් නෑ. සමහර වෙලාවට එක දිගට සති ගණන් ගෙවිල යනවා, මට ගෙයින් එළියට යන්න වත් සිද්ධවෙන්නෙ නෑ. ඔන්න ඔය හේතුව නිසා රටේ මොනවද සිදුවෙන්නෙ කියන එක මට දනගන්න ලැබෙන්නෙ නෑ. ඒ හින්දා මොනවා හරි ආරංචියක්, කාගෙන් හරි අසා දනගන්න මං හරි කැමතියි."

"රතු හිසකෙස් සංගමය ගැන ඔබ කවදාවත් අහල නැද්ද?" ස්පෝල්ඩිං දෑස් ලොකු කරගෙන මගෙන් ඇහුවෙ හරිම පුදුමයකට පත්වෙලා වගේ."

"කිසිදාක අහල නෑ."

"මං මේ කල්පනා කරන්මුන් ඔවුන්ගේ සංගමයේ එක් ක්‍රියාවකට ඔබ හොඳටම සුදුසුයි නේද කියල."

"කොහොමද ඒකට ලැබෙන පඩි?"

"ඒ තරම් ලොකු පඩියක් නම් නෙමෙයි. නමුත් අවුරුද්දකට පවුම් දෙකුන්සීයක්. ඒ වුණාට කරන්න තියෙන්නේ බොහොම සුළු වැඩ කොටසක්ලු. අනික් එක තමන්ගේ සාමාන්‍ය ව්‍යාපාරයකට බාධාවක් නොවෙන විදියට ඒකෙ රස්සාව කරන්න පුළුවනි."

ඉතින් හෝම්ස් මහත්මයා ඔබට හිතාගන්න පුළුවන් නේද මගේ හිතේ ඇතිවුණු සතුට. මෑත කාලයේ අවුරුදු ගණනක් තිස්සේම

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ උගස් බඩු ව්‍යාපාරය බොහොම පහත වැටිලා. මා ජීවත්වුණේ සෑහෙන අමාරුවෙන්. ඉතින් අමතර පවුම් සීයක් හෝ දෙසීයක් ලැබෙනවා නම් ඒක කියන්න බැරි තරම් සැනසීමක්.

"කියනවකෝ මට ඒක ගැන විස්තර."

මං ස්පෝල්ඩිං ගෙන් ඉල්ලා හිටියා.

"මහත්මයා ඔබට පෙනෙනවා නේ මේ සංගමය ගැන විස්තර. රක්ෂාවට අයැදුම් කරන්න ඕන ලිපිනයත් මේකෙ තියෙනවා.

මං දන්න තරමින් මේක පටන් අරගෙන තියෙන්නේ, එසෙකියා හොප්කින්ස් කියලා ඇමරිකානු කෝටිපතියෙක්. ඔහු හරිම පුදුම අදහස් තිබුණු පුද්ගලයෙක්ලු. ඔහුගේ හිසකෙස් රතුම රතු පාටයිලු. ඒ නිසා රතුහිසකෙස් ඇති අය ගැන, ඔහුගේ හිතේ ලොකු අනුකම්පාවක් තිබිල තියෙනවා. ඉතින් ඔහු තමන්ගේ අන්තිම කැමැති පත්‍රයෙන්, ඔහුගේ අති විශාල මුදලය ඉතිරි කරලා තියෙන්නේ රතු හිසකෙස් ඇති අයට. ඒකෙ භාරකාර මණ්ඩලයක් තියෙනවාලු. මුදලයෙන් ලැබෙන පොළිය රතු හිස කෙස් ඇති අයගේ යහපත වෙනුවෙන් බෙදා දෙන්න කියලයි, එසේකියා හොප්කින්ස් නියම කරලා තියෙන්නේ. මං අහල තියෙන හැටියට බොහොම සුළු වැඩ කොටසක් වෙනුවෙන් හොඳ පඩියක් ගෙවනවාලු."

"ඒ වුණාට රතු හිසකෙස් ඇති මිනිස්සු ලක්ෂ ගණනක් මේ රැකියාවට ඉල්ලුම් කරාවි." මම කිව්වා.

"ඔබ හිතන තරම් විශාල ගණනක් එන එකක් නෑ." ඔහු පිළිතුරු දුන්නා.

"මේක ලන්ඩන් නගරයේ අයට සීමාවෙනවා. ඊළඟට සම්පූර්ණයෙන්ම වැඩිහිටියන් බවට පත්වුණු අය විතරයි, මේ සඳහා සලකා බැලෙන්නේ. මේ ඇමරිකන් ජාතිකයා ලන්ඩනයේ ඉපදී මෙහිම හැදුණු වැඩුණු කෙනෙක්ලු. ඉතින් ඔහුට උවමනා වෙලා තියෙනවා තමන්ගේ උපන්ගම වෙනුවෙන් හොඳ වැඩක් කරන්න. අනෙක් කාරණය මේකයි. මං අහල තියෙනවා, ඔය ලා රතුපාට, අඳුරු රතුපාට, කෙස් තියෙන අය ඉල්ලුම් කළාට රස්සාව ලැබෙන්නෙ නැතිලු. එයාට අගය කරන්නෙ ගින්දර වගේ රතුපාටින් දීප්තිමත්ව බැබළෙන හිසකෙස්ලු. විල්සන් මහත්මයා. ඔබ මේකට අයදුම් කළොත් උඩින්ම තේරෙනවා. හැබැයි ඉතින් අනෙක් අතට පවුම්

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.



153. "රතු හිසකෙස් සංගමය පටන් අරගෙන තියෙන්නේ ඇමරිකානු කෝටිපතියෙක්."

http://sherlockholmesinvestigations.blogspot.com

සියගණනක් ලැබෙනවා කියල. නුපුරුදු රක්ෂාවකට යන එකත් මහ කරදරයක් තමයි."

ඉතින් මහත්වරුනි. ඔබට පෙනෙනවා ඇති, මගේ හිසේ කෙස්වල තිබෙන්නේ බොහොම දීප්තිමත් රතු පැහැයක් බව. ඉතින් මට හිතුණා ලස්සනම හිසකෙස් ඇති පුද්ගලයා මේ රැකියාව සඳහා තෝරා ගත්තොත්, ජයග්‍රහණය කරන්න මටත් හොඳ අවස්ථාවක් ඇති බව.

"ස්පෝල්ඩිං. තමුසෙ මේ කාරණාව ගැන හොඳට දන්න කෙනෙක් නේ. මේ සම්මුඛ පරීක්ෂණයට තමුසෙත් එක්ක ගියොත් මට ලොකු පහසුවක් වේවි. මං හිතුවෙ මේ වැඩේට දන්නම යන එක හොඳයි කියල."

"එතකොට අද සාප්පුව?"

"අද අපි කලින්ම සාප්පුව වහමු."

මං සේවකයාට කිව්වා.

"අන්න හොඳයි මහත්මයා. එහෙනම් මටත් අද නිවාඩුවක් ලැබෙනවා. ඒක කොයිතරම් හොඳද. ඔබේ කතාව ඇත්ත තමා. මේ වැඩේ අපි කල් දමන්න හොඳ නෑ."

එහෙම කිව් ස්පෝල්ඩිං සාප්පුව වසා දමලා මා එක්ක යන්න සූදානම් වුණා. ඊළඟට අපි දැන්වීමේ තිබුණු ලිපිනය හොයාගෙන ගියා.

හෝම්ස් මහත්තයා. ඒ වගේ දර්ශනයක් මට ආයෙ කවදාවත් දකින්න ලැබේවි කියල මං හිතන්නෙ නෑ. රටේ උතුරේ සිට දකුණටත්, බටහිර සිට නැගෙනහිරටත් ඉන්න තරමක් රතුහිසකෙස් ඇති අය එතැනට ඇවිත් හිටියා. හිසකෙස් වල යන්තමට හෝ රතු පැහැයක් තිබුණු අය පවා හිටියා. ෆ්ලීට් වීථියත්, පෝප්ස් කෝට් ප්‍රදේශයත් එකම ජන ගංගාවක් බවට පත්වෙලා. සෙනගෙන් අතුරු සිදුරු නැතිව පිරී, ඉතිරී ගියා. මං හිතුවේ නෑ කවදාවත්, මේ තරමක් රතු හිසකෙස් ඇති අය මේ එංගලන්තයේ ඇති කියල. අප එතැනට එකතු කළ ඒ දැන්වීම නොවෙන්න, කවදාවත් ඒක දැනගන්න ලැබෙන්නෙ නෑ. රතු පැහැයට කිට්ටු හැම පැහැයකම හිසකෙස් ඇති අය එතැන හිටියා. ගඩොල් රතු පාට, නැඹිලි රතු පාට, ලේ රතු පාට, පිදුරු රතු, වයින් රතු. ආදී රතු පාටේ හැම ප්‍රභේදයක්ම

http://sherlockholmesinvestigations.blogspot.com

එතැන තිබුණා. ඒ වුණාට ස්පෝල්ඩිං කිව්වා වගේ මගේ වගේ ගින්දර රතු පැහැති හිසකෙස් තිබුණු අය නම්, ඒ හැටි ගණනක් එතැන හිටියෙ නෑ. එතැන රොක් වී හිටි සෙනග ප්‍රමාණය දක්කාම මං සම්පූර්ණයෙන්ම අධෛර්යයට පත්වුණා. මං හිතුවේ ආපහු හැරිල එන්නයි.

"මම ඉදිරිපත් වෙලා වැඩක් නෑ ස්පෝල්ඩිං. මෙච්චර විශාල සෙනගකින් මාව තෝරාගන්න එකක් නැහැ. අපි ආපහු යමු."

"මේ මොනව කථා කරනවද මහත්මයා? ඔබේ හිසකෙස් වල අලංකාර රතුපාට තියෙන වෙන කිසිකෙනෙක් මෙතැන නෑ. මට විශ්වාසයි ඔබට ජයග්‍රහණය කළ හැකි බව. අපි උත්සාහ කරල බලමු."

ඔහු සෙනග දෙපැත්තට තල්ලු කරමින් මාවත් ඇදගෙන ඉදිරියට ගියා. ඒ මහ සෙනග මැද්දෙන් ඔහු ඒ කාර්යාලයට ළං වුණේ කොහොමද කියන එක මට හිතාගන්නවත් බැහැ. ඒකට ඇතුළුවෙන තරප්පු පෙළෙත් මහ සෙනගක් හිටියා. දොරටුව ඉදිරියේ සිටි සෙනග, පෝලිම් දෙකක් සෑදී තරප්පුවේ රොක් වී සිටියා. සමහරු බලාපොරොත්තු සහගතව ඇතුළට යාමේ අරමුණෙන්. සමහරු සම්මුඛ පරීක්ෂණය ඉවර වෙලා බලාපොරොත්තු කඩවී පිටවී යන අය. අපිත් සෙනග අතරට මැදි වෙලා කොහොම හරි කාර්යාලය ඇතුළට යැවුණා."

කථාව මදකට නැවැත්වූ අමුත්තා, තම මතකය අවදිකර ගැනීමේ අටියෙන්, දුම්කුඩු ස්වල්පයක් ඇඟිලිතුඩු අතරට ගෙන නාසයට ඉරුවේය.

"ඔබේ අත්දැකීම හරිම සිත්ගන්නා සුලු එකක්. කරුණාකර ඔය කථාව දිගටම කියාගෙන යන්න මහත්මයා."

හෝම්ස් ඉල්ලා සිටියේය.

"ඒ කාර්යාලයේ ඒ හැටි දෙයක් තිබුණේ නැහැ. මේසයක් සහ ලී පුටු කිහිපයක් පමණයි. මේසය පිටුපස වාඩිවෙලා හිටියේ ශරීර ප්‍රමාණයෙන් කුඩා මිනිහෙක්. ඔහුගේ හිසකෙස් මගේ කෙස්වලටත් වඩා රතු පාටයි.

ඊකියා අපේක්ෂකයන් කාමරයට ඇතුළු වුණාම ඔහු ඔවුනට යමක් පැවසුවා. ඔවුන්ගේ මොකක් හරි අඩුපාඩුවක් හොයා ගැනීමට

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු සමත්වුණා. ඒ අනුව ඔවුන් රැකියාවට නුසුදුස්සන් වුණා. තිබුණු ඇබෑර්තුව පිරවීම ඒ තරම් ලෙහෙසි පහසුවට කෙරෙන වැඩක් නෙමෙයි වගෙයි පෙනුණේ. ඒ වුණත් අපේ වාරය ආවාම අර මිනිහාගේ ප්‍රතිචාරය ටිකක් වෙනස් වුණා. අපි කාර්යාලයට ඇතුළුවුණාම ඔහු එහි දොර වසා දැම්මා. ඒ, මා සමග පෞද්ගලිකව වචන කිහිපයක් කථා කිරීමේ අදහසින්.

"මේ මහත්මයාගේ නම ජේබ්ස් විල්සන්. ඔහු කැමැතියි ඔබේ සංගමයේ ඇති රැකියා ඇබෑර්තුව පිරවීමට"

වින්සන්ට් ස්පෝල්ඩිං කිව්වා.

"ඔහු ඒ සඳහා ඉතාමත් සුදුසු බවයි මට පෙනෙන්නෙ. "අර මිනිහා කිව්වා "ඒ සඳහා ඔහුට හැම සුදුසුකමක්ම තියෙනවා. මේ තරම් අලංකාර රතු හිසකෙස් ඇති කෙනෙක් දැකපු කාලයක් මට මතක නෑ."

ඔහු අඩියක් පිටුපසට ගෙන, හිස පැත්තකට පහත් කරගෙන, මගේ හිසකෙස් දිහා ඇසිපිය නොහෙළා බලා හිටියා. ඔහු ඒ බලාහිටි හැටියට මට ලැජ්ජාත් හිතුණා. ඊළහට ඔහු එක්වරම ඉදිරියට ඇවිත්, මට අතට අත දීලා මගේ ජයග්‍රහණය ගැන මුළු හදින්ම සුභ ප්‍රාර්ථනා කළා.

"මේක තවත් ප්‍රමාද කරන එක ඔබට කරන අසාධාරණයක්. මං අපේ සංගමයේ පරෙස්සම සඳහා මේහෙම පියවරක් ගන්නවාට ඔබ මට සමාව දෙනවා ඇති."

එහෙම කිව් ඔහු ඉදිරියට ආවා. ඊළහට ඔහු දෑතින්ම මගේ කොණ්ඩය තදින් අල්ලා සෙලෙව්වා. මට වේදනාවෙන් කෑගැහුණා.

"ඔය! ඔබේ ඇස් දෙකේත් කඳුළු. ඒ වුණත් අපි රැවටිලිකාරයන්ට අනුනොවී පරෙස්සම් වෙන්න, මෙහෙම පරීක්ෂාවල් කරන්න සිදුවෙනවා. ඒ මොකද දෙපාරක් අප රැවටුණා, බොරු කොණ්ඩා වලට. තවත් වරක් රතු පැහැති වර්ණය කොණ්ඩයට ආලේප කර අපව රැවැට්ටුවා. සමහර මිනිස්සු සපත්තු හම්වලට ආලේප කරන රතු පැහැති පොලිෂ්, කොණ්ඩයට ආලේප කරගෙන එනවා. ඒ  ගැන කථා මං ඔබට ඕනෙ තරම් කියන්නම්. මේ වගේ වංචනික මිනිසුන්ගේ ස්වභාවය ගැන අහලා ඔබට පිළිකුල් හිතේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

මෙහෙම කිව් ඔහු ජනේලය ළඟට ගිහින් රැකියාව සඳහා කෙනෙක් තෝරාගත් බව හඬනඟා කිව්වා. තමන්ගේ බලාපොරොත්තු කඩවීමෙන් ඇතිවුණු කලකිරීම් හඬ සෙනග හිටි පැත්තෙන් අහන්න ලැබුණා. ඊළඟට සෙනග විසිරිලා යන්න පටන් ගත්තා. අන්තිමට රතු හිසකෙස් ඇති අය ඉතිරි වුණේ, මා සහ ඒ කළමනාකරුවා පමණයි.

"මගේ නම ඩන්කන් රොස්. අපේ ඒ ශ්‍රේෂ්ඨ දානපතියා විසින් ඇතිකර තිබෙන අරමුදලෙන් මටත් ආධාර මුදලක් හිමිවෙනවා. ඔබ විවාහක කෙනෙක්ද විල්සන් මහත්මයා? ඔබේ පවුලේ තොරතුරු කොහොමද?"

මට බිරිඳක් හෝ දරුමල්ලන් නොමැති බව මං ඔහුට දැනුම් දුන්නා. ඒක ඇහුවා විතරයි ඔහුගේ මුහුණ තරක් වුණා.

"අනේ දෙවියනේ. මේක මහ බරපතල කාරණයක්. ඒ බව අහන්නත් කණගාටුයි. මේ අරමුදල පිහිටුවලා තියෙන්නේ, රතු හිසකෙස් ඇති අයගේ සුභ සාධනය සඳහා මෙන්ම රතු හිසකෙස් පරම්පරාවක ප්‍රවර්ධනය සඳහා. ඔබ දරුමල්ලන් නොමැති තනිකඩයෙක් වීම හරි අවාසනාවක්"

මේක අහල මගේ මුහුණත් තරක් වෙන්න ඇති. මට එක්වරම හිතුණේ මට ලැබුණු පත්වීම අවලංගු වේවි කියලයි. ඔහු මිනිත්තු කිහිපයක් කල්පනා කරමින් හිටියා.

"හොඳයි කමක් නෑ. වෙන මොනවා කරන්නද. පවුලක් නොමැති වුණත් අපි ඔබව මේ තනතුරට පත්කර ගන්නම්. වෙන කෙනෙක් වුණා නම් පත්වීම සම්පූර්ණයෙන්ම අවලංගු වෙනවා. නමුත් ඔබේ හිසකෙස් වල වර්ණය අනුව අපේ නීතිරීති පොඩ්ඩක් එහෙ මෙහෙ කරල ඔබව බඳවා ගන්න බැරිකමක් නෑ. කවදා ඉඳලද ඔබට අලුත් පත්වීමේ වැඩ භාරගන්න පුළුවන්?" ඔහු ඇහුවා.

"පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මම දැනටමත් පුංචි ව්‍යාපාරයක යෙදිල ඉන්න කෙනෙක්. ඒ නිසා. . . ."

". . . . අා ඒකට බයවෙන්න එපා විල්සන් මහත්මයා." වින්සන්ට් ස්පෝල්ඩිං කිව්වා.

"ඔබ වෙනුවෙන් ඒ ඔක්කොම වැඩ කටයුතු මම බලාගන්නම්"

"වැඩ කරන්න තියෙන වෙලාව මොකක්ද?" මං ඇහුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"උදේ දහයෙ ඉඳල දවල් දෙක වෙනතුරු."

බඩු උකස් තැබීමටත්, ඒවා බේරා ගැනීමටත් ගනුදෙනුකරුවන් වැඩියෙන්ම එන්නේ හැන්දෑ වෙලාවටයි හෝම්ස් මහත්මයා. ඒකත් ඉතින් පඩි ලැබෙන බ්‍රහස්පතින්දා සිකුරාදා දවස් වල තමයි විශේෂයෙන්ම. ඊට අමතරව මගේ සේවකයා ස්පෝල්ඩිං දක්ෂයෙක් බව මං දනහිටියා. ව්‍යාපාරයේ වැඩකටයුතු සාර්ථකව කරගෙන යන්න ඔහුට අපහසු වෙන්නෙ නෑ.

"ඒ වෙලාවල් මටත් පහසුයි." මං කිව්වා.

"එතකොට මගේ පඩිය?"

"සතියකට පවුම් හතරයි."

"කරන්න තිබෙන වැඩ මොනවාද?"

"බොහොම සුළු වැඩ කොටසක්."

"සුළු කියන එකෙන් ඔබ අදහස් කරන්නේ මොකක්ද?"

"මං කියන්නම්. ඉස්සර වෙලාම අපේ නීති මෙන්න මේවායි. ඔබ වැඩ කරන කාලය තුළ මේ කාර්යාලයේ රැඳී සිටිය යුතුමයි. අඩුම වශයෙන් මේ ගොඩනැගිල්ලේ වත් සිටිය යුතුයි. ඔබ එක මොහොතකටවත් මෙතැනින් පිටවී ගියොත් ඔබට රැකියාව සම්පූර්ණයෙන්ම අහිමි වෙනවා. ඒ කාරණාව හොප්කින්ස් මහතාගේ අන්තිම කැමැති පත්‍රයේ පැහැදිලිවම සඳහන් වෙනවා."

"දවසකට පැය හතරයි නේ. මෙතනින් පිටවී යන්න මට උවමනාවක් නෑ."

"ඔව්. හැබැයි එහෙම ගියොත් ඔබගෙන් කිසිම නිදහසට කරුණක් අපි භාරගන්නෙ නෑ. අසනීපයක් වුණත් රාජකාරියක් වුණත්, වෙන යම් කරුණක් වුණත් ඔබ මෙහි රැඳී සිටිය යුතුමයි. නැත්නම් රැකියාවෙන් අස්කරනවා."

"එතකොට කළ යුතු වැඩ මොනවාද?"

"ඔබට කරන්න තියෙන්නේ බ්‍රිටැනිකා විශ්වකෝෂය පිටපත් කිරීමයි. එහි පළමුවැනි වෙළුම මෙතැන තියෙනවා. මේ කටයුත්ත සඳහා කඩදාසි, තීන්ත, පෑන්, තීන්ත පොවන කඩදාසි ආදිය ඔබම සපයා ගත යුතුයි. අපි මෙහෙන් දෙන්නේ මේසයක් හා පුටුවක් පමණයි. හෙට සිට වැඩ පටන්ගන්න ඔබ සූදානම්ද?"

Personal Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"සත්තකින්ම ඔව්" මම පිළිතුරු දුන්නා.

"එහෙම නම් ඔබට ආයුබෝවන් ජේබ්ස් විල්සන් මහත්මයා. මෙම තනතුර ලැබීමට ඔබ වාසනාවන්තවීම ගැන මගේ සුභ පැතුම් තවත් වාරයක් පිළිගන්න"

ඔහු ආචාර කළා. මම ඔහුගෙන් සමුගෙන සේවකයා සමග ගෙදර ආවා. මට පෑදුණු වාසනාව ගැන මම හරිම සතුටකට පත්වුණා.

එදා මුළු දවසමත්, හැන්දෑවෙත් මට නිතර කල්පනා වුණේ මා මුහුණ දුන් මේ සිදුවීමයි. රෑ වෙද්දි මං තරමක මානසික පසුබෑමකට ලක්වුණා. මේක මොකක් හරි මගඩියක්, වංචාවක් කියලා මට නිතරම හිතෙන්න ගත්තා. නමුත් ඒක මොන අරමුණකින් කරන එකක් ද කියලා මට හිතාගන්න බැරිවුණා. බ්‍රිටැනිකා විශ්වකෝෂය පිටපත් කරනවා වැනි වැඩකට, කෙනෙක් තමන්ගේ බුදලයෙන් විශාල මුදලක් වෙන් කරාවිද? සතිපතා මෙවැනි විශාල වැටුපක් ඒ වගේ වැඩකට ගෙවාවි කියලා විශ්වාස කරන්නත් අමාරුයි. මගේ සිතේ පැවැති දොම්නස් ගතිය නැතිකරන්න වින්සන්ට් ස්පෝල්ඩිං සැහෙන උත්සාහයක් දැරුවා. රෑ නින්දට යන වෙලාව වෙද්දි මේක ගැන මගේ කිසිම විශ්වාසයක් නැතිව ගියා. නමුත් පහුවදා උදේ, කොයි එකටත් මේක මොකක්ද කියලා ගිහින් බලන්න ඕනෙ කියලා මට හිතුණා. මං පැන්සයේ තීන්ත බෝතලයක්, පිහාටු පෑනක්, සහ ෆුල්ස්කැප් කඩදාසි හතකුත් අරගෙන පෝප්ස්කෝට් වෙත ගියා.

මාව පුදුමයටත් සතුටටත් පත්කරමින් සියල්ල සූදානම්ව තිබුණු බව මට දකින්න ලැබුණා. ඩන්කන් රොස් මහත්මයා එහි සිටියා. මේසය සූදානම් කරලා, මං වැඩ පටන්ගන්නා හැටි ඔහු බලාගෙන හිටියා. පිටපත් කිරීම මට 'A' අකුරෙන් පටන්ගන්න නියමකර ඔහු පිටත් වී ගියා. ඉන්පසු ඔහු වරින්වර කාර්යාලයට ඇවිත්, මං වැඩ කරන හැටි සෝදිසියෙන් බලාගෙන හිටියා. ආයෙමත් පිට වී ගියා. හවස දෙකට එතැනට ආ ඔහු වැඩ අවසන් කරන්න මට නියම කළා. ඊළහට මට ශුභ දවසක් ප්‍රාර්ථනා කරලා දොර වසා අගුළු දැම්මා.

ඉතින් හෝම්ස් මහත්මයා, වැඩටික දිනපතාම මේ විදියට සිදුවුණා. ඊළහට සෙනසුරාදා හවස දෙකට ඔහු ඇවිත් මගේ

http://sherlockholmesinvestigations.blogspot.com

වැටුප ලෙස රන්පවුමේ කාසි හතරක් මට ගෙව්වා. ඊළඟ සතියෙත් මං යළිත් වැඩට ගියා. මොකුත් ප්‍රශ්නයක් පැන නැඟුණේ නැහැ. සතියෙන් සතිය, දිගින් දිගටම මේ විධියට මං රැකියාවට ගියා. ටික කලක් ගත වෙද්දී, ඩන්කන් රොස් මහත්මයා මගේ වැඩකටයුතු පරීක්ෂා කරන්න ආවේ දවසකට එක්වරක් පමණයි. ඊට පස්සේ ටික කලක් ගතවෙද්දී ඔහු කොහොමටවත් ආවෙ නෑ. එහෙම වුණත් මං කොයි වෙලාවක වත් කාර්යාල කාමරයෙන් නම් පිටතට ගියේ නෑ. ඒ මොකද ඔහු කොයි මොහොතේ එයිද කියල මං නොදන්න නිසා. අනෙක රැකියාවත් මට හොඳින් ගැළපුණු එකක්. ඒ නිසා ඒක අහිමිකරගන්න මං කැමති වුණේ නැහැ.

සති අටක් මේ විධියට ගතවෙලා ගියා. A අකුර යටතේ තිබුණු විස්තර පිටපත් කර අවසන් වෙන්න කිට්ටු වුණා. ඒ නිසා මං බලාපොරොත්තු වුණේ වැඩි දවසක් යන්න කලින් B අකුර පටන්ගන්නයි. ෆුල්ස්කැප් කොළ වලට මට සෑහෙන මුදලක් වියදම් වුණා. මං කළ ලියවිලි වලින් රාක්කයේ එක් තට්ටුවක් සම්පූර්ණයෙන්ම වාගේ පිරුණා. ඊළඟට එක්වරම හැම දෙයක්ම හිටි හැටියේ නැවතුණා."

"නැවතුණා?"

"ඔව් මහත්මයා. ඒක සිද්ධ වුණේ අද උදේ. මං පුරුදු විධියට උදේ දහයට වැඩට ගියා. කාර්යාලයේ දොර වහලා අගුළු දමා ඇති බව මම දුටුවා. හතරැස් කාඩ්බෝඩ් කැබැල්ලක් දොරේ එල්ලා තිබුණා. මෙන්න මං ඒක ගලවාගෙන ආවා. ඔබටම කියවලා බලන්න පුළුවනි."

එහි මෙසේ සඳහන් විය.

රතු හිසකෙස් සංගමය

විසුරුවා හරින ලදී

1890 ඔක්තෝබර් 9

ෂර්ලොක් හෝම්ස් සහ මම මේ දැන්වීම දෙස බලා සිටියෙමු. ඊළඟට එය රැගෙන ආ පුද්ගලයාගේ බලාපොරොත්තු කඩවීම

http://sherlockholmesinvestigations.blogspot.com

නිසා කෝපයට පත් මුහුණ අපට දිස්විය. මෙම සිද්ධියෙන් ඇතිවූ හාස්‍යය නිසා අපට සියල්ල අමතක විය. අප දෙදෙනාටම මහ හඬින් සිනාපහළ විය.

"මෙතැන හිනාවෙන්න තරම් විහිළුවක් ඇති කියල මට නම් හිතෙන්නෙ නෑ."

විල්සන් මහතා පැවසුවේ ඔහුගේ හිසකෙස් තරමටම මුහුණද කෝපයෙන් රතු කරගනිමිනි.

"මට හිනාවෙනව ඇරෙන්න වෙන කරන්න දෙයක් ඔහේල දන්නෙ නැත්නම් මං වෙන කොහේට හරි යන්නම්."

"නෑ නෑ විල්සන් මහත්මයා කලබල වෙන්න එපා." හෝම්ස් පැවසුවේ අපේ අමුත්තා අඩක් නැඟී සිටි පුටුවේ, යළිත් අසුන් ගන්නා මෙන් සංඥා කරමිනි.

"මුළු ලෝකයම දෙනව කිව්වත් මං ඔබේ මේ ගැටලුව නම් කොහොමටවත් අත්අරින්නෙ නෑ. මේක ඉතාම කලාතුරකින් දකින්න ලැබෙන, ඒ නිසාම හරිම සිත් ඇදගන්නා සිදුවීමක්. හැබැයි කිව්වාට තරහ ගන්න එපා මහත්මයා. මේකෙ යම්කිසි හාස්‍යජනක පැත්තකුත් තියෙනවා. ඉතින් මට කියන්න මේ දැන්වීම දැකුවාම ඔබ මොනවද කළේ?"

"මට කරකැවිල්ලක් හැදුණා වගේ දැනුණා මහත්මයා. කළ යුත්තේ මොකක්ද කියලා මට හිතාගන්න වත් බැරිවුණා. ඒ ළඟ තිබුණු කාර්යාල හැම එකකටම ගිහින් මං විමසලා බැලුවා. හැබැයි ඔවුන් මේ සංගමය ගැන කිසිදෙයක් දැනගෙන හිටියේ නෑ. අන්තිමට මං ගියා ගොඩනැගිල්ලේ අයිතිකාරයා හමුවෙන්න.

ඔහු ගණකාධිකාරීවරයෙක්. ඔහුගේ කාර්යාලය තිබුණේ පහළම තට්ටුවේ.

"මහත්මයා. අර ඉහළ තට්ටුවේ කාමරයක පවත්වාගෙන ගිය රතු හිසකෙස් සංගමයට මොකද වුණේ?"

"මොකකටද මහත්මයා?"

"අර රතු හිසකෙස් සංගමය කියල එකක් පවත්වාගෙන ගියෙ? මං මෙච්චර දවසක් රැකියාව කළේ එතැන. අද බලනකොට ඒක වහල."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ කියන ඔය සංගමයක් ගැන මං කිසිම දෙයක් අහලවත් නෑ මහත්මයා."

"එහෙනම් මට කියන්න අර ඩන්කන් රොස් මහත්මයාට මොකද වුණේ කියල?"

"ඩන්කන් රොස්? එහෙම නමක් මං අහපු පළමුවෙනි වතාවයි මේ."

"අර කාමර අංක 4 මහත්මයා?"

"ආ අර රතුපාට හිසකෙස් තියෙන මනුස්සයාද?"

"ඔව් ඔව්."

"ඔහුගේ නම විලියම් මොරිස්. ඔහු නීතිඥයෙක්. එයා ඒ කාමරය පාවිච්චි කළේ තාවකාලිකව. එයාගෙ කන්තෝරු කාමරය නවම හදාගෙන යනවා කියල, ඒක සම්පූර්ණ වන තුරු මෙහෙ හිටියේ. ඒකෙ වැඩ සම්පූර්ණයි කියලා ඊයෙ අස්වෙලා ගියා."

"මට එයාව හම්බවෙන්න පුළුවන් කොහේදි ද?"

"ආ එයාගෙ අලුත් කන්තෝරුවට ගියාම හම්බවෙන්න පුළුවනි. ලිපිනය මං ළඟ ඇති. . . . ආ මේ තියෙන්නෙ. . . . අංක 17 එඩ්වඩ් රජවීථිය, සාන්ත පෝල් දේව මැඳුර අසල."

මං වහාම එතැනට පිටත්වෙලා ගියා හෝම්ස් මහත්මයා. ගිහින් බලන කොට ඒක දණහිස් කටු කෘතිමව හදන කර්මාන්ත ශාලාවක්. ඒකෙ ඉන්න කිසි කෙනෙක්, විලියම් මොරිස් ගැන හෝ ඩන්කන් රොස් ගැන අහලවත් නෑ."

"ඊට පස්සෙ ඔබ මොකද කළේ?"

"ඊළඟට මම සැක්සිකෝබර්ග් චතුරශ්‍රයේ පිහිටි මගේ නිවසට ගියා. මගේ සේවකයාගේ අදහස මං විමසලා බැලුවා. මට උදව් කරන්න ඔහුටත් හැකියාවක් තිබුණෙ නෑ. ඔහු කිව්වෙ තැපෑලෙන් මොනවා හරි දන්වා එවන තුරු, මං ටික දවසක් බලාගෙන සිටිය යුතු බවයි. ඒ වුණත් ඒ අවවාදයෙන් මං සෑහීමකට පත්වුණේ නැහැ. මේ තරම් හොඳ රැකියාවක් එක්වරම මට අහිමි වී ගියා. ඒක නිහඬව භාරගෙන, නිකං ඉන්න මම සූදානම් නෑ. හෝම්ස් මහත්මයා. මං අහල තියෙනවා, අවවාද උපදෙස් අවශ්‍ය දුප්පත්

http://sherlockholmesinvestigations.blogspot.com

මහිසුන්ට ඔබ උදව්කරනවා කියලා. ඒකයි මං වහාම ආවේ, ඔබව හොයාගෙන.

"ඔබ බොහොම බුද්ධිමත්ව කටයුතු කර තිබෙනවා විල්සන් මහත්මයා. ඔබේ මේ ගැටලුව ඉතාම සුවිශේෂ එකක්. ඒක විසඳීම මං බොහොම සතුටෙන් භාරගන්නම්. ඔබ මට හෙළිකළ කාරණා වල හැටියට, මට හිතෙනවා මෙකෙ යට, බැලූ බැල්මට නොපෙනෙන, මොනවා හරි බැරෑරුම් දෙයක් සැඟවිලා තියෙනවා කියල."

"බැරෑරුම් නේන්නං! මට සතියකට රත්පවුම් හතරක් ලැබෙන එකත් අහිමි වුණා!"

ජේබ්ස් විල්සන් කීය:

"ඔබේ පැත්තෙන් හිතුවොත්, ඒ තරමටම කණගාටුවෙන්න දෙයක් ඔබට සිදුවුණා කියල මං හිතන්නෙ නෑ මහත්මයා. ඇත්තෙන්ම ඔබට වුණේ වාසියක්. පවුම් 30 කට නොඅඩු මුදලක් ඔබ උපයා ගත්තා. ඊට අමතරව විශ්වකෝෂයේ A අකුර යටතේ ඇති හැම විෂයයක්, මාතෘකාවක් ගැනම විස්තර සහිත දැනුමක් ඔබට ලැබුණා. ඔබට ඒකෙන් කිසි පාඩුවක් වුණේ නැහැ."

"නැහැ මහත්මයා. මට උවමනා කරන්නේ ඔබ ලවා උන් කවුද කියලා හොයා ගන්නයි. මේක මහ විකාර විහිළුවක්! මාව මේ විදියට විහිළුවට ලක් කිරීමේ අරමුණ මොකක්ද කියලා මට හොයාගන්න ඕන. ඒකට උන්ට බොහොම වියදම් වුණා. ඔව්. පවුම් 32 ක් වියදම් වුණු විහිළුවක්."

"ඔබ වෙනුවෙන් මේ හැම දෙයක්ම පැහැදිලි කරගන්න අප බලාපොරොත්තු වෙනවා මහත්මයා. ඊට කලින් මට ඔබෙන් ප්‍රශ්නයක් දෙකක් අහන්න තියෙනවා. මේ දැන්වීම ගැන ඔබේ අවධානය යොමු කළේ ඔබේ සේවකයා නේද? ඔහු දැන් කොයිතරම් කල් ඉඳලද ඔබ ළඟ ඉන්නෙ?"

"ඒ දවස් වලදී ඔහු ඇවිත් මාසයයි."

"ඔහු කොහොමද ඔබ ළඟ රැකියාවට බැඳුණේ?"

"මං පත්තරේ පළ කළ දැන්වීමක් අනුව ආවා."

"ඔහු පමණද රැකියාවට ඉල්ලුම් කළේ?"

"නැහැ. දහදොළොස් දෙනෙක් ආවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ ඔහුව තෝරාගත්තේ ඇයි?"

"ඔහු බොහොම දක්ෂ හුරුබුහුටි පුද්ගලයෙක් වගේ පෙනුණා. අඩුපඩියට රැකියාවට එන්න කැමති වුණා."

"හරියටම කියනවා නම් පඩියෙන් භාගයකට?"

"ඔව්."

"මේ වින්සන්ට් ස්පෝල්ඩිංගේ පෙනුම කොහොමද?"

"ශරීර ප්‍රමාණයෙන් කුඩායි. ඒ වුණාට ශක්තිමත්. වැඩට හරි කඩිසරයි. මුහුණේ රැවුල ගහක් වත් නෑ. ඒ වුණත් වයස නම් මං හිතන්නේ තිහට අඩු නෑ. ඔහුගේ නළලේ තිබෙනවා ඇසිඩ් නිසා ඇති වූ සුදුපාට, පිළිස්සීමේ ලකුණක්."

හෝම්ස් පුටුවේ හරිබරි ගැහුණේ ඉමහත් සන්තෝෂයෙනි.

"මං හිතුවා ඔය ටික. මහත්මයා ඔබ දුටුවාද ඔහුගේ කන්පෙති දෙක සිදුරු කර ඇති හැටි, කරාබු දැමීමට මෙන්?"

"ඔව් මහත්මයා. ඔහු කිව්වා, ඔහු පුංචි කාලේ ජිප්සි (අහිකුණ්ඨික) මිනිස්සු ඔහුගේ කන් විද්දා කියල."

"හ්ම්! ඔහු තවමත් ඔබ ළඟ ඉන්නවාද?"

"ඔව් මහත්මයා. ඔහු උකස් බඩු සාප්පුවේ ඉඳිද්දියි මේ දැන් මං පිටවී ආවේ."

"ඔබ නැති අතරේ ඔබගේ ව්‍යාපාරයේ වැඩ කටයුතු කෙරුණු හැටි කොහොමද? ගනුදෙනු කරුවන් ඇවිත් තියෙනවද?"

"කියන්න තරම් දෙයක් නෑ මහත්මයා. උදේ වරුවේ කෙනෙකු එන්නේ බොහොමත්ම කලාතුරකින්."

"හොඳයි විල්සන් මහත්මයා. අපට දැනගන්න උවමනා එපමණයි. මං මේ ගැන හොයා බලලා, දවසකින් දෙකකින් ඔබට තොරතුරු කියන්නම්. අද සෙනසුරාදානෙ. මං බලාපොරොත්තු වෙනවා සඳුදා වෙනකොට මේක ඉවරයක් කරන්න."

අපේ අමුත්තා සමුගෙන, නිවහනෙන් නික්ම ගියේය.

"හොඳයි වොට්සන්. මේ සිද්ධියෙන් ඔබට තේරුම් ගැනීමට හැකිවුණේ මොනවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මට මොකුත් තේරුම් ගන්න බෑ. මේක සම්පූර්ණයෙන්ම අභිරහසක් කියලයි මට හිතෙන්නෙ." මම කීවෙමි.

"සිරිතක් වශයෙන් ගැටලුවක් සංකීර්ණ වෙන්න, වෙන්න, ඒකෙ අභිරහස් ගතිය අඩුවෙනවා. තේරුම් ගන්න බැරි මහ ප්‍රහේලිකා බවට පත්වෙන්නේ, අරමුණක් නැති, එදිනෙදා ජීවිතයේ සිදුවෙන අපරාධ. ඒක හරියට, ඔය ඕනෑම තැනකදී දකින්න ලැබෙන සාමාන්‍ය මුහුණක, හඳුනාගැනීමේ ලක්ෂණ නැතුවා වගේ. කොහොම වුණත් මේ වැඩේට මං වහාම ක්‍රියාත්මක වෙන්න ඕන. ප්‍රමාද කරන්න බෑ."

"මොනවාද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"දුම්පානය කරන්න. මේක පයිප්ප තුනක් බොන්න වෙන ගැටලුවක්. මං ඔබෙන් ඉල්ලා හිටිනවා මිනිත්තු පනහක් යනතුරු මා එක්ක කථා කරන්න එපා කියල."

හාන්සිපුටුවේ වකුටු වුණු හෝම්ස්, කකුල් දෙක ඉහළට ගෙන දණිස් දෙක මුහුණට ළං කර ගත්තේය. ඊළඟට ඔහුගේ කළු පැහැති පිහන් මැටි දුම්පයිප්පය දුම්කොළ වලින් පුරවාගෙන මුවේ රුවා ගත්තේය. දන් මට ඔහුගේ ඡායාව පෙනුණේ පුදුමාකාර හොටයක් ඇති, අරුම පුදුම කුරුල්ලෙකු විලසිනි. දෑස පියාගත් හෝම්ස් වරින්වර පයිප්පයෙන් දුම්පිටකරමින් කල්පනාවට වැටුණේය. ඔහුට නින්ද යන්නට ඇතැයි මට සිතිණි. ඇත්තෙන්ම මම ද නිදිකිරා වැටෙන්නට පටන්ගතිමි. ටික වේලාවකට පසු ඔහු එක්වරම පුටුවෙන් නැගිට්ටේය. ඒ යම්කිසි තීරණයකට පැමිණි අයුරෙනි.

"වොට්සන්. අද හවස ශාන්ත ජේම්ස් ශාලාවේ, සරසවේ වාදනයේ යෙදෙන සංගීත සන්ධ්‍යාවක් තියෙනවා. මොකද හිතන්නේ? ඔබේ රෝගීන්ට පුළුවන් වේවිද, සංගීත වාදනයට කන්දීම සඳහා ඔබට පැයක් දෙන්න?"

"මට අද කරන්න කිසිදෙයක් නැතුවයි ඉන්නෙ. මේ වෙදකම නම් කිසිසේත් මගේ සිත් ඇදගන්නා එකක් නෙමෙයි."

"එහෙම නම් ඔබේ හිස්වැස්ම දාගෙන එන්න. මට මුලින් නගරය හරහා ගමන් කරන්න සිදුවෙනවා. අප යන අතරේ දවල් කෑම කොහෙන් හරි කමු. මේ සංගීත සංදර්ශනයේ වැඩි වශයෙන් තියෙන්නේ ජර්මන් සංගීතයලු. ඒකට මං වැඩිය කැමැතියි. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

මොකද මං ඉතාලි සහ ප්‍රංශ සංගීතයට වඩා ජර්මන් සංගීතය ප්‍රියකරන නිසා, ඒකෙන් අපේ යටිසිතේ ඇති හැඟීම් උඩට මතුකර පෙන්වනවා. මං කැමැතියි මගේ යටිහිතේ ඇති හැඟීම් මොනවද කියලා පරීක්ෂා කර බලන්න."

අපි උමං දුම්රියක නැගී ඕල්ඩර්ස් ගේට් දක්වා ගමන් කළෙමු. එතැනින් කෙටි දුරක් පාගමනින් ගමන් කළ පසු, අපට සැක්ස් කෝබර්ග් චතුරශ්‍රය වෙත ළඟාවීමට හැකිවිය. ඒ අපේ සුවිශේෂ කථාව ඇරැඹුණු ස්ථානයයි.

එතැන එතරම් ප්‍රියමනාප, සුවදායක තැනක් නොවීය. යකඩ වැටකින් ආවරණය කළ ඉඩමක් තුළ, කුඩා තට්ටු නිවාස පේළි හතරක් අපට දකින්නට ලැබිණි. වල් පැළෑටි වලින් වැසුණු මිදුලේ, කණාටු මල් පඳුරු කිහිපයක් විය. දුමෙන් වැසුණු දූෂිත පරිසරය නිසා, ජීවිතය රැකගැනීමට මල් පඳුරු වලට පවා සටන් කිරීමට සිදුවී ඇති බැව් පැහැදිලිය.


දුඹුරු පැහැති නාම පුවරුවක "ජේබ්ස් විල්සන්" යන නම ලියා තිබිණි. එය සවිකර තිබුණේ වත්තේ අන්තිම කෙළවරට වන්නට පිහිටි නිවසේයි. එය ඉදිරිපිට නැවතුණු හෝම්ස්, හිස පැත්තකට ඇළ කරගෙන ඒ දෙස පරීක්ෂාවෙන් බලා සිටියේය. එවිට ඔහුගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණු අයුරු මම දුටුවෙමි. මීළඟට ඔහු වත්තට ඇතුළු නොවී, වීථියේම මදක් ඉහළට ගමන් කළේය. යළිත් ආපසු ආවේය. ඉන්පසු ඔහු උකස්බඩු ගන්නාගේ නිවස ඉදිරිපිටට පැමිණ, පදික වේදිකාව මතට තමාගේ සැරයටියෙන්, දෙතුන් වාරයක් තදින් ඇන්නේය. අනතුරුව ඔහු ඉදිරි දොර වෙත ගොස් දොරට තට්ටු කළේය. සේවකයා විසින් දොර වහාම විවෘත කරන ලදී. ප්‍රසන්න පෙනුමක් තිබූ ඔහුගේ මුහුණේ, එක් රැවුල් ගසක් හෝ නොතිබිණි. නිවස ඇතුළට එන මෙන් ඔහු අපට ඇරයුම් කළේය.

"බොහොම ස්තූතියි." හෝම්ස් කීය.

"මට නම් ඕනෑවුණේ ඔබෙන් පාරක් අහගන්න. මෙතෝ ඉඳල ස්ට්‍රැන්ඩ් වලට යන්න අපි කොයි පැත්තටද හැරෙන්න ඕනෑ?"

"තුන්වැනි හන්දියෙන් දකුණට හැරිලා ඊළඟට හමුවන හතරවැනි හන්දියෙන් වමට හැරෙන්න." පැවසූ ඔහු දොර ඉක්මනින් වසා දැම්මේය.

http://sherlockholmesinvestigations.blogspot.com



167. ". . . . මට ඕනෑ වුණේ ඔබෙන් පාරක් අහගන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම දක්ෂ පුද්ගලයෙක්," හෝම්ස් පැවසුවේ අප ඉදිරියට ඇවිද යද්දීයි.

"මම විනිශ්චය කරලා තියෙන හැටියට ලන්ඩනයේ ඉන්න දක්ෂම පුද්ගලයින්ගෙන් හතරවැනි තැනට එන්නේ මේ මිනිහා. නිර්භය කම අතින් නම් මං හිතන්නේ තුන්වැනි තැනින් පහළට යන්නෙ නෑ. මං ඔහු ගැන මීට කලින් තොරතුරු ටිකක් අහල තියෙනවා" හෝම්ස් කීය.

"මට පෙනෙන හැටියට, රතු හිසකෙස් අභිරහසට, විල්සන් මහත්මයාගේ උදව් කාරයාත් සෑහෙන තරමකින් සම්බන්ධයි. මං දැනගත්තා ඔබ පාර අහන්න ඇත්තේ මිනිහව හොඳට බලාගන්න කියල."

"මිනිහව නෙමෙයි. . . ."

"එහෙනම්?"

"ඔහුගේ දිග කලිසමේ දණිස් ප්‍රදේශය හොඳින් බලාගන්න."

"මොනවද ඔබට දකින්න ලැබුණේ?"

"මං දකින්න බලාපොරොත්තු වුණු දෙය දුටුවා."

"ඔබ මොකද අර පදික වේදිකාව මතට හයියෙන් සැරයටියෙන් ගහලා බැලුවේ?"

"මගේ හිතවත් දොස්තර මහත්මයා. මේ නිරීක්ෂණය සඳහා යොදාගත යුතු වේලාව මිසක්, සාකච්ඡා සඳහා යෙදිය යුතු කාලය නෙමෙයි. අපි සතුරු දේශයකට ඇවිත් ඔත්තු බලන රහස් ඔත්තුකාරයෝ. අපි දන් සැක්සි කෝබර්ග් චතුරශ්‍රය ගැන යමක් දන්නවා. ඊළඟට අපි ගවේෂණයක යෙදිලා බලමු, මේකට පිටිපස්සෙන් තිබෙන වීථිය මොන වගේ එක්ක ද කියලා?"

සැක්සි කෝබර්ග් චතුරශ්‍රයෙන් හැරී අතුරු පාරකින් අප පිවිසුණේ සම්පූර්ණයෙන්ම වෙනස් මුහුණුවරක් ගත් මාවතකටයි. එය ලන්ඩනයේ උතුර හා දකුණ අතර වාහන ගමනාගමනය සිදුවූ ප්‍රධානතම මහා මාර්ගයකි. වෙළඳ ද්‍රව්‍ය ප්‍රවාහනය කරමින් තිබූ අශ්වකරත්ත, දිශා දෙකටම පේළි දෙක බැගින් පිරී තිබිණි. වාහන තදබදය නිසා ගමනාගමනය ඇණහිට තිබූ බව අපි දුටුවෙමු. පාර අයිනෙන්ම වූ අතුරු පාර වල මගීහු ගමන්ගත්හ. මේ ප්‍රධාන

http://sherlockholmesinvestigations.blogspot.com

මාවතට මුහුණ ලා අලංකාර කඩසාප්පු, රජයේ හා පෞද්ගලික ආයතන ආදී ගොඩනැගිලි විශාල සංඛ්‍යාවකි. මේ අලංකාර ආයතන වල පිටුපස විවෘත වන්නේ මුඩුක්කු පෙනුමක් තිබූ අපිරිසිදු සැක්සි කෝබර්ග් චතුරශ්‍රයට යයි සිතීමටවත් නොහැක.

"කෝ බලන්න."

හෝම්ස් කීවේ වීථියේ කෙළවරේ සිටගෙන අයිනේ වූ කඩසාප්පු පරීක්ෂා කරමිනි.

"මෙතැන ඉඳගෙන බැලුවම පෙනෙන්න තියෙන ගොඩනැගිලි මොනවාද කියල මං කැමතියි මතක තියාගන්න. ලන්ඩන් නගරය ගැන විශේෂිත දැනුමක් ඇති කරගැනීම මගේ විනෝදාංශයක්.

අර තියෙන්නේ මෝටිමර් දුම්කොළ වෙළෙන්දාගේ සාප්පුව. ඊළඟට පුවත්පත් විකුණන කුඩා කඩය. ඊළඟට සිටි සහ සබ්අර්බන් බැංකුවේ කෝබර්ග් ශාඛාව. ඊටත් පස්සේ නිර්මාංශ ආපන ශාලාව. අන්තිමටම මැක්ෆාලේන්ගේ අශ්වකරත්ත කර්මාන්ත ශාලාව. එතැනින් ගොඩනැගිල්ල සම්පූර්ණයි.

එහෙනම් දොස්තර මහත්මයා, අපට කරන්න තියමිත පාඩම දැන් අවසානයි. දැන් ඇවිත් තියෙන්නේ ක්‍රීඩා වල යෙදෙන වෙලාව. සැන්ඩ්විච් එකක් කාලා, කෝපි කෝප්පයක් බීලා, අපි යමු වයලීන වාදන භූමියට. එතැනදී මධුර සංගීතයේ රාවයෙන් අපේ හදවත් සනසවාගන්න පුළුවනි. රතු හිසකෙස් කාරයෝ, ඔවුන්ගේ ප්‍රශ්නත් අරගෙන අපට කරදර කරන්න එතැනට එන එකක් නැහැ."

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් සංගීතය කෙරෙහි දැක්වූයේ අසීමිත ඇල්මකි. ඔහු නොයෙකුත් වාද්‍යභාණ්ඩ වාදනයෙහි විශිෂ්ට හැකියාවක් දැක්විය. එපමණක් නොව, සංගීත නිර්මාණයට පවා හෝම්ස් අති දක්ෂයෙක් විය. එදා මුළු සැඳෑවරුවම ඔහු සාන්ත ජේම්ස් ශාලාවේ සංගීත වාදනයට සවන් දුන්නේ අපමණ සන්තෝෂයකිනි. වාදන තාල වලට ඇඟිලි ඉහළ පහළ යවමින්, සංගීතයෙන් කුල්මත් වී සිටි ඔහුගේ මුහුණ, සිනාවෙන් ඔපවැටී තිබිණි. අපරාධ කරුවන් ලුහුබැඳ යන තීක්ෂණ බුද්ධියක් ඇති රහස් පරීක්ෂකයාත් මේ හෝම්ස් දැයි සිතාගැනීමටත් අපහසු තරම් විය.

"සැකයක් නෑ. ඔබට ගෙදර යන්න හිතිල වගෙයි වොට්සන්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මම් ගියොත් හොඳයි."

"මටත් තියෙනවා රාජකාරියක යෙදෙන්න. ඒකටත් පැය කීපයක් ගතවේවි. අර කෝබර්ග් චතුරශ්‍රයේ පරීක්ෂණය බොහොම බරපතල එකක්."

"ඇයි ඒ බරපතලයි කිව්වෙ?"

"සෑහෙන තරම් ලොකු අපරාධයක් ගෙරෙන්න, කටයුතු සැලසුම් වෙමිනුයි තියෙන්නෙ, මං හිතනවා ඒක නැවැත්වීමට අපි තවමත් ප්‍රමාද නැහැ කියලා. හමුත් අද සෙනසුරාදා නේද? ඒකෙන් වැඩේ තවත් සංකීර්ණ වෙනවා. අද රෑට මට ඔබේ උදව් ඕනෑ වෙනවා."

"කොයි වෙලාවටද?"

"රෑ දහය වෙනකොට ඉන්න පුළුවන් නම් ඇති."

"රෑ දහය වෙද්දි මං බේකර් වීථියට එන්නම්."

"බොහොම හොඳයි. ඒ වගේම වොට්සන් මෙතැන පොඩි අන්තරායදායක ගතියකුත් තිබෙනවා. කරුණාකරල ඔබේ හමුදා රිවෝල්වරය ගෙන එන්න අමතක කරන්න එපා."

එසේ පවසා මට අත වැනූ හෝම්ස්, ආපසු හැරී ගොස් සෙනග අතරේ අතුරුදන් විය.

මගේ බුද්ධි මට්ටම, මගේ අසල්වාසීන්ගේ තරම් සාමාන්‍ය එකක්යැයි මම විශ්වාස කරමි. එහෙත් ෂර්ලොක් හෝම්ස් සමග යෙදුණු කටයුතු වලදී, මට සිතුණේ මා මහ මෝඩයකු කියායි. මෙම පරීක්ෂණය සම්බන්ධයෙන්, ඔහුට අසන්නට ලැබුණු හැමදෙයක්ම, මට ද අසන්නට ලැබිණි. ඔහු දුටු හැම දෙයක්ම මම ද දුටුවෙමි. එහෙත් ඔහු පැවසූ දෙයින් මට තේරුම් ගත හැක්කේ, සිදුවී ඇති සියල්ලත්, ඉදිරියට සිදුවීමට ඇති දේත්, හෝම්ස්ගේ බුද්ධියට වැටහී ඇති බවයි. හමුත් මට නම් මෙය තවමත් අගක් මුලක් වටහා ගත නොහැකි පටලැවිල්ලකි.

කෙන්සිංටන්හි පිහිටි මගේ නිවස වෙත අශ්වකරත්තයෙන් ගමන් කරමින් සිටියදී, මේ අරුම පුදුම සිද්ධිය පිළිබඳව මම තවදුරටත් කල්පනා කළෙමි. අද්භූත අමුත්තා අපට විස්තර කළ කථාව, රතු හිසකෙස් තිබූ ඩන්කන් රොස්, අප සැක්සි කෝබර්ග්



Reading Purpose Only. Not For Print.

චතුරශ්‍රයට ගිය ගමන, හෝම්ස් පැවසූ තේරුම් ගැනීමට දුෂ්කර වගන්ති; මට මේ සියල්ල එකින් එක මැවී පෙනිණ. රාත්‍රියේ අපට යෑමට සිදුවන මේ ගමන කුමක්ද? අප ආයුධ වලින් සන්නද්ධ වී යා යුත්තේ ඇයි? අප යන්නේ කොහේටද? අපට කිරීමට සිදුවන කටයුතු මොනවාද? උකස්කරුවාගේ සේවකයා - මුහුණේ රැවුල වත් නොවැවුණු ඒ තරුණයා, බොහෝ දරුණු තැනැත්තෙකු බව මට හෝම්ස්ගෙන් අසන්නට ලැබිණි. ඔහු යමකිසි දරුණු ක්‍රීඩාවකට අර අඳිනවා විය යුතුය. මම මේ ප්‍රහේලිකාව විසඳීමට උත්සාහ දැරුවෙමි. එහෙත් එය කළ නොහැකි වූ තැන මම එය අත්හැර දැමුවෙමි. අද රාත්‍රියේ මෙය විසඳනවා නොවැ?

මා ගෙදරින් පිටවූයේ රාත්‍රී නවයයි කාලටයි. උද්‍යානය හරහා ගමන් කොට ඔක්ස්ෆර්ඩ් වීථියට පැමිණ, එතැනින් මම බේකර් වීථියට පිවිසුණෙමි. අපේ නිවහණේ දොරටුව අසල ලොකු අශ්වකරත්ත දෙකක් නවතා තිබිණි. උඩු මහලට නැඟීම සඳහා බරාඳයට පිවිසෙද්දීම, කිහිප දෙනෙකු කථා කරන හඬ මට අසන්නට ලැබිණි.

අපේ විසිත්ත කාමරයට මා ඇතුළු වෙද්දී අමුත්තන් දෙදෙනෙකු සමග හෝම්ස් මහත් උනන්දුවෙන් සාකච්ඡාවක යෙදී සිටියේය. මෙයින් එක් තැනැත්තකු පොලිස් රහස් පරීක්ෂකයකු වන පීටර් ජෝන්ස්ය. අනෙකා කෙට්ටු උස පුද්ගලයෙකි. ඔහුගේ මුහුණේ පළවූයේ දොම්නස් හැඟීමකි.

"හා හරි! අපේ කණ්ඩායම සම්පූර්ණයි." මා දුටු විගස හෝම්ස් පැවසුවේ, ඔහු හඳිමින් ඕවර් කබායේ බොත්තම් පියවා, රාක්කයේ වූ ආයුධය අතට ගනිමිනි.

"වොට්සන්. ස්කොට්ලන්ඩ්යාඩ් හි පීටර් ජෝන්ස් මහත්මයා නම් ඔබ අඳුනනවා මං හිතන්නේ. මේ අනෙක් මහත්මයා අඳුනාගන්න. මේ තමයි මෙරිවෙදර් මහත්මයා. අද රෑට අප යන වික්‍රමාන්විත ගමනට අපට එකතුවෙන මිත්‍රයෙක්."

"අප ආයෙමත් සැරයක් එකතු වෙලා දඩයමේ යනවා. එහෙම නේද දොස්තර මහත්මයා? කොහේ හරි ඉන්න තක්කඩියෙක් ලුහුබැඳ යන්න අපේ හෝම්ස් මහත්තයා පුදුමාකාර දක්ෂයෙක්. ඔහුට ඒ සඳහා ඕනෑ කරන්නෙ ලුහුබැඳ යාමට බල්ලෙක් පමණයි."

ජෝන්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතනවා ඒ ලුහුබැඳීම වැඩකට නැති හිස් එකක් නොවේවි කියලා." මෙරිවෙදර් මහතා පැවසුවේ සතුටු ස්වරයකින් නොවේ.

"හෝම්ස් මහත්මයා ගැන ඔබට සම්පූර්ණ විශ්වාසය තැබිය හැකියි මෙරිවෙදර් මහත්මයා" ඒ කීවේ පොලිස් නිලධරයාය.

"ඔහු යොදාගන්නා ක්‍රම, ඔහුටම විශේෂ වූ අමුතුම ආකාරයක ඒවා. කිච්චට තරහ ගන්න එපා හෝම්ස් මහත්මයා. මට නම් පෙනෙන්නේ ඒවා සිද්ධාන්ත මත ගොඩ නැඟුණු උපකල්පන වලින් ගොඩනඟා ගත් අමුතුම ක්‍රම කියලයි. හරිම අපූරුම උපක්‍රම. ඒ වුණත් අපරාධ පරීක්ෂකයෙකු සතුවිය යුතු හැම ගුණාංගයක්ම ෂර්ලොක් හෝම්ස් මහත්මයාට තිබෙනවා. අර ෂොල්ටෝ මිනීමැරුම සහ ආග්‍රා නිධානය සම්බන්ධයෙන් හෝම්ස් මහත්මයා කළ පරීක්ෂණය ගැන ඔබ අහල තියෙනවද? හෝම්ස් මහත්මයා කළ සොයාගැනීම්, පොලීසියෙන් කළ ඒවාට වඩා නිවැරදියි."

"ජෝන්ස් මහත්මයා. ඔබ එහෙම කියනවා නම් ඉතින් කමක් නෑ." මෙරිවෙදර් මහතා කීවේ ගෞරව සම්පන්න විලසිනි.

"ඒ වුණත් මං කියන්න ඕන, මගේ සුපුරුදු බ්‍රිජ් ක්‍රීඩාවේ යෙදීමේ අවස්ථාව අද නොලැබී ගිය එක මට හොඳට දැනෙනවා. පහුගිය අවුරුදු විසිහතර ඇතුළත කාඩ් ක්‍රීඩාවේ නොයෙදුණු එකම සෙනසුරාදා දවස අදයි."

"මෙරිවෙදර් මහත්මයා." හෝම්ස් කථාව ඇරඹුවේය.

"මං හිතනවා මේ පහුගිය කාලෙම ඔබ කාඩ් ක්‍රීඩාවේ යෙදී, කවදාවත් ඔට්ටු නොඇල්ලූ මුදලකටයි අද ක්‍රීඩා කරන්න යන්නේ. ඒ වගේම ඒ හැම අවස්ථාවකටම වඩා අද ක්‍රීඩාව බොහොම ත්‍රාසජනක එකක් වෙනවාට කිසිම සැකයක් නෑ. ඔට්ටුව දිනාගත්තොත් මෙරිවෙදර් මහත්මයා, ඔබට ලැබෙන මුදල රන්පවුම් 30,000 යි. ජෝන්ස් මහත්තයා දිනාගන්න තැග්ග මොකක්ද? ඔහු බොහොම කාලෙක ඉඳල අල්ලා ගන්න බලාගෙන හිටි තක්කඩියෙක්."

හෝම්ස් කීය.

"ජෝන් ක්ලේ කියන්නේ හොරෙක්, මිනීමරුවෙක්, හොර නෝට්ටු අච්චු ගසන්නෙක්. ඔහු බොහොම තරුණ වයසේ කෙනෙක්. නමුත් මෙරිවෙදර් මහත්මයා ඔහු තමන්ගේ වෘත්තියේ ඉහළම හිනි පෙත්තටම නැගලයි ඉන්නේ. මේ ලන්ඩනයේ ඉන්න අනික් හැම

http://sherlockholmesinvestigations.blogspot.com

අපරාධකාරයෙකුටම වඩා ජෝන් ක්ලේගේ දෑතට යකඩ වළලු දාන්න මං කැමතියි. මේ මිනිහා හරි පුදුමාකාර එකෙක්. ඔහුගේ සීයා බ්‍රිතාන්‍ය රජ පවුලට ලොකු සබඳකම් ඇති ආදිපාදවරයෙක්. ජෝන් ක්ලේ ඊටන් විද්‍යාලයේ ඉගෙන ගෙන, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලැබුවා. ඔහු දෑතෙන් කරන වැඩ වලට වගේම මොළයෙන් කරන වැඩ වලටත් දක්ෂයෙක්. පහුගිය කාලෙ දකින්න ලැබුණු හැම වංචාවකදීම, හැම අපරාධයකදීම ඔහු ඊට සහභාගි වී ඇති ලකුණු දකින්න ලැබුණා. ඒත් ඔහු කොහෙදි අපට කොටුවෙවිද කියන එක නම් කල්තබා අපට කියන්න බැහැ. ඔහු එක් සතියක ස්කොට්ලන්තයේ බැංකුවක් බිඳලා මුදල් කොල්ල කනවා. ඊළඟ සතියේ ඒ මුදල් කෝන්වෝල් ප්‍රදේශයේ අනාථ නිවාසයක් හදන්න පරිත්‍යාග කරනවා. ඔහු ඉතිරි කළ හෝඩුවාවල් පිටුපස, මං ඔහු හඹා යන්න පටන් අරගෙන දැන් අවුරුදු ගණනක් වෙනවා. ඒත් මගේ ඇස් දෙකට තවමත් ඔහුව දැකලා නැහැ."

ජෝන්ස් පැවසුවේය.

"මං විශ්වාස කරනවා අද රාත්‍රියේ ඔහුව ඔබට සතුටින් හඳුන්වාදීමට මට අවස්ථාවක් ලැබේවි කියල. වරක් දෙකක් මට නම් ඔහුව දකින්න ලැබිල තියෙනවා. ඔහු තමන්ගේ වෘත්තියේ හිනි පෙත්තටම නැගල කියල ඔබ කිව් දේට මම සම්පූර්ණයෙන්ම එකඟයි. දහයත් පහුවුණා. අපට පිටත්වෙන්න වෙලාව හරි. ඔබ දෙදෙනා පළමුවෙනි අශ්වකරත්තයේ යන්න. මායි වොට්සනුයි අනෙක් එකේ එන්නම්."

අශ්වකරත්තයට නැග ගමනේ යෙදෙද්දී හෝම්ස් වැඩි කතාබහක යෙදුණේ නැත. එදා හැන්දෑවේ අසන්නට ලැබුණු වාදන වල තාල මුමුණමින් සිටි ඔහු, කතාබහක් අරඹන ලකුණක්වත් නොතිබිණි. ගෑස් පහන් වලින් ආලෝකමත් වූ වීථි ගණනාවක් පසුකර ගිය අපි අවසානයේ ෆැරිංටන් වීථිය කරා පැමිණියෙමු.

"අපි දැන් එතැනට ළඟයි" හෝම්ස් කථාව පටන්ගත්තේය.

"මේ මෙරිවෙදර් කියන මිනිහා බැංකුවක අධ්‍යක්ෂක කෙනෙක්. මේ පරීක්ෂණයට ඔහු සහභාගි වෙන්නෙ පෞද්ගලික කැමැත්ත නිසා. මට හිතුණා ජෝන්ස්වුත් අපත් සමග හිටියොත් වඩා හොඳයි කියල. රහස් පරීක්ෂක වෘත්තියෙන් ජෝන්ස් තරමක මෝඩයෙක් බව

http://sherlockholmesinvestigations.blogspot.com

ඇත්තයි. ඒ වුණාට මිනීහා නරක මිනිහෙක් නෙමෙයි. ඔහුගේ තියෙනවා එක් හොඳ, විශේෂ ලක්ෂණයක්. බුල්ඩෝග් වර්ගයේ බල්ලෙක් වගේ නිර්භයයි. තක්කඩියෙක් අල්ලා ගත්තොත් කකුළුවෙක් එල්ලෙන තාලෙට එල්ලෙනවා. කොහොම හරි අල්ලා ගන්නවා. ආයෙත් උෟට ගැලවීමක් නෑ. ඔන්න අපි උවමනා කරන තැනටම ආවා. ඔවුන් දෙදෙනා අප එනතුරු බලාගෙන ඉන්නවා."

උදේ වරුවේ පැමිණි අපිරිසිදු කෝබර්ග් චතුරශ්‍රයටම යළිත් අපි පැමිණ සිටියෙමු. අප මෙහි ගෙන ආ කුලීරථ පිටත්කර යවන ලදී. අනතුරුව මෙරිවෙදර් මහතාගේ මඟ පෙන්වීම අනුව අපි පටු මඟක් දිගේ පහළට බැසීමට පටන් ගත්තෙමු. ඔහු කුඩා දොරක් විවෘත කළේය. එයින් අප පිවිසියේ පටු කොරිඩෝවකටයි. එය දිගේ අපි ඉදිරියට ගමන් කෙළෙමු. කොරිඩෝව අවසන් වූයේ යෝධ යකඩ ගේට්ටුවකිනි. සාක්කුවෙන් යතුරු කැරැල්ලක් ගෙන මෙරිවෙදර් එය ද විවෘත කළේය. එයින් ඇතුළු වූ අපි තරප්පු පෙළක් දිගේ පහළට බැසගෙන ගියෙමු. එය අවසන් වූයේ තවත් විශාල යකඩ දොරකිනි. ලන්තෑරුම දැල්වූ පසු මෙරිවෙදර් මහතා එම දොර ද විවෘත කළේය. අනතුරුව ඔහු පස්ගඳ හමන අඳුරු බරාඳයක් මැදින් අප කැඳවාගෙන ගියේය. එය අවසානයේ ඔහු හොඳින් වසා තිබූ තුන්වැනි දොර ද විවෘත කළේය. එයින් අප ඇතුළු වූයේ සුරක්ෂිතාගාරයකටයි. එහි සෑම තැනකම විශාල ලෑලි පෙට්ටි රාශියක් ගොඩ ගසා තිබිණි.

"මේකට කාටවත් උඩින් ඇතුළුවෙන්න බැරිද?" හෝම්ස් ඇසුවේ ලන්තෑරුම ඉහළට ඔසවා සුරක්ෂිතාගාරයේ සිවිලිම පරීක්ෂා කරමිනි.

"උඩින් විතරක් නෙමෙයි යටිනුත් බැහැ." එසේ කිව් මෙරිවෙදර් මහතා තම සැරයටිය එහි පොළොව මතට කිහිපවාරයක් ඇන්නේය.

"දෙයියෝ සාක්කි! මට නම් මේ හැන්නෙන් ඇහෙන්නේ බොල් හඬක්!" ඔහුට කෑගැසිණි.

"මහත්මයා. මට ඔබෙන් ඉල්ලා හිටින්න වෙනවා, මීට වඩා නිශ්ශබ්දව කටයුතු කරන්න කියලා." හෝම්ස් කීවේ මෙරිවෙදර්ට තරවටු කරන හඬිනි.

"අපේ කටයුත්තේ සාර්ථකත්වය ඔබ දැනටමත් ලොකු අවදානමකට ලක්කරල ඉවරයි. මං ඔබෙන් ඉල්ලා හිටිනවා,

http://sherlockholmesinvestigations.blogspot.com



175. ලන්තෑරුම දල්වූ මෙරිවෙදර් මහතා, එම දොරද විවෘත කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

කරුණාකර අන්න අර තියෙන පෙට්ටියක් උඩින් වාඩිවෙලා නිශ්ශබ්දව ඉන්න; අපේ වැඩ වලට බාධා කරන්න එපා."

අවට වූ ලෑලි පෙට්ටි වෙත ගිය මෙරිවෙදර් මහතා, ඉන් එකක් මත වාඩිවිය. ඔහුගේ මුහුණේ දක්නට ලැබුණේ, හෝම්ස්ගේ දොස් පැවරීම නිසා සිත් වේදනාවට පත් ලකුණුයි. මේ අතර ලන්තෑරුම අතට ගත් හෝම්ස් පොළොවේ දණගසා ගත්තේය. මීළඟට ඔහු සියුම් දේ පරීක්ෂා කරන කාචයෙන්, බිම පරීක්ෂාවට ලක් කළේය. ඔහුගේ අවධානය මුලින්ම යොමුවූයේ බිම සාදා තිබූ ගල්, එකට සම්බන්ධ වූ බදාම තීර වෙතටයි. තත්පර කිහිපයක පරීක්ෂාවෙන් සෑහීමට පත් ඔහු දෙපයින් නැගී සිටියේ, කාචය තම සාක්කුවට දමා ගනිමිනි.

"අඩු ගණනේ තව පැයක් වත් අපට ඉන්න වෙනවා. අර උකස්බඩුකාරයා ඇඳට ගිහිං, ඔහුට හොඳින් නින්ද යනතුරු උන්ට මොකුත් වැඩක් පටන්ගන්න බෑ. ඊට පස්සේ උන් මොහොතක් වත් ප්‍රමාද වෙන්නේ නෑ. වැඩේ ඉක්මනට අවසන් කළ තරමට උන්ට වාසියි. ඒ මොකද එතකොට උන්ට වැඩි කාලයක් ලැබෙනවා, අහුනොවී පැනගන්න.

දොස්තර මහත්මයා. අපි මේ දැන් ඉන්නෙ කොහේද කියලා, ඔබ සමහර විට දැනටමත් තේරුම් අරගෙන ඇති. අපි ඉන්නේ ලන්ඩනයේ ප්‍රධානතම බැංකුවක, නගර ශාඛාවේ, සුරක්ෂිතාගාරය තුළ. මෙරිවෙදර් මහත්මයා තමයි ඒ බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති. ලන්ඩනයේ ඉන්න නිර්භයම අපරාධකාරයින්ගේ අවධානය මෙතැනට යොමු වෙලයි තියෙන්නෙ. ඒ ඇයි කියල මෙරිවෙදර් මහත්මයා ඔබට කියල දේවි."

"ඒ අප ප්‍රංශයෙන් ගෙන්වාපු රත්තරන් නිසා. මේකට හොරු කඩාපනින්න ඉඩ තියෙනවා කියලා, අපට අනතුරු ඇඟවීම් කිහිපයක්ම ආවා."

"ප්‍රංශ රත්තරන්?"

"ඔව්. අපේ බැංකුවේ වත්කම තවත් ශක්තිමත් කරගන්න, අපට මාස කිහිපයකට කලින් ඉඩක් සැලසුණා. අපි ප්‍රංශ බැංකුවෙන් නැපෝලියන් රන්කාසි තිස්දහසක් ණයට ගත්තා. මං මේ වාඩිවෙලා ඉන්න පෙට්ටියේ, තුනී ඊයම් තහඩු අතරේ රන්කාසි දෙදහසක්

http://sherlockholmesinvestigations.blogspot.com

තියෙනවා. අපේ බැංකුවේ තැන්පත්ව ඇති රත්රන් ප්‍රමාණය, සාමාන්‍යයෙන් මේ වගේ ශාඛා කාර්යාලයක, තබාගත යුතු ප්‍රමාණයට වඩා වැඩියි. මේ ගැන අධ්‍යක්ෂකවරුන් සිටියේ සෑහෙන අසහනයකින්."

"එවැන්නකට පත්වීම සාධාරණ බව දැන් ඔප්පු වෙනවා." හෝම්ස් කීය.

"දැන් ඉතින් අපේ වැඩ සැලසුම් කිරීමට වෙලාව. මං විශ්වාස කරනවා තවත් පැයක් ගතවෙද්දි, මේ කටයුත්තේ ඉහළම තැනට අපි ළඟාවේවි කියලා. මෙරිවෙදර් මහත්මයා. ඒ අතරෙ අපි අර ලන්තෑරුමේ එළිය ආවරණය කර තබමු."

"එහෙම කරලා කළුවරේ ඉන්නෙ කොහොමද?"

"කණගාටුයි. නමුත් මට වෙන කරන්න දෙයක් නෑ. මං කාඩ්කුට්ටමත් සාක්කුවේ දමාගෙනයි ආවෙ. අපි හතර දෙනෙක් ඉන්න නිසා, මෙරිවෙදර් මහත්මයාව අහිමිවුණු "බ්‍රිජ්" ක්‍රීඩාවෙ මෙතැනදී යෙදෙන්න මං බලාපොරොත්තු වුණා. නමුත් දැන් මට පෙනෙනවා අපේ සතුරා කටයුතු සියල්ල ඉතාම ඉහළින් සම්පාදනය කරලයි තියෙන්නේ. ඒ කොපමණද කිව්වොත්, එළිය වැටෙන ලෙස ලන්තෑරුම දල්වා තබා ගැනීමත් අවදානම්.

මුලින්ම අප තීරණය කරන්න ඕන, අප හැංගෙන්නේ කොහේද කියලා. මේ අපරාධකාරයෝ ගිනිඅවි ඇදල අරගෙන වෙඩි තියන්න, කොයි මොහොතකවත් පසුබට වෙන්නෙ නෑ. ඒ බව අප මතක තබා ගත යුතුයි. කිසි දෙයක් නොදන මෙතැනට පැමිණෙන නිසා උන් ඉන්නේ තරමක් අවාසිදායක තත්ත්වයක. ඒ වුණත් අපි පරෙස්සම් විය යුතුයි. මම මේ විශාල ලෑලි පෙට්ටිය පිටුපස්සෙ හැංගෙනවා. ඔබ හැමදෙනාමත් ඒ විදියට පෙට්ටි පිටුපසින් හැංගෙන්න. මං උන් දෙසට ආලෝකය එල්ල කළ වහාම, පැනලා අල්ලා ගමු. වොට්සන් උන් වෙඩිතියන්න හැදුවොත්, කිසිම අනුකම්පාවක් දක්වන්න එපා. වෙඩිතියන්න."

මගේ රිවෝල්වරය සාක්කුවෙන් එළියට ගෙන, එහි ආරක්ෂක අගුළ ලිහිල්කර වෙඩිතැබීමට සූදානම් කර ගතිමි. මීළඟට එය, මා සැඟවුණු ලී පෙට්ටිය මත තැබුවේ, ඕනෑම මොහොතක අතට ගැනීමට හැකිවන අයුරෙනි. අප සියල්ලන් ගන අඳුරේ තබමින්, හෝම්ස් ලන්තෑරුමේ විමිනිය ආවරණය කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ තරම් තිත්ත කළුවරකට මා මුහුණදුන් පළමුවැනි වතාව මෙයයි. කෙසේ වෙතත් ලන්තෑරුමේ රත්වූ ලෝහයෙන් නැඟුණු ගඳ නාසයට දැනිණි. ඒ, පහනේ ආලෝකය ඕනෑම මොහොතක යළි ලබාගැනීමට හැකි බවට සලකුණකි. දරුණු කලබලයක් ඇතිවිය හැකියයි හැඟීමක් මගේ සිතේ ඇතිවී තිබිණ. ඒ නිසා මගේ සිරුරේම ස්නායු ආවේගශීලී තත්ත්වයකට පත්ව ඇත. අප සැඟවී සිටි සුරක්ෂිතාගාරය තුළින් නැඟුණු ශීතල, පිළුණු වාතය නිසා සිතට දැනුණේ අප්‍රසන්න ගතියකි.

"උන්ට පැනයන්න තියෙන්නේ එකම විධියයි." හෝම්ස් කෙඳිරුවේය.

"ඒ ආපහු විල්සන්ගේ ගෙදරට ගිහිං එතැනින් සැක්සි කෝබර්ග් චතුරශ්‍රයට පැන ගැනීමෙන්. මං ඔබෙන් ඉල්ලා සිටි දේ ඔබ ඉටුකරන්න ඇති කියල මං විශ්වාස කරනවා ජෝන්ස්?"

"ඔව් මහත්මයා. පොලිස් පරීක්ෂකවරයෙක් සහ පොලිස් භටයන් දෙදෙනෙක් ගෙදර ඉස්සරහ දොරටුව ළඟ රැඳෙව්වා."

"එහෙනම් ඔක්කොම සිදුරු වහලා. දැන් අපට තියෙන්නේ නිශ්ශබ්දව බලාගෙන ඉන්නයි."

අපට ඉතා දිගු වේලාවක් බලාගෙන සිටීමට සිදුවූයේ යයි මට සිතිණ. මා සතු සටහන් පසුව පරීක්ෂා කිරීමේදී එය පැයකුත් කාලක් බව මට දකින්නට ලැබිණි. එහෙත් එදා මට දැනුණේ මුළු රාත්‍රියම ගෙවී ගොස් අරුණැලු උදාවීමටත් ළංවී ඇත කියාය.

මගේ අත් කකුල් සම්පූර්ණයෙන්ම හිරිවැටී ඇති බවක් මට දැනිණි. ඊට හේතුව මා සිටි ඉරියව්ව හෝ තැන වෙනස් කිරීමට උත්සාහ නොකිරීමයි. මගේ මුළු සිරුරේම දිවගිය උද්වේගකාරී හැඟීම නිසා ඉතා සියුම් දේ පවා කනට ඇසිණි. මගේ සගයන් තිදෙනා හුස්මගත් හඬ පවා සුවණට වැටිණි. තරබාරු ජෝන්ස්ගේ ගැඹුරු හුස්ම ගැනීමේ හඬ, සිහින් මෙරිවෙදර්ගේ කෙටි, නොගැඹුරු හඬ වෙන්ව හඳුනාගැනීමට පවා මට හැකියාව තිබිණ.

මා සැඟවී සිටි තැන සිට, ලෑලි පෙට්ටියට ඉහළින් සුරක්ෂිතාගාරයේ මැද පොළොව මට හොඳින් දැකගැනීමට හැකියාව තිබිණි. එක්වරම ආලෝක දහරාවක් මගේ නෙත ගැටිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

මුලින් එය ගල් ඇතිරූ පොළොවෙන් උඩට මතුවූ ආලෝක කිරණක් පමණි. පසුව එය කහ පැහැති ආලෝක කදම්බයක් බවට පත්වූයේ කිසිදු ශබ්දයක් නොනගමිනි. එක්වරම අපට දක්නට ලැබුණේ ගල් ඇතිරූ මහ පොළොවේ විවරයක් සෑදී ඇති බවයි. මොහොතකින් ඒ විවරය තුළින් සිහින් සුදුමැලි අතක් ඉහළට පැමිණියේය. ගැහැනියකගේ අතක් වැනි සිහින් අත පොළෝ මට්ටමෙන් ඉහළට පැමිණ ඇහිලි ඒ මේ අතට දිගුවෙන ආකාරය අපි දුටුවෙමු. මීළහට එය යළිත් පහළට ඇදගනු ලැබිණ. සියල්ල යළිත් නිහඬ විය. විවරයේ පමණක් කණාමැදිරි එළියක් රැඳී තිබිණි.

ඒ මොහොතකට පමණි. එක්වරම ගලකට එල්ල වූ කුළුගෙඩි පහරක හඬත් සමගම, පොළොවේ සවිකොට තිබූ ගලක් ගැළවී ඇත්ත පෙරළිණි. දැන් විවරය සෑහෙන තරම් විශාලය. ඒ තුළින් ඉහළට ලන්තෑරුමක් ඔසවනු ලැබිණ. ඊටපසු කොලු ගැටයෙකුගේ වැනි කෙට්ටු මුහුණක් උඩට මතුවිය. අනතුරුව විවරය දෙපස ගැට්ට දෑතින් අල්ලාගත් ඔහු, ඉහළට එසවුණේය. හිණ මට්ටම දක්වාම විවරයෙන් එළියට ඇදුණු මේ තැනැත්තා, තම දණහිසක් ගැට්ටේ හිර කරගත්තේ පහළට රුවා නොයන විලසිනි. ඊළඟ මොහොතේ ඔහු විවරයේ පිටුපසට වී, තම සගයාට ඉහළට ඒමට උදව් කෙළේය. ඒ සගයා ද පළමුවැන්නා මෙන්ම කෙට්ටු, ප්‍රමාණයෙන් කුඩා පුද්ගලයෙකි. එහෙත් ඔහුගේ හිසකෙස් දීප්තිමත් රතු පැහැයක් ගත්බව අඩ අඳුරේ වුවද දැකිය හැකි විය.

"ඔක්කොම හරි වගෙයි. කෝ නියනයි මලු ටිකයි? ඒව මෙහාට දීල හිටපං. දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! පැන ගනිං ආචී, පැනගනිං! මට එල්ලුම් ගස් යන්න සිද්ධවුණත්. . . .!"

ඉදිරියට පැන්න හෝම්ස් අමුත්තාගේ කමිස කොලරයෙන් දැඩිව අල්ලා ගත්තේය. ඒ අතර අනෙකා විවරය තුළට රිංගා ගත්තේය. ඔහුගේ ඇඳුම ජෝන්ස්ගේ ග්‍රහණයට හසුවුණු නමුදු, එය ඉරී යන හඬ මට ඇසිණි. එළියට ආ රිවෝල්වරයක් ලන්තෑරුමේ ආලෝකයෙන් බැබළිණි. එහෙත් හෝම්ස්ගේ ආයුධයෙන් හොරාගේ මැණික් කටුවට ප්‍රබල පහරක් එල්ල විය. ඔහු අත වූ රිවෝල්වරය ගල්පොළොව මත ඇද වැටිණි.

"දඟලීමෙන් වැඩක් නෑ ජෝන් ක්ලේ. තමුසෙට මොන විධියකින්වත් ගැළවෙන්න ක්‍රමයක් නෑ" හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මට පෙනෙනවා" අනෙකා පිළිතුරු දුන්නේ ගණනකට නැතිවය.

"මගේ මිත්‍රයා නම් බේරිලා ගියා. මට පෙනෙනවා උගේ කබායේ කෑලි නම් තමුසෙලාට අහුවෙලා තියෙන බව."

"එයා ගියාට කමක් නෑ. ඒ මොකද අර පැත්තෙ දොර ළඟ පොලිසියෙ තුන්දෙනෙක් බලාගෙන ඉන්නවා, එයාව පිළිගන්න."

"හැබෑට? ඔබ වැඩේ බොහොම ක්‍රමානුකූලව සකස් කරල එහෙනම්? ඔබේ දක්ෂකම මා අගය කළ යුතුයි."

"ඇයි මමත් ඔබේ දක්ෂකම අගය කරන්න ඕන ක්ලේ." හෝම්ස් කීය.

"මේ රතු හිසකෙස් සංකල්පය ඉතාම අලුත් එකක්. ඒ වගේම සාර්ථක එකක්."

"තමුසෙගෙ යාළුවා තමුසෙට ඉක්මනටම දකින්න ලැබේවි. ඔහු මේ ගුහා ඇතුළෙ පහළට රිංගලා යන්න මට වඩා දක්ෂ ඇති. ඒ වුණත් ඔහොම ඉන්නවකො මං ඌව අල්ලගන්න තුරු" ජෝන්ස් කීය.

"මං ඔබෙන් ඉල්ලා හිටිනවා ඔය අපිරිසිදු දෑත් වලින් මාව අල්ලන්න එපා කියල." අපේ සිරකරුවා පැවසුවේ ජෝන්ස් ඔහුගේ දෑත් වටා විලංගු තද කරද්දියි.

"ඔහේලා දන්නෙ නැතුව ඇති මගේ ඇඟේ දුවන්නෙ රාජකීය රුධිරය බව. මාව අමතන කොට, "කරුණාකර" සහ "උතුමාණනි" යන වචන යොදන්න අමතක කරන්න එපා!" ජෝන් ක්ලේ කීය.

"බොහොම හොඳයි." ජෝන්ස් පැවසුවේ උපහාසාත්මක බැල්මක් හෙළමිනි.

"උතුමාණනි ඔබට කරුණාකර ඉහළ මාලයට යහපත් විය හැකිද? ඔබතුමන්ව පොලිස් ස්ථානයට ගෙනයෑමට කුලීරියක් කැඳවාගන්න තුරු?"

"අන්න එහෙම කථා කරන එක වඩාත් හොඳයි" ක්ලේ පැවසුවේ ශාන්ත දාන්ත ස්වරයෙනි.

අප තිදෙනාට හිස නමා ආචාර කළ ඔහු, ජෝන්ස්ගේ අත්අඩංගුවේ ඉහළ තට්ටුවට යෑමට පිටත්විය. අපි ඔවුන් පසුපස ගමන්ගත්තෙමු.

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



181. "දඟලීමෙන් වැඩක් නෑ ජෝන් ක්ලේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ඇත්තමයි හෝම්ස් මහාත්මයා. මම දන්නෙ නෑ බැංකුව ඔබට කොහොම ස්තුති කරන්නද කියල. අපි ඔබට පුදුමාකාර විධියට ණය ගැතියි. මගේ ජීවිත කාලය තුළ, බැංකු හොරකම් ගැන මං අහල තියෙන කථා බොහොමයි. එයින් බැංකුවක් මංකොල්ල කෑමට යෙදූ තියුණුම උත්සාහය මේක බවට කිසිම සැකයක් නෑ. ඔබ මේ සූක්ෂම උපායයන් හඳුනාගෙන, ඔවුන් පරාජය කරන්න සමත්වුණු හැටි අපූරුයි."

"ජෝන් ක්ලේ මහාත්මයා සමඟ විසඳාගත යුතු මගේම ගැටලු එකක් හෝ දෙකක් තියෙනවා. මේක විසඳීම සම්බන්ධයෙන් මටත් මුදල් ටිකක් වියදම් වුණා. මං බලාපොරොත්තු වෙනවා බැංකුවෙන් ඒක මට ගෙවාවි කියල. ඒ ඇරුණොම තෑග්ගක් ලෙස, මේ සුවිශේෂ ගැටලුව සාර්ථක ලෙස විසඳා ගන්න ලැබුණු එකම මදෑ."

* * *

පසුවදාට එළිවෙන පාන්දර අපි බේකර් වීථියේ නිවහනේ අපේ අත්දැකීම පිළිබඳව කතාබහ කරමින් හිටියෙමු.

"ඔබට පෙනෙන්න ඇති නේද වොට්සන්, අර රතු හිසකෙස් සංගමය කියල දැන්වීමක් පළකිරීමේ අරමුණ මොකක්ද කියල? ඔවුනට උවමනා වුණා, මේ ටිකක් මෝඩපහේ උකස් බඩු කාරයා දවසකට පැය කිහිපයක් ගෙදරින් ඉවත් කරල තියන්න. යොදා ගත් ක්‍රමය බොහොම විස්මයජනක එකක් බව ඇත්තයි. නමුත් ඒක හොඳින් සාර්ථක වුණා. මේ ක්‍රමය ක්ලේගේ අතිදක්ෂ මොළේට කල්පනා වෙන්න ඇත්තෙ, විල්සන්ගේ හිසකෙස් වල වර්ණය දුටුවාමයි. සතියකට පවුම් හතරක් කියන්නේ හොඳ ඇමක්. පවුම් දහස් ගණනක් කොල්ලකන්න සැලසුම් කරන ඔවුනට පවුම් 32 ක් කියන්නේ සුළු දෙයක්. ඔවුන් පත්තරේට දැන්වීමක් දැම්මා. එක තක්කඩියෙක් කාර්යාලයක් පවත්වාගෙන යනවා. අනෙක් තක්කඩියා විල්සන්ව රැකියාවට බැඳෙන්න පොළඹවා ගන්නවා. ඔවුන් දෙදෙනාම එකතුවෙලා, සතිය පුරාම විල්සන් ගෙදරින් පිටත්කර තබන්න සමත් වෙනවා. ඔහු කිව්වා නේද සේවකයා කැමතිවුණා කියල පඩියෙන් භාගයකට රැකියාවේ ඇයදෙන්න? එතකොට මම පැහැදිලිවම තේරුම් ගත්තා මේ පුද්ගලයා රැකියාව ලබාගත්තේ වෙන යම් අරමුණක් ඇතිව බව."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණත් ඔහුගේ අරමුණ මොකක්ද කියල ඔබ තේරුම් ගත්තේ කොහොමද?"

"මේ මිනිහාගේ ව්‍යාපාරය බොහොම සුළු එකක්. ගෙදර භාණ්ඩාවනුත් නෑ. මේ තරම් සියුම් විධියට ඇලසුම් කරලා, මංකොල්ල කන්න තරම් වටිනා බඩුවක් විල්සන්ගේ ගෙදර ඇතියි කියලා හිතන්නත් අමාරුයි. ඒ මොකද ඔවුන් මේ වැඩේට තරමක මුදලකුත් වියදම් කළා. එහෙනම් ඒක ගෙයින් පිටත් පිහිටි දෙයක් විය යුතුයි.

ඒක කුමක් විය හැකිද? ඊළඟට මට සිහිවුණේ සේවකයා ඡායාරූප ශිල්පය සඳහා තිබුණු දැඩි ආශාව. ඒ මගින් ඔහුට නිතර, නිතර ගොඩනැගිල්ලේ අඩිතාලම පිහිටි බිම් මහලට යන්න අවකාශ සැලසුණා. මේ පැටළුණු ගැටලුව කෙළවර වන්නේ එතැනින්. ඊළඟට මං හොයල බැලුවා විල්සන්ගේ මේ අරුම පුදුම උදව්කාරයා ගැන තොරතුරු. එතකොටයි මට දැනගන්න ලැබුණේ. මට සටන් කරන්න වෙලා තියෙන්නේ, මහ භයානකම, මිනීමරු අපරාධකාරයෙක් සමග බව. ඔහු බිම් මහළට වෙලා මොනවා හරි කරනවා. දවසකට පැය ගණනාවක් එතැන ගත කරනවා. ඒ ආකාරයෙන් ඔහු මාස ගණනාවක් ඒ වැඩේ යෙදෙනවා. එතකොට ඒ කුමක් සඳහා විය හැකිද? නිසැකව ඔහු එතැන සිට තවත් ගොඩනැගිල්ලකට උමඟක් හාරනවා විය යුතුයි.

අප එදා සැක්සි කෝබර්ග් චතුරශ්‍රයට යනවිට මම ඒ තරම් දුරට කාරණා උපකල්පනය කර තිබුණා, ඔබ පුදුමයට පත්වුණා නේද, සැරයටියෙන් මම පදික වේදිකාවට ඇණ බැලූ ආකාරයෙන්? මං පරීක්ෂා කරල බැලුවෙ, උමඟ හාරා තිබෙන්නේ ඉදිරියටද පිටුපසට ද කියලා. උමඟ ඉදිරියට තිබුණේ නෑ. ඊළඟට මම සීනුව නාද කළා. මං බලාපොරොත්තු වුණු විධියට සේවකයාම දොර විවෘත කළා. මීට කලින් කිප වාරයක්ම මට ඔහුව එහෙන් මෙහෙන් දකින්න ලැබිල තියෙනවා. නමුත් අපි දෙන්නා මුහුණට මුහුණ හමුවෙලා නෑ. මං ඔහුගේ මුහුණ දිහා බැලුවේ යන්තමින් පමණයි. මට උවමනා වුණේ ඔහුගේ දණහිස් ප්‍රදේශය බලන්න. ඔබම සිටවා කලිසම් කකුලේ එම හරිය, කිළිටි වෙලා, ගෙවිලා, රැළි ගැහිලා තිබුණු හැටි ගැන. ඒකෙන් පෙන්වන්නේ ඔහු පැය ගණනක් දණගහ ගෙන උමඟ හෑරීමේ කටයුතුවල නිරතවුණු වග. ඊළඟට මා විසින් තීරණය කළ යුතු තවත් කරුණක් තිබුණා. ඒ තමයි,

http://sherlockholmesinvestigations.blogspot.com

ඔවුන් උමග හාරන්නේ කුමන අරමුණකින්ද යන්න නිශ්චය කිරීම.

අර හන්දියෙන් හැරී ගියාම මට දකින්න ලැබුණෙ මොකක්ද? සිටි සහ සබ්අර්බන් බැංකුවේ, කෝබර්ග් ශාඛාව තියෙන්නේ, විල්සන්ගේ ගෙදරට අල්ලපු වත්තේ බව. එතකොට මං තේරුම් ගත්තා, ගැටලුවට විසඳීම මං හොයාගෙන අවසන් බව. එදා සංගීත සන්ධ්‍යාව අවසන් වෙලා, ඔබ ගෙදර ගියාට පස්සේ මං කෙළින්ම ගියේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට. එතැනින් බැංකු අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති ළඟට. ඒකෙන් ලැබුණු ප්‍රතිඵල ඔබ දුටුවා."

"ඔබ කොහොමද දැනගත්තේ බැංකුව බිඳීමේ උත්සාහය සෙනසුරාදා රාත්‍රියේම දරන බව?"

"ඔවුන් එදා රතු හිසකෙස් කාර්යාලය වහල දැම්ම නේ. ඒකෙන් මං තේරුම් ගත්තා, ජේබ්ස් විල්සන් තවදුරටත් ගෙදර රැඳී සිටීම ගැන ඔවුනට ප්‍රශ්නයක් නැතිබව. වෙනිං වචනවලින් කියනවා නම්, උමග හැරීමේ කටයුතු දැන් අවසන් බව. දැන් ඔවුන් වහාම ක්‍රියාත්මක වියයුතු වෙනවා. ඒ මොකද, උමගක් හාරා ඇති බව අහම්බෙන් හොයාගන්න පුළුවනි. අනෙක සුරක්ෂිතාගාරයේ ගබඩා කර තිබෙන රන්කාසි තොගය, එතැනින් ඉවත්කරගෙන යන්න පුළුවනි. මේ වගේ බැංකු බිඳින වැඩට, සෙනසුරාදා අනික් හැම දවසකටම වඩා හොඳයි. ඒ මොකද ඔවුනට මංකොල්ල කාපු දේ අරගෙන පැනගන්න දවස් දෙකක්ම තියෙනවා. ඒ කාරණා හැම එකක්ම නිසා මං හිතුවා ඔවුන් එදා රෑම පැමිණේවි කියලා."

"තර්කානුකූලව ඔබ ඒ නිගමනයන්ට පැමිණි හැටි ඉතාම විශිෂ්ටයි. ඒක බොහොම දීර්ඝ සිදුවීම් දම්වැලක්. නමුත් හැම පුරුකක්ම, අනෙක් එක හා සම්බන්ධව බැඳෙනවා." මේ විධියට ගැටලු විසඳාදීම මගින්, ඔබෙන් සමාජයට විශාල මෙහෙවරක් සිදුවෙනවා නේද?"

මම ඇසීමි.

"ඔව්. බාගවෙලාවට ඔබ කියන විධියේ සමාජ මෙහෙවරක් සිදුවෙනවා වෙන්නත් පිළිවන්."

http://sherlockholmesinvestigations.blogspot.com

# බිහිසුණු අත්දැකීමක්

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# බිහිසුණු අත්දැකීමක්

සිත්ගන්නා සුලු කථාවක් ඔබ වෙත ඉදිරිපත් කිරීම සඳහා මම, ෂර්ලොක් හෝම්ස් විසින් 1882 - 1890 කාලයේ කළ පරීක්ෂණ කියවා බැලීමි. එහෙත් මේ කාලයේ කර ඇති පරීක්ෂණ වලින් සිත් ඇදගන්නා එක් කථාවක් පමණක් තෝරා ගැනීම පහසු කටයුත්තක් නොවේ. ඊට හේතුව, ඒ හැම එකක්ම එකකට එකක් නොදෙවෙනි, අභිරහස් හා ත්‍රාසජනක පරීක්ෂණ වීමයි.

1887 වර්ෂයේ අප විසින් කෙරුණු පරීක්ෂණ රැසක සටහන් මා සතුව ඇත. මේ අතර පෑරඩෝල් කුටියේ වික්‍රමය, ලී බඩු කම්හලක බිම් මහලේ සුඛෝපභෝගී සමාජශාලාවක් පවත්වාගෙන ගිය, පිඩු සිඟන යාචකයින්ගේ සංගමයේ කථාන්තරය, සොෆී ඇන්ඩසන් නම් බ්‍රිතාන්‍ය නෞකාව අතුරුදන් වූ සිද්ධිය, උෆා දූපතේදී ග්‍රයිස් පැටර්සන් මුහුණදුන් අරුමපුදුම සිදුවීම, සහ කැම්බර්වෙල්හි විෂ යොදා කළ මිනීමැරීම වෙයි. අන්තිමට සඳහන් කළ පරීක්ෂණයේදී, මළ සිරුරේ අතේ බැඳ තිබූ ඔරලෝසුව වයින් කළ හෝම්ස් එක් වැදගත් කරුණක් නිශ්චය කිරීමට සමත්විය. එනම් ඊට පැය දෙකකට පෙර මෙම ඔරලෝසුව වයින් කර ඇති බවයි. එහෙයින් මියගිය පුද්ගලයා නින්දට ගොස් ඇත්තේ මෙම කාලය තුළ දී බව සනාථ විය. මේ අභිරහස් මිනීමැරුම විසඳීමට හැකිවූයේ හෝම්ස්ගේ ඒ විශිෂ්ට සොයාගැනීම නිසයි. මෙම කථා සියල්ලක්ම අනාගතයේ දිනෙක ඔබ වෙත ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙමි. එහෙත් මා දැන් ඔබට විස්තර කිරීමට සූදානම් වන සිද්ධිය අනික් ඒවාට වඩා අතිශයින්ම විස්මයජනක එකක් යයි මට සිතේ. මෙය හා සම්බන්ධ වූණු කරුණු සමහරක් කිසි දිනෙක හෙළිකරගැනීමට අප සමත්වූයේ නැත. ඒවා කිසි දිනෙක පැහැදිලි කිරීමට හැකිවේද යන්න පවා අවිනිශ්චිතය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ සැප්තැම්බර් මාසයේ අවසන් දින කිහිපයයි. මහ වැහි රැගත් විෂුවය කුණාටු, දැඩි වේගයකින් ලන්ඩන් නගරය හරහා හමා යාමට පටන්ගෙන තිබිණි. දවස පුරාම ඇද හැළුණු මහ වැස්ස නිසා නිවාස තුළම කොටුවී සිටීමට ලන්ඩන් නගර වාසීන්ට සිදුවිය. හැන්දෑ කාලය ළං වෙද්දී කුණාටුව තව තවත් වේගයෙන් හමන්නට පටන් ගත්තේය. එයින් නැඟුණු නාදය කෙමෙන් කෙමෙන් උග්‍ර වූයේ, කුඩා දරුවකු හඬන, ඉකිබිඳින නාදය සිහිගන්වමිනි.

දවස පුරා පැවැති අයහපත් කාලගුණය නිසා මගේ මිත්‍රයා සිටියේ තරමක් නුරුස්සනා ගතියෙනි. මගේ බිරිඳ ඇගේ මෑණියන් දකිමට ගොස් සිටි නිසා, මම දින කිහිපයක් බේකර් වීථියේ නිවහනේ නැවතීමට පැමිණ සිටියෙමි. හැන්දෑ යාමයේ මම ක්ලාක් රසල්ගේ රසවත් මුහුදු කථාන්තර පොතක් කියවීමට පටන්ගත්තෙමි. එදා ඇදහැළුණු ධාරානිපාත වර්ෂාවේ හඬ, කථා පොතේ විස්තරවූ මහ මුහුදේ ප්‍රචණ්ඩ කුණාටුවක විස්තරය සමග හොඳින් මුසු වූ බවක් පෙනිණ.

"අර! සීනුව නාද වුණා නේද?"

මා ඇසුවේ මගේ මිත්‍රයා දෙස බලමිනි.

"කවුද මේ මහ රෑ? බාගවෙලාවට ඔබේ මිත්‍රයෙක්ද දන්නෙ නෑ?" මම කීවෙමි.

"ඔබ හැරෙන්න මට වෙන මිත්‍රයො කවුරුවත් නෑ වොට්සන්. අමුත්තන්ට මෙහේ එන්න කියලා මං ධෛර්යමත් කරන්නෙ නෑ."

"එහෙනම් ඔබේ අනුග්‍රාහකයෙක්ද දන්නෙ නෑ?"

"ඒ අනුග්‍රාහකයෙක් නම්, මොකක් හරි බරපතල ප්‍රශ්නයක් වෙන්න ඇති. මේ වගේ වැහි කුණාටු අවසක, මෙවැනි වෙලාවක මිනිහෙක් එළියට බහින එකක් නෑ, එහෙම දෙයක් නොවෙයි නම්. හමුත් මට හිතෙනවා ඒ ගෙහිමි කාන්තාවගේ මිතුරියක් වෙන්න ඇති කියලා."

ෂර්ලොක් හෝම්ස්ගේ නිගමනය වැරැදි බව ඔප්පු විය. කිසිවෙකු අපේ පියගැට පෙළ නැගගෙන උඩුමහලට එන හඬත් අනතුරුව දොරට තට්ටු කරන හඬත් අසන්නට ලැබිණි. අමුත්තා

http://sherlockholmesinvestigations.blogspot.com

පැමිණ අසුන්ගත යුතු පුටුවට, හොඳින් ආලෝකය ලැබෙන සේ පහන ඒ දෙසට හැරවූ හෝම්ස්, "ඇතුළට එන්න." යයි කීය.

කාමරයට ඇතුළුවූයේ අවුරුදු විසි දෙකක පමණ තරුණයෙකි. බැලූ බැල්මටම ඔහුගේ මුහුණෙන් වැදගත් පෙනුමක් දිස්විය. දිලිසෙන වැහිකබාය හා කුඩය, කුරිරු කාලගුණයේ ස්වභාවය අපට කියාපෑවේය. පහනේ ආලෝකය ඔහුගේ මුහුණට වැටෙද්දී අමුත්තාගේ හැඟීම් මම පැහැදිලිව දුටුවෙමි. අතිශයින්ම සුදුමැලිවී තිබූ ඔහුගේ මුහුණත්, භීතියෙන් බරවූ ඔහුගේ දෑසත් කියා පෑවේ, ඔහු මුහුණදුන් තදබල කම්පනයක ලකුණුයි.

"මං ඔබෙන් සමාව අයැද සිටිනවා මහත්මයා." ඔහු පැවසුවේ රන්වන් උපැස් යුගල දෑසට ළං කරගනිමිනි.

"මහත්මයා, මං විශ්වාස කරනවා, මගේ මේ හදිසි පැමිණීමෙන් ඔබට හිරිහැරයක් වුණේ නැහැ කියල. ඔබේ මේ උණුසුම් කාමරය තුළට, මං වැස්සයි කුණාටුවයි අරගෙන ආව එක ගැන කණගාටුයි."

"කෝ දෙන්න ඔබේ කුඩයයි වැහිකබායයි. මා ඒව මේ කොක්කෙ එල්ලා තබන්නම්. ටික වේලාවක් යද්දි වියළේවි. ඔබ ආවෙ එංගලන්තයේ නිරිතදිග පැත්තෙන් බවයි මට පෙනෙන්නෙ."

"ඔව්. හෝෂාම් සිට."

"ඔබේ සපත්තු වල ඉදිරි කොටසේ ඇති හුණු මිශ්‍ර මැටි ඒ ප්‍රදේශයට විශේෂයි."

"මං ආවෙ ඔබෙන් උපදෙස් ලබාගන්න."

"ඒව බොහොම පහසුවෙන් දිය හැකියි."

"ඒ වගේම උදව්."

"ඒව නම් ඒ හැටිම පහසු නෑ."

"හෝම්ස් මහත්මයා. මට ඔබ ගැන අහන්න ලැබුණෙ මේජර් ප්‍රෙන්ඩර්ගාස්ට්ගෙන්. ඔහු කිව්වා ටැන්කර්විල් සමාජශාලාවේ ඇතිවූ ආන්දෝලනයකදී ඔබ ඔහුව බේරාගත්තා කියල."

"ආ ඔව්. කාඩ් ක්‍රීඩාවෙදි ඔහු වංචා කරනවා කියල ඔහුට නිකරුණේ චෝදනා එල්ල වී තිබුණා."

"ඔහු කිව්වා, ඔබට ඕනෑම ගැටලුවක් විසඳන්න පුළුවන් කියලා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු කියලා තියෙන්නේ හුඟාක් වැඩි කරලා."

"ඒ වගේම ඔබ කිසිදිනක පරාජයට පත්වී නැහැලු."

"මං හතර වාරයක් පරාජයට පත්වී තිබෙනවා. තුන්වරක් පිරිමින් අතින්, එක් වරක් කාන්තාවක් අතින්."

"ඒ වුණත් ඔබ යෙදී තිබෙන පරීක්ෂණ සංඛ්‍යාවේ හැටියට, සාර්ථක වී ඇති පරීක්ෂණ වල හැටියට, ඒ හතර මොකක්ද?"

"ඒකත් ඇත්ත. සාමාන්‍යයෙන් මං ජයග්‍රහණය කරල තියෙනවා."

"එහෙම නම් මගේ ගැටලුවෙදිත් ඔබ සාර්ථක වේවි."

"මහත්මයා. මං ඔබෙන් ඉල්ලා හිටිනවා ඔය පුටුව ගිනි උදුනට ළං කරගෙන ඔබේ ගැටලුව මට විස්තර කරන්න කියලා."

"මේක කොහොමටවත් සාමාන්‍ය විදියේ ගැටලුවක් නොමෙයි."

"මා ළඟට එන ඔක්කොම අසාමාන්‍ය ඒවා. මං තමයි අන්තිම ඇපැල් උසාවිය."

"ඒ වුණත් මහත්මයා, මගේ පවුලට මුහුණ පාන්න සිද්ධවුණු ඕගිසුණු මෙන්ම විස්මයජනක අත්දකීම් වලින් පිරුණු මේ වගේ ප්‍රශ්නයක් ඔබට කවදාවත් ලැබුණා කියල මම හිතන්නේ නෑ."

"ඔබ මගේ හිතේ දැඩි කුතුහලයක් ඇතිකරනවා. කරුණාකරල අත්‍යවශ්‍ය කරුණු සියල්ලම මුල ඉඳලම මට කියන්න. මට වැදගත් යයි හිතෙන කරුණු ගැන ප්‍රශ්න මං පසුව ඉදිරිපත් කරන්නම්."

පුටුව ගිනි උදුන දෙසට ළං කරගත් තරුණයා, ඔහුගේ නෙත් දෙපා ගිනිමැලය දෙසට දිගුකරගත්තේය.

"මගේ නම ජෝන් ඕපන්ෂෝ. මට තේරෙන හැටියට මගේ පෞද්ගලික දේවල් නම් මේ සිදුවීමට අදාල නැහැ. මේක අපේ පවුලේ උරුමයට එන දෙයක්. ඒ නිසා මේ පිළිබඳව ඔබට පැහැදිලිව විස්තර කරන්න, මට ටිකක් කාලයේ ආපස්සට යන්න වෙනවා.

මගේ සීයට පුත්තු දෙන්නෙක් හිටියා. ඒ මගේ මහප්පා එලියස් හා මගේ තාත්තා ජෝසප්. මගේ තාත්තට කොවෙන්ට්‍රි ප්‍රදේශයේ කුඩා කර්මාන්ත ශාලාවක් තිබුණා. බයිසිකල් නිෂ්පාදනය වැඩිදියුණු වෙද්දී, ඔහුගේ කර්මාන්ත ශාලාවේ කටයුතු සාර්ථක කරගැනීමට මගේ තාත්තට හැකිවුණා. ඕපන්ෂෝ නොකැඩෙන

http://sherlockholmesinvestigations.blogspot.com

ටයරය නම් ටයරය වෙල්දපොළට හඳුන්වා දුන්නේ ඔහුයි. ඒකට පේටන්ට් අයිතිවාසිකම් ලැබීම නිසා, තාත්තා විශාල ධනයක් උපයාගත්තා. ඒ නිසාම කර්මාන්ත ශාලාව විකුණා දමල, සෑහෙන මුලදක් අතට ලැබෙන ආකාරයට විශ්‍රාම ගන්න ඔහුට හැකිවුණා.

මගේ මහප්පා එලියස්, තරුණ කාලයේදීමයි ඇමරිකාවට සංක්‍රමණය වෙලා තියෙන්නෙ. එහිදී ඔහු, ෆ්ලොරිඩාවෙ ඉතා සාර්ථක වැවිලිකරුවකු වූ බවයි අපට අහන්න ලැබුණෙ. ඇමරිකාවෙ සිවිල් යුද්ධය පටන්ගත්තු වෙලාවේ, ඔහු යුද්ධ හමුදාවට බැඳිල තියෙනවා. මුලින් ජැක්සන්ගේ සේනාංකයක සටන් කළ ඔහු, පසුව හුඩ් යටතේ සේවය කරලා, කර්නල් තනතුර දක්වා උසස්වුණා. ආයුධ බිම තබලා ලී සෙනෙවියා සටන් අවසන් කරද්දී මගේ මහප්පා ආපහු ඔහුගේ වතුයායට ගියා. තවත් අවුරුදු තුන හතරක් ඔහු වැවිලි කර්මාන්තයේ යෙදී හිටියලු.

1869 හෝ 1870 විතර මහප්පා ආපහු එංගලන්තයට ආවා. ඔහු සසෙක්ස් ප්‍රාන්තයේ හෝෂාම් වලට නුදුරින් වතුයායක් මිලට ගත්තා. මහප්පා ඇමරිකාවේදී විශාල ධනයක් උපයාගෙන තිබුණා. එම රට අත්හැරදමා ආපසු එන්න හේතුව ලෙස ඔහු කිව්වේ, නීග්‍රෝ ජාතිකයන් කෙරෙහි දක්වූ පිළිකුලත්, ඇමරිකානු ජනරජය මඟින් නීග්‍රෝ ජාතිකයන්ට ඡන්ද බලය ලබාදීමත් යන කාරණා දෙකයි. ඔහු හරි අමුතු තාලේ පුද්ගලයෙක්. බොහොම සැරපරුෂයි. ඒ වගේම හරිම තදින් කෝන්ති යන කෙනෙක්. තරහා ගියාම ඔහු බොහොම නපුරු විධියටයි කථා කළේ. අනෙක් වෙලාවට කිසිවෙක් සමග කතාබහ කළේ නෑ. ඔහු සමාජ ආශ්‍රය ප්‍රිය නොකළ කෙනෙක්. හෝෂාම් හි ජීවත්වුණු කාලය තුළදී ඔහු එක දවසක් වත් නගරයට අඩියක් තැබුව කියල මං හිතන්නෙ නෑ. ඔහුගේ ගේ වටේට මල් වත්තක් හා කුඹුරු දෙක තුනක් තිබුණා. ඔහු ව්‍යායාම් කටයුතුවල යෙදුණේ එතැනයි. ඒ වුණත් සමහර කාල වලට, ගෙදරින් එළියට නොබැහැ ඔහු සති ගණන් කාමරය තුළටම වී සිටියා. මහප්පා අධික වශයෙන් මත්පැන් පානය කළා; දුම්පානය කළා. ඒ වුණත් ඒ කිසිම යහළුවෙක් සමග නෙමෙයි. ඔහුට තමන්ගේ සහෝදරයාව වත් උවමනා වුණේ නැහැ.

ඒ වුණාට මහප්පාගේ සිතේ මා ගැන අකමැත්තක් තිබුණේ නෑ. ඇත්තෙන්ම ඔහුගේ සිතේ මා ගැන යම් ආදරයක් තිබුණා. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

කාලේ මම වයස අවුරුදු දොළහක් පමණ වූ ලාබාල ළමයෙක්. මේ කියන අවුරුද්ද 1878 විය යුතුයි. එතකොට ඔහු ආපසු එංගලන්තයට ඇවිත් අවුරුදු අටක් හෝ නවයක් ගතවෙලා. මහප්පා මගේ තාත්තාගෙන් අවසර ඉල්ලා හිටියා, මාව ඔහුගේ ගෙදර නවත්වාගන්න. ඔහු මට බොහොම කරුණාවන්ත බවක් දැක්වුවා. ඔක්පැන් නොබී හිටි වෙලාවලට මහප්පා මා සමග දාම් හෝ බැක්ගැමොන් ක්‍රීඩාවේ යෙදුණා. ඔහු වෙනුවෙන් ඔහුගේ පණිවුඩ ගෙනයාමේ රාජකාරිය භාරකළේ මටයි. සේවකයන්ටත් වෙළෙන්දන්ටත් ඔහුගේ නියෝජිතයා වුණේ මම. ඒ නිසා මගේ වයස අවුරුදු දහසය වෙද්දී ඔහුගේ ගෙදර හැම රාජකාරියක්ම කෙරුණේ මගේ අනුදැනුම යටතේ. ගෙදර ඔක්කොම යතුරු තිබුණේ මගේ භාරයේ. මට ගෙදර ඕනෑම තැනකට යන්න, කැමැති දෙයක් කරන්න අවසර තිබුණා. නමුත් ඒ ඔහුගේ පෞද්ගලික නිහඬ ජීවිතයට බාධාවක් නොවෙන විධියට. නමුත් මේ නිදහස ගෙදර එක් කාමරයක් සම්බන්ධයෙන් නම් මට ලැබුණෙ නැහැ. ඒ තමයි ගෙදර අටුවේ තිබුණු ගබඩා කාමරය. ඒක කොයි වෙලෙත් යතුරු දමා වහලයි තිබුණේ. ඒකට ඇතුළුවෙන්න, ඔහු මට වත් වෙන කාටවත් අවසර දුන්නේ නෑ. ළමයෙකු හැටියට මට ඇතිවූ කුතුහලය නිසා, මං ඒ කාමරයේ යතුරු සිදුරෙන් බැලූ වාර අනන්තයි. ඒත් ඇතුළත තිබූ පරණ ට්‍රන්කපෙට්ටි හා එකට ගොඩගසා තිබූ පොදි රාශියක් හැරෙන්න වෙන කිසිවක් මං දුටුවේ නැහැ.

එක දවසක් මහප්පා නමට ලියුමක් ආවා. ඒ 1883 මාර්තු මාසයේ දවසක. පිටරටක මුද්දරයක් අලවා තිබූ ඒ ලියුම මේසය මත තබා තිබුණා. යාළුවො නොහිටි නිසා සාමාන්‍යයෙන් ඔහුට ලිපි කිසිවක් ලැබුණෙ නැහැ. කළ යුතු ගෙවීම් ආදිය මුදලෙන්ම ගෙවූ නිසා තැපැලෙන් බිල්පත් වත් ලැබුණෙ නැහැ.

"ලියුම ඉන්දියාවෙන්" ඔහු ලියුම අතට ගනිමින් කීවා.

"තැපැල් මුද්‍රාව ඉන්දියාවේ පොන්ඩිචෙරි නගරයෙන්. මේක මොකක් කියල හිතන්නද?" ඇසූ ඔහු ලියුම විවෘත කළා.

ලියුම ඇතුළෙ තිබී එක්වරම එළියට වැටුණේ වියළී ගිය දොඩම් ඇට පහක්. මට එක්වරම හිනාගියා. නමුත් ඔහුගේ මුහුණේ මතුවුණු හැඟීම දුටු මගේ හිනාව එහෙමම නැවතුණා. ඔහුගේ කට බාගෙට ඇරුණා. භීතිය පිළිබිඹු කරමින් දෑස් ඉදිරියට නෙරා

http://sherlockholmesinvestigations.blogspot.com

ආවා. මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලි වුණා. වෙවුලන අතින් ලියුම් කවරය අල්ලාගෙන ඔහු ඒ දිහා බලා හිටියා. ඔහුට කැගැසුණේ අපමණ භයකින් වගේ.

"කේ. කේ. කේ!. . . . . . . . . . දෙවියනේ! අනේ දෙවියනේ! මං කළ පාපකර්ම මගේ පස්සෙන් එළවනවා!"

"ඇයි මොකක්ද මහප්පෙ?" මං ඇහුවා.

"මරණය!"

එහෙම කිව් ඔහු පුටුවෙන් නැගිට්ටා. ඊළඟට ඔහු තමන්ගේ කාමරයට ගියේ එක වචනයක් වත් කථා නොකර. මේ කිසි දෙයක් තේරුම් ගන්න බැරිව මම භීතියෙන් බලාගෙන හිටියා.

ඊළඟට මම ලියුම් කවරය අතට අරගෙන පරීක්ෂා කර බැලුවා. කවරය ඇතුළත රතු පාටෙන් K. K. K. යනුවෙන් ලියා තිබුණා. අර වියළී ගිය දොඩම් ඇට හැරෙන්න වෙන කිසිවක් එහි තිබුණේ නැහැ. මහප්පා මේ විධියට අධික භීතියට පත්වීමට හේතුව කුමක්ද? මම උදේ තේ මේසයෙන් නැගිටලා තරප්පු පෙළ දිගේ උඩතට්ටුවට නගින්න පටන්ගත්තා. ඒ අතර උඩ ඉඳලා පහළට බහින මහප්පා මට තරප්පුවේදි හමුවුණා.

ඔහුගේ එක් අතක තිබුණා මලකාපු යතුරක්. අනෙක් අතේ තිබුණා පිත්තල වලින් තැනූ පෙට්ටියක්. ඒක හරියට අර මුදල් දමන්න පාවිච්චි කරන පෙට්ටි හැඩයේ, ඒ ප්‍රමාණයේ එකක්.

"උන්ට ඕනෙ දෙයක් කරපුවාවෙ. මං ඒවට භය නෑ. මට පුළුවන් උන්ව පරාජය කරන්න."

ඔහු කිව්වේ දිවරමින්.

"ජෝන්. මගේ කාමරේ උදුනේ ගින්දර සුදානම් කරන්න කියලා මේරිට කියන්න. ඒ ගමන්ම පණිවුඩයක් යවන්න, හෝර්ෂාම්හි අර නීතිඥයා - ෆෝඩිහැම්ට එන්න කියලා."

මහප්පා නියම කළ දේ මං ඒ හැටියටම ඉටුකළා. නීතිඥයා ආවට පස්සේ මාව ඒ කාමරයට කැඳවනු ලැබුවා. ගිනි උදුන ඉතා දීප්තිමත්ව දල්වෙමින් තිබුණා. කඩදාසි ගොඩක් ගින්නට දම්මාම වගේ සැහැල්ලු අළු, විශාල තොගයක් උදුනේ තිබුණා. ඒ අසලම තිබුණේ හිස් වූ පිත්තල පෙට්ටිය. ඒ පෙට්ටිය දිහා නිකමට බැලු

http://sherlockholmesinvestigations.blogspot.com



193. ". . . . ඔහුගේ කට බාගෙට ඇරුණා. භීතිය පිළිබිඹු කරමින් දෑස් එළියට නෙරා ආවා. . . ."

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

මම, එය ඇතුළත ලියා තිබූ දෙය දැකලා ඉමහත් විස්මයට පත්වුණා. එහි ලියා තිබුණේ උදේ ලියුම් කවරයේ දුටු පරිදි K. K. K. කියලයි. මහප්පාට මට කීමට බොහෝ දේ තිබුණා.

"ජෝන් මං කැමතියි උඹ මගේ අන්තිම කැමැති පත්‍රයේ සාක්ෂියට අත්සන් කරනවා දකින්න. මං මගේ සියලුම දේපොළ - එහි ඇති වාසි, අවාසි, ඔක්කොම එක්ක උඹේ තාත්තගේ නමට ලිව්වා. කිසි සැකයක් නෑ. ඒක් ඊළඟට උරුම වෙන්නෙ උඹටයි. ඒක සතුටෙන් සාමදානයෙන් භුක්ති විඳින්න පුළුවන් නම් බොහොම හොඳයි. එහෙම භුක්ති විඳින්න ලැබෙන්නේ නැත්නම්, මං අවවාද කරන්නේ දීපන් ඒක උඹේ පරම හතුරට. මේ වගේ දෙපැත්ත කැපෙන ආයුධයක් වැනි වස්තුවක් උඹල නමට ලියන්න සිදුවීම ගැන මට කණගාටුයි. නමුත් ඉස්සරහට මොන මොන දේවල් සිද්ධවේද කියල මට කියන්න අමාරුයි. ඒ හින්දා මේ ෆෝඩ්හැම් මහත්මයා පෙන්වන තැන අත්සන් කරපන්."

ඔවුන් කියූ විධියට මං ඒ නියමිත තැන අත්සන් කළා. නීතිඥයා ඒ ලියවිල්ල අරගෙන ගියා. මේ සිද්ධිය මගේ හිතේ තදින් කාවැදුණා. මේකෙ ඇති සැඟවුණු අර්ථය මොකක්ද කියලා මට තේරුම් ගන්න අපහසු වුණා. පැය ගණන් ඒ ගැන කල්පනා කළත් මොන අතකට පෙරළා බැලුවත්, මහප්පා කිව් දේ වල අගක් මුලක් මට හිතාගන්නවත් බැරිවුණා. ඒ වුණත් ඒ හා බැඳුණු යම්කිසි ඛේදජනක, භයානක බවක් ඇතිබව මට ඉවෙන් මෙන් වැටහුණා.

සති කිහිපයක් ගතවී ගියා. අර හිතට වධ දුන් හැඟීම් ද ක්‍රමයෙන් ඒ සමග අඩුවුණා. අපේ දිනපතා ජීවිතයේ වෙනසක් කළහැකි කිසිම දෙයක් අමුතුවෙන් සිදුවුණේ නැහැ. ඒ වුණත් මහප්පාගේ ගති පැවතුම්වල වෙනසක් මට දකින්න ලැබුණා. ඔහුගේ මත්පැන් බීම තවතවත් වැඩිවුණා. ඒ වගේම කෙනෙක් හමුවීම හෝ කතාබහ කිරීම ඔහු වඩවඩාත් මගහරින්න පටන්ගත්තා. දවසේ වැඩි කාලයක් ඔහු ගතකළේ, තමන්ගේ කාමරයට වෙලා දොර ඇතුළතින් යතුරු දමාගෙන. නමුත් සමහර වෙලාවලදි ඔහු මත්පැන් වලින් වෙරිවෙලා, පිස්තෝලයක් අතැතිව කාමරයෙන් එළියට ආවා. එහෙම ඇවිත් ගෙයින් එළියේ උද්‍යානයේත් යළි ගේ ඇතුළටත් කෝපයෙන් කෑගසමින් දුව ඇවිද්දා. ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

එහෙම වෙලාවට තමන් කිසි මිනිහෙකුට තබා යක්ෂයාටවත් භය නැති බවත්, කූඩු කළ බැටළුවෙක් වගේ නිවටයෙක් නොවන බවත් කියමින් කෑගැසුවා. මේ විදියට හිතට ආවේගයක් ඇවිත් කෝපයෙන් බැණ - අඬගැසුවත්, ඊළඟට ඔහු කලේ කාමරය තුළට වැදී දොරගුළු දමාගැනීමයි. මට ඒ වෙලාවට හිතුණේ මහප්පාගේ හෘද සාක්ෂියෙන්ම එල්ල වන යම්කිසි බිහිසුණු හැඟීමක් ඉවසාගන්න බැරිව ඔහු එසේ කළා කියලයි. කොයිතරම් සීතල දවසක් වුණත් ඒ වගේ වෙලාවල ඔහුගේ මුහුණ පුරා ඩහදිය ගලාගියා.

එක දවසක් රෑ මේ විදියට කෝපයෙන් කෑගසමින් බීමතින් එළියට ගිය මහප්පා ආපහු ආවේ නෑ. අප ඔහු හොයන්න ගියා. වත්ත පහළ තිබුණු වතුර පිරුණු වළක වැටී ඔහු මියගොස් හිටියා. කිසිවෙකු ඔහුට තුවාලයක් සිදුකළ බවට හෝ පහරදීමක් කළ බවට සලකුණු තිබුණේ නෑ. නමුත් ඒ වළේ වතුර තිබුණේ අඩි දෙකක් ගැඹුරට පමණයි. මහප්පාගේ පිස්සු විකාර පිළිවෙළ ගැන දැනසිටීම නිසා, මරණ පරීක්ෂණයේදී තීරණය වුණේ එය සියදිවි හානිකරගැනීමක් ලෙසයි. නමුත් මරණය කියන වචනය ගැන පවා බියෙන් සිටි ඔහු, මෙවැනි දෙයක් කරගත්තා කියල මං විශ්වාස කලේ නැහැ. ඒක එතැනින් ඉවරවුණා. ඔහුගේ වතුයායත්, බැංකුවේ ඔහුගේ ගිනුමේ තිබූ පවුම් 14,000 ක මුදලකුත් මගේ තාත්තාට හිමිවුණා."

"මොහොතක් ඉන්න." හෝම්ස් ඒ කථාවට බාධා කළේය.

"ඔබේ කථාන්තරය මං මෙතෙක් නොඇසූ එකක් බවට සැකයක් නෑ. මට අර දින වක්වානු ආයෙමත් කියන්න. ඔබේ මහප්පාට අර ලියුම ලැබුණු දිනයත්, ඔහුගේ මරණය සිදුවුණු දිනයත් මට කියන්න."

"ලියුම ලැබුණේ 1883 මාර්තු 10 වැනිදා. මරණය සිදුවුණේ ඊට සති හතකට පස්සේ මැයි 2 වැනි දා රාත්‍රියේ."

"ස්තුතියි. දැන් ආයෙමත් කථාව කියන්න."

"හෝෂාම්හි තිබුණු ඉඩම මගේ තාත්තගේ භාරයට පත්වුණා. උඩ අටුවේ හැමදාම යතුරු දමා තිබුණු කාමරය ගැන මං තාත්තට කිව්වා. ඒක පරීක්ෂා කර බැලීමට මං ඔහුට යෝජනා කළා.

http://sherlockholmesinvestigations.blogspot.com

අර මම කලින් කීව් පිත්තල පෙට්ටිය ඒකෙ තිබුණා. නමුත් ඒ තුළ තිබූ ලියකියවිලි සියල්ල විනාශකර දමා ඇති බැව් අපට පෙනුණා. පෙට්ටියේ පියන ඇතුළත කඩදාසියෙන් ලේබලයක් අලවා තිබුණා. එහිත් K. K. K. අකුරු ලියා තිබුණා. ඊට පහළින් නාමලේඛනය, ලියුම්, සිහිකිරීමේ සටහන් හා ලැබීම් යනුවෙන් සඳහන් කර තිබුණා. කර්නල් ඕපන්ෂෝ විසින් විනාශ කළ ලිපිලේඛන මෙවැනි ආකාරයේ ඒවා වියයුතු බව අපට සිතාගත හැකිවුණා. ඒ හැරෙන්න වෙනත් වැදගත් දෙයක් ඒ කාමරයේ තිබුණේ නැහැ. මහප්පා ඇමරිකාවේ ගතකළ ජීවිතය පිළිබඳ තොරතුරු අඩංගු සටහන් පොත් කිහිපයක් සහ ලේඛන වලින් ගැළැවී ගිය කඩදාසි කිහිපයක් ද එහි තිබුණා. සටහන් පොත් සමහරක අඩංගු වුණේ යුද්ධය සමයේ ඔහු ගෙවූ ජීවිතයයි. ඔහු නිර්භීත සොල්දාදුවෙක් ලෙස, තම යුතුකම් කොටස ඉටුකිරීම නිසා, කීර්තියට පත්වී තිබූ අයුරු අපට සිතාගැනීමට හැකිවුණා. අනෙකුත් ලියවිලි ඇමරිකාවේ දකුණු දිග ජනපද නැවත පිහිටුවීමට අදාළ දේශපාලන සටහන්. මේ කාර්යය සම්බන්ධයෙන් උතුරේ සිටි පරිපාලකයන් විසින් එවනු ලැබූ දේශපාලකයන්ට එරෙහිව මහප්පා දැක්වූ දැඩි පිළිවෙත ගැන එහි සඳහන් වී තිබුණා.

මගේ තාත්තා හෝෂාම්හි පදිංචියට ආවේ 1884 මුල හරියෙදියි. 85 ජනවාරි වනතුරු අපට කිසිම කරදරයක් ඇතිවුණේ නෑ. අලුත් අවුරුදු දිනයට දින හතරකට පස්සේ අප දෙදෙනා උදේ තේ මේසයට වාඩිවී තේ බොමින් හිටියා. තාත්තා එක්වරම මහත් පුදුමයෙන් මෙන් කෑගැසූ සැටි මට අහන්න ලැබුණා. මට දකින්න ලැබුණේ ඔහුට ලැබුණු ලියුමක් විවෘත කර ඒ කවරය එක් අතකත්, අනෙක් අතේ දොඩම් ඇට පහකුත් ඇති සැටි. මහප්පාට මෙවැනි ලියුමක් ලැබුණු බව ඒ දවස්වල මං තාත්තාට කිව්වාම, ඔහුට ඒක මහා විහිළුවක් වුණා. නමුත් එවැන්නක් ඔහු නමටත් ලැබුණාම තාත්තා ගැටලුවකට මැදිවී බියට පත්වී ඇති බව මට දකින්න ලැබුණා.

"මොකක්ද ජෝන් මේ පිස්සු විකාරයේ තේරුම?"

ඔහු ඇසුවේ ගොත ගසමින්.

"ඒ K. K. K. එකෙන් ලියුමක්."

මං කිව්වේ ශෝකයෙන් බරවූ හදවතෙන්.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු ලියුම් කවරය පරීක්ෂා කර බැලුවා.

"ඔව් ඇත්ත තමයි. මේ ඒ අකුරු ලියා තිබෙන්නේ. නමුත් මේ ඊට ඉහළින් ලියා තිබෙන්නේ මොකක්ද?"

"ලියවිලි සියල්ල සන්ධ්‍යලය මත තබන්න."

"මොන ලියවිලිද? මොන සන්ධ්‍යලයද?"

තාත්තා ඇසුවා.

"අපේ වත්ත පහළ උද්‍යානයේ තිබෙන සන්ධ්‍යලය විය යුතුයි. වෙන එකක් නැහැනෙ. ලියවිලි කියන එකෙන් ඔවුන් අදහස් කරන්න ඇත්තෙ මහප්පා පුළුස්සා විනාශ කළ ලියවිලි වෙන්න ඇති."

"පූඃ" තාත්තා කිව්වේ සිතට ධෛර්යය උපදවා ගනිමින්.

"අපි ඉන්නේ නීතිය හරිහැටි ක්‍රියාත්මක කරන ශීලාචාර රටක. මේ වගේ පිස්සු විකාර වලට භයවෙලා ජීවත්වෙන්න බෑ. කොහෙන්ද මේ එවලා තියෙන්නෙ?"

"ඩන්ඩි වලින්." මං තැපැල් මුද්‍රාව බලා කිව්වා.

"කාගෙ හරි මහ දරුණු තාලේ මෝඩ විහිළුවක්. ඔය ලියවිලි ගැන මං දන්නේ කොහොමද? සන්ධ්‍යල් උඩ මොනවා තියන්නද? මං ඔය පිස්සු වැඩ ගණනකට ගන්නෙ නෑ."

"මට නම් හිතෙනවා පොලීසියට දැනුම් දුන්නොත් හොඳයි කියලා." මං කිව්වා.

"එහෙම දැනුම් දුන්නොත් පොලීසිය මට හිනාවේවි. කාටවත් කියන්න ඕන නෑ."

"එහෙනම් පොලීසියට කියන වැඩේ මං කරන්නම්. තාත්තා මට ඒකට ඉඩ දෙන්න."

"එපා. කොහොමටවත් එපා. මේවා ගැන පොලීසි යන එක දැඹට තහනම්. මේ විකාරයක් ගැන අහන ප්‍රශ්න වලට උත්තර දීලා මට ලැජ්ජාවට අත්වෙන්න බෑ."

තාත්තා සමග කවදුරටත් වාද කිරීමෙන් පලක් වුණේ නැහැ. ඔහු කොහොමටත් මුරණ්ඩු අදහස් තිබුණු කෙනෙක්. මං දවස ගත කළේ අනතුරක් ළඟ එනවා කියන පෙරනිමිති දකපු කෙනෙක් හැටියට.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ ලියුම ලැබිලා තුන්වෙනි දවසේ තාත්තා ඔහුගේ පැරණි මිතුරෙක් හමුවෙන්න ගියා. ඒ මිත්‍රයා පෝට්ස්ඩවුන් කන්දේ බලකොටුව භාරව හිටි මේජර් ෆ්‍රීබොඩි. තාත්තා එහෙම ගෙදරින් පිටවී යන එක ගැන මං සතුටට පත්වුණා. ඒ මොකද ඔහු ගෙදරින් ඈත්වුණාම, අන්තරායදායක බවෙනුත් ඈත්වෙනවා නේද කියලයි මට හිතුණේ. නමුත් ඒ සිතුවිලි සියල්ල සම්පූර්ණයෙන්ම වැරැදී ගියා. තාත්තා ගිහින් දෙවැනි දවසේ මට මේජර්වරයාගෙන් හදිසි විදුලිපුවතක් ලැබුණා. හැකි වහාම එහි පැමිණෙන මෙන් ඔහු ඉල්ලා තිබුණා. එම ප්‍රදේශයේ බහුලව තිබූ හුණුගල් භාරාගත් වළක වැටී හිස්කබලට තුවාල සිදුවීම නිසා තාත්තා හිටියේ සිහි විසඥවෙලා.

මා ඉක්මනින් තාත්තා ළඟට ගියත්, ඔහු සිහි නොලබාම මියගියා. අපට දැනගන්න ලැබුණේ ඉර බැහැගෙන යන හැන්දෑ වෙලාවෙ තාත්තා ඇවිදින්න ගොස් ඇති බවත්, ඔහුට නුපුරුදු ප්‍රදේශයේදී, ආරක්ෂක වැටක් නොතිබුණු නිසා ඔහු හුණු වළකට ඇද වැටී ඇති බවත්. මේක හදිසි අනතුරක් නිසා සිදුවූ මරණයක් කියා නිගමනය කරන්න හදිසි මරණ පරීක්ෂකවරයා පසුබට වුණේ නැහැ. තාත්තා මරණය කරා ළඟාවූ අන්දම ගැන කාරණා හැම එකක්ම මං හොයා බැලුවා. ඊළඟට ඒවා සියුම්ව පරීක්ෂාකර බැලුවා. ඒ වුණත් කවුරුත් හෝ හිතාමතා මිනීමැරුමක් කර ඇති බව ඔප්පුවෙන, කිසිදු හේතුවක් මට හොයාගැනීමට හැකිවුණේ නැහැ. හිස්කබලේ වූ පිපිරීම හැරෙන්න ඔහුගේ ශරීරයේ වෙනත් කිසිදු තුවාලයක් තිබුණේ නැහැ. සැක කටයුතු අඩි සටහන් කිසිවක් නැහැ. ඔහු සතුව තිබූ මුදල් හෝ වෙනත් වටිනා දෙයක් පැහැරගැනීමේ අරමුණෙන් කළ දෙයකුත් නොවෙයි. පාරේ නාඳුනන අය ගැවසුණු බවට ආරංචියක් ලැබුණේත් නැහැ. නමුත් අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. තාත්තාගේ මේ හදිසි මරණය ගැන මගේ හිතේ ලොකු සැකයක් ඇතිවුණා. මට හොඳටම විශ්වාසයි, යම්කිසි කුමන්ත්‍රණයක් මගින් ඔහු සැලසුම් සහගතව මරාදමුණු බවට.

දේපළ සියල්ල සහ අභාග්‍යය මට උරුම වුණේ ඔන්න ඔය විධියටයි. ඉතින් දේපල සියල්ල විකුණා දමල නිදහස් නොවුණේ ඇයි කියල ඔබ මගෙන් අහවි. පිළිතුරු ලෙස මට කියන්න තියෙන්නේ එක් දෙයයි. මේ අවාසනාවන්ත සිදුවීම් මගේ මහප්පාගේ ජීවිතයට යම් ආකාරයකින් බැඳුණු සිදුවීම්. ඒ නිසා අන්තරායයන් ඔහුගේ

http://sherlockholmesinvestigations.blogspot.com

නිවසට පමණක් නෙමෙයි, අපේ නිවසටත් ශාපයක් වෙලයි තිබුණේ.

මගේ තාත්තා මියගියේ අසූපහේ ජනවාරි මාසෙ. එය අවසන් වෙලා දැන් අවුරුදු දෙකකුත් මාස අටක් ගතවුණා. මේ කාලය තුළ මං හොඳාම්හි සතුටින් ජීවත්වුණා. මේ බියකරු ශාපය අපේ පවුලේ ඒ පරම්පරාව සමගම ඉවත්වෙලා යන්න ඇති කියලා හිතමිනුයි මං හිටියේ. කරදර ඔක්කොම අවසන් කියලා මං හිත සනසාගත්තා කලින් වැඩියි. තාත්තගේ මුහුණ දෙන්න වුණු විධියටම ඊයේ උදේ මගේ හිස මතට ඒ හෙණගෙඩිය පහත්වුණා."

තම ඇතුළු කබායේ සාක්කුවෙන්, පොඩි වූ ලියුම් කවරයක් ඉවතට ගත් තරුණයා එය විවෘත කොට මේසය දෙසට හැරවුයේය. එයින් පහතට වැටුණේ වියළී ගිය දොඩම් ඇට පහකි.

"ලියුම් කවරය මේකයි. තැපැල් මුද්‍රාව නැගෙනහිර ලන්ඩනයේ. ඇතුළත සටහන් කරලා තිබුණේ මගේ තාත්තට එවූ පණිවුඩයමයි.

**K. K. K. - ලියකියවිලි සන්ඩයලය මත තබන්න.**"

"ඉතින් ඔබ මොනවද කළේ?"

"මං මොකුත් කළේ නෑ."

"මොකුත් කළේ නෑ?"

"ඔබට මං ඇත්තම කියන්නම්. . . ." තරුණයා පැවසුවේ සුදුමැලි වූ කෙට්ටු දෑතින් මුහුණ වසාගනිමින්.

"මගේ හිතට දැනුණා හරිම අසරණ භාවයක්. තමන්ව ගිලගන්න සර්පයෙක්, උගේ දහර දිගහරිමින් බඩගාගෙන එනකොට අසරණ වෙලා ඉන්න හාවෙකු වගේ; මාව කැපවෙලා ඉන්නේ මොන විධියකින් වත් ගැලවීමක් නැති භයානක ඉරණමකට. කොයිතරම් කලින් දැනගත්තත්, මගේ ජීවිතය ගළවාගන්න ඉඩක් නෑ."

"ෂඃ ෂඃ" හෝම්ස්ට කෑගැසිණ.

"ඔබ් නොපමාව ක්‍රියාත්මක වෙන්න ඕනෙ මනුස්සයෝ. නැත්නම් ඔබ ඉවරයි. දැඩි ශක්තියකින් ක්‍රියාත්මක වීමෙන් පමණයි මේ ඉරණමෙන් බේරෙන්න පුළුවන් වෙන්නේ. මේක බලාපොරොත්තු අත්හැර දැමීමට වෙලාවක් නෙමෙයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං පොලිසියට ගියා."

"ආහ්?"

"ඔවුන් මගේ කථාන්තරය අහගෙන හිටියෙ සිනාමුසු මුහුණෙන්. මට හොඳටම විශ්වාසයි. ඔවුන් හිතන්නෙ අපේ ගෙදරට ලැබුණු අර ලියුම් කාගේ හරි විහිළු වැඩ කියලයි. ඊළඟට මහප්පාගේත් තාත්තාගේත් මරණ, හදිසි මරණ පරීක්ෂක විසින් තීන්දු කළ විධියේ ඒවා කියල. මරණ වලත් ලියුම් වලත් කිසිම සම්බන්ධයක් නැතිලු."

"මන්ද බුද්ධික මෝඩයෝ" හෝම්ස් කෝපයෙන් කීවේ දෑත් මිට මොලොවා ගනිමිනි.

"ඒ වුණත් ඔවුන් එක් පොලිස් භටයෙකු දුන්නා මා සමග නිවසේ රැඳී සිටීමට."

"දැන් ඔබ මේ රෑ පිටත්ව එද්දී ඔහුව එක්කගෙනද ආවෙ?"

"නැහැ. ඔහුට නියෝග ලැබිලා තියෙන්නෙ අපේ ගෙදරට වෙලා ඉන්නයි."

හෝම්ස්ගේ සිතේ මතුවූ දැඩි කෝපය සළිත් වරක් මිට මෙළවූ දෑත් වලින් පළ විය.

"ඇයි ඔබ මා හොයාගෙන මෙහෙම ආවෙ. . . . එහෙම නෙමෙයි. . . . ඇයි ඔබ වහාම මාව හොයාගෙන ආවෙ නැත්තෙ?"

"මං ඔබ ගැන දන හිටියෙ නෑ මහත්මයා. මගේ කරදර ගැන මං මේජර් ප්‍රෙන්ඩගාස්ට් ට කිව්වේ අදයි. ඔහුයි මට අවවාද කළේ වහාම ඇවිත් ඔබව හමුවෙන්න කියාල."

"ඔබට ලියුම් ලැබිලා දැන් දවස් දෙකක් ගතවෙලා. අපි ක්‍රියාත්මක වෙන්න තිබුණේ මීට කලින්. ඔබ ළඟ වෙන මොකුත්ම කාරණා තොරතුරු නැද්ද? මං අදහස් කරන්නෙ ඔබ අපට කියූ දේවල් වලට වඩා අමතර යමක්? අපට ප්‍රයෝජනවත් වියහැකි මොනවා හරි විස්තරයක්?"

"තවත් එක් දෙයක් තියෙනවා." යයි පැවසූ ඕපන්ෂෝ ඔහුගේ කබා සාක්කුවෙන් දුර්වර්ණ වූ නිල්පැහැති කඩදාසි කැබැල්ලක් ගත්තේය. ඔහු එය මේසය මත තබා දිගහැරියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ මහප්පා අර ලියකියවිලි පුළුස්සා දැමූ දවසේ, උදුනේ ඉතිරි වී තිබුණු කඩදාසි කෙළවර වල් මෙන්න මේ පාටයි. මේ කඩදාසිය මට ලැබුණේ ඔහුගේ කාමරයේ තිබිලා. මං හිතන්නේ මේක ඔහුගේ අනෙක් කඩදාසි සමග තිබිලා සුළඟින් ඉවතට ගසාගෙන ගිය එකක් වෙන්න ඇති. ඒ නිසා පුළුස්සා දැමූ ලියුම් ගොඩට අහුනොවී මෙය ඉතිරි වෙන්න ඇති. දොඩම් ඇට ගැන තිබෙන සඳහන ඇරෙන්න, මේකෙන් අපට යම් අදහසක් ගන්න පුළුවන් කියල මං හිතන්නෙ නෑ. මට හිතෙන්නේ මේක පෞද්ගලික දිනපොතක පිටුවක් කියලයි. මේකෙ තිබෙන අත්අකුරු නම් මගේ මහප්පාගෙ. ඒ ගැන කිසිම සැකයක් නෑ."

හෝම්ස් පහනේ ආලෝකය මේසය මතුපිටට හැරෙව්වේය. අපි දෙදෙනාම ඒ දෙසට නෙත් යොමු කළෙමු. එක් දාරයක් කඩතොලු සහිතව ඉරී තිබුණු නිසා, එය පොතකින් ඉරා ගත් එකක් බව පැහැදිලිය.

**1869 මාර්තු**

4 වැනිදා - **හඩ්සන් ආවා. තැන පැරැණි තැනමයි.**

7 වැනිදා - **දොඩම් ඇට යැව්වා. සාන්ත ඔගස්ටින්හි මැකෝලි, පැරාමෝ හා ජෝන් ස්වේන්ට.**

9 වැනිදා - **මැකෝලි ඉවත් කළා**

10 වැනිදා - **ජෝන් ස්වේන් ඉවත් කළා**

12 වැනිදා - **පැරාමෝ බැලීමට ගියා**

**සියල්ල හොඳින් සිදුවෙමින් ඇත.**

"ඔබට ස්තුතියි" හෝම්ස් කීවේ කඩදාසිය නමා ආපසු තරුණයාට භාරදෙමිනි.

"ඔබ දැන් මොනම හේතුවක් නිසාවත් එක මොහොතක් වත් ප්‍රමාද වෙන එක නරකයි. ඔබ මා සමග කිව් දේවල් සාකච්ඡා කිරීමටවත් අපට වේලාවක් නැහැ. ඔබ වහාම ගෙදර ගොස් ක්‍රියාත්මක විය යුතුයි."

"මොනවද මං කළ යුත්තේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට කරන්න තියෙන්නේ එක් දෙයයි. එය වහාම කළ යුතුමයි. ඔබ මට දුන් පෙන්වූ කඩදාසිය අර පිත්තල පෙට්ටියට දමන්න. ඊළඟට ඔබේ මහප්පා විසින් අනෙක් ලියකියවිලි සියල්ල පිළිස්සූ බව සඳහන් කරලා ලියුමක් ලියන්න. කියන්න ඉතිරි වී තිබුණේ මේ කඩදාසිය පමණක් බව. ඊළඟට ඒ ලියුමත් පෙට්ටියට දමලා සන්ධයලය මත තබන්න. මෙය වහාම කළ යුතු දෙයක්. ඔබට තේරුණාද?"

"හොඳට තේරුණා."

"මේ වෙලාවේ පළිගැනීමක් හෝ එවැනි දෙයක් ගැන හිතන්න එපා. මං හිතන්නේ අප ඒ දෙය කළ යුත්තේ නීතියේ පිහිට ලබාගෙන. නමුත් අපට තියෙනවා දැලක් වියන්න. ඔවුන්ගේ දැල දැනටම වියා අවසන්. මුලින්ම අපේ අවධානය යොමුකරන්න ඕනෙ, ඔබේ ජීවිතය කෙරෙහි එල්ල වී ඇති අවදානම ඉවත් කිරීමටයි. අපේ ඊළඟ පියවර මේ අබිරහස හෙළිකරගැනීමට සහ අපරාධ කරුවන්ට නිසි දඬුවම් ලබාදීම."

"ඔබට බොහොම ස්තුතියි මහත්මයා." තරුණයා පැවසීය.

"ඔබ මගේ කලකිරුණු ජීවිතයට අලුත් ජීවයක් සහ බලාපොරොත්තුවක් ලබාදුන්නා. මම ඔබ දුන් අවවාද ඒ හැටියෙන්ම පිළිපදින්නම්."

"එක මොහොතක් වත් පමාවෙන්න එපා. ඒ අතරම ඔබේ පරෙස්සම ගැනත් සැලකිලිමත් වෙන්න. ඔබ ඉන්නේ ඉතාම භයානක අන්තරායකට මුහුණ පාලා. ඒ ගැන කිසිම සැකයක් නෑ. ඔබ ආපහු යන්නේ කොහොමද?"

"මං වෝටලූ දුම්රිය පොළෙන් දුම්රියක නැගිල යනවා."

"තවම රෑ නවය වුණේ නැහැ. පාරෙ තවමත් සෙනග ඉඳීවි. ඒ නිසා මං විශ්වාස කරනවා, ඔබට යම් පමණකට ආරක්ෂාවක් තිබේවි කියලා. ඒ වුණත් ඔබට ඔබේ පරෙස්සම ගැන මීට වඩා කළයුතු දෙයකුත් නැහැ."

"මා ළඟ ගිනි අවියක් තිබෙනවා."

"ඒක බොහොම හොඳයි. ඔබේ කටයුත්ත පිළිබඳ පරීක්ෂණය මං හෙට උදයේම අරඹනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ හෝෂාම් වලට ආවාම මං එහේදි මුණ ගැහෙන්නම්?"

"නෑ. ඔබේ අභිරහස තියෙන්නේ ලන්ඩන් නුවර. මං ඒක හොයන්නේ මෙහේ ඉඳන්."

"එහෙම නම් මං දවසකින් හෝ දෙකකින් ඔබ හමුවෙන්න එන්නම්. ඔබ දුන් හැම අවවාදයක්ම මං අකුරටම පිළිපදින්නම්."

අප දෙදෙනාටම අතට අත දුන් ජෝන් ඕපන්ෂෝ සමුගෙන පිටත්ව ගියේය. නිවසෙන් පිටත කුණාටුවේ විලාප හඬත්, හොකඩවා ඇද හැලෙන වර්ෂාවේ හඬත් නොඅඩුව ඇසිණි.

ෂර්ලොක් හෝම්ස් මඳ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටියේය. හිස පහළට නමාගත් ඔහුගේ, දෑස් යොමුවී තිබුණේ ගිනි උඳුනේ රතු පැහැති ගිනිඅඟුරු දෙසටයි. මීළඟට පයිප්පය දල්වාගත් හෝම්ස්, හාන්සි පුටුවේ පිටුපසට හේත්තු වී දුම්වළලු නංවමින් කල්පනා කරන්නට පටන් ගත්තේය.

"මට හිතෙනවා වොට්සන්, අපට ලැබුණු පරීක්ෂණ වලින් එකක්වත් මේ තරම් අද්භූත වගේම ත්‍රාසජනක වුණේ නැහැ කියල?"

"ඔව්. බාග වෙලාවට සිව්රහස් සලකුණ හැරුණාම."

"අන්න හරි. මේ ජෝන් ඕපන්ෂෝ කියන ඉලන්දාරියා ගමන් කරන්නේ ෂොල්ටෝලටත් වඩා බොහොම බිහිසුණු අන්තරායදායක පරිසරයක."

"මේ අපරාධ කුමන ආකාරයකින් පටන් අරගෙන සිදුවෙන එවද කියලා, නිශ්චිත නිගමනයකට එන්න ඔබට හැකිවුණාද?"

"මෙහි ස්වභාවය ගැන නම් මගේ හිතේ කිසිම ගැටලුවක් නෑ."

"එහෙනම් මොනවද මේ අපරාධ? කවුද K. K. K. කියන්නේ? ඇයි මේ අවාසනාවන්ත පවුල ලුහුබැඳ එන්නේ?"

තම දෑත් පුටු ඇඳි මත තබාගෙන දෑස් පියාගත් හෝම්ස් මඳ වේලාවක් නිහඬව සිටියේය.

"ඔහුගේ වෘත්තියේ යෙදීමට අවශ්‍ය වන හැම තොරතුරක්ම සිහියේ තබාගැනීමට මිනිහෙකුට බැරිකමක් නෑ. මට ඒ දේ කරන්න හැකිවෙලා තියෙනවා. අපේ මිත්‍රත්වය පටන් ගත් දිනවල මගේ

http://sherlockholmesinvestigations.blogspot.com

දැනුවත් කමේ හා නොදැනුවත් කමේ සීමාවන් පිළිබඳව ඔබ සූක්ෂ්ම විග්‍රහයක් කළ බව මට මතකයි. එහෙම නේද වොට්සන්?"

"ඔව් ඒක බොහොම සුවිශේෂ වාර්තාවක්. දර්ශනය, තාරකා ශාස්ත්‍රය හා දේශපාලනය පිළිබඳ දැනුම බින්දුවයි. උද්භිද විද්‍යාව පිළිබඳ දැනුම විවිධාකාරයි. භූගර්භ විද්‍යාව ගැන කිව්වොත්, ලන්ඩනයෙන් සැතපුම් පනහක් ඇතුළත පසේ ස්වභාවය අනුව මඩ පැල්ලම් විශ්ලේෂණය කිරීමට ඇති දැනුම විශිෂ්ටයි. රසායන විද්‍යාව ගැන දැනුම අක්‍රමවත්. කාය ව්‍යවච්ඡේද විද්‍යාව ගැන දැනුම අවිධිමත්. භයානක අපරාධ හා සියලු ආකාරයේ සුවිශේෂ සිදුවීම් ගැන දැනුම අති විශිෂ්ටයි. උසස්ම ගණයේ වයලීන වාදකයෙක්, බොක්සිං ක්‍රීඩකයෙක්, කඩු සටන් ශිල්පයේ අතිදක්ෂයෙක්. ඒ වගේම කොකේන් සහ දුම්කොළ විෂ තමන්ගේ ශරීරයට ඇතුළුකර ගැනීම සඳහා ඇති දක්ෂතාවය අද්විතියයි!"

මගේ අවසන් වැකියට හෝම්ස්ට සිනාපහළ විය.

"හොඳයි. එදාත් මං ඔබට කිව්ව වගේ මිනිහෙකුගේ මොළය කියන කුඩා කුටියේ ගබඩා කර තබාගන්න පුළුවන්, ඔහුට අත්‍යවශ්‍ය එදිනෙදා පාවිච්චි කෙරෙන දැනුම පමණයි. අනෙක් සෑම දෙයක්ම ඔහු තමන්ගේ ගබඩා කාමරයේ, ඒ කියන්නේ පුස්තකාලයේ ගබඩා කරගත යුතුයි. එතකොට අවශ්‍ය වූ වෙලාවට ප්‍රයෝජනයට ගන්න පුළුවනි. අපට මේ රාත්‍රියේ ලැබිල තියෙන ගැටලුවත් ඒ වගේ එකක්. අපට ඇති සටහන් හැම එකක්ම ප්‍රයෝජනයට ගෙන ගැටලුවට අදාල දැනුම තර කරගත යුතුයි.

වොට්සන්. ඔබ සිටින තැනම රාක්කයේ ඇමරිකානු විශ්වකෝෂය තැන්පත් කරල තියෙනවා. කරුණාකරල එහි K අකුර යටතේ තිබෙන පොත මට දෙන්න. ස්තූතියි. දැන් අපි බලමු ලැබී ඇති කරුණු අනුව ගන්න පුළුවන් නිගමනයන් මොනවද කියල.

මුලින්ම අපි වැඩිපුර හිතා බැලිය යුතු කාරණය තමා, කර්නල් ඕපන්ෂෝ ඇමරිකාවෙන් පිටවෙලා ආපහු එංගලන්තයට ආවෙ ඇයි කියන එක. මට නම් හිතෙන්නේ ඒකට මොනවා හරි බරපතල කාරණයක් හේතු වෙන්න ඇති කියලයි. මේ වයසට ආව මිනිස්සු දීර්ඝ කාලයක් තිස්සේ තමන් පවත්වාගෙන ආ ජීවන

http://sherlockholmesinvestigations.blogspot.com

රටාව, එක්වරම, නිකරුණේ වෙනස් කරන්නෙ නෑ. බොහොම සනීපදායක ෆ්ලොරිඩා ප්‍රාන්තය අත්හැර දමල, එංගලන්තයේ පාළු ගමක ජීවත්වෙන්න ආවෙ ඇයි? එංගලන්තයට ආවට පස්සෙ, ඔහු කිසිම කෙනෙකු සමග ආශ්‍රයට නොයා, තනිවමයි ජීවිතය ගත කළේ. ඒකෙන්ම පෙනෙනවා ඔහු යම්කිසි දෙයක් හෝ පුද්ගලයෙකු ගැන භයෙන් ජීවත්වුණු බව. ඒ අනුව අපේ භාවිතය සඳහා අපි මෙහෙම උපකල්පනය කරමු. කර්නල් ඕපන්ෂෝ ඇමරිකාවෙන් පිටමං කළේ යම්කිසි දෙයකට හෝ පුද්ගලයෙකුට තිබුණු භය. ඔහු භය වුණේ කුමකටද? ඒක අපට තීරණය කරන්න හැකි වෙන්නේ ඔහුටත්, අනෙක් අයටත් ලැබුණු අර බිහිසුණු ලියුම් ගැන සලකා බැලීමෙන්. ඒවල තැපැල් මුද්‍රාවේ වැදී තිබුණු තැන් ගැන ඔබට මතකද වොට්සන්?"

"පළමුවැනි ලියුම ඉන්දියාවේ පොන්ඩිචෙරියෙන්. දෙවැන්න ස්කොට්ලන්තයේ ඩන්ඩි වලින්. තුන්වැන්න ලන්ඩනයෙන්."

"ඔව්. නැගෙනහිර ලන්ඩනයෙන්. මේකෙන් ඔබට ගතහැකි නිගමනය කුමක්ද?"

"මේ හැම එකක්ම වරායන්. මේ ලියුම් ලියූ පුද්ගලයා නැවක යාත්‍රා කළ කෙනෙක්."

"විශිෂ්ටයි වොට්සන්. ඔන්න අපට ඉක්මනින්ම හෝඩුවාවක් ලැබුණා. ඒ ගැන කිසිම සැකයක් නෑ. ඔහු නැවක යාත්‍රා කළ කෙනෙක්. ඊළඟට අපි තවත් කරුණක් ගැන සලකා බලමු. පොන්ඩිචෙරියෙන් ලියුම ආවට පස්සේ, මරණය සිදුවුණේ සති හතක් ගතවෙලා. ඩන්ඩියෙන් ලියුම් ආවට පස්සේ, මරණය වුණේ දින තුනකින් හෝ හතරකින්. ඒකෙන් ඔබට තේරුම් ගන්න පුළුවන් මොකක්ද?"

"ඔහුට ගමන් කිරීමට සිදුවුණු දුර ප්‍රමාණය?"

"එහෙම නම් ලියුමටත් එම දුරම ඒමට තිබුණා නොවැ?"

"මට හිතාගන්න අමාරුයි."

"මේකට අදාල මිනිහා හෝ මිනිසුන් ගමන් කරන යාත්‍රාව රුවල් නැවක් විය යුතුයි. මට පෙනෙන හැටියට, ඔවුන් යම්කිසි ප්‍රහාරයක් එල්ල කරන්න කලින්, අනතුරු ඇඟවීමේ සංඥාවක් එවනවා. ඔබට පෙනෙනවා නේද ඩන්ඩි නගරයෙන් එවූ ලියුමට

http://sherlockholmesinvestigations.blogspot.com

පස්සේ ප්‍රහාරය එල්ල වුණේ කොයි තරම් ඉක්මනින්ද කියලා? ඔවුන් පොන්ඩිචෙරියේ සිට ආවේ දුම්නැවකින් නම්, ලියුම මෙහේට ලැබෙද්දිම ඔවුනටත් එන්න තිබුණා. ඒ මොකද තැපැල්මලු ගෙනයන දුම්නැවේ වේගයටම ඔවුනටත් ගමන් කළ හැකි නිසා. නමුත් ඔවුනට ඒකට සති හතක් ගතවුණා. මං හිතන්නේ ඒ සති හතෙන් පෙන්නුම් කරන්නේ, තැපැල් මලු ගෙනයන දුම්නැවේ සහ ඔවුන්ගේ රුවල්නැවේ, වේගයේ වෙනස."

"ඔව්, වෙන්න පුළුවන්."

"විය යුතුයි. දැන් ඔබට පෙනෙනවාද ඕපන්ෂෝ තරුණයාට පරෙස්සම් වෙන්න කියලා මං කියූ එකට හේතුව? ලියුම එවූ පුද්ගලයන්ගේ ගමනට ගතවූ කාලය අවසන් වුණු ගමන් මාරාන්තික ප්‍රහාරය එල්ල වුණා. නමුත් අන්තිම ලියුම ආවෙ ලන්ඩනයෙන්. ඒ හින්දා ප්‍රහාරය ප්‍රමාද වේවි කියලා අපට හිතන්න බෑ."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! මොකක්ද මේ අනුකම්පා විරහිත ලුහුබැඳීමේ තේරුම?"

"ඕපන්ෂෝ සහවාගෙන තිබූ ලියකියවිලි, රුවල් නැවේ යාත්‍රා කරන පුද්ගලයාට හෝ පුද්ගලයන්ට අත්‍යවශ්‍ය ඒවා. මං හිතන්නේ මෙතැන එක්කෙනෙකුට වැඩි ගණනක් ඉන්න බවට සැකයක් නෑ. හදිසි මරණ පරීක්ෂකයන් නොමඟ යවන විධියේ මිනීමැරුම් දෙකක්ම කරන්න, තනි පුද්ගලයෙකුට හැකියාවක් නෑ. මෙතැන ඔය වැඩකටයුතු වලට සෑහෙන ගණනක් සම්බන්ධයි. උන් බොහොම අධිෂ්ඨානයෙන් වැඩ කරන, මුදල්, මිනිස්සු හෝ අනෙක් සම්පත් වලින් අඩුවක් නැති පිරිසක්. ඔවුන් කවුරු වුණත්, මේ ඉල්ලා සිටින ලියකියවිලි, උන් කාටත් අත්‍යවශ්‍ය වැදගත් ඒවා. එතකොට ඔබට පෙනෙනවා ඇති K K K කියන්නේ එක් පුද්ගලයෙකුගේ නමක මුල අකුරු නොවන බව. ඒක එක්තරා කල්ලියක් හඳුන්වන කෙටි නමක්."

"මොකක්ද මේ කල්ලිය?"

"ඔබ කූ ක්ලක්ස් ක්ලෑන් කල්ලිය ගැන කවදාවත් අහල නැද්ද?"

"කවදාවත් අහල නෑ."

හෝම්ස් ඔහු අතටගත් ඇමරිකානු විශ්වකෝෂයේ K අකුරින් වූ වෙළුම පෙරළුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

# කූ ක්ලක්ස් ක්ලෑන් (K. K. K)

මෙම නම සාදාගෙන ඇත්තේ රයිෆලයක් වෙඩි තැබීම සඳහා සූදානම් කරගනිද්දී එයින් නැගෙන හඬ අනුවයි. මෙය ඇමරිකාවේ පැවැත්වුණු සිවිල් යුද්ධයෙන් පසුව සෑදුණු මිනීමරු සංවිධානයකි. දකුණු දිග ජනපද වල, ජනරජයක් වෙනුවෙන් හමුදාවට බැඳී සටන් කළ, පසුව ඉන් ඉල්ලා අස්වූ යුද සෙබළුන් විසින් ඇතිකරගත් බිහිසුණු කල්ලියකි. පසුව මෙහි ශාඛා ටෙනෙසි, ලුසියානා, උතුරු හා දකුණු කැරොලයිනා, ජෝජියා හා ෆ්ලොරිඩා යන ජනපදවලට ද පැතිර ගියේය.

එහි බලය යොදාගන්නා ලද්දේ දේශපාලන අරමුණු මුදුන්පත්කර ගැනීම සඳහාය. ඔවුන්ගේ එක් ප්‍රධාන කටයුත්තක් වූයේ කළු (නීග්‍රෝ) ඡන්ද දායකයින් බියවද්දා, ඡන්දය දීමට ඉදිරිපත් වෙද්දී පළවා හැරීමත්, හැකි අවස්ථාවල මරාදැමීමත්ය. ඔවුන්ගේ දේශපාලන අදහස් වලට විරුද්ධ වූ සුදු ජාතිකයනට ද මේ ඉරණම ම අත්විය. මොවුන් විසින් යම් බිහිසුණු ක්‍රියාවක් සිදුකිරීමට පෙර, එම අදාළ පුද්ගලයාට අනතුරු ඇඟවීමක් දන්වා යැවීම සිරිතක් විය. එම අවස්ථා වලදී ඕක් කොළ කිහිපයක්, කොමඩු හෝ දොඩම් ඇට කිහිපයක් යැවීම සිදුකරන ලදී. අන්තරාය පිළිබඳ මෙම හැඟවීම ලැබුණු වහාම, අදාළ තැනැත්තා එක්කෝ ඔහුගේ දේශපාලන අදහස් වෙනස් කළ බව විවෘතව ප්‍රකාශයට පත්කළ යුතුය. නැතිනම් එම ප්‍රදේශයෙන් පැන යායුතුය. එම දෙකම නොකොට, නිර්භයව තර්ජනයට මුහුණදීමට උත්සාහ කළහොත් මරණය ඔහු වෙත අනිවාර්යයෙන්ම ළඟාවෙනු ඇත. බොහෝවිට මෙම මරණය සිදුවන්නේ කිසිවිටෙකත් බලාපොරොත්තු නොවූ අද්භූත ආකාරයකිනි. මෙම මිනීමරු කල්ලිය කොතරම් ක්‍රමානුකූල ලෙස සංවිධානය කර තිබුණේ ද, ඔවුන්ගේ අපරාධ කොතරම් සියුම් ලෙස සිදු කළේ ද යත්, ඔවුන්ගේ ඉලක්ක බවට පත්වූ පුද්ගලයෙකු කිසි විටෙකත් දිවි ගලවාගත් බවට වාර්තාවී නොමැත. එමෙන්ම අදාළ පුද්ගලයාගේ මරණය සිදුකළේ කවුරුන් විසින්ද යන්න සොයාගැනීමට හැකියාවක් නොතිබිණ. එක්සත් ජනපද රජයෙන් හා මහජන සංවිධාන වලින් මෙම මිනීමරු කල්ලිය විනාශ කිරීමට කොපමණ උත්සාහ දැරුවත්, ඔවුන්ගේ මැර ප්‍රහාර අසීමිත ලෙස වර්ධනය විය. කෙසේ වෙතත් 1869 දී K K K කල්ලිය එක්වරම බිඳ වැටිණි. ඉන්පසු ඉඳහිට, තැන් තැන් වල පමණක් සිද්ධීන් කිහිපයක් වාර්තා විය."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට පෙනෙනවා නේද වොට්සන්. . . ." හෝම්ස් කීවේ පොත මේසය උඩින් තබමිනි.

"**K K K** කල්ලිය හදිසියේම බිඳ වැටුණෙත්, කර්නල් ඕපන්ෂෝ වැදගත් ලියකියවිලිත් සමග ඇමරිකාවෙන් අතුරුදන් වුණෙත් එකම කාලයක. බොහොම වෙලාවට කල්ලියේ බිඳ වැටීමට හේතුවුණේ ඔහුගේ ඒ අතුරුදන්වීම වෙන්න පුළුවන්. ඕපන්ෂෝලගෙ පරම්පරාව සමගම බද්ධ වෛරයෙන් පිරිසක් සිටීමේ පුදුමයක් නෑ. දන් ඔබට තේරුම් ගන්න පුළුවන් නේද ඔවුන් මොනවද මේ හොයන්නෙ, ඇයි ඒව හොයන්නේ කියලා. ඕපන්ෂෝ තරුණයා දුටු අර පිත්තල පෙට්ටියේ ඇතුළු පැත්තේ ලේබලයේ සඳහන්ව තිබුණේ මොකක්ද? නාමලේඛනය, සිහිකිරීම් සටහන්, දින පොත්, ලැබීම් ආදිය. එතකොට **K K K** ව්‍යාපාරයේ මුල් අවධියේ සිටම ඒකට සම්බන්ධ අයගේ නාම ලේඛනය හා විස්තරත්, ඔවුන් කළ වැඩකටයුතු ගැන තොරතුරුත් කර්නල් ළඟ තියෙන්න ඇති. අර ගැළවී ගොස් තිබී අපට දකින්න ලැබුණු පිටුවෙත් ඔවුන්ගේ කටයුතු ගැන පැහැදිලිව සටහන් වී තිබුණා. එක්සත් ජනපදයේ දකුණුදිග ප්‍රාන්තවල, සමහරක් අයගේ K K K වැඩකටයුතු ගැන තොරතුරු ඒ ලියවිලි වල ඇති. ඒ නිසා ඒවා හොයාගන්නා තුරු නින්ද නොයන අයත් ඇති සැකයක් නැතුවම."

"අර අප දුටුව පිටුවේත් තිබුණා. . . ."

"ඒක අපට බලාපොරොත්තු විය හැකි ආකාරයේම එකක්. මගේ මතකය නිවැරදි නම් එහි තිබුණේ මෙහෙමයි. A ට B ට හා C ට දොඩම් ඇට යැව්වා. ඒ කියන්නේ ඔවුනට අනතුරු ඇඟවීම් යැව්වා. ඊට පස්සේ කිහිපතැනකම තිබුණා, A හා B ඉවත් කළා. ඊටත් පස්සේ C හමුවෙන්න ගියා. ඒකෙන් අදහස් කරන්නේ මං හිතන හැටියට ඔවුනට ඛේදජනක ඉරණම් අත්වුණු බව. එහෙනම් වොට්සන් මට කියන්න තියෙන්නේ මේ අන්ධකාර ගැටලුවට ආලෝකය ටිකක් ලබාදෙන්න අපට හැකිවේවි කියලයි. මේ අතරේ ඕපන්ෂෝ තරුණයාගෙ ගැළවීමට කළ හැකි එකම දේ නම්, මා ඔහුට දුන් උපදෙස් අනුව ක්‍රියාකිරීමයි. අද රෑට මේ ගැන, අපට මීට වඩා කළ හැකි දෙයක් නෑ. වෙන කථාකරන්න දෙයකුත් නෑ. මගේ ඔය වයලීනය දෙන්න. අයහපත් කාලගුණයයි. ඊටත් වඩා

Peadme Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

අයහපත් බවට පත්වුණු අපේ මිනිස්සුන්ගේ ස්වභාවයයි, පැය භාගයකට අමතක කරන්න පුළුවන්ද බලමු."

* * *

පසුදා උදේ වන විට වැස්ස තුරල් වී ගියේය. ලන්ඩන් නගරය වසා පැවැති අඳුරු මීදුම තුළින් යන්තමින් හිරු එළිය වැටෙන්නට පටන්ගෙන තිබිණි. මා එහි යද්දී ෂර්ලොක් හෝම්ස් උදේ ආහාරය ගනිමින් සිටියේය.

"ඔබ එන තෙක් නොහිටියාට මට සමාවෙන්න වොට්සන්. මේ ඕපන්ෂෝ තරුණයාගෙ ගැටලුව ගැන මං අද දවසම ගත කරන්නයි බලාපොරොත්තු වෙන්නෙ. අද බොහොම වැඩ අධික කලබලකාරී දවසක් වේවි."

"ඔබ මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ඒ ඔක්කොම තීරණය වෙන්නෙ, මං මුලින්ම කරන විමසීම් වලට ලැබෙන පිළිතුරු අනුවයි. අන්තිමට මට හෝෂාම් වලටත් යන්න වෙයි වගේ."

"ඔබ වැඩකටයුතු හෝෂාම් වලින් අරඹන්න අදහස් කරන්නෙ නැද්ද?"

"නෑ. මං වැඩ පටන්ගන්නෙ ලන්ඩනයෙන්. සීනුව නාදකරන්න වොට්සන්. සේවිකාව කෝපි අරගෙන ඒවි."

එතෙක් මම මේසය උඩ තිබූ, තවමත් විවෘත නොකළ පුවත්පතේ මුල්පිටුව දෙස නෙත් යොමු කළෙමි. එහි තිබූ පුවෘත්තියක සිරස්තලය දුටු මගේ හදවත හිරිවැටී ගියේය.

"හෝම්ස්! වැඩක් නෑ. ඔබ ප්‍රමාද වැඩියි!"

"ආ?" ඔහු ඇසුවේ අතට ගත් කෝපි කෝප්පය ආපසු තබමිනි.

"මගේ හිතේ ඔය භය තිබුණා. කොහොමද ඒක සිද්ධවෙලා තියෙන්නෙ?" හෝම්ස් ඇසුවේ තිවුණු ස්වරයෙනි. එහෙත් ඔහු දැඩි කලකිරීමකට පත්වූ බව මට පැහැදිලි විය. පුවෘත්තියේ වූ ඕපන්ෂෝ නම නිසයි මගේ අවධානය ඊට යොමු වූයේ.

http://sherlockholmesinvestigations.blogspot.com



210. "හෝම්ස්, ඔබ ප්‍රමාද වැඩියි!"

Reading Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# වෝටලූ පාළම අසල ඛේදජනක සිදුවීමක්

ඊයේ රාත්‍රි නවයත් දහයත් අතර වෝටලූ පාළම අසල රාජකාරියේ යෙදී සිටි එච් අංශයේ පොලිස් නිලධර කුක් මහතාට, කිසිවෙකු උදව් ඉල්ලා කෑගසන හඬක් හා වතුරට ඇද වැටෙන හඬක් ඇසී තිබේ. රාත්‍රිය කුණාටු සහිත අන්ධකාර එකක් වූ බැවින්, මඟ යන්නන් කිහිප දෙනෙකු සිටියත් දිවි ගළවා ගැනීමකට ඉඩ ලැබී නැත. අනතුර ගැන වහාම දැනුම් දෙන ලදි. පොලිස් බෝට්ටු අංශයේ උදව්වෙන් මළසිරුර සොයාගැනීමට හැකිවී ඇත. ඔහුගේ සාක්කුවේ තිබූ ලියුම් කවරයකින් හඳුනාගත් පරිදි, මේ තරුණ මහතා හෝෂාම්හි ජෝන් ඕපන්ෂෝ නම් තැනැත්තේකි.

වෝටලූ දුම්රියපොළෙන් පිටත්වෙන අවසන් දුම්රිය අල්ලා ගැනීම සඳහා ඔහු වේගයෙන් ගමන් කරන්නට ඇතැයි ද, පය පැටලී යාම නිසා ගඟට ඇද වැටෙන්නට ඇතැයි ද විශ්වාස කෙරේ. ඔහුගේ සිරුරේ තුවාල කිසිවක් නොතිබුණු අතර, මෙම තරුණයා අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වී ඇති බැව් පැහැදිලිය. ගඟ දෙපස ඇති ආරක්ෂක වැට නිසි ආකාරයෙන් නොමැති වීමෙන් මේ ඛේදජනක මරණය සිදුවී ඇති බවට සැකයක් නැත. මෙයට වගකිවයුත්තන්ගේ අවධානය යොමු කිරීම වටී."

අපි මිනිත්තු කිහිපයක් නිහඬව සිටියෙමු. ජීවිතයේ කිසිදාක මා නොදුටු අයුරින් ෂර්ලොක් හෝම්ස් කම්පාවටත්, කලකිරීමටත් පත්ව සිටියේය.

"මේක මගේ ආත්මාභිමානයට ඇතිවූ විශාල කැළලක් වොට්සන්."

හෝම්ස් පැවසුවේ මඳ වේලාවකට පසුවයි.

"මේක සුළු සිද්ධියක් බව ඇත්තයි. නමුත් මගේ කීර්ති නාමයට මහ මදිකමක්. දැන් ඉතින් මේක මගේ පෞද්ගලික කටයුත්තක් බවට පත්වෙනවා. දේව පිහිටෙන් මං නොමැරී හිටියොත්, මං මේ කල්ලිය කොහොම හරි අල්ලා ගන්නවා. මං ළඟට උදව් ඉල්ලාගෙන ආව මනුස්සයා. . . . දෙවියනේ! මං ඒ මනුස්සයව යැව්වෙ මරණය කරා නේද"

http://sherlockholmesinvestigations.blogspot.com

පුටුවෙන් නැගී සිටි මගේ මිත්‍රයා දැඩි ශෝකයකින් කාමරයේ ඉහළ පහළ ඇවිදීමට පටන් ගත්තේය.

"මුං මහා කපටි යක්ෂයෝ රැළක්. මුං කොහොමද මේ අහිංසක මිනිහව වැරැදි පාරකට රවටාගෙන ගියේ? පාළමේ හුහක් සෙනග ගමන් කරන්න ඇති. මේ තරම් වැහි දවසක් වුණු නැටි, උන්ට ඕනෙ පිළිවෙළට. හොඳයි බලන්න වොට්සන්, කවුද මෙකෙන් අන්තිමට දිනන්නේ කියල. මට යන්න වෙලාව හරි."

"පොලීසියටද?"

"නෑ. මගේ පොලිසියත් මම මයි. මං දැල වියන්නම්. ඒක වියල ඉවර වුණාම පුළුවනි මට ඕනෙ කරන මැස්සන්ව අල්ලගන්න; ඊට කලින් නෙමෙයි."

එදා දවසම මගේ වෛද්‍ය වෘත්තියේ කටයුතු නිසා මට අවිවේකී දිනයක් විය. මා නැවත වරක් බේකර් වීථියට යනවිට රෑ බෝවී තිබිණි. හෝම්ස් ඒ වනවිටත් ආපසු පැමිණ සිටියේ නැත. ඔහු ආපසු එද්දී රාත්‍රී දහයට ළංවී තිබිණ. මගේ මිත්‍රයා දැඩි වෙහෙසකට පත්ව සුදුමැලි වී සිටි අයුරු මට දකින්නට ලැබිණි. සයිඩ්බෝඩය වෙත ගිය ඔහු පාන් ගෙඩිය එළියට ගෙන, එයින් කෑල්ලක් කඩා ගිල දැම්මේ, වතුර උගුරු කිහිපයක් බොමිනි.

"ඔබට හොඳටම බඩගිනි වගෙයි?"

මම ඇසීමි.

"උදේ කෑමට පස්සේ කිසිදෙයක් කෑවෙ නෑ. කෑම ගැනීමත් මට අමතක වුණා."

"කොහොමද වැඩ කටයුතු සාර්ථක වුණාද?"

"ඔව්. සෑහෙන තරම්."

"හෝඩුවාවක් ලැබුණද?"

"උන් දැන් මගේ අතේ ඉන්න ගණනයි." ඕපන්ෂෝ තරුණයාට කළ අපරාධයට මං පළිය ගන්නවා. ඇයි වොට්සන් උන් අනික් මිනිස්සුන්ට දඬුවම් කරනවානෙ. උන්ගෙ ඒ දඬුවම ම අපි උන්ට දෙමු."

"මොකක්ද ඔබ එයින් අදහස් කරන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

ආහාර දමා තිබූ රාක්කයෙන් හෝම්ස් දොඩම් ගෙඩියක් අතට ගත්තේය. ඔහු එය කැබලිවලට කඩා ඉන් දොඩම් ඇට සිහිපයක් ඉවතට ගත්තේය. මීළඟට ලියුම් කවරයක් ගෙන එහි අලවන කොටස ඇතුළේ

S. H. ගෙන් J. C. ට යයි ලියා දොඩම් ඇට පහක් ඇතුළට දමා ඇලෙව්වේය. ඉන්පසු පිටත

**කපිතන් ජේම්ස් කැල්හුන්,**

**ලෝන් ස්ටාර් නෞකාව,**

**සැවැන්නා**

**ජෝජියා**

යනුවෙන් ලියුවේය.

"නැව වරායට ඇතුළුවෙනකොට මේ ලියුම එහි ගිහින් තියේවි."

හෝම්ස් කීවේ සතුටෙනි.

"ඌට මේක දක්කාම රෑට නින්ද යන එකක් නෑ. ඕපන්ෂෝට මරණයට ඉස්සර වෙලා දැනුණු වේදනාව ඔහුටත් දැනේවි."

"කවුද මේ කපිතාන් කැල්හුන් කියන්නෙ?"

"ඒ තමයි කල්ලියේ නායකයා. මං අනික් උන් වත් අල්ලා ගන්නවා. නමුත් ඉස්සර වෙලා නායකයාව"

"ඔබ කොහොමද මොවුන් ගැන තොරතුරු හොයාගත්තේ?'

"හෝම්ස් සාක්කුවෙන් විශාල කඩදාසියක් එළියට ඇද්දේය. එය පිරෙන සේ දින වකවානු හා නම් රාශියක් සටහන් කොට තිබිණ.

"මං මුළු දවසක්ම ඒකට ගතකළා. ලොයිඩ්ස් නාවික කටයුතු කාර්යාලයේ, නැව් වල යෑම් ඊම් ගැන පුරාණ පොත් ලිපි ලේඛන අවුස්සා බලමින් කරුණු රැස්කළා.

83 අවුරුද්දේ ජනවාරියේ හෝ පෙබරවාරියේ පොන්ඩිචෙරි වරායට ළඟාවූ නැව් මොනවාද කියලයි මුලින්ම බැලුවෙ. නැව් තිස්හයක් තිබුණා. මෙයින් මගේ අවධානය එක්වරම යොමුවුණේ "ලෝන් ස්ටාර්" නැවට. ඒක ලන්ඩනයේ නිෂ්පාදිත නැවක් ලෙස සඳහන් වුණාට ඒකට මුලින් දීලා තිබිල තියෙන්නේ ඇමරිකාවෙ ජනපදයක නමක්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ටෙක්සාස් වෙන්න ඇති?"

"මට ඒක හරියටම විශ්වාස නෑ. කොහොම වුණත් මට හිතුණේ මේක ඇමරිකාවෙ එකක් කියලයි."

"ඊට පස්සෙ?"

"ඊළඟට මං බැලුවා ඩන්ඩි වරායට නැව් පැමිණීම ගැන විස්තර. 85 අවුරුද්දේ ජනවාරියෙදි "ලෝන් ස්ටාර්" නැව ඩන්ඩියට ඇවිත් තියෙනවා. මගේ සැකය නිවැරදි බව එයින් තහවුරු වුණා. ඊළඟට මං හොයා බැලුවා ලන්ඩන් වරායේ දැන් නැංගුරම්ලා තිබෙන නැව් පිළිබඳව.

"ලෝන්ස්ටාර්" ලන්ඩනයට සේන්දු වෙලා තියෙන්නෙ ගිය සතියෙ. ඒ ගමන ඔම ගියා වරායේ ඇල්බට් තටාකාංගනයට. අද උදේ පාන්දරම බාදියත් එක්ක නැව පිටත්වෙලා ගිහිං, සැවැන්නා බලා ආපහු ගමනේ. මං ග්‍රේව්ස්එන්ඩ් තොටුපොළට විදුලි පුවතක් යැව්වා. නැව පැය කිහිපයකට කලින් එතැන පහුකර ගියාලු. සුළං හමන්නේ නැගෙනහිර දිශාවට නිසා, ඔවුන් දැන් ගුඩ්වින් පහුකරලා, වයිට් දූපතට කිට්ටු කරල ඇති."

"ඔබ මොකක්ද උන්ට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"කොහොම හරි උන්ව අල්ලා ගන්නවා. මුළු නැවටම ඉන්නෙ ඇමරිකන් ජාතිකයො තුන්දෙනයි. ඒ අර කැල්හුන් සහ තවත් නාවික නිලධරයන් දෙදෙනෙක්. අනික් අය ඔක්කොම ජර්මන් සහ පින්ලන්ත ජාතිකයො. අර තුන්දෙනා ඊයෙ රාත්‍රි නැවේ ඉඳල නැති බවත් මං හොයාගත්තා. ඒක මං දැනගත්තේ නැවට බඩු පටවපු සේවකයින්ගෙන්. එයාලගෙ රුවල් නැව සැවැන්නා වලට යන්න කලින්, තැපැල් ගෙනියන දුම්නැවෙන් යන මේ ලියුම සැවැන්නා වෙත යනවා. ඊළඟට මං විදුලි පුවතක් යවනවා අසවල් මහත්වරු තුන්දෙනා, මිනීමැරීමේ චෝදනාවට මෙහේට අවශ්‍යයි කියලා."

ඉතාම සූක්ෂ්ම අයුරින් සැලසුම් කරන කටයුත්තක් වුවද බලාපොරොත්තු නොවන ලෙස අසාර්ථක වීමට ඉඩ ඇත. හෝම්ස් විසින් යවන ලද දොඩම් ඇට, ඔපන්ෂෝ මිනීමරුවනට කිසිදාක නො ලැබිණ. ඒ අවුරුද්දේ අත්ලාන්තික් සාගරය හරහා හමාගිය විෂුවය කුණාටු, ඉතාම දරුණු, ප්‍රබල මෙන්ම දීර්ඝ කාලයක් පැවතුණු ඒවා විය. "ලෝන් ස්ටාර්" නැව සැවැන්නා වරායට

http://sherlockholmesinvestigations.blogspot.com

සේන්දු වූ බවට තොරතුරු ලැබෙන තෙක් අපි බොහෝ කාලයක් බලා සිටියෙමු. අත්ලාන්තික් සාගරය මැද්දේ, විනාශ වුණු නැවකින් කැඩීගිය කුඹගසක් පාවෙමින් තිබූ බව අපට අසන්නට ලැබිණ. නාවිකයන් විසින් දුටු ඒ කුඹ ගසෙහි "L. S" යන අකුරු කැටයම් කොට තිබූ බව දකින්නට ලැබී ඇත. "ලෝන් ස්ටාර්" නැවට අත්වූ ඉරණම ගැන අපට අසන්නට ලැබුණේ එපමණකි.



Reading Purpose Only, Not For Pr

http://sherlockholmesinvestigations.blogspot.com

# බොස්කෝම්බ් නිම්නයේ ඛේදවාචකය

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# බොස්කෝම්බ් නිම්නයේ ඛේදවාචකය

එදින මම බිරිඳ සමග උදේ ආහාරය ගනිමින් සිටියෙමි. සේවිකාව අප වෙත විදුලි පුවතක් රැගෙන ආවාය. එය මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගෙනි.

"දින කිහිපයක නිවාඩුවක්, ගත හැකිද? බොස්කෝම්බ් නිම්නයේ ඛේදවාචකය ගැන බටහිර එංගලන්තයෙන් මේ දැන් විදුලිපුවතක් ලැබුණා. ඔබටත් මා සමග ආ හැකි නම් සතුටක්. එහි නැවුම් වාතය හා සුන්දර දර්ශන අනර්ඝයි. පැඩිංටන් දුම්රිය පොළෙන් එකොළහයි කාලට පිටත්වෙමි."

"මොකද ඔයා කියන්නෙ? යනවද?" මගේ බිරිඳ ඇසුවාය.

"අනේ මං දන්නෙ නෑ මොනවා කියන්නද කියල. පුළු ශලාකම් ඇදහා බලාගෙන ඉන්න මගේ රෝගීන්ගේ නාමලේඛනයත් සෑහෙන්න දිගයි."

"ආ. . . . ඔයාගෙ ප්‍රතිකාර වැඩේ නම් ඇන්ස්ට්‍රුදර් කරාවි. රස්සාවටම කැපවෙලා මහන්සිවෙලා වෙන්න ඇති; ඔයාගෙ මුහුණ මෑතක ඉඳන් හරියට සුදුමැලියි. දිගින් දිගටම රෝගීන් බැලීමෙන් ඇතිවූ තෙහෙට්ටුව නැතිවෙන්නත් එක්ක, ඔයා මේ ගමන ගිහින් එන්න. ෂර්ලොක් හෝම්ස් මහත්මයාගෙ පරීක්ෂණ ගැන ඔයා හැමදාමත් හරි ආශාවෙන් දක්වනවා නේ."

"ඒ පරීක්ෂණ වල යෙදෙන්න ගිහින් මට අත්වුණු වාසිය පෙනි පෙනී තියෙද්දිම මං කොහොමද හෝම්ස්ට බෑ කියන්නෙ. එහෙම කළොත් මං හරි අකෘතඥ පුද්ගලයෙක් වේවි. . . . ඒ වුණත් මේ ගමන යනව නම් මං වහාම ගමන්බඩු සූදානම් කරගත යුතුයි. ඒ වැඩේට මට තව ඉතිරි වෙලා තියෙන්නේ පැය භාගයයි."

http://sherlockholmesinvestigations.blogspot.com

මම පිළිතුරු දුනිමි.

ඇෆ්ගනිස්ථානයේ මා ගෙවූ කදුරු ජීවිතය නිසා, ගමනක් පිටත්වී යාම සඳහා ඉතා ඉක්මනින් සූදානම් වීමට මට පුහුණුවක් ලැබී තිබිණි. මගේ අවශ්‍යතාවයන් ලෙස සූදානම් කරගැනීමට තිබුණේ සුළු සුළු දේවල් කිහිපයක් පමණි. එහෙයින් පැය භාගයක් යාමටත් පෙර, කුඩා බෑගයක් ද රැගෙන මම අශ්වකරත්තයෙන් පැඩිංටන් දුම්රියපොළ වෙත ගමන් කළෙමි.

ෂර්ලොක් හෝම්ස් දුම්රියපොළේ ඉහළ පහළ සක්මන් කරමින් සිටියේය. ඔහු හැඳ සිටි දිගු ගමන්කබාය නිසා, කොහොමටත් කෙට්ටු සිරුර, වඩාත් උසට හා කෙට්ටුවට දිස්විය. හෝම්ස්ගේ හිසේ රෙදි වලින් තැනූ හිස්වැස්මක් ද විය.

"ඔබ ආ එක හරිම හොඳයි වොට්සන්. සම්පූර්ණ විශ්වාසය තබන්න පුළුවන් කෙනෙක් මා සමග යන එක, මං තනියම යනවට වඩා සෑහෙන වෙනසක්. එතැනට ගියාම පොලිසියෙන් නම් උදව් වගේම අදහසුත් ලැබේවි. එක්කො ඒවායින් කිසිම ප්‍රයෝජනයක් ඇත්තෙ නෑ. එහෙමත් නැත්නම් ඒ අදහස් හැම එකක්ම, ඔවුන් මේ දිහා බලන දෘෂ්ටි කෝණයෙන් බලල දෙන ඒවා. මං දුම්රියට ප්‍රවේශපත්‍ර අරගෙන එන්නම්. අර කෙළවරේ අසුන් දෙක අපට තියාගන්න."

එම දුම්රිය මැදිරියේ ගමන් කිරීමට සිටියේ අප දෙදෙනා පමණකි. හෝම්ස් පුවත්පත් රාශියක් ගෙනැවිත් තිබිණි. ඔහු සමහර පුවත්පත් පිටු, අකුරක් නෑර කියෙව්වේය. තවත් විටෙක පිටු පෙරළා බලා, යම් යම් දේ සටහන් කරගත්තේය. මෙසේ ඔහු පුවත්පත් සියල්ලම සූක්ෂම සෝදිසියකට ලක්කළේය. අනතුරුව දෑස් පියාගෙන කල්පනා කළේ භාවනාවක යෙදෙන අයුරෙනි. මේ සියල්ල දක්නට ලැබුණේ අපේ දුම්රිය, රෙඩිං නගරයට ළඟාවනතුරු පමණකි. අප රෙඩිං පසු කරද්දී, පුවත්පත් පිටු රැඟියක්ම එකට එකතුකොට විශාල බෝලයක් සෑදූ ඔහු, එය දුම්රිය කවුළුව තුළින් ඉවතට විසි කළේය.

"මේ සිද්ධිය ගැන ඔබට මොනවා හරි අහන්න ලැබුණද වොට්සන්?"

"මේ ගැන එක වචනයක් වත් මං දන්නෙ නෑ. මට දවස් ගණනකින් පුවත්පතක් කියවන්න ලැබුණෙ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ලන්ඩනයේ පුවත්පත් වල නම් ඒ තරම් සම්පූර්ණ විස්තරයක් තිබුණෙ නෑ. මං මේ හැම පත්තරයක්ම පෙරළමින් බැලුවේ අත්‍යවශ්‍ය ප්‍රධාන කරුණු ටික ග්‍රහණය කරගන්න පුළුවන්ද කියලයි. පෙනෙන්න තියෙන කරුණු වල හැටියට, මේක තේරුම් ගන්න අමාරු, ඒත් බොහොම සරල සිදුවීමක්."

"ඒක හරි පරස්පර විරෝධී කියමනක් නේ."

"නමුත් සත්‍යය ඒකයි. යම්කිසි අපරාධයක් කිසි අරමුණක් නැති එකක් වුණාම ඒක විසඳන්න අමාරුයි. නමුත් මෙතැනදී නම් මිනීමැරුමට ලක්වූ පුද්ගලයාගේ පුතාට විරුද්ධව බරපතල ලෙස චෝදනා සහ සාක්ෂි එල්ල වෙලා තියෙනවා."

"එහෙනම් මිනීමැරුමකුත් සිද්ධවෙලා."

"එහෙම වෙලා කියලයි කියන්නෙ. නමුත් මේක පෞද්ගලිකවම මගේ ඇස් දෙකෙන් දකලා තීරණය කරන තුරු, අනික් අය කියන පළියට මං විශ්වාසයට ගන්නෙ නෑ. මං මේක තේරුම් අරගෙන තියෙන විදියට, සිදුවෙලා තියෙන්නෙ මොකක්ද කියලා මං ඔබට කියන්නම්

බොස්කෝම්බ් නිම්නය කියන්නේ හෙර්ෆර්ඩ්ෂයර් ප්‍රාන්තයේ, රොස් නගරයට නුදුරින් පිහිටි දිස්ත්‍රික්කයක්. මේ ප්‍රදේශයේ ඉන්න ලොකුම ඉඩම්හිමි වැවිලිකරුවා තමයි, ජෝන් ටර්නර්. ඔහු එංගලන්තයේ සිට ඕස්ට්‍රේලියාව වෙත ගිහින්, එහිදී මුදල් සම්භාරයක් උපයාගෙන, ආපසු තමන්ගේ රටට ආ කෙනෙක්. ඔහුට අයිති හාදර්ලි නම් එක් ගොවිපොළක් චාල්ස් මැකාති නම් කෙනෙකුට බද්දට දී තිබුණා. මේ මැකාති මහත්මයත් ඕස්ට්‍රේලියාවේ රැකියාව කර පැමිණි කෙනෙක්. පිටරට වල රැකියා කරද්දී දනහැඳින ගෙන ඉඳපු මිනිස්සු, තමන්ගෙ රටට ආවට පස්සෙ, එකම පළාතක අසල්වාසීන් ලෙස පදිංචිවීමේ පුදුමයක් නැහැ. මේ අතරින් වඩාත් ධනවත් පුද්ගලයා ජෝන් ටර්නර් වගෙයි පෙනෙන්නෙ. ඒ මොකද චාල්ස් මැකාතිට තමන්ගේ දේපොළ බදු දෙන්න තරම් ටර්නර්ට හැකියාවක් තිබුණු නිසා. මේ කොහොම වුණත් දෙදෙනා අතර තිබුණේ හුඟක් සමීප හිතවත්කමක් බවයි ප්‍රසිද්ධියට පත්වෙලා තියෙන්නෙ. ඔවුන් දෙදෙනා එකට ආශ්‍රය කරන හැටි, නිතර නිතර දකින්න ලැබුණු දෙයක්.

http://sherlockholmesinvestigations.blogspot.com

මැකාතිට ඉන්නවා එක පුතෙක්, වයස අවුරුදු දහඅටක ඉලන්දාරියෙක්. ටර්නර්ට ඉන්නේ එකම දියණියක් පමණයි. ඇයත් මේ වයසේම තරුණියක්. ටර්නර් සහ මැකාති දෙදෙනාගේම බිරින්දෑවරු මියගිහින්. මේ දෙගොල්ලොම ඒ පළාතේ ඉන්න අනෙක් ඉංග්‍රීසි ජාතික පවුල් සමග වැඩි ආශ්‍රයකට ගිහින් නොමැති බවයි අහන්න ලැබුණේ. කොහොම වුණත් මැකාති පියා සහ පුතා අශ්වරේස් ක්‍රීඩා ප්‍රිය කළ අයලු. ඒ පළාතට නුදුරු අශ්වරේස් පිටි වල ඔවුන්ව නිතර නිතර දකින්න ලැබිල තියෙනවා. මැකාති නිවසේ සේවකයන් දෙදෙනෙක් ඉන්නවා; මිනිහෙක් සහ ගැහැනු ළමයෙක්. ටර්නර්ට නම් ලොකු සේවක මඩුල්ලක් ඉන්නවා. අඩුම ගණනේ හයදෙනෙක් වත්. පවුල් දෙක ගැන මට දැනගන්න ලැබුණු තොරතුරු එපමණයි.

ජුනි මාසේ 3 වැනි දා, ඒ කියන්නේ පහුගිය සඳුදා හවස තුනට පමණ, චාල්ස් මැකාති, හාදර්ලි ගොවිපොළේ ඔහුගේ නිවසෙන් පිටත්වෙලා ආවා. ඔහු මේ හවස් වරුවේ පයින් ඇවිදගෙන ගියේ බොස්කෝම්බ් ජලාශය දෙසටයි. බොස්කෝම්බ් ජලාශය කියන්නේ, කඳු ප්‍රදේශ වල සිට බොස්කෝම්බ් නිම්නය හරහා ගලා බහින ඔයක්, පුළුල්ව විහිද යෑමෙන් සෑදුණු, කුඩා වැවක් වැනි එකක්. මැකාති උදේ වරුව ගතකරල තිබුණේ රොස් නගරයේ. ඒ ඔහුගේ සේවකයාත් සමග. කලින් යොදාගත් වැදගත් වැඩක් තමන්ට හවස තුනට ඇති බව, මැකාති තමන්ගේ සේවකයා සමග පවසලා තියෙනවා. ඒ නිසාමයි ඔහුන් රොස් නගරයේ ඉඳල ඉක්මනින් ආපහු ඇවිත් තියෙන්නේ. ඊළඟට මෙන්න මේ කලින් යොදාගත් හමුවීමට, බොස්කෝම්බ් ජලාශය අසලට ගිය චාල්ස් මැකාති පණපිටින් ආපහු ආවෙ නෑ.

හාදර්ලි ගොවිපොළේ තිබෙන ගෙදර ඉඳලා බොස්කෝම්බ් ජලාශයට දුර හැතැක්ම කාලයි. මෙම දුර ප්‍රමාණය ඔහු ඇවිදගෙන ගිය හැටි දෙදෙනෙක් දැක තිබෙනවා. මෙයින් එක් අයෙක්, නම සඳහන් කර නැති වයසක ගැහැනු කෙනෙක්. අනෙක් තැනැත්තා විලියම් ක්‍රව්ඩර් නම් අයෙක්. ජෝන් ටර්නර්ට අයත් වතුයායේ වල් සතුන් හා පක්ෂීන් දඩයම් කිරීම සඳහා දඩබිමක් වෙන්කර තියෙනවා. විලියම් ක්‍රව්ඩර් තමා ටර්නර්ගේ මේ දඩබිම භාර සේවකයා. මේ සාක්ෂිකරුවන් දෙදෙනාම දිවුරා කියා හිටිනවා මැකාති ගමන්

http://sherlockholmesinvestigations.blogspot.com

කළේ තනියම බව. මීට අමතරව විලියම් ක්‍රව්ඩර් කියා හිටිනවා, චාල්ස් මැකාති ගිහිං මිනිත්තු කිහිපයක් ගතවුණාට පස්සෙ, ඔහුගේ පුත්‍රයා වන ජේම්ස් මැකාති තුවක්කුවක් අතේ ඇතිව ඒ පැත්තට යනවා තමන් දුටු බව. ක්‍රව්ඩර් කියන හැටියට, වයසක මැකාති මේ වෙනකොට ඉන්න ඇත්තෙ පුතාට පෙනෙන තෙක් මානෙ වගේ. ක්‍රව්ඩර් මේ ගැන වැඩිදුර යමක් හිතුවේ නැහැ. ඛේදජනක සිදුවීම ගැන හැන්දෑවේ ආරංචි වුණාමයි ඔහුට අර කාරණය මතක් වුණේ.

විලියම් ක්‍රව්ඩර්ගේ දර්ශන පථයෙන් මැකාති පියපුතු දෙදෙනා නොපෙනී ගියාට පස්සේත් ඔවුන් දුටු අය ඉන්නවා. බොස්කෝම්බ් ජලාශය අවට, සෑහෙන්න ඝනව ගහකොළ වැවුණු තරමක කැලෑරොදක් තියෙනවා. ඒ කැලෑවේ, කැලෑමල් කැඩීමට ඔය කියන වෙලාවෙ ගැහැනු ළමයෙක් පැමිණියා. අවුරුදු දහහතරක් වයසැති ඇය තමයි පේෂන්ස් මොරාන්. මේ ගැහැනු ළමයා බොස්කොම් වතුයායේ අඩබිමේ පිහිටි විවේකාගාරය භාරකරුගේ දුවණිය. ඇයටත් යමක් දකින්න ලැබිල තියෙනවා.

ඇය සාක්කි දෙමින් කියා හිටියා ජලාශයට කිට්ටුවෙන්, එහෙත් කැලෑ රොද අවසන් වෙන හරියෙදී ඇයට අසන්නට ලැබුණු කතාබහක් ගැන. මැකාති මහත්මයාත් ඔහුගේ පුතාත් දෙදෙනා, බොහොම සැර වචන වලින් බනින්බස් වුණාලු. වයස්ගත මැකාති ඉතාම නපුරු වචන වලින් තම පුතාට බැණ වැදුණු හැටිත්, එවිට පුතා, තම පියාට පහරදීමට මෙන් අත ඉහළට එසවූ හැටිත් ඇය දැක තිබෙනවා. මෙම සණ්ඩුවේ බිහිසුණු බවෙන් බියට පත්වුණු පේෂන්ස්, ආපහු තමන්ගේ ගෙදරට දිව ගියා. ගෙදර ගිය ඇය, ඇගේ මවට කිව්වාලු බොස්කෝම්බ් ජලාශය අසල මැකාති පියපුතු දෙදෙනා සණ්ඩු වෙමින් සිටිනා බවත්, කොයි මොහොතේ හෝ ඔවුන් ගුටි ඇණ ගැනීමට ඉඩ ඇති බවත්. ඇයට ඒ කථාව කියල ඉවර කරන්න හම්බ වුණේ නැහැ, මැකාති තරුණයා ඔවුන්ගේ නිවසට දුව ආවා.

"කෝ මොරාන් ඉන්නවද? ඔහුට ඉක්මනට කථා කරන්න. මගේ තාත්තට තුවාල වෙලා ජලාශය අසල වැටිල ඉන්නවා. මට හිතෙන්නෙ ඔහු මියගිහින්. මට මොරාන්ගේ උදව් ඕනෑමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

කැළැඹීමට පත්වෙලා හිටි තරුණයා එහෙම කිව්වා. ඔහුගේ අතේ තුවක්කුව වත් ගිස්වැස්මක් වත් තිබුණේ නැහැ. තරුණ මැකාතිගේ දකුණු අතේ හා කමිස අතේ අලුත් ලේ තැවරී ඇති බව මොරාන් පවුලේ අය දුටුවා. තරුණයා පසුපස ගිය ඔවුනට දකින්න ලැබුණේ මහලු මැකාතිගේ මළසිරුර. එය ජලාශය අසල තණබිමේ වැටී තිබුණා. මේ මරණයට හේතුව ඔහුගේ හිසට සිදු වී තිබුණු බරපතල තුවාල බව බැලූ බැල්මටම පෙනුණා. මේ තුවාල, බර, මොට ආයුධයකින් කළ ඒවා බවයි පෙනුණේ. තරුණ මැකාතිගේ තුවක්කුවේ මිටෙන් වුණත් කළ හැකි ඒවා. මේ ආයුධය මළසිරුරට පියවර කිහිපයක් දුරින් තණබිම මත තිබෙනු කාටත් දකින්න ලැබුණා. මෙම සාක්ෂි එවනේ තරුණ ජේම්ස් මැකාති පොලීසිය මගින් අත්අඩංගුවට ගැනුණා. පසුව කරන ලද මරණ පරීක්ෂණයේදී මෙය සිතාමතා කළ මනුෂ්‍ය ඝාතනයක් බවට තීරණය වුණා. බදාදා මේ විත්තිකරුවා රොස් නගරයේ මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරනු ලැබුවා. නඩුව එතැනින් ඉහළ උසාවියට තබා තිබෙනවා. හදිසි මරණ පරීක්ෂණයේදීත්, මහේස්ත්‍රාත් උසාවියේදීත් දනගන්නට ලැබුණේ ඒ කාරුණුයි."


"මේ වගේ පැහැදිලි ලෙසම විත්තිකාරයාට විරුද්ධව සාක්ෂි තියෙන සිද්ධියක් ගැන මට මතක් කරන්නත් අමාරුයි. වක්‍රව ලැබෙන සාක්ෂි වලින් අපරාධකාරයෙක්ව පෙන්නාදීම සිදුකරනවා නම්, ඒක බොහොම අගේට මෙතැනදී සිදුවෙනවා." මම කීවෙමි.

"වක්‍රව ලැබෙන එහෙමත් නැත්නම් පරිවේණීය සාක්ෂි කියන ඒවා බොහොම මායාකාරී සාක්ෂි ලෙස හඳුන්වන්න පුළුවන් වොට්සන්."

හෝම්ස් පැවසුවේ කල්පනාකාරී වෙමිනි.

"බැලූ බැල්මට ඒකෙන් පැහැදිලිව කියන්නේ අසවල් කරුණ කියලා ඔබට හිතෙන්න පුළුවනි. නමුත් ඔබේ දෘෂ්ටි කෝණය ටිකක් වෙනස් කරලා බලන්න වොට්සන්. එතකොට ඔබට පෙනේවි අර බොහොම පැහැදිලියි කිව් සාක්ෂි යොමුවෙන්නෙ වෙනත් දිසාවකට බව. මේ තියෙන තත්ත්වය උඩ නම් මේ තරුණයා මුහුණපාලා ඉන්නේ භයානක ඉරණමකට. ඒක අපි පිළිගන්න ඕන. ඒ කියන්නේ ඔහු මිනීමරුවා බවට සාක්ෂි වලින් පැහැදිලිවම ඔප්පු වෙනවා. ඔහුට ගැළැවීමක් ඇති බවක් පෙනෙන තෙක්

http://sherlockholmesinvestigations.blogspot.com



223. ". . . . ඔවුනට දකින්නට ලැබුණේ මහලු මැකාතිගේ මළසිරුර!"

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

මානයක වත් නැහැ. අපරාධකාරයා බොහොම වෙලාවට ඔහු වෙන්නත් පිළිවන්.

නමුත් ඔබ දන්නවාද වොට්සන්. අසල්වැසියන් ගණනාවක්ම ඉන්නවා මේ තරුණයා අහිංසකයි කියල විශ්වාස කරන අය. එයින් එක් අයෙක්, අර ඉඩම්හිමි ටර්නර්ගේ දියණිය. මේ අපරාධය ගැන තවදුරටත් පරීක්ෂා කිරීමට ලෙස්ට්‍රේඩ්ට භාරදීල තියෙන්නේ ටර්නර් මෙනෙවිය විසිනුයි. ලෙස්ට්‍රේඩ්ට මේක මහා ප්‍රහේලිකාවක් වුණා. ඉතින් මිනිහා පරීක්ෂණය මට භාර කළා. ඔබට මතක නේද ලෙස්ට්‍රේඩ්? අර ලෝහිත පරීක්ෂණයේදීත් අපට උදව්වුණේ. උදේ කෑම දිරවාගන්න විවේකයක් වත් නොගෙන, මැදිවියේ මහත්වරු දෙන්නෙකුට, පැයට හැතැක්ම පනහක වේගයෙන් බස්නාහිර දෙසට දුම්රියෙන් ගමන් කරන්න සිදුවෙලා තියෙන්නෙ ඒක නිසා නේ."

"මට නම් අවංකව කියන්න පුළුවන් මේ ටිකයි හෝම්ස්. විත්තිකාරයාට විරුද්ධව ඇති සාක්ෂි කොයිතරම් පැහැදිලිද කිව්වොත්, ඔහුට මේකෙන් ගැලවීමක් ඇත්තෙත් නෑ. ඉතින් ඔබට ලිහන්න ගැටලුවකුත් නෑ. ඒ නිසා ඔබට මෙතැනින් ලබාගතහැකි, යම්කිසි කීර්තිනාමයක් හෝ ගෞරවයකුත් නෑ. මං කියන්නේ බොරුද?"

"ඔය පැහැදිලිවම පෙනෙන සාක්ෂි තරම් කෙනෙකු නොමග යවන්න පුළුවන් වෙනත් දෙයක් නෑ." හෝම්ස් කීවේ සිනාසෙමිනි.

"ඒ ඇරුණාම බාග වෙලාවට අපටත් බොහොම පැහැදිලි සාක්ෂි අහම්බෙන් හම්බවෙන්න පුළුවනි. ඒවා සමහරවිට ලෙස්ට්‍රේඩ්ට පැහැදිලිව නොපෙනුණු සාක්ෂි වෙන්නත් පිළිවන්. ඔබ හොඳින් දන්නවා වොට්සන්, මං යොදාගන්න සමහර ක්‍රම ලෙස්ට්‍රේඩ්ට යොදාගන්න තියා තේරුම්ගන්නත් බැරි බව. එතකොට එවැනි ක්‍රමයක් මගින් ලෙස්ට්‍රේඩ්ගේ උපකල්පන එහෙම් පිටින්ම පුපුරුවා හරින්න මට හැකිවෙන්න ඉඩතියෙනවා. මං මෙහෙම කියන්නෙ බොරු පුරසාරම් කථාවක් හැටියට නොවන බව ඔබ දන්නවා. මං හොඳ උදාහරණයක් කියන්නම් වොට්සන්. මං කවදාවත් ඔබේ ගෙදරට ඇවිත් නෑ. නමුත් ඔබේ ඒ ගෙදර, නිදන කාමරයේ ජනේලය තියෙන්නේ දකුණු පැත්තේ. නමුත් ඒ තරම් පැහැදිලිවම නිශ්චය කළ හැකි කරුණක් ලෙස්ට්‍රේඩ්ට හොයාගන්න පුළුවන් වේවි කියල ඔබ හිතනවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"දෙයියෝ සාක්කි! ජනේලය තියෙන්නෙ දකුණු පැත්තෙ බව ඔබ හොයා ගත්තෙ කොහොමද හෝම්ස්?"

"මගේ හිතවත් මිත්‍රයා. මං ඔබේ පිළිවෙළ හොඳින් හඳුනනවා. යුද්ධහමුදාවේ ගතකළ ජීවිතය නිසා බොහොම පිරිසිදුවට පිළිවෙළට ඉන්නට ඔබ සිරිත් විරිත් ඉගෙන ගත්තා; ඒවා ඔබ නිසි ලෙස ඉටුකරන බව මං හොඳින් දන්නවා. ඔබ හැමදාම උදේට රැවුළ කපනවා. අවුරුද්දේ මේ කාලයට ඔබ රැවුළ කපන්නේ ඉර එළියේ ආධාරයෙන්. ඔබේ මුහුණේ රැවුළ බෑම සාර්ථකව ඉටුකෙරිලද යන්න ගැන හොඳින් බැලුවොත්, නිරීක්ෂණය කරන්න පුළුවන් මොනවද? ඔබේ මුහුණේ වම් පැත්තේ ඉහළට යන්න යන්න වෙනසක් පෙනෙනවා. මොකක්ද මේ වෙනස? මුහුණේ දකුණු පැත්තේ හොඳ දිහිදුවට, සියුම්ව සිටින සේ රැවුළ බාල. නමුත් වම් පැත්තේ එහෙම නැහැ. ඒකෙන් අපට පැහැදිලිවම තේරුම්ගන්න පුළුවනි, මුහුණේ දකුණු පැත්තට හොඳින් එළිය ලැබෙනවා; වම් පැත්තට එහෙම නැහැ. මුහුණේ දෙපැත්තටම එක සමානව ආලෝකය ලැබුණොත්, ඔබ එක් පැත්තක් වැඩියෙනුත්, අනෙක් පැත්ත අඩුවෙනුත් රැවුළ බාවිද? ඔබ වගේ බොහොම ක්‍රමානුකූලව වැඩකරන කෙනෙක් ගැන මට එහෙම හිතන්නවත් බෑ. ඒකෙන් ගත හැකි නිගමනය, කාමරයේ දකුණු පැත්තේ ජනේලය ඇති බව. මං මේ සුළු උදාහරණයක් අරගෙන පෙන්නුවා පමණයි.

මගේ වෘත්තිය සම්පූර්ණයෙන්ම රැඳී තියෙන්නේ ඔන්න ඔය නිරීක්ෂණය සහ නිගමනය යන දෙක උඩ. මේ පරීක්ෂණයේදීත් ඒක බොහොම ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා. ඉන්ක්වෙස්ට් විභාගයේදී සුළු කරුණක් හෝ දෙකක් කියැවී තිබෙනවා. ඒවා ගැනත් හොඳින් හොයා බලන්න වටිනවා."

"ඒ කරුණු මොනවාද?"

"මැකාති තරුණයා සිද්ධිය වුණු වහාම හිරභාරයට අරගෙන නැහැ. ඒක කරල තියෙන්නේ ඔහු ආපසු හාදර්ලි ගොවිපොළට ආවට පස්සෙ. ඒ වෙලාවෙ පොලිස් පරීක්ෂකයා කිව්වලු,

"මහත්මයා. මේ මිනීමැරුම සම්බන්ධයෙන් අපට ඔබව අත්අඩංගුවට ගන්න සිද්ධවෙනවා" කියල.

"ඒක අහල මං පුදුමයට පත්වෙන්නෙ නෑ. මට අත්වෙන්න තියෙන ඉරණම ඒක තමයි." තරුණයා පිළිතුරු දුන්නාලු.

http://sherlockholmesinvestigations.blogspot.com

තරුණයා අපරාධකාරයා බවට මරණ පරීක්ෂකයාගේ ජූරියේ කාගෙ හරි හිතේ සැකයක් තිබුණා කියල හිතමු. තරුණයාගේ අර කථාව ඇහුවාම ඒ සැකයත් ඉවත්වෙලා යනවා."

"ඒක පාපෝච්චාරණයක් නේ." මම කීවෙමි.

"නැහැ වොට්සන්. අර කථාව කියල ඉවරවෙලා තරුණයා කිව්වලු මේ මරණය ගැන තමා සම්පූර්ණයෙන්ම නිර්දෝෂයි, තමා අහිංසකයෙක් කියල."

"සිදුවෙලා තියෙන දේවල් වල හැටියට, පැහැදිලි සාක්ෂි වල හැටියට, කාටද පුළුවන් ඒ කථාව විශ්වාස කරන්න?" මම ඇසීමි.

"එහෙම කියන්නත් එපා. මේ අන්ධකාර කළු වලාකුළේ, මට පෙනෙන එකම රිදී රේඛාවත් ඒක විතරයි. අපි මොහොතකට හිතමු තරුණ මැකාති අහිංසකයෙක් කියල. ඒ වුණත් ඔහු තමන්ට විරුද්ධව ඇති සාක්ෂිවල බරපතලකම තේරුම් ගන්න බැරි අඥානයෙක් නොවෙයි. ඔහු අත්අඩංගුවට ගත්තු වෙලාවෙ පුදුමවුණු බවක් පෙන්නුවා නම්, නැත්නම් බලවත් ලෙස කෝපයට පත්වුණු බවක් පෙන්නුවා නම්, මගේ හිතේ ලොකු සැකයක් ඇතිවෙන්න ඉඩ තිබුණා. ඒ මොකද ඒ විදියට පුදුමයක් හෝ තරහක් ඇතිවීම එවැනි වෙලාවක ස්වාභාවිකයි. ඒ නිසාම වංචනික පුද්ගලයෙක් ඒ වෙලාවේ ඒ අයුරින් රඟපාන්න ඉඩ තියෙනවා. ඔබට පැහැදිලිද මං මේ කියන කාරණය? ඔහු මුහුණපා ඇති තත්ත්වය පිළිබඳව හරි හැටි තේරුම් අරගෙන, අවංකව එය පිළිගැනීම කාරණා දෙකක් නිසා වෙන්න පුළුවනි. එක්කෝ ඔහු අහිංසකයෙක්. එහෙමත් නැත්නම් තමන්ගේ සිතේ ඇතිවන ආවේග දැඩි ලෙස පාලනය කරගන්න පුළුවන් කෙනෙක්.

"මට අත්වෙන ඉරණම ඕක තමයි!" කියා ඔහු කිව්වා නේද?

තාත්තාගේ මළසිරුර අසල ඔහු සිටි බවත්, අර පුංචි ගැහැණු ළමයාගේ සාක්ෂියත් තරුණයාට විරුද්ධ ප්‍රබල සාක්ෂි. ඒක තේරුම් ගත් නිසා අර වගේ කථාවක් ඔහු කිව් එක ස්වාභාවිකයි. මෙතැනදී ඔහු කටයුතු කර ඇති පිළිවෙළෙනුත්, කථා කළ වචන වලිනුත් මොකක් ද හිතාගන්න පුළුවන්? මට නම් හිතෙන්නේ ඔහු අහිංසකයෙක් මිස අපරාධකාරයෙක් නොවේ කියන එකයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ තරමට පැහැදිලි කමක්, තියුණු බවක් නැති හාගෙම් මග පවා මිනිස්සු එල්ලුම් ගස් ගිහිං තියෙනවා."

මා කීවේ හෝම්ස්ගේ අදහසට එකඟ නොවෙමිනි.

"ඒක සම්පූර්ණ ඇත්ත. අහිංසක මිනිස්සු අනන්තවත් තමන් නොකළ වරදට එල්ලුම් ගස් ගිහිං තියෙනවා."

"මේ සිද්ධිය ගැන තරුණයා මොනවද කරල තියෙන ප්‍රකාශ?"

"කණගාටුයි කියන්න. ඔහුගේ ඒ ප්‍රකාශයෙන් ඔහුට ඒ තරම් වාසියක් සැලසෙන්නේ නෑ. තරුණයාට පාක්ෂික ආධාරකාරයෝ ඒකෙන් අධෛර්යයට පත්වෙනවා. යම්කිසි වැදගත් කමක් තියෙන කරුණක් දෙකක් ඒකෙ නැත්තෙම නෑ. මේ පත්තරේ තියෙනවා ඔහුගේ සාක්ෂිය ඔබම කියවා බලන්න."

තමා ළඟ ඉතිරි කරගෙන තිබූ පුවත්පත් කිහිපයෙන්, හෙරිෆඩ්ෂයර් ප්‍රදේශයේ පළවන ප්‍රාදේශීය පුවත්පතක් හෝම්ස් තෝරාගත්තේය. අවාසනාවන්ත තරුණයා දුන් කට උත්තරය එහි සඳහන්ව තිබිණි. දුම්රිය අඳුරේ කෙළවරටවී මම එය ඉතා සැලකිල්ලෙන් කියවීමට පටන්ගතිමි. එහි සඳහන්ව තිබුණේ මෙසේය.

". . . . මියගිය තැනැත්තාගේ පුත්‍රයා වන ජේම්ස් මැකාති අනතුරුව සාක්ෂියට කැඳවන ලදී.

"මම ගෙදරින් පිටවෙලා බ්‍රිස්ටල් නගරයට ගිහිං, එහේ දවස් තුනක් ගතකරලා ගෙදර ආවෙ පහුගිය සඳුදා. ඒ කියන්නේ තුන්වැනිදා. මං ගෙදර එනකොට තාත්තා ගෙදර හිටියෙ නැහැ. තාත්තා, ජෝන් කොබ් නම් අශ්වයින් බලාගන්නා සේවකයා සමග රොස් නගරයට ගිය බව සේවිකාව මට දැනුම් දුන්නා. මං ආපහු ඇවිත් වැඩිවේලා යන්න කලින්, තාත්තාගේ අශ්වකරත්තයේ රෝදවල ශබ්දය මට ගෙයින් එළියේ ඇහුණා. මං ජනේලයෙන් එබී බැලුවා. තාත්තා කරත්තයෙන් බැහැලා බොහොම ඉක්මනින් මිදුලෙන් ඉවතට යන හැටි මං දුටුවා. ඔහු ගියේ කොයි දිසාවටද යන්න මට හිතාගන්න බැරිවුණා.

ඊට පස්සේ මම මගේ තුවක්කුවත් අතට අරගෙන, බොස්කෝම්බ් ජලාශය දෙසට ඇවිදගෙන ගියා. මගේ අරමුණ වුණේ ජලාශය එහා පැත්තේ හාවුන් ගැවසෙන මණ්ඩියෙන් හාවෙකු

http://sherlockholmesinvestigations.blogspot.com

දඩයම් කර ගැනීමයි. මං එහෙම යද්දී දඩබිම භාරකරු, විලියම් ක්‍රව්ඩර් මට දකින්න ලැබුණු බව ඇත්තයි. නමුත් මං තාත්තව ලුහුබැඳ ගියා කියල ඔහු හිතුව නම් ඒක වැරැදියි. තාත්තා මට ඉදිරියෙන් ගමන් කළ බවක් මං දැනහිටියේ නෑ.

මං ජලාශයට යාර සියයක් පමණ දුරින් සිටියදී, මට ඇහුණා තාත්තා "කූ" කියා ශබ්දයක් නඟනවා. මේක සාමාන්‍යයෙන් තාත්තා සහ මා අතර තිබුණු සංඥාවක්. ඉතින් මං ඉක්මන් කරලා ඉදිරියට දිවගියා. මට දකින්න ලැබුණා තාත්තා ජලාශය අසල හිටගෙන ඉන්නා හැටි. මං එහි සිටි බව දකලා ඔහු පුදුමයට පත්වුණු බව පෙනුණා. ඊළඟට ඔහු මට ටිකක් සැරෙන් කථාකරලා ඇහුවා, මං මොකක්ද එතැන කරන්නෙ කියලා. අප දෙදෙනා අතර ඇතිවුණු කතාබහ බෝහොම දුරදිග ගියා. උණුසුම් වචන හුවමාරුවක් ඇතිවුණා. තව ටිකෙන් ඔහු මට පහර දෙන්න වුණත් ඉඩ තිබුණා. ඒ මොකද මගේ තාත්තා බොහොම දරුණු විධියට කෝන්ති යන කෙනෙක්. ඔහුගේ කෝපය ඔහුටම පාලනය කරගන්න බැරිතරමට උත්සන්න වුණා. ඒක දක්කාම මං තීරණය කළා වහාම එතැනින් පිටවී යන්න.

මං ආවෙ හාදර්ලි ගොවිපොළ දිහාවට. මට යන්න ලැබුණේ යාර 150ක පමණ දුරක් පමණයි. මහා විලාප හඬක් මා පිටුපසින් අහන්න ලැබුණා. හැකි වේගයෙන් මං ආපහු දිවගියා. මට දකින්න ලැබුණේ මගේ තාත්තා අවසන් හුස්ම හෙළමින් සිටි ආකාරය. ඔහුගේ හිසට බරපතල තුවාල සිදුවී තිබුණා. මගේ තුවක්කුව පැත්තකට දමලා මං තාත්තව දෑතින් ඔසවා ගත්තා. නමුත් ඔහු මියගියා. ඔහු මියගියේ මගේ දෑතේ. මිනිත්තු කිහිපයක් මං ඔහු අසලින් දණගසා ගෙන හිටියා. කිට්ටුවම තිබුණේ දඩබිමේ විවේකාගාරය භාරකරුගේ නිවස. ඔවුන්ගෙන් හැකි උදව්වක් ලබාගන්නා අරමුණෙන් මා එහි දිව ගියා.

තාත්තාගෙ විලාපය ඇහිලා, මං ආපහු දුවගෙන එද්දී ඔහු අසල කිසිවෙක් ඉන්නා බවක් මං දක්කේ නැහැ. ඔහුගේ හිසට මේ තරම් දරුණු තුවාල සිදුවුණේ කොහොමද කියල මට හිතාගන්නත් අමාරුයි. තාත්තා මිනිසුන් අතර ඒ තරම් ජනප්‍රිය කෙනෙක් නෙමෙයි. ඒ මොකද ඔහු හිතේ ඒ තරම් කරුණාවක් නොතිබුණු, අනෙක් අය නුරුස්සනා කෙනෙක්. ඒ වුණත් මං දන්න තරමින් ඔහුට විරුද්ධව

http://sherlockholmesinvestigations.blogspot.com

ක්‍රියාත්මක වූ හතුරන් හිටියේ නෑ. මේ ගැන වෙනත් කිසිම දෙයක් මා දන්නේ නෑ."

මරණ පරීක්ෂක : මියයන්න කලින් ඔබේ තාත්තා ඔබට මොකුත් කිව්වද?

සාක්ෂිකරු : ඔහු මොනවාදෝ වචන කිහිපයක් තොල් මැතිරුවා. ඔහු කියූ දෙයින් මට පැහැදිලිව ඇසුණේ "රැට්" හෝ "රට්" යන ශබ්දය පමණයි.

ම. ප. : ඔබ එයින් තේරුම් ගත්තේ මොකක්ද?

සා : ඒකෙන් මට මොකුත්ම තේරුම් ගන්න බැරිවුණා. මං හිතන්නේ ඔහු මරුවිකල්ලෙන් මොනවා හරි දොඩවන්න ඇති."

ම. ප. : ඔබත් ඔබේ පියාත් අතර බහින්බස්වීමක් ඇතිවුණු බව කිව්වා නේ. ඒ මොකක් සම්බන්ධයෙන්ද?

සා : මං ඊට පිළිතුරු දෙන්න කැමැති නැහැ.

ම. ප. : එයට පිළිතුරු දෙන්න කියා ඔබට බලකිරීමට මට සිදුවෙනවා.

සා : එය ඔබට කීමට මට හැකියාවක් නැහැ. එය මේ ඛේදජනක සිද්ධියට සම්බන්ධ එකක් නොවන බවට මං සහතික වෙන්නම්.

ම. ප. : එය තීරණය කළ හැක්කේ උසාවියටයි. ඔබ ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන එක මහ හැරියා. එයින් ඉදිරියේදී ඔබට බලවත් අවාසියක් ඇතිවෙන බව ඔබට අමුතුවෙන් කිවයුතු නැහැ.

සා : ඒ වුණත් එය හෙළිකිරීම මං ප්‍රතික්ෂේප කරනවා.

ම. ප. : ඔබ කිව් "කූ" කියන සංඥාව, ඔබත් ඔබේ තාත්තාත් අතර භාවිත වූ එකක්ද?

සා : ඇත්තෙන්ම ඔව්.

ම. ප. : ඔබ බ්‍රිස්ටල් නගරයේ ඉඳල ආපසු ගෙදර ආ බව ඔබේ තාත්තා දැන හිටියේ නැහැ. ඔබ

Reading Purpose Only Print

http://sherlockholmesinvestigations.blogspot.com

ජලාශය පැත්තට ආ බව වත් තාත්තා දන හිටියේ නැහැ. ඉතින් ඔහු කොහොමද ඔබ කැඳවීමට "කූ" කියල සංඥාවක් කළේ?

සා : (කිසිවක් තේරුම් ගැනීමට නොහැකිව අවුල් වූ මනසකින්)

ඒක මටත් තේරුම් ගන්න බෑ.

ජූරි සභිකයෙක් : තාත්තාගේ විලාපය අහලා ඔබ එතැනට දුවගෙන ආවා. ඒ වෙලාවෙ මරණීය තුවාල ලැබූ තාත්තා අසල, සැක කටයුතු යමක් ඔබට දකින්නට ලැබුණේ නැද්ද?

සා : විශ්වාසෙට කියන්න අමාරුයි.

ම. ප. : ඒ කියන්නේ?

සා : මම මහත් කැළඹීමකට පත්වෙලයි හිටියේ. මේ වෙලාවේ එතැනට දුව එද්දී වෙනත් කිසිදෙයක් නොමෙයි, තාත්තා විතරයි මගේ හිතට ආවේ. ඒ වුණත් මං ඉදිරියට දුව එද්දී. . . . මං ඉදිරියට එද්දී මගේ වම් අත පැත්තේ යම්කිසි දෙයක් බිමවැටී තිබුණා වගේ මට යන්තමට මතකයි. ඒකෙ පාට අළුපාට වගෙයි, මට යන්තමට මතක. එක්කෝ මොනවා හරි ආකාරයක කබායක්. එහෙමත් නැත්නම් අර ස්කොට්ලන්ත ජාතිකයන් අඳින ලෝම සායක් වැනි රෙද්දක් විය හැකියි. තාත්තා ළඟ බිම දණගහ ගෙන ඉඳලා නැගිට්ටාට පස්සේ, එය එතැන තිබුණේ නෑ.

ම. ප. : ඔබ කියන්නේ උදව් ඉල්ලාගෙන ඔබ මොරාන්ගේ ගෙදරට යන්න කලින් එය අතුරුදන්වුණා කියලද?

සා : ඔව්. ඒක එතැන තිබුණේ නෑ.

ම. ප. : හරියටම ඒ මොකක්ද කියලා ඔබට කියන්න අපහසුද?"

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print.

සා : අපහසුයි. නමුත් මට හිතුණා එහෙම දෙයක් තිබුණා කියල

ම. ප. : ඔය කියන දෙය තිබුණේ මැකාති මහත්මයාගේ සිරුරට කොපමණ ඇතින්ද?

සා : යාර දහයක් දොළහක් ඈතින්.

ම. ප. : ඒ කියන්නේ කැලෑරොද කෙළවර වන තැන සිට කොපමණ දුරකින්ද?

සා : ඒ කරමම දුරකින්.

ම. ප. : ඒක කවුරු හරි ඉවත් කළා නම් ඒ, ඔබ ඊට යාර දහයක් නුදුරින් සිටියදී?"

සා : ඔව්. නමුත් මං ඒ පැත්තට පිටුපස හරවාගෙනයි හිටියෙ."

මැකාති තරුණයාගෙන් හරස් ප්‍රශ්න ඇසීම මෙතැනින් අවසන් වී තිබිණි. මරණ පරීක්ෂණ වාර්තාව පිළිබඳව පුවත්පතේ සඳහන්ව තිබූ දේ මම දිගටම කියවා බැලීමි.

"මරණ පරීක්ෂකවරයා, විභාගය අවසන් කරමින් කළ කථාව මැකාති තරුණයාට බොහොම අවාසියි. වයසක මැකාති තමන්ගේ පුතාව ඉන්නා බව වත් නොදන, ඔහුට සංඥා කරා කීම සැක උපදවන කථාවක්. ඊළඟට ඔහු තාත්තා සමග බහින්බස් වුණේ මොකකටද කියන එක හෙළිකිරීම ප්‍රතික්ෂේප කිරීම. ඊට පස්සේ තාත්තා මියයද්දී පුතාට කිව් තේරුමක් නැති වචන. මේ හැම දෙයකින්ම මරණ පරීක්ෂක කියන විධියට සැකය එල්ල වෙන්නේ පුත්‍රයාට."

හෝම්ස් සිනාසුණේ සුවපහසු ආසනය මත දිගහැරෙමිනි.

"මේ ඉලන්දාරියාට වාසි සහගත කාරණා කිහිපයක් තිබෙනවා. ඔබත්, මරණ පරීක්ෂකයාත් දෙදෙනාම ඒ කාරණා ටික මතුකරලා පෙන්වන්න සෑහෙන මහන්සියක් දරනවා. එහෙම නේද වොට්සන්?

දැන් බලන්න, මැකාති තරුණයා බොරු කාරණාවක් ගොතන්න ඉතාම අදක්ෂයෙක් බවටත්, ඊළඟට දක්ෂයෙක් බවටත් ඔබ ඔහුව මාරුවෙන් මාරුවට පත්කරනවා. අදක්ෂයෙක් වෙන්නේ, තාත්තා

http://sherlockholmesinvestigations.blogspot.com

හා ඔහු අතර වුණු බහින්බස් වීම මොකක්ද කියන එක ගැන බොරුවක් ගොතල කියන්න ඔහුගේ ඇති අදක්ෂකම. ඒ වෙනුවට ඒක ප්‍රතික්ෂේප කරලා ඔහු ජූරියේ සැකයට භාජනය වෙනවා.

ඊට පස්සේ ඔබ කියනවා ඔහු බොරු ගෙතීමේ හරිම දක්ෂයෙක් කියල. මියයන මනුස්සයා "රැට්" ඒ කියන්නේ මීයෙකු ගැන සඳහන් කළ බවටත්, එක්වරක් පෙනිලා ඊළඟට නොපෙනී ගිය රෙද්දක් ගැන කළ ප්‍රකාශ? නැහැ මිත්‍රයා. මම මේ සිද්ධිය ගැන බලන්නේ වෙනත් දෘෂ්ටි කෝණයකින්. මේ තරුණයා ගේ ප්‍රකාශය ඇත්තක් කියල හිතාගෙන, මං ඒ මත උපකල්පන ගොඩනගනවා. ඊටපස්සේ අපි බලමු ඒ උපකල්පන වලින් අප යොමුවෙන්නේ කොහේටද කියලා. සිද්ධිය වූ තැනට යාබදව වෙන මොකුත් කථා එපා වොට්සන්. මිනිත්තු විස්සක් ගතවෙද්දී අපට ස්වින්ඩන් වලට ළඟාවෙන්න පුළුවන් වේවි. එහේදී අපි දවල් කෑම කාල ඉඳිමු."

ස්වින්ඩන් දුම්රිය පොළෙන් බැස රොස් නගරය දක්වා සැහෙන දුරක් ගමන්කිරීමට අපට සිදුවිය. දර්ශනීය ස්ට්‍රෞඩ් මිටියාවත හරහා ගොස්, අලංකාර සෙවන් නදිය හරහා වැටුණු පාලමෙන් එතෙර වී, රොස් නගරයට සේන්දු වෙද්දී පැවය හතර පමණ වී තිබිණි. උඟුඩු ඇස් දෙකක් තිබූ කෙට්ටු මිනිසෙක් අප එනතුරු දුම්රිය පොළේ වේදිකාවේ බලා සිටියේය. දුඹුරු පැහැති පිටකබායක් හැඳසිටි ඔහු, අපේ මිත්‍ර ලෙස්ට්‍රේඩ් බව හඳුනාගැනීමට මට අපහසු නොවීය. අශ්වකරත්තයකින් අපි හෙර්ෆර්ඩ් ආම්ස් නම් හෝටලය වෙත ගමන් කළෙමු. ඒ වනවිටත් ලෙස්ට්‍රේඩ් අප වෙනුවෙන් හෝටලයේ කාමරයක් වෙන්කර තිබිණි.

"මිනීමැරුම සිදුවූ තැනට යන්න මං අශ්වකරත්තයක් කුලියට ගත්තා."

ලෙස්ට්‍රේඩ් කීවේ අපට තේ පැන් පිළිගැන්වෙන අතරතුරයි.

"මං දන්නවා තේ. හෝම්ස් මහත්මයා අප්‍රමාණ ශක්තියකින් වැඩකරන කෙනෙක් බව. ඔය මරණය සිදුවුණු තැනට යන්න බැරිවුණොත්, ඔබ සෑහීමට පත් නොවෙන බව මං හොඳින්ම දන්නවා."

"ඔබේ ක්‍රියාමාර්ගය හරි බුද්ධිමත් ලෙස්ට්‍රේඩ්. ඒ වගේම ප්‍රකාශය මගේ සිතට සතුට උපදවන එකක්. ඒ වුණත් හැම

http://sherlockholmesinvestigations.blogspot.com

එකක්ම රඳාපවතින්නේ වායුපීඩන මානයේ සටහන් වන පීඩනය මත." හෝම්ස් කීය.

ලෙස්ට්‍රේඩ් ඒ කථාවෙන් විමතියට පත්වූ බව පෙනිණ.

"ඒ කථාව මට මොකුත් තේරුම් ගන්න බෑ?"

"වායුපීඩන මානයේ සටහන් වෙන පාඨාංකය කීයද? 29 යි. ඒ කියන්නේ අද තදින් හමන සුළඟක් නැහැ. අහසේ එක වලාකුළක් වත් නැහැ. ගම්බද හෝටලයක සාමාන්‍යයෙන් දකින්න ලැබෙන සෝපාවකට වඩා, මේක සුවපහසුයි. ඒ තත්ත්වය උඩ මං හිතන්නේ නෑ අද හැන්දෑවේ මං ඔය අශ්වකරත්තය පාවිච්චියට ගනීවි කියල."

ලෙස්ට්‍රේඩ් මහ හඬින් සිනාසුණේය. "කිසි සැකයක් නෑ. ඔබ පුවත්පත් වල පළ වූ වාර්තා කියවලා නිගමනයකට එන්න ඇති. මේ අපරාධය ගැන හැම දෙයක්ම පැහැදිලියි. වඩාත් හොඳින් පරීක්ෂා කර බලන්න බලන්න, කිසි අවුලක් නැති දෙයක් බව පැහැදිලි වෙනවා. ඒ ඔක්කොම හරි. ඒ වුණත් කාන්තාවකගේ ඉල්ලීම මම කොහොමද අහක දාන්නෙ? නිකං ඉල්ලා හිටිනවා නෙමෙයි නේ. ඇයට හොඳටම විශ්වාසයි මේ තරුණයා අහිංසකයෙක් කියල. ඇය හෝම්ස් මහත්මයා ගැන අහලා තියෙනවා. ඇය මට කිව්වේ මෙහෙමයි.

"මං කැමතියි මේක ෂර්ලොක් හෝම්ස් මහත්මයා ලවා පරීක්ෂා කරවා බලල ඔහුගේ අදහස් දැනගන්න."

"මෙනෙවිය. මේ අපරාධය ගැන මං ගැඹුරටම අධ්‍යයනය කරලා, පැහැදිලි නිගමනයකට ඇවිල්ලයි ඉන්නෙ. ෂර්ලොක් හෝම්ස් මහත්තය ආවත්, මං කළාට වැඩි දෙයක් මෙතැන කරන්නෙ කොහොමද?"

මං එහෙම කිව්වාට ඇය ඒකට සවන් දෙන්නෙ නෑ. ෂර්ලොක් හෝම්ස් මහත්මයා කැඳවන්න කියල ඇය නැවත නැවතත් මට කරදර කළා. අහා! මේ මතක් කරන කොටම එන්නෙ ඇගේ අශ්වකරත්තය නේද?"

ඔහුගේ කථාව අවසන් වෙද්දීම තරුණ කාන්තාවක් අප සිටි තැනට පැමිණියාය. මා දක ඇති ඉතාමත් සුන්දර සුවතියන් අතර ඇයට ද විශේෂ තැනක් හිමිවන බව කිවයුතුය. කෙසේ වෙතත්

http://sherlockholmesinvestigations.blogspot.com

කැළැඹීමට පත්වී සිටීම නිසා ඇගේ රූප ශෝභාවේ යම්කිසි අඩුවීමක් සිදුවී ඇතැයි මට සිතිණ.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා!"

ඇයට කෑගැසිණ, ඊළඟට ඇය අපි දෙදෙනා දෙස මාරුවෙන් මාරුවට බැලුවාය. බුද්ධිමත් ගැහැනියක සතු තීක්ෂණ නුවණෙන් මෙන් ඇය මගේ මිත්‍රයා හඳුනාගත්තාය.

"ඔබ මෙහි පැමිණීම ගැන මට හරිම සන්තෝෂයි මහත්මයා. මං මේ විශේෂ ගමනක් මෙහේට ආවෙ ඔබට ඒ බව කියන්නයි. මං හොඳටම දන්නවා ජේම්ස් ඔය අපරාධය කළේ නැහැ. මං ඒක හොඳාකාරවම දන්නවා. ඒ නිසා එම කරුණ මතක තබාගෙනම ඔබේ වැඩ පටන්ගන්න කියල මං ඉල්ලා හිටිනවා. ඔහු ගැන නම් ඔබේ හිතේ කිසිම සැකයක් තියාගන්න එපා. පුංචි ළමයි කාලෙ ඉඳලම අපි එකිනෙකා හොඳින් අඳුනනවා. මං දන්නවා ජේම්ස්ගේ දුර්වලකම්, වැරදි මොනවද කියලා. ඒව ගැන මං තරම් දන්න වෙන කිසිකෙනෙක් නෑ. ඒ වුණත් ඔහු හරිම අහිංසක කෙනෙක්. ඔහුට තියෙන්නෙ මැස්සෙකුට වත් හිංසාවක් කරන්න පුළුවන් හදවතක් නෙමෙයි. ජේම්ස්ගේ පිළිවෙළ හොඳින් දන්න ඕනෙම කෙනෙකුට හිතේවි, ඔහුට මේ වගේ චෝදනාවක් කිරීම මොන තරම් අපරාධයක් ද කියල."

"ටර්නර් මෙනෙවිය. මං විශ්වාස කරනවා අපට ඔහුව නිදහස් කරගන්න හැකිවේවි කියල. ඒ ගැන මට පුළුවන් හැම දෙයක්ම මං කරන්නම්. මා ගැන විශ්වාසය තබන්න."

හෝම්ස් කීවේය.

"ඒ වුණාට පුවත්පත් වල පළවුණු මරණ පරීක්ෂණ වාර්තාව ඔබට කියවන්න ලැබුණද මහත්මයා? මොකක් හරි අවසන් තීරණයකට එන්න ඔබට හැකියාව ලැබුණද? මේ සාක්ෂිවල මොනවා හරි අඩුපාඩු ඔබට දකින්න ලැබුණෙ නැද්ද? ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබට හිතෙන්නෙ නැද්ද ඔහු අහිංසකයි කියල?"

"මං හිතන්නේ බොහෙම දුරට ඔහු අහිංසකයෙක් වගෙයි."

"අන්න බලන්න!" ඇය උස් හඬින් කෑගැසුවේ ලෙස්ට්‍රේඩ් දෙස බලමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

ෂර්ලොක් හෝම්ස් මහත්මයා කියූ දේ ඇහුණා නේද? හෝම්ස් මහත්මයා කියන දෙයින් අපේ හිතේ යම් බලාපොරොත්තුවක් ඇති කරගන්න පුළුවනි."

ලෙස්ට්‍රේඩ් දෙවුර හකුළා තමා ඊට එකඟ නොවන බව ප්‍රකාශ කළේය.

"කණගාටුයි කියන්න. අවසන් තීරණ වලට එන්න මගේ මිත්‍රයා බොහොම කලබල වෙනවා වැඩියි."

"නමුත් ඔහු නිවැරදියි. මං හොඳටම දන්නවා හෝම්ස් මහත්මයා නිවැරදියි! ජේම්ස් කොහොමටවත් මේ අපරාධය කළේ නෑ.

මහත්මයා. ඔහු තමන්ගේ තාත්තා එක්ක සණ්ඩුවුණු කාරණය මරණ පරීක්ෂකට හෙළි කළේ නැහැ නේද? ඔහු එහෙම හෙළි නොකළේ මං එතැනට සම්බන්ධ නිසා."

"ඔබ සම්බන්ධ නිසා? ඒ කොහොමද?"

"දැන් මේ කාරණා තවදුරටත් මං හංගාගෙන සිටීම සුදුසු නැහැ. මේ ඒකට කාලය නොමෙයි. මං ඔබට ඔක්කොම කියන්නම්. ජේම්ස් සහ ඔහුගේ තාත්තා අතර බහින්බස්වීමක් වුණේ මා ගැන. ඔවුනට බැරිවුණා මා ගැන එකඟතාවයකට එන්න. වයසක මැකාති මහත්මයාට උවමනාව තිබුණේ ජේම්ස් සහ මා අතර විවාහය සිදුවෙනවා දකින්න. ඒ වුණාට අපි දෙන්නා එකිනෙකාට ආදරය කළේ එක පවුලක සහෝදර සහෝදරියන් වගේ. ඔහු ළාබාලයි. ඒ නිසා ඔහුට ජීවිතය ගැන අත්දැකීම් තිබුණේ ඉතාම ස්වල්පයයි. ඉතින් පුදුමයක් නැහැ. මෙවැනි දෙයක් කරන්න ඔහුට මේ වන තුරුත් හිතිල තිබුණෙ නැහැ. ඒ නිසා ඒ දෙන්නා අතර සණ්ඩු ඇතිවුණා. මේකත් එයින් එකක්. මට ඒ ගැන සැකයක් නෑ."

"එතකොට ඔබේ තාත්තා? එහෙම විවාහයකට ඔහුත් කැමැත්තක් දැක්වුවාද?"

හෝම්ස් ඇසීය.

"නැහැ. ඔහුගේත් ඊට කැමැත්තක් තිබුණේ නැහැ. මැකාති මහත්මයාට හැරෙන්න වෙන කිසිකෙනෙකුට එහෙම උවමනාවක් තිබුණේ නැහැ." පැවසූ ඇයගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

දඩි විමසිල්ලෙන් හෝම්ස් තම දෙනෙත් ඇය වෙත යොමු කරගෙන සිටි අයුරු දුටු විටයි.

"මේ තොරතුරු අපට ලබා දුන්නාට මං ඔබට කෘතඥ වෙනවා ටර්නර් මෙනෙවිය. හෙට ඔබේ නිවසට ආවොත් මට ඔබේ පියා හමුවෙන්න පුළුවන්ද?"

"මං දන්නෙ නෑ වෛද්‍යවරයා ඔබට එයට ඉඩදේවිද කියලා."

"වෛද්‍යවරයා?"

"ඔව්. ඇයි ඔබට අහන්න ලැබුණෙ නැද්ද? මගේ තාත්තා අවුරුදු ගණනක් තිස්සේ බොහොම දුර්වලව ජීවත්වෙන කෙනෙක්. මේ සිද්ධිය නිසා ඔහු දැඩි කම්පනයකට පත්වෙලයි ඉන්නේ. දැන් ඔහුට ඇඳෙන් නැඟිටින්න බැහැ. විලෝස් දොස්තර මහත්මයා තමයි ඔහුට ප්‍රතිකාර කරන්නෙ. ඔහු කියන්නේ තාත්තාගේ ස්නායු දැඩි කම්පනයකට පත්වීම නිසා ආබාධිත තත්ත්වයකට පත්වී ඇති බවයි. මගේ තාත්තා ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ඉන්න කාලේ ඉඳන් දන හැඳින සිටි එකම මිත්‍රයා, මැකාති මහත්මයා."

"අහා! වික්ටෝරියා? ඒක හරිම වැදගත්."

"ඔව් ආකර ප්‍රදේශවල."

"අන්න හරි. මං හිතන්නේ රත්රන් ආකර වෙන්න ඇති. ටර්නර් මහත්මයා ඔහුගේ මුදල් උපයාගන්න ඇත්තේ රත්රන් ඉල්ලම් වලින්?"

"ඇත්තෙන්ම ඔව්."

"බොහොම ස්තූතියි ටර්නර් මෙනෙවිය. ඔබ මට ලබාදුන් තොරතුරු හුඟක්ම ප්‍රයෝජනවත්."

"හොඳයි. එහෙනම් ඔබට කරන්න හැකිවුණේ මොනවද කියලා හෙට මාව හමුවුණාම කියන්න. ඔබ ජේම්ස් හමුවෙන්න රක්ෂිත බන්ධනාගාරයට යනව නේද? අනේ ඔහුට කියන්න හෝම්ස් මහත්මයා. කියන්න ඔහු අහිංසකයෙක් බව මං දන්නවා කියලා."

"ඇත්තෙන්ම මං එය දනුම් දෙන්නම් ටර්නර් මෙනෙවිය."

"මං ඉක්මනට ගෙදර යන්න ඕන හෝම්ස් මහත්මයා. ඒ මොකද තාත්තගෙ අසනීපය බොහොම බරපතලයි. මං ඔහුගෙන් ඈත්වෙලා හිටියොත් තාත්තට ඒකට හරියට හිතට අමාරුයි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබට මේ ප්‍රශ්නය විසඳා ගැනීමට දෙවියන්ගේ ආධාරයත් ලැබේවා කියල මං ප්‍රාර්ථනා කරනවා. ආයුබෝවන්."

කාමරයට ඇතුළුවූ වේගයෙන්ම ඇය පිටවී ගියාය. ඇගේ අශ්වකරත්තයේ රෝදවලින් නැඟුණු ශබ්දය මොහොතකින් අපට ඇසෙන්නට ලැබිණි.

"මට ඔබ ගැන ලැජ්ජාත් හිතෙනවා හෝම්ස් මහත්මයා." ලෙස්ට්‍රේඩ් පැවසුවේ තරමක් උඩඟු ලීලාවෙනි.

"කඩකරන්න වෙන බව දැන දැනම ඇයි අර ගැහැනු ළමයට අනවශ්‍ය විදියට බලාපොරොත්තු දුන්නෙ? මං ඕනෙවට වඩා හිත උණුවෙන කෙනෙක් නෙමෙයි. ඒ වුණත් මේ විදියට බලාපොරොත්තු ඇතිකරගන්න ඉඩදීම හරි කුරිරු වැඩක්."

"මට හිතෙනවා ලෙස්ට්‍රේඩ් ජේම්ස් මැකාති නිදහස් කරගන්න මාර්ගයක්, මට සොයාගන්න හැකිවේවි කියල. ඔහුව හිරගෙදරදී හමුවෙන්න ඔබට අවසර පත්‍ර තියෙනවද?" හෝම්ස් ඇසීය.

"ඔව්. ඒ වුණත් ඒ ඔබටත් මටත් පමණයි."

"එහෙම නම්, මං එළියට නොයන්න ගත්තු තීරණය දැන් වෙනස් කරන්න සිද්ධ වෙනවා. හෙරිෆර්ඩ් වෙත ගිහිං අද රෑම ඔහුව දකින්න අපට වෙලා ඇතිවේවි නේද?"

"ඕනෙ තරම් ඇති."

"එහෙම නම් අපි යමු. වොට්සන් ඔබට නම් ටිකක් කම්මැලි හිතේවි. ඒ වුණත් මට එහේ ගතකරන්න වෙන්නෙ පැය කිහිපයක් පමණයි."

මම ඔවුන් දෙදෙනා සමග දුම්රියපොළ දක්වා ඇවිද ගියෙමි. ඒ කුඩා නගරයේ වීථි වල ඇවිදිමින් මඳ වේලාවක් ගතකොට, මම ආපසු හෝටලයට පැමිණියෙමි.

සෝපාවේ, වැතිරී නවකථා පොතක් කියවීමට ගත්තත්, එය මගේ සිත ඇදගැනීමට සමත් නොවීය. මගේ සිතට නැවත නැවතත් මතුවී ආවේ, මේ අපරාධය හා බැඳුණු සිදුවීම්ය. මම පොත ඉවතට විසිකර දැමුවෙමි.

මේ අවාසනාවන්ත තරුණයා පැවසූ සාක්ෂිය අකුරක් නෑර සම්පූර්ණ සත්‍යයමයි සිතුවොත් අප එන්නේ කොතැනටද? ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

පියාගෙන් ඈත්වී ගිය මොහොතේ සිට, විලාප හඬ ඇසුණු මොහොත දක්වා ඉතාම කෙටි කාලය තුළ මහල්ලා ඛේදජනක ලෙස මරණයට පත්වූයේ කෙසේද? ඔහු ලැබූ තුවාල වල හැටි මගේ වෛද්‍ය විද්‍යාත්මක දැනුමෙන් තක්සේරු කර බැලිය යුතුය. එවිට මට ගැනීමට හැකිවන නිගමනය කුමක්ද යන්න, ගැටලුව විසඳීමට වැදගත්වනු නොඅනුමානය. මම යීනුව නාදකොට හෝටල් සේවකයා කැඳවීමි.

"පහුගිය දින කීපයේ මේ ප්‍රාන්තයේ පළවූ පුවත්පත් මට ගෙනැවිත් දෙන්න පුළුවන්ද?"

"ඔව් මහත්මයා." කියූ සේවකයා ඒවා මට නොපමාව ලබාදුන්නේය. මට අවශ්‍යව තිබූ තොරතුරු පුවත්පත් වල පළවී තිබිණ.

"අධිකරණ ශල්‍ය වෛද්‍යවරයාගේ නිරීක්ෂණ මෙසේයි :

හිසේ වම පාර්ශ්වික කපාල අස්ථියේ පිටුපස තුනෙන් එකක කොටස සහ අපර්කපාල අස්ථියේ වම පැත්තේ අඩක් පමණ සම්පූර්ණයෙන්ම කැබලි වී යනසේ බිඳී ගොස් ඇත. මෙය මොට ආයුධයකින් එල්ල වූ ප්‍රබල ප්‍රහාරයක් නිසා සිදුවූ එකක් යයි කිවහැක."

මේ විස්තර කර ඇති පෙදෙස, මම මගේ හිසේ අතගා බැලීමි. පැහැදිලි ලෙසම මේ පහර එල්ල වී ඇත්තේ පිටුපසිනි. මෙය තරුණ ජේම්ස්ගේ වාසියට හේතුවක් විය හැකි සාක්ෂියකි. ඒ කුමක්නිසා ද යත්, ඔහු පියා සමඟ සණ්ඩු සරුවල් වෙද්දී සිටින්නට ඇත්තේ මුහුණට මුහුණ බලාගෙනයි. එහෙත් මෙයින් විත්තිකාරයාට සම්පූර්ණ වාසියක් සැලසෙන්නේ නැත. පහර එල්ල වීමට පෙර මහලු මැකාති ආපසු හැරුණා විය හැකියි. කෙසේ වෙතත් මෙය හෝම්ස්ගේ අවධානය ලක් කළ යුතු කරුණකි.

මීළඟට අප සිතාබැලිය යුත්තේ, අවසන් හුස්ම හෙළමින් සිටි පුද්ගලයාගේ මුවෙන් නිකුත් වූ "රට්" හෝ "රැට්" යන වචනයටයි. මෙහි තේරුම කුමක්ද? එය මරුවිකල්ලෙන් කළ දෙඩවීමක් යයි සිතිය නොහැක. හිසට එල්ල වූ පහරකින් එක්වරම මියයන කෙනෙකුගේ සිහිවිකල් වීමක් සිදුනොවේ. මෙය නිසැකවම තමාට ඒ ඉරණම අත්වූ හැටි තේරුම් කරදීමට මැකාති කළ උත්සාහයක් විය යුතුය. නමුත් එම වචනයෙන් අදහස් වන්නේ කුමක්ද? ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රහේලිකාව විසඳිය හැකි ආකාරයක් මම මගේ සිතට වධ දෙමින් කල්පනා කළෙමි.

අනතුරුව අපේ අවධානය යොමු කළ යුත්තේ, තරුණ මැකාති විසින් දුක ඇති අළු පැහැති රෙද්ද ගැනයි. මෙය ඇත්තක්ද? එසේ නම් මිනීමරුවා අනිත් ඔහුගේ ඇඳුමේ යම් කොටසක් ප්‍රහාරය එල්ල කිරීමේදී බිම වැටුණා වීමට ඉඩ ඇත. සමහර විට ඒ මිනීමරුවා හැඳ ආ කබායක් වුවද විය හැක. පැනයද්දී ඇදවැටුණු කබාය, ඔහු ආපසු පැමිණ ගෙනගියා විය යුතුය. තරුණයා මළසිරුරට පියවර කිහිපයක් නුදුරේන්, පිටුපස හරවාගෙන දණගසා ගෙන සිටියදී, ආපසු ඇවිත් කබාය ගෙන ගියේ නම්, මේ මිනීමරුවා ඉතා නිර්භය කෙනෙකු විය යුතුය. මෙය, වියහැකි මෙන්ම විය නොහැකි කාරණා රැසක් එකට පැටළුණු පුදුමාකාර අභිරහසක් නොවේද? ලෙස්ට්‍රේඩ් ගෙන තිබූ නිගමනය ගැන, මා පුදුමයට පත්වූයේ නැත. එහෙත් ෂර්ලොක් හෝම්ස් සතු, යමක් විනිවිද දැකීමේ හැකියාව ගැන මගේ දැඩි විශ්වාසයක් තිබිණ. තරුණ මැකාති අහිංසකයෙක් බව සනාථ කරන සාක්ෂි රැසක් සොයාගැනීමට හෝම්ස් සමත්වෙනවා නිසැකයි.

මගේ මිත්‍රයා ආපසු පැමිණෙන විට බොහෝ ප්‍රමාද වී තිබිණ. ඔහු ආවේ තනිවමයි. ලෙස්ට්‍රේඩ් බොස්කෝම්බ්හි තානායමක ලැගුම් ගත් බව හෝම්ස් කීය.

"අද රෑට නොවැස්සොත් අපට ලොකු පිහිටක් වොට්සන්. ඒ මොකද ජලාශය අවට තණබිම, සියුම්ව පරීක්ෂා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ඒක කරන්න ඉස්සර වෙලා මහ වැස්සක් කඩාහැළුණොත් අපට කිසිදෙයක් බලාගන්න බැරුව යනවා."

"ඉතින් ඇයි ඔබ ගිය වෙලාවෙම ඒක කළේ නැත්තෙ?"

"ඒ වගේ සියුම් පරීක්ෂණයක යෙදෙන්න සුදුසු ශාරීරික තත්ත්වයක මං හිටියෙ නෑ වොට්සන්. එවැනි කටයුත්තක යෙදෙන්න නම් ඇඟට බොහොම සුවදායක, සංවේදී ඉන්ද්‍රියයන් ඉහළම තත්ත්වයක තිබෙන අවස්ථාවක් විය යුතුයි. දීර්ඝ දුම්රිය ගමනකින් ඇතිවුණු වෙහෙස මහන්සිය නිසා මේ කටයුත්තේ යෙදෙන්න මං කැමැති වුණේ නැහැ. ඒ වෙනුවට මං මැකාති තරුණයා හමුවෙන්න ගියා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවද ඔබට ඔහුගෙන් දැනගන්න ලැබුණේ?"

"කිසිවක් නෑ."

"සිද්ධිය තවත් පැහැදිලි වෙන යමක් කියන්න ඔහුට හැකිවුණේ නැද්ද?"

"කිසිවක් නෑ. මට වැරැක්කිහ හිතුණා, මේක කළ පුද්ගලයා කවුද කියලා ජේම්ස් මැකාති හොඳින් දන්නවා; නමුත් තරුණයා හදන්නේ ඒ අපරාධය කළ තැනැත්තා හෝ තැනැත්තිය අපට වසන් කරන්නයි. නමුත් දැන් මට විශ්වාසයි. මේක කළේ කවුද කියන එක ගැන ඔහුත් අනෙක් අය වගේම ප්‍රහේලිකාවකට මැදිවෙලා. පෙනුමෙන් ඔහු බොහොම කඩවසුම්. මට හිතෙන හැටියට කරුණාබර හදවතක් ඇත්තෙත්. නමුත් තීක්ෂණ බුද්ධියක් ඇත්තෙත් කියල මට කියන්න අමාරුයි." හෝම්ස් කීය.

"ඔහුගේ රුචිකත්වය ගැන නම් මට තේරුම් ගන්න හරි අමාරුයි." මම කීවෙමි. "බලන්න මේ තරම් ලස්සන හුරුබුහුටි ටර්නර් මෙනෙවිය වගේ තරුණියක් සමග විවාහ වෙන්න, ඔහු කැමැත්තක් නොදක්වන එක?"

"ඔතැන තියෙනවා වොට්සන්, හරි කණගාටුදායක කථාවක්. මේ ඉලන්දාරියා අවුරුදු දෙකකට වගේ ඉස්සර, ටර්නර් මෙනෙවිය ගැන පිස්සු වැටිලා වගේ ආදරයෙන් ඉඳලා තියෙනවා. ඒ කාලෙදි ඇය, ඔහුව හරිහැටි අඳුනාගෙන, ඉඳලත් නැහැ. ඒ මොකද ටර්නර් මෙනෙවිය අවුරුදු පහක පමණ කාලයක් මෙහෙන් ඈත පළාතක, කාන්තා විද්‍යාලයක නේවාසිකාගාරයේ නැවතී ඉගෙනුම ලබල තියෙනවා. ඒ අතරේ මේ මෝඩයා මොකක්ද කරගෙන තියෙන්නේ? බ්‍රිස්ටල් නගරයේ තැබෑරුමක බීම අල්ලන වේටර්වරියකට අහුවෙලා. ඒ මදිවට ඔහු විවාහ ලියාපදිංචි කිරීමේ කාර්යාලයකට ගිහිං, ඇය එක්ක නීත්‍යානුකූලව විවාහත් වෙලා. කිසිකෙනෙක් ඒ ගැන එක වචනයක් දන්නෙ නෑ. ඉතින් ඔබට හිතාගන්න පුළුවන්ද වොට්සන්, ඇතිවී තිබෙන තත්ත්වය? මිනෑම පරිත්‍යාගයක් කරල ඔහු විවාහ වෙන්න කැමැත්තෙන් හිටි තරුණිය පෙනෙන්න ඉන්නවා. තාත්තාත් ඔහුට දසවධ දෙනවා මේක කරගන්න කියලා. නමුත් එහෙම විවාහයක් කොහොමටවත් කරන්න බැරිබව ඔහු විතරයි දන්නේ. ඉතින් මිනිහෙකුට පිස්සු හැදෙනවා නේද?

http://sherlockholmesinvestigations.blogspot.com

එදා ජලාශය ළඟදී, ටර්නර් මෙනෙවියට විවාහ යෝජනාවක් කළ යුතුයි කියලා තාත්තා තර්ජනය කළාලු. ඒ වෙලාවෙ තරුණයා, අන්න අර පිස්සුවෙන් වගේ තමයි දැන් ඔසවාගෙන තාත්තා එක්ක මහ සණ්ඩුවක් වෙලා තියෙන්නෙ. අනෙක් අතට, තමන් කරගෙන තිබුණු විවාහය ගැන තාත්තාට දනුම් දෙන්න, තරුණ ජේම්ස්ට හැකියාවක් නෑ. ඒ මොකද ඔහුට කිසිම රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් නෑ. ඔහු සම්පූර්ණයෙන්ම යැපුණේ තාත්තාගෙ පිහිටෙන්. තාත්තා බොහොම සැරපරුෂ, තද හිතක් තිබූ කෙනෙක්. බීම හලක සේවිකාවක් හිතුමතේට විවාහ කරගත් බව මහලු මැකාතිට ආරංචි වුණා නම්, ඔහු ජේම්ස්ව ගෙදරින් අන්නා දමනවා. මේ බව පුතා දනහිටියා. ජේම්ස් බ්‍රිස්ටල් නගරයට ගිහිං දින තුනක් ගතකොට තිබුණේ ඔහුගේ බිරිඳත් සමඟයි. තාත්තා දනගෙන හිටියේ නැහැ පුතා ගියේ කොහේද කියලා. අන්න ඒ කාරණාව හොඳට මතක තියාගන්න වොට්සන්. ඒක හරිම වැදගත්.

ඊළඟට තවත් එකක්. හැම කළු වලාකුළකම රිදී රේඛාවක් තියෙනවා කියනවා නේ, මිනීමැරීමේ චෝදනාව එල්ල වීමෙන් තරුණ මැකාතිට පොඩි වාසියක් වුණා. අර බීමහල් සේවිකාව - ජේම්ස්ගේ බිරිඳ, පත්තරවලින් දනගත්තා තම සැමියාට මිනීමැරීමේ චෝදනාවක් එල්ල වී ඇති වග. ඒ අනුව ඔහු වරදකරු වෙලා, කොයි මොහොතේ හෝ තරුණයා එල්ලුම් ගහට නියම වීමට ඉඩ ඇති බව ඇයට වැටහුණා. ඒ ගැනි මොකද කළේ වහාම තරුණයාගෙන් අයින්වුණා. ඇය ජේම්ස්ට මෙහෙම ලියා දන්නුවලු.

"තමුසෙත් එක්ක මගේ ඇති සම්බන්ධය මෙතනින් ඉවරයි. මං දනටමත් කසාද බැඳලා. මගේ ස්වාමිපුරුෂයා බර්මියුඩා වරායේ සේවකයෙක්. ඔහේ එක්ක මින් ඉදිරියට මගේ කිසිම බැඳීමක් නෑ."

මං හිතන්නේ මේ තරම් දවසක් හිතෙන් අප්‍රමාණ විධියට දුක් විඳපු මැකාති තරුණයාට ඒ ආරංචියෙන් ලොකු සැනසීමක් ලැබිලා."

"හොඳයි තරුණයා අහිංසක නම් කවුද මේ අපරාධය සිදු කළේ?"

"අහා! කවුද? කවුද මේ අපරාධය සිදු කළේ? අන්න ඒක තමා ප්‍රශ්නය. වොට්සන් මං කැමතියි ඉතාම වැදගත් කාරණා

http://sherlockholmesinvestigations.blogspot.com

දෙකකට ඔබේ අවධානය යොමු කරනවා නම්. පළමුවැනි එක මේ මියගිය තැනැත්තා බොස්කෝම්බ් ජලාශය ළඟදි කවුරු හරි හමුවෙන්න කල්තබා සූදානමක් කරගෙන හිටියා. ඒ තැනැත්තා ඔහුගේ පුතා වෙන්න බෑ. ඒ මොකද පුතා දවස් තුනක් තිස්සේ ගෙදරින් පිටත ගිහින් හිටියේ. ඔහු ආපහු එන්නේ කවදටද කොයි වෙලාවටද කියන එක වත්, තාත්තා දැනගෙන හිටියෙ නෑ. දෙවැනි කරුණ අහගන්න. පුතා මේ ජලාශය ඇත්තට ආවද කියල කිසිම දෙයක් නොදන්න මහලු මැකාති, "කූ" කියල සංඥාවක් කරන හඬක් ඇහුණා. මේ අපරාධය විසඳීම කෙරෙහි බලපාන ප්‍රධාන කාරණා දෙක ඒවායි. හරි. දැන් ඉතින් මේ අපරාධයට සම්බන්ධ හැම කරුණක්ම මෙට වෙනතුරු පැත්තකින් තියමු. අපි හිත් යොමු කරමු වෙනත් දෙයකට. කථා කරමු මෙරිඩිත් ගැන. . . ."

හෝම්ස් අපේක්ෂා කළ ලෙසම එදා රාත්‍රියේ වර්ෂාවක් නොතිබිණි. පසුවදා හොඳින් හිරු පෑයූ දීප්තිමත් දවසක් විය. උදේ නවය වෙද්දී ලෙස්ට්‍රේඩ් අශ්වකරත්තයකින් හෝටලයට පැමිණියේය. හාදර්ලි ගොවිපොළට හා බොස්කෝම්බ් ජලාශය දෙසට යාමේ අරමුණෙන් අපි එතැනින් පිටත්වීමු.

"තවත් කණගාටුදායක ආරංචියක් ලැබුණා." ලෙස්ට්‍රේඩ් කථාව ඇරඹුවේය.

"අර ටර්නර් මෙනෙවියගේ පියා - වයස්ගත ටර්නර් මහත්මයා, බොහොම බරපතල ලෙස රෝගාතුර වෙලාලු. ඔහුගේ ජීවිතය බේරාගැනීමට හැකිවේවි කියල වෛද්‍යවරුන්ගේ විශ්වාසයක් නැහැ."

"බොහොම වයස්ගත කෙනෙක් මං හිතන්නේ?" හෝම්ස් ඇසීය.

"වයස අවුරුදු හැටක් විතර. විදේශ රටක ජීවත්වෙලා, මුහුණපාන්න වුණු දුෂ්කර ජීවිතය නිසා ඔහු ස්වභාවයෙන්ම දුර්වල සිරුරක් තියෙන කෙනෙක්. මෑතක සිට සෞඛ්‍ය තත්ත්වය වඩාත් නරක අතට හැරිල බවයි අහන්න ලැබුණේ. මේ අපරාධය ඔහුගේ හිතට දරාගන්න බැරි පහරක් වුණා. ඔහු මැකාති මහත්මයාගේ පරණම මිත්‍රයෙක්. ඒ නිසා මැකාති මහත්මයාට බොහොම උදව් උපකාර කරල තියෙනවා. ගොවිපොළ පවත්වාගෙන ගිහින් ආදායමක් ලබාගන්න කියල, හාදර්ලි ගොවිපොළ ඔහු මැකාතිට දීල තියෙන්නෙ කිසිම බද්දක් අයකර නොගෙන."

http://sherlockholmesinvestigations.blogspot.com

"හැබැට? ඒක අහන්නත් ආශ්‍ර්‍ය වගේම පුදුම හිතෙන දෙයක්!" හෝම්ස් කීය.

"ඇත්තෙන්ම ඔව්! ටර්නර් මහත්මයා මැකාතිට සියදහස් වාරයක් උදව්කරලා ඇතිලු. ටර්නර්, මැකාතිට දක්වූ කරුණාව ගැන, මේ පැත්තේ හැමෝම කථාකරනවා මට අහන්න ලැබුණා."

"ඇත්තට?" හෝම්ස් ඇසීය.

"ඔබට මෙතැන මොකුත් අමුත්තක් පෙනෙන්නෙ නැද්ද ලෙස්ට්‍රේඩ්? තමන්ගෙම කියල කිසිම දෙයක් නැති මැකාති, ටර්නර්ගෙන් සියලුම උදව් උපකාර ලබාගෙන ජීවත්වෙනවා. එහෙම ජීවත්වෙන ගමන්, තමන්ගෙ පුතාට ටර්නර්ගෙ දුව විවාහ කර දෙන්න කියලත් ඉල්ලා හිටිනවා. මේක හරිම අකාරුණික දෙයක් වගෙයි නේද? ඒ මොකද ටර්නර්ගෙ දුවම අපට කිව්වා ඇගේ පියා මේ විවාහයට අකැමැති බව. එහෙම තිබෙද්දී, ටර්නර්ගේ ලක්ෂ ගණනක දේපොළ හැම දෙයක්ම උරුම වෙන දුව, තමන්ගේ පුතාට බන්දල දෙන්න කියල මැකාති කරන ඉල්ලීම? මේකෙන් ඔබට ගතහැකි නිගමනය මොකක්ද ලෙස්ට්‍රේඩ්?"

"ඔහෝ! ඔන්න එහෙනම් අපි නිරීක්ෂණය කිරීමේ සහ නිගමන ගැනීමේ අවස්ථාවටත් ආවා."

ලෙස්ට්‍රේඩ් කීවේ මා දෙස බලා ඒක් ඇසක් වසමින් ඉඟිකරමිනි.

"හෝම්ස් මහත්මයා. මං දන් ඉන්නේ මේ ලැබිල තියෙන සාක්ෂි ටික එකට ගළපගන්න වත්, සකස් කරගන්නවත් බැරිව. නිරීක්ෂණයි, නිගමනයි, උපකල්පනයි පස්සෙ එළවගෙන යන්න මට කොහොමටවත් හැකියාවක් නෑ."

"ඔබේ කථාව සම්පූර්ණ ඇත්ත."

හෝම්ස් කීවේ බැරෑරුම් ස්වරයෙනි.

"සාක්ෂි ටික එකට ගළපා ගැනීම හරි දුෂ්කර වැඩක්."

"ඒ කොහොමවුණත් හෝම්ස් මහත්මයා ඔබට හොයාගන්න බැරිවුණු එක් වැදගත් කාරණයක් මං හොයාගත්තා."

"මොකක්ද ඒ?"

"වයස්ගත මැකාති මැරුම් කෑවේ තරුණ මැකාති අතින්. ඊට විරුද්ධ උපකල්පන තියෙනවා නම් ඒ හැම එකක්ම හිතේ මවාගත් සිහින."

http://sherlockholmesinvestigations.blogspot.com

"කිසිවක් නොපෙනෙන ඝන මීදුමට වඩා, සිතේ මවාගත් සිහින අලංකාරයි නේද ලෙස්ට්‍රේඩ්? මට වැරැදීමක් නොවෙයි නම් මේ අපේ වම් පැත්තෙන් දිස්වෙන්නේ හාදර්ලි ගොවිපොළ වෙන්න ඇති?"

"ඔව්. එය තමා."

එය ඉතා විශාල බිම් ප්‍රමාණයක විහිදුණු තට්ටු දෙකේ ගොඩනැගිල්ලක් විය. අළු පැහැති බිත්ති, කහ පැහැති පුස් හා පැල්ලම් වලින් වැසී තිබිණි. අපි දොරට තට්ටු කළෙමු. සේවිකාවක් පැමිණ දොර විවෘත කළාය. ලෙස්ට්‍රේඩ් හඳුනාගත් ඇය, අපට අවශ්‍ය දේ නොපමාව සැපයීමට ඉදිරිපත් වූවාය.

"මට උවමනායි වයසක මැකාති මහත්මයා මරණය සිදුවෙන වෙලේ හැඳසිටි සපත්තු කුට්ටම, සහ ජේම්ස් මැකාති මහත්මයා එදා හැඳසිටි සපත්තු."

ඇය නිවස තුළින් සපත්තු කුට්ටම් දෙකක් ගෙන ආවාය.

"ලොකු මහත්තයා ඒ අවලාවේ පැළැඳගෙන හිටියේ මේ සපත්තු කුට්ටම. ජේම්ස් මහත්මයා හැඳ සිටියේ ඔහු සාමාන්‍යයෙන් ඉවත යන විට පළඳින සපත්තු. ඒක දන් නිවසේ නැහැ."

"හොඳයි. එහෙනම් ඔහුගේ වෙනත් සපත්තු කුට්ටමක් මට දෙන්න."

අවශ්‍ය ඒවා ලැබුණු පසු, එකම සපත්තුව තැන් හතකින් හෝ අටකින් නොයෙක් ආකාරයෙන් මැන බැලූ හෝම්ස් සෑහීමට පත්විය.

"එහෙනම් අපි මිදුලටත් ගිහිං, ඊට පස්සේ බොස්කෝම්බ් ජලාශය පැත්තට යමු."

තමාට ඉව ඇල්ලිය හැකි වැදගත් යමක් ලැබුණු පසු, ෂර්ලොක් හෝම්ස්ගේ ස්වභාවය තරමක් වෙනස්වීම සාමාන්‍ය සිරිතයි. බේකර් වීථියේ සැප පුටුවකට වී පයිප්පය උරමින්, තර්කානුකූලව නිගමන වලට එළඹෙන චින්තකයා මෙවිට දක්නට ලැබෙන්නේ නැත. මෙවිට ඔහුගේ මුහුණ තදින් රත්පැහැ වෙයි. ඇස්බැමි දෙක එකට ලංවන්නේ කළු ඉරිකැලි දෙකක හැඩය ගනිමිනි. දෑස් දීප්තිමත් වේ. ඔහු දෙතොල් එකට තදකරගෙන, මුහුණ පහතට නමා ගනී. මෙවැනි අවස්ථාවල ඔහුගේ බෙල්ලේ ලේ නහර එළියට ඉලිප්පී, මතු වී

http://sherlockholmesinvestigations.blogspot.com


පෙනෙන හැටි, මා හොඳින් දක පුරුදු දෙයකි. ගොදුරක් ලුහුබැඳ යන සුනඛයෙකුගේ මෙන් නාස්පුඩු විශාල කරගන්නා ඔහු, වේගයෙන් හුස්ම ඉහළ පහළ හෙළන්නට පටන් ගනී. මෙවැනි වෙලාවලදී අප කිසිවෙකු කරන ප්‍රකාශයක් හෝ අසන ප්‍රශ්නයක් හෝම්ස්ගේ කනට නම් වැටෙන්නේ නැත. යම් විදියකින් එය ඔහුගේ අවධානය බිඳින කාලේ එකක් වුවහොත්? එවිට නම් කෝපාවිෂ්ඨ කෑගැසීමක් හෝම්ස්ගෙන් පිළිතුරු වශයෙන් ලැබෙනු ඇත!

තණබිම්, ලඳු කැලෑ මැදින් වැටුණු අඩිපාර දිගේ හෝම්ස් ඉදිරියට ගමන් කළේය. ගමන ඉක්මන්ය. එහෙත් ඔහු නිහඬය. ඒ ගමන් කළේ බොස්කෝම්බ් ජලාශය දෙසටයි. ජලාශයෙන් ගලා අා දිය සීරාව නිසා වටේට පිහිටි තණබිම, දියෙන් පෙඟුණු මඩ සහිත වගුරු බිම් පෙදෙසක් බවට පත්වී තිබිණි. අඩි පාරේත්, ඒ දෙපස වූ කෙටි තණකොළ සහිත ඉවුරු වලත් අඩි සටහන් රාශියක් සලකුණු වී ඇති අයුරු මම දුටුවෙමි.

හාදර්ලි ගොවිපොළේ සිටම හෝම්ස් ඉදිරියට ගමන් කළේ, තම දෙනෙත් පා සටහන් වෙත යොමු කරගෙනයි. මඩ බිම් පෙදෙසට ළං වෙද්දී ඔහු තම අවධානය වඩාත් තීව්‍ර කළේය. විටෙක වේගවත් ගමනින් ඉදිරියට ගිය ඔහු විටෙක නැවතුණේය. වරක් ඔහු අඩි පාරෙන් ඉවත් වී තණ කොළෙන් වැසුණු පෙදෙසේ ඉදිරියට ගියේය. ලෙස්ට්‍රේඩ් සහ මම අපේ මිත්‍රයා පසුපස ගියෙමු. හෝම්ස් ඉදිරියට තැබූ සෑම පියවරක්ම, කළ ක්‍රියාවක්ම මා නිරීක්ෂණය කළේ දැඩි ආශාවකිනි; එමෙන්ම උනන්දුවකිනි. ඔහුගේ ඒ සෑම ක්‍රියාවක්ම යොමු වී ඇත්තේ, නිශ්චිත අරමුණකට ළඟාවීමට බව මම දැන සිටියෙමි. එහෙත් ලෙස්ට්‍රේඩ් ඉදිරියට ගමන් කළේ තරමක් උදාසීන ආකල්පයකිනි.

බොස්කෝම්බ් ජලාශය පළලින් අඩි පනහක් පමණ වූ වැවක් වැනි ස්ථානයක් විය. එහි ඉවුර වටකරමින් පන් ගස් වලින් වැසුණු තීරයකි. ජලාශය පිහිටා තිබුණේ එක් පසෙකින් හාදර්ලි ගොවිපොළට අයත් ඉඩමටත්, අනෙක් පැත්තෙන් ටර්නර් මහතාට අයත් වතුයායටත් මායිම්වන අයුරෙනි. ජලාශයේ ඈත කෙළවර, කැලෑරොදකින් වැසී තිබිණ. කැලෑ රොදේ පිහිටි ගස් වලට ඉහළින් ටර්නර් මහතාගේ මන්දිරයේ රතු පැහැති වහළ අපට දකගැනීමට හැකිවිය. ජලාශයෙන් එහා හාදර්ලි ගොවිපොළ පැත්තට වන්නට පිහිටි කැලෑරොද

http://sherlockholmesinvestigations.blogspot.com




246. බොස්කෝම්බ් ජලාශය අවට පෙදෙසේ දළ සිතියමක්.

Reading Purpose Only, Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

තරමක් ඝනව වැවී තිබිණි. මෙම කැලෑරොදටත්, ජලාශයේ ඉවුරටත් අතර පියවර විස්සක් පමණ පළල තණබිම් තීරුවක් විය.

"හෝම්ස් මහත්මයා. මළසිරුර වැටී තිබුණේ මෙන්න මෙතැනයි." ලෙස්ට්‍රේඩ් අපට පෙන්වා දුන්නේය.

මඩ සහිත ගතිය නිසා පොළොව කොතරම් මෘදු වී ද යත්, මැකාති බිම ඇද වැටීම නිසා ඇතිවුණු සලකුණු එහි පැහැදිලිව දැකිය හැකිවිය. කිහිප දෙනෙකුගේ පා වලට පෑගුණු තණබිමෙන් හෝම්ස්ට නම් කරුණු රාශියක් අවබෝධ කරගැනීමට හැකිවුවා විය යුතුය. ඔහුගේ නොඉවසිලිමත් මුහුණෙන් හා දිදුලන දෑසින් මම ඒ බව වටහා ගතිමි. තණබිම් කඩ එටා හෝම්ස් කිහිපවරක් දිව ගියේ ඉව අල්ලන සුනඛයෙකු විලසිනි. අවසානයේ ඔහු පොලිස් නිලධරයා දෙසට හැරුණේය.

"ලෙස්ට්‍රේඩ් මොකටද මේ ජලාශයට බැස්සෙ?"

"මං රේක්කයක් අරගෙන වතුරට බැහැල, සියුම්ව පරීක්ෂා කරල බැලුවා. මට හිතුණා මිනීමැරීමට යොදාගත් ආයුධය හෝ වෙනත් යමක් එහි තිබේවි කියලා. ඒ වුණත් ඔබ කොහොමද. . . ."

"ෂඃ ෂඃ අර ඇතුළු පැත්තට ඇඹරුණු ඔබේ වම් කකුලේ සටහන පොළොවේ හැම තැනකම වැදිලා. ඒක හොයාගන්න පුළුවනි ඌරු මීයෙකුට වුණත්. අයියෝ! සිද්ධිය වුණු ඉක්මනින් මෙතැනට ඇවිත් මට මේ තණබිම පරීක්ෂා කරල බලන්න ලැබුණා නම් මොන තරම් පහසුවක් වෙනවද. දැන් මෙතැන මීහරක් රංචුවක් ඇවිත් පොළොව සීසාල ගියා වගේ. අඩි සටහන් ඔක්කොම විනාශ වෙන්න ගිහිං. විවේකාගාරය භාරකරුගේ සෙනග ඇවිත් තැබූ ලකුණු තමා මේ තියෙන්නෙ. මළසිරුරෙ ඉඳන් අඩි 6 ක් 8 ක් දුරට තිබුණු සලකුණු ඔවුන්ගේ පා සටහන් වලින් වැසී ගිහින්. නමුත්. . . . මේ තියෙන්නෙත්. . . . එකම පුද්ගලයාගේ දෙපා වලින් ඇතිවුණු පා සටහන් පේළි තුනක්."

කුඩා දේ විශාල කොට බලන කාචය අතටගත් හෝම්ස්, වැහිකබාය බිම අතුරා ඒ මත වැතිරුණේය. මීළඟට තම මුහුණ පොළොවටම ළං කරගත් ඔහු, කාචයේ ආධාරයෙන් ඒ පා සටහන් තවදුරටත් පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. ඔහු දිගින් දිගටම යමක් මුමුනනු මට . යන්තමින් ඇසිණ. ඒ අපට පැවසූ දෙයක් නොව තමාටම කියාගත් දෙයක් ලෙස මම තේරුම් ගතිමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ තියෙන්නේ මැකාති තරුණයාගේ අඩි සලකුණු. ඔහු දෙපාරක් මෙතැනට ඇවිද ආ ලකුණු තියෙනවා. එක සැරයක් ඔහු ඇවිත් තියෙන්නේ වේගයෙන් දුවගෙන බව කිව හැකියි. සපත්තු අඩියේ ඉදිරි කොටස මඩ පොළොවට හෑරිලා වගේ. විලුඹ හරිය බිමට වැදී නැති තරමයි. ඔහු දී තිබුණු සාක්ෂිය ඒකෙන් තහවුරු වෙනවා.

ඔහුගේ පියා බිම වැටී සිටි හැටි දැක්කාම මැකාති තරුණයා ඉදිරියට දුවගෙන ඇවිත් තියෙනවා. එතකොට මේ තියෙන්නේ වයසක මැකාති ඉහළ පහළ සක්මන් කරමින් හිටි අඩි සලකුණු. එහෙම නම් මේ සලකුණු මොකක්ද? ආ. . . . ඒ තුවක්කු මිට බිමට වැදුණු ලකුණ. පියාගේ කථාවට සවන් දෙමින් තරුණ මැකාති හිටියේ තුවක්කු මිට බිම තබාගෙන. ඊළඟට මේ මොකක්ද? හා! හා! මේ මොනවද? සපත්තුවේ පා ඇඟිලි කොටස පමණක් බිමට වදින සේ ඉදිරියට ආ ලකුණු. මේ බූට්ස් සපත්තුවේ ඉදිරි කොටස හතරැස්; තරමක් අසාමාන්‍ය ආකාරයක එකක්. ඔන්න ඒ අඩිසටහන් ඉදිරියට ආවා. ආපසු ගියා, නැවත් සැරයක් ආවා. ඒ බිම වැටී තිබුණු පිට කබාය අරගන්න. හොඳයි අපි දැන් බලමු. ඒ අඩි සටහන් මෙහේට ආවේ කොහෙන්ද කියලා?"

අඩි සටහන් දෙසම නෙත් යොමු කරගෙන හෝම්ස් තණබිමේ ඉහළ පහළ දිව්වේය. ඒ අඩි සටහන් විටෙක නොපෙනී ගිය අතර, විටෙක යළි දිස්විය. තණබිම්කඩ අවසන් කොට ඉදිරියට ගිය හෝම්ස්, මීළඟට පිවිසුණේ කැලෑරෝදටයි. එයට ඇතුළුවී මඳ දුරක් ගිය ඔහු යෝධ බීච් ගසක් සෙවණේ නැවැතුණේය. හෝම්ස් පසුපස ගිය අපි ද එතැනට ළඟාවීමු. එය, මේ කැලෑරොදේ පිහිටි විශාලම වෘක්ෂයයි. ගසේ මුලට සමීප පෙදෙස සියුම් පරීක්ෂාවකට ලක්කිරීමකට මගේ මිත්‍රයා පටන් ගත්තේය. යළිත් වරක් මුනින් අතට බිම වැතිරුණු ඔහු, කාචය ද ඇසට ළං කරගෙන විමසිලිමත් විය. එය අවසන් වුණේ හෝම්ස්ගේ මුවෙන් නැඟුණු ජයග්‍රාහී හඬකිනි.

ඉන්පසු මගේ මිත්‍රයා සෑහෙන වේලාවක් එතැන පරීක්ෂාවට ලක් කළේය. ගස් වලින් වැටී තිබුණ වියළුණු කොළ එකින් එක ගෙන ඒවා දෙපැත්තම පෙරළා බලා සෝදිසි කළ හෝම්ස්, කුඩා කෝටු කැබැලි එකතුකොට ඒවා ද පරීක්ෂාවට ලක් කළේය. මීළඟට

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු බිම තිබුණු දූවිලි වැනි ද්‍රව්‍යයක් ලියුම් කවරයකට එකතු කර ගත්තේය. අනතුරුව බිව් ගසේ කඳ වටේටම කාචයේ ආධාරයෙන් පරීක්ෂා කර බැලුවේය. ඔහු ගසට නුදුරින් පාසි වැවී තිබුණු තැනක වූ උල් සහිත තුඩක් තිබූ ගලක් අතට ගෙන සෝදිසි කර බලා, එය තම සාක්කුවට දමා ගත්තේය. අවසානයේ කැලෑරොද මැදින් වැටී තිබුණු අඩිපාර පරීක්ෂා කරමින් ඉදිරි ගමන ඇරඹුවේය. මීළඟට අප පැමිණියේ මහා මාර්ගය වෙතටයි. එතැනදී පා සටහන් සියල්ල අතුරුදන් විය.

"මේක හරිම සිත්ගන්නා සුලු පරීක්ෂණයක්." හෝම්ස් කීවේ යළිත් සාමාන්‍ය තත්ත්වයකට පත්වෙමිනි.

"මේ දකුණු පැත්තේ තිබෙන අළුපාට නිවස, මං හිතන්නේ දඩබිමේ විවේකාගාරය භාරකරුගේ නිවාසය වෙන්න ඇති. මං කැමතියි ගිහිල්ල, ඒ මනුස්සයා, මොරාන් එක්ක වචනයක් දෙකක් කථාකරල එන්න. ඒ ගමන් පොඩි ලියුම් කැබැල්ලකුත් ලියාගන්න පුළුවනි. ඒවා අවසන් කළාට පස්සේ අපට දවල් කෑම සඳහා යන්න පුළුවනි. වොට්සන්, ලෙස්ට්‍රේඩ් ගිහිං අශ්වකරත්තයට නගින්න. මං ඉක්මනට එනවා."

හෝම්ස් ආපසු පැමිණ අශ්වකරත්තය පිටවී යාමට තවත් මිනිත්තු දහයක් ගතවිය. අපි රොස් නගරය බලා ගමන් ගත්තෙමු. බිව් ගස යටදී ඔහු අහුලා ගත් ගල තවමත් හෝම්ස් අතේ තිබිණ.

"මෙන්න මේක ගැන විස්තර අහන්න ඔබ කැමැති වේවි ලෙස්ට්‍රේඩ්."

හෝම්ස් පැවසුවේ ගල ලෙස්ට්‍රේඩ්ට පෙන්වමිනි.

"මිනීමැරුම සඳහා යොදාගත් ආයුධය මේකයි."

"මට නම් ඒ බවට කිසිම ලකුණක් මේකෙ පෙනෙන්න නෑ."

"කිසිම ලකුණක් නෑ."

"එහෙනම් ඔබ කොහොමද දන්නෙ ආයුධය මේකයි කියලා?"

"මේ ගල තිබුණු තැන, යටින් තණකොළ හැදෙමින් තිබූ තැනක්. ගල එතැනට වැටිල තියෙන්නේ දින කිහිපයකට කලින්. මේක කාලෙක සිට තිබී, ඉවත්කරගත්තු තැනක්, ගහ යට කොහේවත් නෑ. මැකාතිගේ හිසේ තිබූ තුවාල වල හැඩයට හා ප්‍රමාණයට මේ

http://sherlockholmesinvestigations.blogspot.com

ගලේ තිබෙන තුඩු තුලටම ගැළැඹපුනවා. වෙනත් කිසිම ආයුධයක කිසිම සලකුණක් නෑ."

"එතකොට මිනීමරුවා?"

"ඔහු උස පුද්ගලයෙක්. වමත් කාරයෙක්. දකුණු කකුල ටිකක් නොන්ඩි ගහමින් ඇවිදින කෙනෙක්. පළඳින සපත්තු - දඩයමේ යන්න පළඳින වර්ගයේ ඝනකම් අඩියක් සහිත බූට්ස් සපත්තු. ඔහුගේ පිට කබාය අළු පැහැති එකක්. දුම්බොන්නෙක්. ඒ සඳහා යොදාගන්නේ ඉන්දියානු සුරුට්ටු. ඒක දුරන්නේ හෝල්ඩරයකට සවිකරලයි. ඔහුගේ සාක්කුවේ ඇති මුවහත නොමැති, මොට වූ පෑනපිහියක්. තවත් හුඟක් කාරණා තියෙනවා. නමුත් අපේ සෝදිසිය සඳහා උදව් කරගන්න, මේ කාරණා ටික ඇති."

ලෙස්ට්‍රේඩ් හඬනගා සිනාසුණේය.

"මට නම් කියන්න තියෙන්නේ උපකල්පන මගින් කරන ඔය සොයාගැනීම් ගැන මට තවමත් සැකයි කියන එකයි. සිද්ධාන්ත බොහොම අනර්ඝ ඒවා වෙන්න පුළුවනි. නමුත් අපට කටයුතු කරන්න වෙන බ්‍රිතාන්‍ය ජූරි සභාවල තත්ත්වය ඊට වෙනස්. ඔවුන් බොහොම ගැඹුරට හිතාබලන අය. පැහැදිලිව පෙනෙන සාක්ෂියක් නැතිව ඔවුනට කිසිවක් ඒත්තු ගන්වන්න බෑ."

"හොඳයි. කවුරුත් තමන්ගේ බුද්ධි මට්ටමට අනුකූලව ක්‍රියා කළ යුතුයි. ලෙස්ට්‍රේඩ් ඔබ ඔබේ ක්‍රමයට කටයුතු කරන්න. මං මගේ ක්‍රමය අනුගමනය කරන්නම්. අද හවස්වරුව මට බොහොම අවිවේකී එකක් වෙනවා. බොහොම වේලාවට හැන්දෑවෙ දුම්රියෙන් මට ලන්ඩනයට යන්න සිදුවෙන්නත් පුළුවනි."

"එතකොට ඔබේ පරීක්ෂණය සම්පූර්ණ නොකොට අත්හිටවලාද යන්නෙ?"

"නැහැ. සම්පූර්ණ කර අවසන්."

"ඒ වුණාට මේතැන තියෙන අභිරහස?"

"විසඳුවා."

"කවුද එහෙනම් අපරාධකාරයා?"

"මං අර කිව්ව මහත්මයා."

"ඉතින් කවුද ඒ මිනිහා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක හොයාගන්න එක එච්චර අමාරු වෙන්න බෑ ලෙස්ට්‍රේඩ්. මේ අවට ඒ තරම් විශාල ජනගහනයක් නෑ නේද?"

ලෙස්ට්‍රේඩ් තම දෙවුර හකුළුවා, හෝම්ස් ගේ නොපැහැදිලි ප්‍රකාශය ගැන අවිනිශ්චිත බවක් පළකළේය.

"මං බොහොම ප්‍රායෝගිකව වැඩ කරන මිනිහෙක් හෝම්ස් මහත්මයා. එක සකුලක් නොනඩ්ඩගහන, චමත්කාරයා කවුද කියල මට ගම පුරා ඇවිද ඇවිද හොයන්න බෑ. මං එහෙම කළොත් ස්කොට්ලන්ඩ්යාඩ් එකේ මගේ සගයො හිනාවෙලා මැරේවි."

"බොහොම හොඳයි" හෝම්ස් කීවේ කිසිදු කැළැඹීමකින් තොරවයි.

"මං ඔබට අවස්ථාවක් සලසා දුන්නා. මෙන්න අපි ඔබේ නවාතැනටත් ආවා. එහෙනම් ආයුබෝවන්. මං ලන්ඩනය බලා පිටත්වෙන්න කලින් ඔබට පණිවුඩයක් එවනවාම්."

ලෙස්ට්‍රේඩ් ඔහුගේ නවාතැන අසලදී අශ්වකරත්තයෙන් බැස ගියේය. අප ලැගුම්ගත් හෝටලය දක්වා අපි දිගටම පැමිණියෙමු. අපේ දහවල් ආහාරය සූදානම්ව තිබිණ, හෝම්ස් සිටියේ දැඩි නිහඬ බවකිනි. ඔහු කල්පනාවක වෙළී සිටියේ විසඳීමට අසීරු ගැටලුවකට මුහුණදුන් පුද්ගලයෙකු විලසිනි.

"මේ අහන්න වොට්සන්" ඔහු කථාව පටන් ගත්තේ සේවකයා කෑම මේසය අස්කරගෙන ගිය පසුයි.

"මෙහෙන් වාඩිවෙලා ඉඳගෙන, මං කියන දේට මොහොතක් කන්දෙන්න. මට තියෙනවා ඔබට කියන්න දිග කථාවක්. එතැනින් එහාට ගන්න ඕනෙ මොන වගේ පියවරක්ද කියන එක මට තේරෙන්නෙ නෑ. මේ ගැන ඔබ්ට උපදෙස්ක් දිය හැකි නම්, මං ඒක ඉතාමත් අගේකොට සලකනවා."

"කියන්න, මං අහගෙන ඉන්නම්."

"මැකාති තරුණයාගේ සාක්ෂියට සවන් දෙද්දී ඉතාම වැදගත් කාරණා දෙකක්, අපි දෙන්නටම වැටහුණා. ඒ වුණත් ඒ කාරණා දෙක ඔබට පෙනී ගියේ, තරුණයාට විරුද්ධ සාක්ෂි හැටියට; නමුත් මට පෙනී ගියේ ඒවා තරුණයා නිර්දෝෂ යයි හඟවන සාක්ෂි ලෙස. එහෙම නේද?"

"ඔව්."

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙයින් පළමුවෙනි එක වූණේ, තමාව දකින්න කලින්, තමන්ගේ තාත්තා අර "කූ" කියන රහස් සංඥාව කළ එක. දෙවැනි එක ඔහු මිය යද්දී "රට්" යනුවෙන් කිව් වචනය. මැරෙන්න පණ අදිමින් සිටි මහලු මැකාති වචන කිහිපයක්ම තොල් මැතිරුවා. නමුත් ඔහුගේ පුතාගේ කනට හරි හැටි වැටුණෙ "රට්" යන වචනය විතරයි. අපේ පර්යේෂණාත්මක ඉදිරිගමන අපි දන් මේ කාරණා දෙකෙන් අරඹමු. අපි මුලින්ම හිතමු මේ ඉලන්දාරියා කියන කථාව අකුරක් නෑර සම්පූර්ණ සත්‍යයක් කියල."

"එතකොට "කූ" එක?"

"පැහැදිලිවම ඒක මහලු මැකාති තම පුතා වෙනුවෙන් කළ සංඥාවක් වෙන්න බෑ. මේ වෙලාවේ මහලු මැකාතිගේ හිතේ තිබුණේ පුතා ඇත්තේ බ්‍රිස්ටල් නගරයේ කියලයි. පුතා ආපහු ඇවිත්, තාත්තා කියනා දේ ඇහෙන තෙක් මානෙක සිටීම, සම්පූර්ණයෙන්ම අහම්බෙන් සිදුවුණු දෙයක්. එහෙම නම් "කූ" කියන සංඥාව නිකුත් කළේ කාටද? පැහැදිලිවම වෙනත් කෙනෙකුට. කවුද ඒ පුද්ගලයා? ඒ තමයි වයස්ක මැකාති කැලැරොදේදී හමුවීමට කල්තබා වෙලාවක් යොදාගෙන හිටි පුද්ගලයා. මේ "කූ" කියන ශබ්දය ඕස්ට්‍රේලියානු ආරේ ශබ්ද හැඟීමක්. ඒක ඕස්ට්‍රේලියානු ජාතිකයන් අතර හුවමාරු වෙන සංඥා ශබ්දයක්. එතකොට අනිවාර්යයෙන්ම අපේ හිතට හැඟීමක් ඇතුළුවෙනවා, ජලාශය අසලදී මැකාති මේ හමුවෙන්න හිටි පුද්ගලයා, කාලයක් ඕස්ට්‍රේලියාවේ වාසය කළ කෙනෙක් යන්න."

"එතකොට අර "රට්" කියන වචනය?"

හෝම්ස් තම සාක්කුවෙන් නමා තිබූ විශාල කඩදාසියක් එළියට ගත්තේය. ඊළඟට ඔහු එය මේසය මත දිග හැරියේය.

"මේ තියෙන්නේ ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ සිතියමක්. මං ඊයේ රාත්‍රි බ්‍රිස්ටල් වලට විදුලි පුවතක් යවලා මේක ගෙන්වා ගත්තේ. වොට්සන් කියන්න බලන්න මම මේ පෙන්වන තැන තිබෙන වචනය මොකක්ද කියලා."

මගේ මිත්‍රයා සිතියමට දබරැඟිල්ල තබා ''බැලරැට්'' නමක් පෙන්වීය.

"ඇරට්" මම කියෙව්වෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙක මොකක්ද?"

"බැලරට්."

"හරියට හරි. මැකාති කියූ වචනය ඒකයි. නමුත් ඔහුගේ පුතාට ඇහුණේ වචනයේ අන්තිම ස්වරය පමණයි. මහලු මැකාති උත්සාහ කළේ, තමාට මරණීය තුවාල සිදුකළ පුද්ගලයාගේ නම පුතාට හෙළිකරන්නයි. බැලරට්හි අසවලා යනුවෙන්."

"ඒක හරි අපූරුයි!" මම කීවෙමි.

"ඔව්. හරිම පැහැදිලියි. දැන් ඔබට පේනෙනවා තේද මිත්‍රයා, අප සොයා යා යුතු ක්ෂේත්‍රය බොහොම පටු එකක් වන අයුරින් මං සීමා කළා. පුතාගේ සාක්ෂිය ඇත්ත නම්, අලු පැහැති පිටකබායක් තිබීම තුන්වැනි වැදගත් කරුණ. කිසිදෙයක් නොපැහැදිලි තැනක ඉඳලා දැන් අපි ඇවිත් තියෙනවා, හොයා ගත යුත්තේ කාවද කියන පැහැදිලි තැනකට. ඔහු කවුරු වුණත්, අළු පැහැති පිටකබායක් හිමි, ඕස්ට්‍රේලියාවේ බැලරට් ග්‍රාමයෙන් ආ කෙනෙක්."

"සත්තකින්ම ඔව්."

"ඊළඟට ඒ තැනැත්තාට මේ පළාත තමන්ගේ ගම වගේ හුරු පුරුදුයි. පහසුවෙන් මේ අඩවියට යන්න එන්න පුළුවනි. බොස්කෝම්බ් ජලාශය පැත්තට ඇතුළුවෙන්න පුළුවන් හාදර්ලි ගොවිපොළෙන්; එහෙමත් නැත්නම් වතුයායෙන් පමණයි. පිටස්තරයෙකුට, මෙහි ඒම අපහසුයි."

"ඒකත් හරි."

"ඊළඟට අප පැමිණෙනවා අද අප කළ ගවේෂණාත්මක චාරිකාවට. පොළොව හොඳින් පරීක්ෂා කිරීමෙන් මට හැකිවුණා බොහොම සියුම් සාක්ෂි කිහිපයක් සොයාගන්න. ඒවා තමයි අපරාධකාරයා හඳුනාගත හැකි ඔහුගේ පෞද්ගලික තොරතුරු කිහිපයක්. ඒවා මං දුන්නා අර මෝඩයා ලෙස්ට්‍රේඩ්ට. . . ."

"නමුත් ඔබ කොහොමද ඒවා හොයාගත්තේ?"

"මං යොදාගන්න ක්‍රම මොනවද කියල ඔබ දන්නවානේ වොට්සන්. ඉතාම සියුම්, නොවැදගත් යයි හිතෙන දේ නිරීක්ෂණය කිරීමයි එතැන රහස."

http://sherlockholmesinvestigations.blogspot.com

"මට හිතාගන්න පුළුවනි ඔබ අපරාධකාරයාගේ උස නිගමනය කරන්න ඇත්තෙ කොහොමද කියලා. ඔහුගේ පියවර දෙකක් අතර දුරෙන්, ඔබ උස ගැන දළ වශයෙන් නිගමනයකට එන්න ඇති. ඔහුගේ බූට්ස් සපත්තු ගැනත් ඔබ අඩිසටහන් වලින් දකින්න ඇති."

"ඔව්. ඒවා විශේෂ බූට්ස් සපත්තු වර්ගයක්."

"ඒ වුණාත් කොර ගසමින් ඇවිදින් බව කිව්වෙ කොහොමද?"

"ඔහුගේ දකුණු සපත්තුවෙන් වැදුණු පා සටහන, වම් සපත්තුවෙන් වැදුණු සටහන තරම් පැහැදිලි නෑ. ඔහු දකුණු කකුලට වැඩි බරක් යොදන්නේ නෑ. ඇයි? දකුණු කකුලේ කොර ගතියක්, නොාන්ඩි ගතියක් ඇති නිසා."

"ඔහු වමත්කාරයෙක් බව කිව්වෙ කොහොමද?"

"ඇයි වොට්සන්, අධිකරණ ශල්‍ය වෛද්‍යවරයා ඉන්ක්වෙස්ට් විභාගයේදී දී තිබුණු සාක්ෂියෙන් ඔබත් යම් තරමක විමතියකට පත්වුණා නේ. පහර එල්ල කර තිබුණේ පිටුපසින්; ඒ වගේම බොහොම ළඟ ඉඳන්. නමුත් එය වැදී තිබුණේ හිසේ වම්පසට. අපරාධකාරයා වමත්කාරයෙක් නොවෙයි නම් එහෙම වෙන්නේ කොහොමද? තාත්තයි පුතයි අතරේ ආරවුල ඇතිවෙන වෙලාවෙ අපරාධකාරයා අර යෝධ බීච් ගසට මුවාවෙලා බලාගෙන ඉඳල තියෙනවා. ඔහු දුම්වැටියක් දල්වාගෙන ඉඳල තියෙනවා. මට හමුවුණා ඔහුගේ සුරුට්ටුවේ අළු. දුම්වැටි වර්ග වල අළු පිළිබඳව මා සතු විශේෂඥ දැනුම නිසා, මට කීමට පුළුවනි ඒ ඉන්දියන් සුරුට්ටුවක අළු බව. ඔබ දන්නවා මං මේ අංශය ගැන තරමක අවධානයක් යොමුකර ඇති බව. මං ඒ ගැන ලියූ කුඩා පොතේ විස්තර කර තිබෙනවා, පයිප්ප, සුරුට්ටු හා සිගරට් වර්ග 140 ක අළු පිළිබඳව. අළු ටික හමුවුණාම මං හොයා බැලුවා සුරුට්ටු කොටය ගැන. ඔහු ඒක විසිකර තිබී, ගහමුල පාසි වැවී තිබුණු තැනකින් මට ඒක හමුවුණා. ඒක ඉන්දියානු සුරුට්ටුවක්. නමුත් මේ වර්ගය ඔතනු ලබන්නේ රොටර්ඩෑම්හි."

"ඊළඟට සුරුට්ටුව හෝල්ඩරයට සවිකර උරන බව?"

"සුරුට්ටුවේ කෙළවර දත්වලින් සපා නොමැති බව මට පෙනී ගියා. ඒ කියන්නේ ඔහු හෝල්ඩරයක් පාවිච්චි කර තිබෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

සුරුට්ටුවේ කෙළවර කටෙන් කඩා ඉවත්කර නැහැ; පිහියකින් කපා තිබෙනවා. නමුත් ඒ කැපුම් පාරේ හැටියට පැහැදිලියි පිහියේ මුවහතක් නැති බව."

"හෝම්ස්. ඔබ මේ අපරාධය කළ පුද්ගලයා වටා දැලක් වියා හමාරයි. දැන් නම් ඔහුට ඒකෙන් ගැළවීමක් නැහැ. එපමණක් නොවෙයි. ඔබ අහිංසක තරුණයෙකුගේ ජීවිතයත් බේරාගත්තා. ඒක හරියට අලුගෝසුවා ඔහුගේ තොණ්ඩුව තරුණයාගේ ගෙලේ හිරකරලා එල්ලද්දී, කඹය කපා ඔහුව ගළවාගත්තා වගෙයි. සාක්ෂි යොමුවන්නේ කොයි දිශාවටද කියල මට හිතාගන්න පුළුවනි. සැකයක් නෑ අපරාධකාරයා තමයි. . . ."

". . . . ජෝන් ටර්නර් මහත්මයා." යයි කෑගැසූ හෝටලයේ සේවකයා අපේ දොර විවෘත කොට අමුත්තෙකු ඇතුළට කැඳවාගෙන ආවේය.

කාමරයට ඇතුළු වූ පුද්ගලයා අපූරු පෙනුමක් තිබූ අයෙකි. කකුලක් කොර ගසමින් හෙමින් හෙමින් ඇවිදගෙන ආ විලසින් ඔහු අබල දුබල පුද්ගලයෙකු බව පෙනිණ. ඒ වයස් ගතවීම හා ලෙඩරෝග නිසා විය යුතුය. එහෙත් ඔහුගේ අත් පා වලින් සිරුරේ ශක්තියත්, රළු වැටී තිබුණු මුහුණෙන් පළවූ හැඟීම් වලින් චිත්ත ශක්තියත් මැනැවින් පෙනිණි. ඔහුගේ පැසුණු හිසකෙස්, ගොරෝසු රැවුළ හා ඉහළට වැටී තිබුණු ඇහිබැම පෞරුෂත්වය විදහා දැක්විය. එහෙත් මේ අමුත්තාගේ මුහුණ තදින්ම සුදුමැලි වී තිබූ අතර නාස්පුඩු අසල නිල් පැහැ ගැන්වී තිබිණ. මේ තැනැත්තා මාරාන්තික නිදන්ගත රෝගයක ග්‍රහණයට හසුවී, ජීවිතයේ අවසානය කරා ළංවෙමින් සිටිනා බව එයින් මම වටහා ගතිමි.


"ඔය සෝපාවේ වාඩිවෙන්න මහත්මයා. මා එවූ ලියුම් කැල්ල ඔබට ලැබෙන්න ඇති?"

"ඔව්. මොරාන් මට ඒක ගෙනැවිත් දුන්නා. ඔබ කියලා තිබුණා, අපකීර්තිය ගෙනෙන මහා ආන්දෝලනයක් වළක්වන්න මා හමුවන්න කැමතියි කියල?"

"මං ඔබේ නිවසට ආවා නම්, මිනිස්සු නොයෙක් ඕපාදූප කථාකරන්න පටන්ගනීවි කියල මට හිතුණා."

හෝම්ස් පිළිතුරු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com



256. ". . . . හෝටලයේ සේවකයා දොර විවෘත කොට අමුත්තෙකු ඇතුළට කැඳවාගෙන ආවේය.

Reading Purpose Only... Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"මාව හමුවෙන්න ඕන කිව්වෙ මොකටද?" යයි ඇසුවත් ටර්නර් මහතාගේ මුහුණේ සලකුණු වී තිබුණේ පරාජයයි.

"ඔව්. මැකාති සිද්ධිය ගැන හැම දෙයක්ම මං දන්නවා."

මහල්ලා දෑත් වලින් තම මුහුණ වසාගත්තේය.

"දෙවියන් වහන්සේ මට පිහිටවන සේක්වා!" ඔහුට උස් හඬින් කියැවිණි.

"ඒ වුණත් අර ඉලන්දාරියට අනතුරක් වෙන්න ගියා නම්, මං ඒකට ඉඩඅරින්නේ නෑ මහත්මයා. දෙයියම්පා! මං එහෙනම් උසාවියට ගිහින් හැමදේම හෙළිකරනවා."

"ඔබ එහෙම කියනවා අහන්නත් මට සතුටුයි." හෝම්ස් කීය.

"මගේ කෙල්ල නිසා නොවෙයි නම් මෙළහකට මං ඇත්ත හෙළිකරලා මහත්මයා. මිනීමරුවෙක් හැටියට මාව හිරභාරයට ගත්තොත් මගේ පුංචි කෙල්ලගෙ පපුව පැළිල මැරෙයි."

"ඒ තත්ත්වයට එන්න අපි ඉඩහරින්නෙ නෑ." හෝම්ස් කීය.

"මොනවා?"

"මම රහස් පරීක්ෂකයෙක් වුණත් රජයෙන් පත්කෙරුණු නිල ලත් කෙනෙක් නොවෙයි. මාව මෙහේට ගෙන්නුවේ ඔබේ දුවණිය. ඇයගේ ඉල්ලීම මතයි මං කටයුතු කරන්නේ. ඒ වුණත් අප මැකාති තරුණයා නිදහස් කරගත යුතුයි."

"මම මරණාසන්න මිනිහෙක් මහත්මයා. මං දියවැඩියාව නිසා අවුරුදු ගණනාවක් තිස්සේ රෝගීව සිටින කෙනෙක්. මගේ වෛද්‍යවරයා කීවේ මං තව මාසයක් ජීවත්වේද කියන එකත් සැක සහිතයි කියල. ඒ වුණත් මං කැමතියි, ඒ ටික කාලෙට හරි හිරගෙදරට නොගිහින් මගේ වහළ යට මැරෙන්න."

හෝම්ස් හාන්සිපුටුවෙන් නැගිට ගොස් මේසය අසල අසුන්ගත්තේය. කඩදාසි කිහිපයක් හා පෑනක් අතට ගත් ඔහු ලිවීමට සූදානම් විය.

"ටර්නර් මහත්මයා. අපට ඇත්ත කියන්න. මං හැම දෙයක්ම ලියාගන්නම්. ඊට පස්සේ ඔබ ඊට යටින් අත්සන් කරන්න. මේ වොට්සන් මහත්මයා ඒකෙ සාක්ෂියට අත්සන් කරාවි. මැකාති තරුණයාට අධිකරණයෙන් දඬුවම් නියම වුණොත්, ඔහු බේරා

http://sherlockholmesinvestigations.blogspot.com

ගන්න වෙන කළ හැකි කිසිම දෙයක් නොමැති නම් පමණක්, අපි ඔබේ පාපෝච්චාරණය ඉදිරිපත් කරනවා. මං ඔබට පොරොන්දු වෙන්නම් අප මේක යොදා ගන්නේ එය අත්‍යාවශ්‍යම වුණොත් පමණක් බව."

"ඒක බොහොම හොඳයි. ඒ වුණත් මෙතැන ප්‍රශ්නය තියෙන්නේ නඩුව මහාධිකරණයේ අහන්න පටන් ගන්නා තුරු මං ජීවත් වේද කියන එකයි. ඒ හින්දා මං ගැන ප්‍රශ්නයක් නැහැ. මට උවමනා ඇලිස්ට මේකෙන් ඇතිවෙන කම්පනය වළක්වාගන්නයි, මං ඔබට හැමදෙයක්ම පැහැදිලි කරලා කියන්නම්. ඒක සිද්ධවෙන්න බොහොම කාලයක් ගියා. නමුත් කියන්න එච්චර වෙලාවක් යන එකක් නෑ.

හෝම්ස් මහත්මයා. මේ මැරුණු මැකාති මොන විදියේ කෙනෙක්ද කියා ඔබ දන්නේ නෑ. ඔහු තමයි නියම යක්ෂයා - යක්ෂයා මිනිස් ස්වරූපයෙන් නැවත ඉපදීම. ඒ ටික ඔබට විශ්වාසෙටම කියන්න මට පුළුවනි. මං ප්‍රාර්ථනා කරනවා ඒ වගේ මිනිහෙකුගේ ග්‍රහණයට ඔබ අහුනොවෙන්න, ඔබට දෙවියන්ගේ පිහිට ලැබෙන්න කියල. මේ පහුගිය අවුරුදු විස්ස තුළ මං ඔහුගේ ග්‍රහණයට හිරවෙලයි හිටියේ. ඌ මගේ ජීවිතය විනාශ කළා. මං ඌට අහුවුණේ කොහොමද කියලා මං ඔබට කියන්නම්.

මේක සිද්ධවුණේ 1860 ගණන්වල මුල හරියේ. තැන, ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ, රත්තරන් ඉල්ලම් හාරන ප්‍රදේශ. ඒ කාලෙ මං තරුණ ගැටයෙක්. කිසිදේකට භය නැති, ක්ෂණිකව තීරණ ගන්නා, හරි දේ මොකක්ද, වැරදි දේ මොකක්ද කියලා නොහඳුනන තරුණයෙක්. මං නරක යාළුවන්ගේ ආශ්‍රයට වැටුණා. මත්පැන් වලට ඇබ්බැහි වුණා. රන් ඉල්ලම් ගැරීමෙන් සෑහෙන මුදලක් හොයාගන්නත් බැරිවුණා. ඒ වැඩ අසාර්ථක වුණාම අපි කැලේ පැන්නා. ඊට පස්සේ අපි මං පහරන පල්හොරුන් බවට පත්වුණා. අපේ කල්ලියේ හයදෙනෙක් හිටියා. අපි බොහොම නිදහසේ මංකොල්ල කමින් ජීවත්වුණා. සමහර වෙලාවට අපි ප්‍රවාහණයට සූදානමින් රත්තරන් ඉල්ලම් ගබඩාකරපු තැන් හොයාගෙන ගිහින්, ඒවා මංකොල්ල කෑවා. එහෙමත් නැත්නම්, පතල් වලින් ඉල්ලම් අරගෙන ගිය අශ්වකරත්ත නවත්වා කොල්ලකෑවා. මාව හැඳින්වුණේ බැලරට්හි මැරවර ජැක් නමින්. අපේ කට්ටියට මිනිස්සු කිව්වේ බැලරට්හි කොල්ල කල්ලිය කියලයි.

http://sherlockholmesinvestigations.blogspot.com

එක දවසක් බැලරට් සිට මෙල්බෝන් දක්වා, රත්රන් ඉල්ලම් රැගත් අශ්වකරත්ත ගණනාවක් එක්වරම එන බව ආරංචිවුණා. අපි කැලේ සැඟවිලා ඉඳලා උන්ට පහර දුන්නා. අශ්වකරත්තවල ආරක්ෂාවට අවිආයුධ ගත් හමුදා භටයින් හයදෙනෙක් යොදා තිබුණා. අපේ කට්ටියෙත් හයදෙනයි. අපි උන්ට පහරදුන්නා විතරයි, ඔවුන්ගෙනුත් දරුණු ප්‍රතිප්‍රහාර එල්ලවුණා. තියුණු සටනකට පස්සේ උන් ගෙනගිය කරත්ත හතරකම රන් ඉල්ලම් කොල්ලකාගන්න අපි සමත්වුණා. ඒත් අපේ අයගෙන් තුන්දෙනෙක් සටනේදී එතැනම මියගියා. එක කරත්තයක රියැදුරාගෙ හිසට පිස්තෝලය එල්ල කරලා, ඌව මරාදමන්න හදලත් මං නිකං හිටියා. ඒ තමයි මේ මිනිහා මැකාති. එදා මං ඌට කොකා ගැස්සුවේ නැත්තේ ඇයිද කියල මට හිතාගන්න බෑ. මගේ මුහුණුවර හැමදෙයක්ම මතක තියාගන්න වගේ, ඌ මං දිහා එදා බලා හිටපු හැටි, මට තවමත් මතකයි.

ඒ රත්තරන් තොගය අරගෙන පැන ගහිපු අපි විශාල ධනවතුන් බවට පත්වුණා. ඊට අස්සෙ කිසිවෙකුට අහුනොවී අපි එංගලන්තයට පැන ආවා. කාගේවත් සැකයට භාජනය නොවී මෙහේ පදිංචි වෙලා ජීවත්වෙන්න අපිට හැකියාව ලැබුණා. මගේ අනෙක් මිත්‍රයන් දෙදෙනාගෙන් සමුගෙන, අපරාධ වලට සම්බන්ධ නොවී, වැදගත් ජීවිතයක් ගෙවන්න මං තීරණය කළා. ඒ කාලේ විකිණීමට තිබුණු මේ ඉඩම මං මිලයට ගත්තා. මං මේ මුදල් උපයා ගත්තේ වැරැදි පිළිවෙළකටයි. ඒ පව් ගෙවෙන්න මේ මුදල් වලින් යහපත් වැඩකටයුතු මොනවා හරි කරන්නත් මං අරමුණු කරගත්තා. ඊට පස්සෙයි මම විවාහ වුණේ.

මගේ පුංචි දුව ඇලිස් ඉපදුණාට පස්සේ, තරුණ කාලයේදීම මගේ බිරිඳ මියගියා. ඇලිස් පුංචි කාලේ ඉඳන් හැදුණේ වැඩුණේ හොඳ ගතිගුණ ඇති දරුවෙක් හැටියට. ඇගේ පුංචි අත් වලින් මාව ගෙන ගියේ නිවැරදි පාරකට, හොඳ දේවල්වලට. මීට කලින් කිසිවිටියකින් මාව එවැනි මහකට යොමු වී තිබුණේ නෑ. වෙනත් වචන වලින් කියනොත් මං මගේ ජීවිතයේ අලුත් පිටුවක් පෙරළුවා. පහුගිය කාලේ පව් මකාදමන්න මං හැකි තරමින් හොඳ කටයුතු වල යෙදුණා. මේ හැමදේයක්ම හොඳින් සිදුවෙගන යද්දී තමයි මං මැකාතිගේ ග්‍රහණයට හසුවුණේ.

http://sherlockholmesinvestigations.blogspot.com

මං මගේ මුදල් ආයෝජන කැඩක් සඳහා එක දවසක් ලන්ඩන් නගරයට ගියා. මට රීජන්ට් වීදියේදී මේ මිනිහව හමුවුණා. ඉරුණු කබායක් ඇඳගෙන, කැඩීගිය පාවහන් පැළැඳගෙන ඔහු හිටියේ අන්තිම දුගියෙක් විදියට.

"ඔන්න අපි ආයෙමත් හමුවුණා ජැක්."

ඔහු කිව්වේ මගේ අතින් අල්ලාගෙන.

"මගේ පවුලෙ ඉන්නෙ මායි පුතයි විතරයි. අපි ඔබේ පවුලෙ අය වගේ හිතවත්ව ඉන්නම්. ඔබට තියෙන්නේ අපට ජීවත්වෙන්න ඉඩ සලස්වන එක විතරයි. එහෙම නොකෝළොත්? ඔබ දන්නවනේ, එංගලන්තය කියන්නේ ඉතාහොම හොඳට නීතිය ආරක්ෂා කරන රටක්. පොලිස් භටයෙක් ගෙන්වාගන්න යන්නම් ශබ්දෙට කෑගැහුවොත් ඇති."

ඉතින් උන් මං ජීවත්වුණු ප්‍රදේශයේ පදිංචියට ආවා. උන්ගෙන් මට කිසිම ගැළැවීමක් තිබුණෙ නෑ. මගේ වතුයායේ හොඳම කොටසක කිසිම බද්දක් නොගෙවා ජීවත්වුණා. මගේ හිතට කිසිම සැනසීමක්, සාමයක් තිබුණේ නෑ. මට කිසිම දේකට නිදහසක් තිබුණෙත් නෑ. මැකාති උගේ කපටි සිනාවත් රඳවාගෙන මං ළඟින්ම හිටියා.

ඇලිස් වයසින් වැඩෙද්දී මැකාතිගේ කෛරාටිකකමත්, කුරිරුකමත් එන්න එන්නම වැඩිවුණා. ඒ මොකද මගේ ලැජ්ජාසහගත අතීතය, පොලීසිය දැනගන්නවාටත් වඩා, මගේ දුව දැනගන්නවාට මං අකමැති බව ඔහු තේරුම් ගත්තා. ඔහුට උවමනා වුණේ මොනවද ඒ හැම දෙයක්ම, අඩුවක් පාඩුවක් නැතුව ඔහු මගෙන් ගත්තා. උගෙන් වැඩිපුර ප්‍රශ්න නොඅසාම මං ඒ දේවල් උාට දුන්නා. සල්ලි, ගෙවල්, ඉඩම් ඒ හැම දෙයක්ම. අන්තිමට ඌ මගෙන් ඉල්ලුවා මට දෙන්න බැරි දෙයක්. ඒ මගේ දුව ඇලිස්.

ඔබට තේරෙනවා, මේ කාලය වෙන කොට ඔහුගේ පුතාත් මගේ දුවත් දෙදෙනාම වයසින් වැඩිලා. මේ අසනීප තත්ත්වය නිසා මං දුර්වලව හිටි බවත් ප්‍රකට කරුණක්. ඉතින් ඔහුට හොඳ අදහසක් පහළ වුණා. කිසිම කරදරයක් නැතිව මගේ මුළු දේපතම ඔහුගේ පුතාට අයිතිවෙන යෝජනාවක්. මං ඒකට කැමැතිවුණේ නෑ. උගේ කාලකණ්ණි පරපුර, මගේ පරපුර එක්ක මිශ්‍ර කරගන්න

http://sherlockholmesinvestigations.blogspot.com



261\. ". . . . ඔහුගේ පුතා ඉවත්ව යනතුරු ගහක් යටට වෙලා සුරුට්ටුවක් උරමින් හිටියා."

http://sherlockholmesinvestigations.blogspot.com

මං කොහොමටවත් කැමැති වුණේ නෑ. මේ ඉලන්දාරියා ගැන මගේ හිතේ අකමැත්තක් තිබුණා නෙමෙයි. නමුත් උගේ ඇගේ දුවන්නෙත් උගේ තාත්තගෙ ලේ. ඒ කාරණාවම මට ඇති මේ විවාහයට විරුද්ධ වෙන්න. ඉතින් මං ඒකට විරුද්ධ වුණා. මගේ රහස හෙළිකරන බවට මැකාති තර්ජනය කළා. ඔහුට කළ හැකි තරකම දේ කරන්න ඉඩහරින්න මං හිතාගත්තා. ගෙවල් දෙකට අතර මැද ජලාශය හරියෙදි අපි හමුවෙන්න තීරණය කළේ ඒ ගැන වැඩිදුර කථාකරගන්න අදහසිනුයි.

මං එතැනට යද්දි, මැකාති ඔහුගේ පුතා සමග කතාබහක යෙදිලා හිටියා. ඉතින් මං ගහක් යටට වෙලා ඔහුගේ පුතා ඉවත්ව යනතුරු සුරුට්ටුවක් උරමින් හිටියා. මැකාති කියූ දේවල් මගේ කනට වැටෙද්දි, මගේ හිත්ට නැඟුණේ ඔහු කෙරෙහි දැඩි වෛරයක්, ද්වේෂයක්. මගේ දුව පාර අයිනෙ ඉන්න හිඟන ගැහැනියක් කියල හිතල, ඇය කියන කිසිදෙයක් ගණන් නොගෙන, ඇයව බඳින්න කැමැති වෙයං කියල මැකාති ඔහුගේ පුතාට තර්ජනය කළා.

මං මේ තරම් ආදරයෙන් රැක බලාගත් වස්තුවක්, මේ නීචයාගේ ග්‍රහණයට හසුවෙලා විනාශවෙන්න යනහැටි දක්කාම මං පිස්සු වැටුණා මහත්මයා. ඔහුගේ ග්‍රහණයෙන් මට ගැළවීමක් නැද්ද? මං දැන් කොහොමටත් විනාශයට පත්වුණු, මරණාසන්න මිනිහෙක්. මගේ සිහිකල්පනාව හොඳයි. අතපය ශක්තිමත්. ඒ වුණත් මං දන්නවා මගේ ඉරණම, මට ජීවත්වෙන්න ඉතිරිවෙලා තියෙන්නේ තව දවස් කිහිපයක් පමණයි. ඒ වුණත් මගේ කෙල්ලගේ අනාගතය වෙනුවෙන් මා යමක් කළ යුතුයි. මගේ ලැජ්ජාසහගත අතීතය යටපත් කරල දමන්න, මගේ ආදරණීය දුවගේ අනාගතය ආරක්ෂා කරන්න, මේ විනාශකාරී කට සදහටම වසා දැමිය යුතුයි කියල මට හිතුණා. ඒ නිසා මං ඒ දේ කළා හෝම්ස් මහත්මයා. මං ඒ ගැන කම්පා වෙන්නෙ නෑ. තවත් සැරයක් හරි මං ඒ දේ කරනවා. මං ඒ කාලෙ ජීවත්වුණේ අපරාධකාරයෙක් හැටියට. ඒත් ඒකට හරියන්න මං මැරෙන්නෙ වීරයෙක් වගේ. අර නීචයාගේ දැලේ පැටලිලා මං අවුරුදු විස්සක් දුක්වින්දා. මගේ කෙල්ලටත් ඒ දැලේ පැටලෙන්න ඉඩතියන්න, මට කොහොමටවත් හැකියාවක් තිබුණේ නෑ. මං ඔහුට පහර එල්ල කළේ, විෂ සහිත දරුණු සර්පයෙකුට පහර දෙන තරම් සැහැල්ලුවෙන්. ඔහුගේ විලාපය ඇහිලා, ඔහුගේ

http://sherlockholmesinvestigations.blogspot.com

පුතා දුව ආවා. නමුත් ඒට කලින් කැලෑරොදේ හැංගෙන්න මට හැකිවුණා. නමුත් මගේ අතින් වැටුණු මගේ පිටකබාය ගන්න තවත් වාරයක් එතැනට යන්න මට සිදුවුණා. ඇත්ත කථාන්තරය ඒකයි මහත්වරුනි."

"ඔබේ ක්‍රියාවේ සාධාරණත්වය ගැන නිශ්චය කිරීම මට අයිති කටයුත්තක් නොමෙයි."

හෝම්ස් පැවසුවේ වයස්ගත පුද්ගලයා තම පාපෝච්චාරණයට අත්සන් තබද්දීය.

"මං ප්‍රාර්ථනා කරනවා ඔය වගේ තත්ත්වයකට මුහුණ පාන්න අපට නොලැබේවා කියල."

"මමත් එහෙම ප්‍රාර්ථනා කරනවා මහත්මයා. දැන් ඔබ මොකක්ද කරන්න හදන්නෙ?"

"ඔබේ සෞඛ්‍ය තත්ත්වය ගැන සලකලා මං කිසිම දෙයක් කරන්නෙ නෑ මහත්මයා. මං දන්නවා මහාධිකරණයට වඩා වෙනත් උසාවියකට ළඟදීම ඔබට යන්න සිදුවෙන බව. ඔබේ ක්‍රියාවලට උත්තර දෙන්න සිදුවෙන්නෙ එතැනදී. ඔබේ පාපෝච්චාරණය මා ළඟ ආරක්ෂා සහිතව තබාගන්නවා. තරුණ මැකාති එල්ලුම්ගහට නියම වුණොත්, ඔහු බේරාගැනීම සඳහා මං මේක පාවිච්චි කරනවා? එහෙම නැතිවුණොත් මේක යළිත් මිනිස් ඇසකට දකින්න ලැබෙන්නෙ නෑ. ඔබ පණපිටින් හිටියත් මියගියත් ඒ රහස අප ළඟ ආරක්ෂා වෙනවා."

"එහෙනම් ඔබට ආයුබෝවන් මහත්මයා. කවදා හරි ඔබේ මරණ මංචකයේදි මා ගැන සිහිකරන්න. මරණාසන්නව ඉන්න මගේ හිතට ඔබ දුන් සැනසීම සිහිවුණාම ඔබේ හිතට ලොකු සැහැල්ලුවක් ඇතිවේවි. සැනසිලිදායක මරණයකට යන්න ඔබට ඒකම ඇතිවේවි."

එසේ පවසා අපෙන් සමුගත් ජෝන් ටර්නර් මහතා, වෙව්ලමින්, ඉතා අපහසුවෙන් අපේ කාමරයෙන් ඉවත්වී ගියේය.

"දෙවියෝ අප ආරක්ෂා කරත්වා!"

හෝම්ස් පැවසුවේ සෑහෙන වේලාවක් නිහඬව කල්පනා කිරීමෙන් පසුවයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වගේ අසරණ අහිංසක මිනිසුන් සමගම දෛවය මොකද මේ වගේ සෙල්ලම් කරන්නෙ?" හෝම්ස්ගේ මුවෙන් පිටවිය.

මැකාති ඝාතන නඩුව මහාධිකරණයේදී විභාගයට ගැනිණ. විත්තියේ නීතිඥයා වෙත හෝම්ස් ලබාදුන් තොරතුරු රාශියක් අනුව, නීතිඥයා විසින් හරස් ප්‍රශ්න හා විරෝධතා රැසක් අධිකරණයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ජේම්ස් මැකාති සම්පූර්ණයෙන්ම නිදහස් විය.

මහලු ටර්නර් අප හමුවී කළ කතාබහෙන් මාස හතකට පසු මියගියේය. ඔවුන්ගේ ජීවිත වටා පැවැති අඳුරු අතීතය කෙසේ වුවත්, ඒ පිළිබඳ නොදනම, ජේම්ස් මැකාති හා ඇලිස් ටර්නර් සතුටින් අතිනත ගැනීමට ඉඩ ඇතැයි මම විශ්වාස කරමි.

- නිමි -

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com




## හීෂණයක් !

අභිරහස් මිනීමැරුම් සහ අද්භූත ගැටලු
විද්‍යානුකූලව විසඳූ සුප්‍රකට රහස් පරීක්ෂක
ෂර්ලොක් හෝම්ස්ගේ සුවිශේෂ පරීක්ෂණ
හයක් ඇතුළත් ග්‍රන්ථය

අසංක්ෂිප්ත පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**

මෙම ග්‍රන්ථයට පහත සඳහන් කථා අඩංගුය.


**බ්ලැක් මෝගල් මංකොල්ලය**
**ඇබර්ගැවනි බේදවාචකය**
**මංජුසාවේ අභිරහස**
**බිශොප්ස්ගේට් මැණික් හොරකම**
**හීෂණයක් !**
**අද්භූත ආගන්තුකයා**


## බ්ලැක් මෝගල් මංකොල්ලය

"බාප්පා දීර්ඝ කාලයක් දකුණු අප්‍රිකාවේ ගතකරලා, හදිසියේම ආපහු එංගලන්තයට ආවා. ඒකට හේතුවුණේ දකුණු අප්‍රිකාවේ ඇරඹුණු බෝවර් යුද්ධයයි."

"දෙයියෝ සාක්කි! අන්න ඌ තමයි! ඌ තමයි මිනීමරු එකා. ඌ තමයි මැරවරයා. දෙවියනේ! ඌත් ඇවිත්ද? ඌට අහුවුණොත් මං ඉවරයි. දෙවියන් වහන්ස. මේ පව්කාරයාට කමා කළ මැනව! මේ පව්කාරයාගේ ජීවිතය බේරාගත මැනව!"

"ඌ මහා නපුරු කපටි එකෙක්" ඔහු කිව්වා. "මං හුස්ම ගන්නා හැම වාරයක් පාසාම මට ඌ මතක් වෙනවා. ඔගේ ඉළ ඇට තුනක් කඩා දැම්මා. කකුලේ ඇටකටු පොඩිකළා. තව ටිකෙන් දොස්තරලා මගේ කකුල කපනවා. ඒ ඔක්කොම කළේ ඌ තමයි. මේ සැරේ ඌට අහුවුණොත් නම් ඕකා මාව මරාවී. ඒකෙ ආයෙ දෙකක් නෑ."

"ජෝන් කොහොමටවත් කොංගල්ටන් දුම්රිය පොළේ බහින්න එපා. ඔය එන දුම්රියේම තවත් ඉදිරියට යන්න. ඊළඟ දුම්රියපොළ ස්ටෙඩිං බ්‍රිජ්. එතැනදී දුම්රියෙන් බහින්න. මං අශ්වකරත්තය එවන්නේ එතැනටයි."

http://sherlockholmesinvestigations.blogspot.com

## ෂර්ලොක් හෝම්ස්ගේ වික්‍රමාන්විත පරීක්ෂණ 1

## THE ADVENTURES OF SHERLOCK HOLMS



**ඉන්ද්‍රනීල මාණික්‍යය**

"උඹයි උඹේ පාත්තයායි ගැන කථාව මට දැන් තිත්ත වෙලා.....
මං ප්‍රාර්ථනා කරනවා තොපි ඔක්කොම යක්ෂයාට බිලිවේවා
කියල.....
කරදර කරන්න ආවොත් ලිහනවා බල්ලුව!"

**උමං දුම්රියේ අභිරහස් මරණය**

"අග්‍රාමාත්‍යතුමා මේ තරම් කලබල වෙලා ඉන්නවා මං කවදාවත් දැකල නෑ. නාවික හමුදා මූලස්ථානය අභියස පැත්ත පෙරළුණු මී වදයක් වගේ කැළඹිලා! ෂර්ලොක් ඔබේ අගනා ප්‍රතිභාණ ඥානය විසිකරන්න.... හොයන්න මේ තරුණයා මිය ගියේ කොහොමද?"

**බිහිසුණු අත්දැකීමක්**

......ඔහුගේ කට බාගෙට ඇරුණා. භීතිය පිළිබිඹු කරමින් දෑස් ඉදිරියට නෙරා ආවා. මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලි වුණා.

ඔහුට සැහැලුණේ අප්‍රමාණ
භයකින්.
"ඝේ. ඝේ. ඝේ !.... දෙවියනේ !
අනේ දෙවියනේ ! මං කළ
පාපකර්ම මගේ පස්සෙන්
එලවනවා"
"ඇයි මොකක් ද?"
"මරණය !!"

**අයිරින් ඇඩ්ලර්**

එක්වරම හෝම්ස් විලාප නගමින් බිම ඇද වැටුණේය. ඔහුගේ මුහුණ පුරා ලේ ගලා යන්නට පටන් ගත් හැටි මම දුටුවෙමි. පිරිසක් තුවාල වී ඇද වැටුණු හෝම්ස්ට උදව් කිරීමට ඉදිරිපත් විය.
"ඔය අහිංසක මහත්මයාට හුඟක් තුවාල ද?"
"ඔහු මැරිලා!"
"නෑ නෑ! තවම යන්තම් පණ තියෙනවා"

සහ

**බොස්කෝම්බ් නිම්නයේ ඛේදවාචකය**

**රතු හිසකෙස් ගැටලුව**

## වන්දන මෙන්ඩිස්ගේ පරිවර්තනයකි

http://sherlockholmesinvestigations.blogspot.com